ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)



Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com


# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන


Beyond Your Expectations
For ALL Your Real Estate Needs
Gamini Abeysinghe
Sales Representative
The Diamond Realty Inc.



Tel: 416 822 2789
www.gaminiabeysinghe.com



Pages 52 | OCTOBER 2018 Issue : 106 | මාසික සංග්‍රහය | 2018 ඔක්තෝබර්, 106 කලාපය | 50 ¢





ඔක්තෝබර් 01
ජාත්‍යන්තර වැඩිහිටි දිනය

## UNITED STATES-MEXICO-CANADA AGREEMENT - USMCA

1993 දෙසැම්බර් 27 වෙනි දින ඇමරිකාවේ හිටපු ජනාධිපති බිල් ක්ලින්ටන් විසින් අත්සන් කරන ලදුව 1994 ජනවාරි 01 වන දින සිට බලාත්මක කෙරුණු උතුරු ඇමරිකාවේ නිදහස් වෙළඳ ගිවිසුම - North American Free Trade Agreement (NAFTA) එතැන් පටන් විවිධ කේවල් කිරීම්, වෙනස් කිරීම් මධ්‍යයේ වුවත් නොකඩවා පැවතුණි. මෙම ගිවිසුමෙහි පාර්ශ්වකරුවන් වන ඇමරිකාව, කැනඩාව හා මැක්සිකෝවෙහි පාලක රජයයන් මෙම කාලය තුළ වෙනස් වූවත් ගිවිසුමෙහි ප්‍රධාන අන්තර්ගතයයන්ට එයින් එතරම් බලපෑමක් එල්ල නොවුණි.

එහෙත් 2017 ජනවාරි 20 වන දින ඇමරිකාවේ ජනාධිපති ලෙස ඩොනල්ඩ් ට්‍රම්ප් පත්වීමත් සමග NAFTA ගිවිසුමට කණකොකා හඬන්නට වූ අතර ඔහු මුල සිටම මෙම ගිවිසුම පිළිබඳව අප්‍රසාදයෙන් කතා කරන්නට වුණි. ට්‍රම්ප්ගේ මැතිවරණ ව්‍යාපාරයේදීත් ඔහු විසින් පුන පුනා පවසා සිටියේ NAFTA ගිවිසුම 'ලෝක ඉතිහාසයේ නරකම වෙළඳ ගිවිසුම' (worst trade deal in the history of the world) බවත් 'ලෝක ඉතිහාසයේ බලවත්ම විපත්තිකර වෙළඳ ගිවිසුම' (The greatest disaster trade deal in the history of the world) බවත්ය. එනිසා මෙම භයානක ගිවිසුම අහෝසි කර රටවල් තුන එක්ව අලුත් වගන්ති සහිත නව ගිවිසුමකට යෑමේ අවශ්‍යතාව ඔහු සෑම විටකම අවධාරණය කොට

8 වන පිටුව බලන්න

## වේන් ගෙනා නීති ෆෝඩ් කපා දමයි ?

සේවක වැටුප් සංශෝධනය කරමින් කැත්ලීන් වේන්ගේ ලිබරල් රජය විසින් ගෙන ආ Bill 148 සංශෝධනය කිරීමට ෆෝඩ් රජය සැරසේ. පසුගියදා පැවති පාර්ලිමේන්තු සැසි වාරයේදී ප්‍රෙමියර් ඩග් ෆෝඩ් මේ බව ප්‍රකාශ කර තිබුණි.

මෙම පනත සංශෝධන කිරීම නිසා ඇතැම් විට ඔන්ටේරියෝවේ අර්ධකාලීන රැකියාවල නියුක්ත වන්නන්ට බලපෑම් එල්ල විය හැකි බව මේ පිළිබඳ අදහස් දක්වන විශ්ලේෂකයින්ගේ අදහසයි. ලිබරල් රජය ගෙන ආ එම පනත මගින් අර්ධ කාලීන රැකියාවල නියුක්ත වූවන්ට වැටුප් පිළිබඳ සුරක්ෂිතතාවක් ලබා දී තිබූ අතර එහිදී සමාන රැකියාවන් කරන පූර්ණකාලීන සේවකයින්ට හා සමාන වැටුපක් අර්ධ කාලීන රැකියාවල නියුක්ත වන්නන්ටත් ලබාදිය යුතු විය. එසේම සේවකයින් සඳහා හදිසි නිවාඩු 10 ක් අනිවාර්ය කර තිබූ අතර එයින් 2 ක් පඩි සහිත නිවාඩු විය යුතු බවද එම පනතේ සඳහන් විය.

8 වන පිටුව බලන්න


October 22, 2018
Middle of Ballot 9th Name (3rd from Last)
Fresh Perspective
1 of your 3 votes
Advocates the best for the people of Vaughan
Giving back to the community where I raised my family
Over 3 decades of experience in I.T. and Personal Finance.
Everyone in Every ward should VOTE SKANDA
*** A minimum of 10% of pay donated to charities ***
YOUR VOTE HELPS ME SERVE YOU
City of Vaughan
ELECT
Skanda SINGARAJAH
LOCAL & REGIONAL COUNCILLOR



CANADIAN HOME APPRAISALS INC.
CHAI



S.K.Bales CRA ,DAR, MVA Residential,FRI,CRES.
President
Bus: 416-438-2200
Cell: 416-801-3219
Email: skbales@hotmail.com
If you need a accurate and speedy appraisal for Street Capital "A" side or "B" side, Genworth Canada, CMLS Financial, Industrial Alliance, ICICI Bank, IC Savings, Equity Credit Union, Most Private Lenders, Canada Revenue Agency (CRA) and Legal and Listing Purpose you can order via our website WWW.CHAINC.CA or please contact


FLAVO
BRINGING YOUR BRANDS TO LIFE ONLINE
Jason&Clarke
LUXURY REAL ESTATE
DESIGN & PHOTOGRAPHY
MADE BY JOHN SMITH
MY PORTFOLIO
SHABBY CHIC
DISCOVER OUR FURNITURE
MacBook
WEB DESIGN | PHOTOGRAPHY | SOCIAL MEDIA MARKETING | SEO
www.FlavoMedia.com
-35%
MENTION DASATHA WHEN YOU CALL/EMAIL TO GET A 35% DISCOUNT ON YOUR NEXT PURCHASE!
GET IN TOUCH WITH US
For a hassle free quote call: 1 647 - 995 3391
Or Email us at your convenience : info@flavomedia.com

# සරණාගතයන්ගෙන් පිරී ඉතිරී යන හෝටල්

දිනෙන් දින කැනඩාවට පැමිණෙන සරණාගතයින්ගේ සංඛ්‍යාව අධික වීමත් සමග ඔවුන් සඳහා ඇති සරණාගත කඳවුරු පිරී ඉතිරී යන තත්ත්වයකට පත්ව ඇති බව වාර්තා වේ. 2017 වසරේ මුල් භාගයේ සිට මේ දක්වා කැනඩාවට අනවසරයෙන් ඇතුළු වී මේ වන විට ලියාපදිංචි වී ඇති සරණාගතයින් සංඛ්‍යාව 34,000 ඉක්මවා ඇති බව ඒ පිළිබඳ ඇති සංඛ්‍යාලේඛන සඳහන් කරයි.

මේ අතරින් 398 දෙනෙකු පමණක් ඉවත් කර ඇති අතර අනෙකුත් සරණාගතයින් සියල්ලන්ම තම සරණාගත හිමිකම් ලබාගැනීමට බලාපොරොත්තුවෙන් පසු වේ.

සරණාගතයින් පිළිබඳ ගැටලුව දැඩිව දැනෙන පළාත් අතර GTA කලාපය ප්‍රධාන තැනක් ගෙන ඇති අතර මෙම පළාතෙහි හෝටල්, මොටෙල් ඇතුළු බොහෝ නවාතැන්පොළවල් මෙම සරණාගතයින් සඳහා නවාතැන් පහසුකම් සැපයීමට යොදාගෙන ඇත. ෆෙඩරල් රජයේ අනුග්‍රහය සහිතව එම ස්ථානවල මෙම පිරිසට නවාතැන් පහසුකම් ලබා දී ඇති අතර සැප්තැම්බර් 30 වනදා දක්වා මෙම හෝටල් සහ මොටෙල් කාමර සඳහා රජය විසින් ගෙවීම් සිදුකොට ඇත. එහෙත් එම ස්ථානවලින් ඔවුන් ඉවත් කොට පොදු කඳවුරුවලට, නිවෙස්වලට හෝ පහසුකම් ඇති වෙනත් ස්ථාන කරා රැගෙන යෑමට රජය බලාපොරොත්තු වූ කාලයට වඩා දිගු කාලයක් ගතවනු ඇතැයි පැවසේ. මෙම තත්ත්වය තුළ ඔක්තෝබර් මාසය සඳහාද මොවුන් වෙනුවෙන් හෝටල් සහ මොටෙල් බිල්පත් ගෙවීමට රජයට සිදුවෙනු ඇත. මෙසේ හෝටල් වැනි ස්ථානවල මෙම පිරිස් නැවැත්වීම තාවකාලික විසඳුමක් වන අතර අවතැන් වූවන් සඳහා ස්ථිර නවාතැන් සැපයීම වෙනුවෙන් ෆෙඩරල් සහ නාගරික නිලධාරීන් විශාල අරගලයක යෙදී ඇති බවක් දක්නට ලැබේ.

මේ අතර පසුගිය ජූලි මාසයේ සිට සරණාගතයින් නැවත පදිංචි කිරීම සඳහා සහයෝගය ලබාදීම ඔන්ටේරියෝ රජය විසින් ප්‍රතික්ෂේප කොට ඇත. මේ පිළිබඳව අදහස් දක්වන ඔන්ටේරියෝ ප්‍රෙමියර් ඩග් ෆෝඩ් පවසා ඇත්තේ, මෙම ගැටලුව ෆෙඩරල් රජය විසින් නිර්මාණය කරගත්තක් නිසා එය දරා ගැනීමද ඔවුන් විසින්ම කළ යුතු බවයි. ෆෝඩ්ගේ මෙම ප්‍රකාශය ඔන්ටේරියෝ මහජන කටයුතු හා සමාජ සේවා අමාත්‍යාංශයද නිවේදනයක් නිකුත් කරමින් තහවුරු කර ඇති අතර, දේශසීමා කළමනාකරණය, සරණාගතයින් සඳහා රැකවරණ කටයුතු සැපයීම ආදිය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ 'තනි අයිතිය' (sole jurisdiction) ෆෙඩරල් ආණ්ඩුව සතු වූවක් බව එයින් පැවසේ.

දේශසීමා හා අවිධිමත් ස්ථාන හරහා පැමිණෙන පිරිස් ඔන්ටේරියෝව වෙත යොමු කිරීමේදී ඔවුන් වෙනුවෙන් දරන්නට සිදුවන සියලු පිරිවැය සඳහා වන වගකීම ෆෙඩරල් රජය විසින් ගත යුතු බව පසුගිය ජූලි මාසයේදී ඔන්ටේරියෝ පළාත් ආණ්ඩුව විසින් ෆෙඩරල් ආණ්ඩුවට දන්වා තිබුණි. මෙම සරණාගත පිරිස වෙනුවෙන් ඩොලර් මිලියන 200 ක් පමණ වැය වෙතැයි ඇස්තමේන්තුගත කර ඇත. එම මුදල ෆෙඩරල් රජය ගෙවිය යුතු බව ඔන්ටේරියෝ ආණ්ඩුව පවසයි.

එපමණක් නොව එසේ යොමුකරන සරණාගතයින් සඳහා සිදුකරන නඩු විභාග දින 60 ක් වැනි කාලයකදී අසා අවසන් කරන ලෙසද ඔන්ටේරියෝ රජය ෆෙඩරල් රජයට ලිපියක් මගින් දන්වා ඇත. පසුගිය කාලය පුරා දේශසීමාව හරහා මෙරටට පැමිණි ඇති දහස් ගණනක් වූ සරණාගතයින් ප්‍රමාණය නිසා සරණාගත ඉල්ලීම් ඉතාමත් අධික වී ඇති අතර එය සාමාන්‍ය තත්ත්වය මෙන් තුනෙන් දෙකක ප්‍රමාණයක් ඉක්මවා යන තරම් යැයි වාර්තා වේ.

සරණාගතයින් සම්බන්ධයෙන් කැනඩාවට ඇති ගැටලු සහගත තත්ත්වයන් මෙසේ වුවත්, කැනඩා ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ගත් සුවිශේෂී තීරණයක් වන Singh Decision 1985 අනුව කැනේඩියානු භූමියට පය ගසන කිසිදු අයෙකුව ක්‍රමවත් වාචික විභාගයකින් තොරව රටින් පිටමං කිරීම කළ නොහැක්කකි. එය මෙරටට පා තබන සියල්ලන්ම වෙත ඉබේම ලැබෙන හිමිකමකි. එසේ හෙයින් සරණාගතයින් ලෙස මෙරටට පිළිගන්නා තැනැත්තන්ගේ වාචික පරීක්ෂණ අවස්ථාව පැමිණෙන තෙක් ඔවුන්ව රැක බලා ගැනීමේ අයිතිය සහ වගකීම කැනඩා රජය වෙත ඉබේම පැවරී ඇත.

# කැනඩා ඩොලරය ඉහළට

ඇමරිකා මැක්සිකෝ කැනඩා වෙළඳ ගිවිසුම (USMCA) අත්සන් කිරීමත් සමගම ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව කැනේඩියානු ඩොලරයේ අගය ඉහළ ගොස් ඇති බව මහ බැංකු වාර්තා පෙන්වා දේ.

කැනඩාව මෙම ගිවිසුමට එකඟත්වය පළකිරීමට පෙර ඇමරිකාව හා සිදුකරන වෙළඳ ගනුදෙනු සම්බන්ධයෙන් අවිනිශ්චිත තත්ත්වයක් පැවති අතර ගිවිසුමත් සමග එම අවිනිශ්චිතතාව දුරු වීම නිසා වෙළඳපොළ තුළ කැනේඩියානු ඩොලරයට ඉහළ වටිනාකමක් ලැබී ඇති බව ආර්ථික විශ්ලේෂකයෝ පෙන්වා දෙති.

මෙම ගිවිසුම මගින්, ඇමරිකානු ගොවීන්ට කැනඩාව තුළ වැඩි ප්‍රවේශයක් ලබාදීමත් කැනඩා මෝටර් රථවාහන සඳහා ඇමරිකානු වෙළඳපොළ නැවත විවෘත කිරීමත් වැනි විශේෂිත කරුණු රැසක් සිදුවන නිසා ඩොලරයෙහි අගය ඉහළ යෑම එම කරුණු සෘජුව බලපෑම් කොට ඇති බව පෙනෙන්නට ඇත.

මීට මාස 04 කට පෙර USMCA ගිවිසුම පිළිබඳ ඇමරිකා-කැනඩා සාකච්ඡා බිඳ වැටීමත් සමග කැනේඩියානු ඩොලරයේ අගය සැලකිය යුතු ආකාරයෙන් පහළ වැටීමට පටන් ගැනුණි. එහෙත් ගිවිසුමට එකඟ වීමත් සමග එය සියයට 0.7 ක ඉහළ යෑමක් පෙන්නුම් කර ඇත.

නව ගිවිසුමත් සමගම කැනේඩියානු කොටස් වෙළඳපොළද ඉහළ ගොස් ඇති බව වාර්තා පෙන්වා දේ.

# විසඳුමක් නැති TRANS MOUNTAIN PIPELINE

ආරම්භයේ සිට පෞද්ගලික සමාගමක් යටතේ පාලනය වූ Trans Mountain pipeline හි සියලු කටයුතු කැනේඩියානු රජය යටතට ගෙන බාහිර ආයෝජකයින් යොදා ක්‍රියාත්මක කරන බවත් එම නළ මාර්ගය ඩොලර් බිලියන 4.5 කට මිල දී ගැනීමට අදහස් කර ඇති බවත් පසුගිය මැයි මාසයේදී ෆෙඩරල් රජය නිවේදනයක් නිකුත් කරමින් පවසා තිබුණි. ඒ අනුව මෙතෙක් කලක් එම තෙල් නළ පද්ධතියේ නඩත්තු සහ සියලු හිමිකම් පැවති Kinder Morgan, Inc සමාගම අගෝස්තු 31 වෙනි දින නිවේදනයක් නිකුත් කරමින් පවසා තිබුණේ Trans Mountain තෙල් නළ පද්ධතිය පිළිබඳව කැනඩා රජය විසින් ගෙන ආ ගනුදෙනුව තම සමාගම විසින් අනුමත කළ බවයි.

එම සමාගම විසින් නළ පද්ධතිය විකිණීම සඳහා අනුමැතිය දුන් දිනට පෙර දින (අගෝස්තු 30 දා) ෆෙඩරල් අධිකරණය විසින්ද අපූරු තීන්දුවක් දී තිබුණි. ඒ ඩොලර් බිලියන 9.3 ක් ආයෝජනය කරමින් Trans Mountain තෙල් නළ පද්ධතිය පුළුල් කිරීමේ අනුමැතිය සඳහා ජාතික බලශක්ති මණ්ඩලය (National Energy Board) ඉදිරිපත් කළ කරුණු අධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලද තීන්දුවයි. මෙම තෙල් නළ පද්ධතිය නිසා වඩාත් අගතියට පත්වන කැනඩාවේ පළමු පුරවැසි කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස දැනුවත් නොකිරීමත් ව්‍යාපෘතියෙන් පරිසරයට සිදුවන බලපෑමත් තක්සේරු කොට මෙම නළ පද්ධතියේ කටයුතු අත්හිටුවන ලෙස එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කොට තිබුණි.

අධිකරණය මගින් ලබාදුන් එම තීන්දුව සම්බන්ධයෙන් කරුණු දක්වන ෆෙඩරල් රජය පවසන්නේ රජයේ කැබිනට් අනුමැතිය ලැබූ ට්‍රාන්ස් මවුන්ටේන් නළ පද්ධති ව්‍යාපෘතිය ඉරා දැමීමට දුන් අධිකරණ තීන්දුවට එරෙහිව නැවතත් අභියාචනා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු නොවන බවයි.

නමුත් මෙම නළ පද්ධතියේ කටයුතු ඉදිරියට ගෙන යෑම සම්බන්ධයෙන් පළමු ප්‍රජාව හා සාකච්ඡා කිරීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිසුරුවරයකු වන Frank Iacobucci ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කිරීමට තීරණය කොට ඇති බවත් රජය සඳහන් කරයි.

මේ පිළිබඳව අදහස් දැක්වූ ස්වභාවික සම්පත් අමාත්‍ය අමර්ජීට් සෝහි පවසන්නේ, පළමු ප්‍රජාව සමග ඉදිරියේදී සිදුකිරීමට නියමිත සාකච්ඡාවලදී මීට පෙර ආරම්භ කර ඉදිරියට ගෙන යමින් පැවති තුන්වෙනි අදියර මුල සිට නැවතත් ඇරඹීමට සූදානම් නැති බවයි. නමුත් අගෝස්තු මාසයේදී අභියාචනාධිකරණය විසින් ලබාදුන් තීරණයේ පවතින දුර්වලතා විසඳීමට මෙම අවස්ථාව යොදාගන්නා බව ඔහු පවසයි.

# VAPING නිෂ්පාදන තහනම් කරන්න

## සෞඛ්‍ය අංශ ඉල්ලයි

ඊ-සිගරට් ඇතුළු වාෂ්ප ආඝ්‍රාණය කරන නිෂ්පාදන ප්‍රදර්ශනය හා ප්‍රවර්ධනය ඔන්ටේරියෝව තුළ තහනම් කරන ලෙස පිළිකා සංගමය ඇතුළු සෞඛ්‍ය අංශ රජයෙන් ඉල්ලා සිටී. මෙම Vaping භාවිතයට පෙළඹී කෙටි කලකින්ම දුම්වැටිවලට ඇබ්බැහි වීම සිදුවීම නොවැළැක්විය හැක්කක් බව සෞඛ්‍ය නිලධාරීහු පවසති. සිගරට් භාවිතය මගින් අනාගත තරුණ පරපුර විවිධ ස්වශන ආබාධ, පෙනහළු රෝග සහ පිළිකා රෝග ආදියට පහසුවෙන් ගොදුරු විය හැකි බවත් මෙම තත්ත්වය වැළැක්වීම සඳහා රජයේ සහයෝගයද ලැබිය යුතු බවත් සෞඛ්‍ය අංශ පවසති.

ඒ අනුව Vaping නිෂ්පාදන ප්‍රදර්ශනය හා ප්‍රවර්ධනය වැළැක්වීමට ෆෝඩ් රජයේ අවධානය දැඩිව යොමු කළ යුතු බව ඔවුන්ගේ අදහසයි.

මේ පිළිබඳව අදහස් දැක්වූ ඔන්ටේරියෝ සෞඛ්‍ය ඇමතිනි ක්‍රිස්ටියන් එලයිට් පවසන්නේ, ෆෙඩරල් නීතියට අනුකූලව වයස අවුරුදු 19 ට අඩු වූවන්ට දුම්කොළ හා වාෂ්ප ආඝ්‍රාණ නිෂ්පාදන විකිණීම සම්පූර්ණයෙන් තහනම් කර ඇති බවයි. එසේම අලෙවියට තබා ඇති සියලුම දුම්කොළ නිෂ්පාදන ආවරණය කළ ස්ථානවල (වැසිය හැකි අල්මාරි හෝ ලාච්චු ආදියෙහි) තැබිය යුතු බව ඔන්ටේරියෝ නීතිය බවද මේ පිළිබඳව කරුණු දක්වමින් ඇමතිනිය පවසා ඇත.

# ප්‍රසිද්ධ ස්ථානවල මත්පැන් පානයට ඉඩ ?

මත්පැන් සම්බන්ධයෙන් ඔන්ටේරියෝව තුළ මේ වන විට බලපැවැත්වෙන සීමාවන් සංශෝධනය කිරීමට කාලය පැමිණ ඇතැයි ඔන්ටේරියෝ ප්‍රෙමියර් ඩග් ෆෝඩ් පවසයි. ඒ අනුව ඉදිරියේදී එළිමහන් හා ප්‍රසිද්ධ ස්ථානවල මහජනතාවට නිදහසේ බීර, වයින් පානය කිරීමට හැකි ආකාරයට නීති ගෙන ඒමට ෆෝඩ් රජය බලාපොරොත්තු වේ.

මේ මාසයේ සිට මරිජුවානා භාවිතය නීතිගත කිරීමට ෆෙඩරල් රජය කටයුතු සකස් කර ඇති අතර ඔන්ටේරියෝවේ හිටපු ලිබරල් රජය විසින් ඒ පිළිබඳව ගෙන තිබූ ප්‍රතිපත්ති සංශෝධනය කිරීමට ෆෝඩ් රජය පියවර ගෙන ඇත. ඒ අනුව මෝටර් රථ සහ බෝට්ටු ආදියෙහි හැර ඔන්ටේරියෝව තුළ සෙසු සෑම ස්ථානයකම මරිජුවානා පානය සඳහා අවසර ලැබෙනු ඇත.

උද්‍යාන සහ එළිමහන් ස්ථානවල බීර, වයින් ආදිය පානය කිරීමේ අයිතියද ඔන්ටේරියෝනුවන්ට ලබාදෙන බව පසුගියදා ෆෝඩ් ප්‍රකාශ කර තිබුණි.

මෙහිදී තවදුරටත් අදහස් දක්වමින් ෆෝඩ් පවසා ඇත්තේ මහජනතාව ප්‍රසිද්ධ ස්ථානවල මත්පැන්, මරිජුවානා ආදිය භාවිත කිරීම පෞද්ගලිකව තමා අනුමත නොකළත් රජයක් වශයෙන් කටයුතු කිරීමේදී මෙවැනි තීරණ ගැනීමට සිදුවන බවයි. ඒ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා හා ඇටෝර්නි ජනරාල්වයා සමග කතාබස් කොට ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමට ෆෝඩ් අදහස් කරයි.

මරිජුවානා නීතිගත කිරීමත් සමග ප්‍රසිද්ධ ස්ථානවල ඒවා භාවිත කිරීමට අවසර ලබා දුන්නත් කුඩා දරුවන් ගැවසෙන ක්‍රීඩාංගන හා උද්‍යාන තුළ මරිජුවානා ගැනීමට අවසර නොදෙන බව ෆෝඩ් රජයේ බලධාරීහු පවසති. ඒ අනුව එම ස්ථානවල සිට මීටර් 20 ක දුරකට මෙම නීතිය බල පැවැත්වෙනු ඇත.

# වස් විසීමේ ඉතිහාසය



■ නාලන්දේ විමලවංශ නාහිමි

හේමන්ත, ගිම්හාන, වස්සාන යනුවෙන් සෘතු තුනක් ඇත. නොවැම්බර් මුල මාස හතර හේමන්ත සෘතුව වශයෙන්ද අවසාන දක්වා මාස හතර ගිම්හාන සෘතුව වශයෙන්ද ජූලි මාසයේ සිට ඔක්තෝම්බර් මාසයේ අග දක්වා දක්වා මාස හතර වස්සාන සෘතුව වශයෙන්ද සැලකේ. වස්සාන සෘතුව පුරාම වර්ෂාව හට ගනියි. මෙයින් පීඩාවට පත්වන සිව්පා සතුන් මෙන්ම වෙනත් පක්ෂීන්ද එක් තැනක විසීමට උත්සාහ ගත්හ. බුද්ධ කාලයෙහි වෙනත් ආගමිකයන්ද වැසි කාලය එකම ස්ථානයක වාසය කළහ. එහෙත් බුද්ධ ශ්‍රාවකයන් පමණක් 'චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය' යන බුද්ධ වචනය අකුරටම පිළිපදිමින්, අව්ව වැස්ස, සුළඟ, ගංවතුර වැනි කාලගුණය නොතකා දිවා රාත්‍රි ගම් දනව් සැරිසැරූහ. හුදෙක් ජනතාවගේ සත්‍යය අවබෝධය උදෙසා එසේ චාරිකාවන්හි නියැලුනත් එදා භාරතීය සමාජයේ සිරිත් විරිත් හා පිළිගැනීම් අනුව එය නොගැළපෙන්නක් විය. ඒ නිසා බුදු සව්වන් වැඩෙන පැළෑටි දෙපයින් පාගමින් පොඩි කරති. කෘමි සතුන් පාගති. තෙමි තෙමී පාගමනින් චාරිකාවෙහි යෙදෙති. මඩ තවරා ගනිති.

'සාපිපාසාවෙන් පෙළෙන ප්‍රේතයන් මෙන් බුදු සව්වෝ පිණ්ඩපාතයෙහි හැසිරෙති.' යනුවෙන් ජනතාව උද්ඝෝෂණය කරන්නට විය.

මහජන මතයට නිරන්තරයෙන් ගරු කළ ශාස්තෘවරයකු වශයෙන් බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට ඇතිවන ලෝක අපවාදයන්ගෙන් නිදහස් කර ගැනීම සඳහාත් සැදැහැවත් දායක දායිකාවන්ට වැඩිමනත් පිං රැස් කර ගැනීම උදෙසාත්, 'අනුජානාමි භික්ඛවේ වස්සානේ වස්සං උපගන්තං' යනුවෙන් 'මහණෙනි, වස්සාන සෘතුවෙහි වස් වැසීම අනුදනිමි' යනුවෙන් ශික්ෂා පදයක් පැනවූහ. ඒ අනුව උපසම්පාදා භික්ෂුවක් වස්සානයේ වස් වැසිය යුතුය. එසේ නොවූ විට 'න භික්ඛවේ වස්සානං න උපගන්තබ්බං යේන උපගච්ඡෙය්‍ය, ආපත්ති දුක්ඛටස්' යන ආකාරයට 'දුකුලා' ඇවැත් සිදු වන බවද වදාරා ඇත.

මෙම විනය නීතියට අනුව දායකයන් ඇරයුම් කළත්, නොකළත් භික්ෂූන් වස් වැසිය යුතුය. එහෙත් ආරාධනා කිරීම තුළින් ගිහි පැවිදි දෙපිරිසම අතර සුහදතාවය දියුණුවන බැවින් බුද්ධ කාලයේ සිටම වස් ආරාධනා කිරීම චාරිත්‍රයක් වශයෙන් පවතින බව පෙනෙයි. ඒ අනුව දායකයන් විසින් දැහැත් වට්ටියක් පිළිගන්වා 'ස්වාමීනී මේ වස් තුන් මාසය තුළ මෙම ස්ථානයෙහි වස් වසනු මැනවි. අප විසින් සිව්පසයෙන් උපස්ථාන කරන්නෙමු.' යනුවෙන් වස් ආරාධනාව සිදු කරති. පෙරවස් සමාදන් වන භික්ෂූන් වහන්සේලා ඇසළ පොහොය දිනට පසු දිනද යම් හෙයකින් එදිනට අපහසු වුවහොත් නිකිණි පුර පසළොස්වක දිනයට පසු දින පසු වස් සමාදන් විය හැකිය.

වස් සමාදන්ව වාසය කිරීමට හැම ස්ථානයකම නොහැකිය. ඒ සඳහා සුදුසු ස්ථානයක් තිබිය යුතුය.



බුදු රජාණන් වහන්සේ වස් වැසීමට සුදුසු ස්ථාන ගැන දේශනා කර ඇත. ඒවා නම්, ආවරණ සහිත විහාරස්ථානවල, හොඳින් ආවරණය වූ නිවාස, දික් අතට සාදා ඇති ප්‍රාසාද, සඳලුතල සහිත නිවාස, ගල් ගුහා යන මෙම ස්ථාන සුදුසු බවට අනු දැන වදාළහ. තවදුරටත් මේ පිළිබඳ පැහැදිළි කරන්නේ නම්, පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

නියමිත පරිදි විනය කර්ම කර වස් වසන ස්ථානයට පැමිණි භික්ෂූන් වහන්සේ 'ඉමස්මිං විහාරේ ඉමං තේමාසං වස්සං උපේමි' යනුවෙන් දීර්ඝව හෝ 'ඉධ වස්සං උපේමි' යනුවෙන් කෙටියෙන් හෝ තුන් වාරයක් කියා වස් සමාදන් විය යුතුය. බුද්ධ කාලයෙහි භික්ෂූන් වහන්සේලාට වස් විසීමට ස්ථිර ස්ථාන නොතිබුණ බැවින් විශාල ගස් බෙනවලත්, ගස් දෙබල්වලත්, ගස් යටත් වස් සමාදන්ව විසූහ. එවන් අවස්ථාවල විහාර ආරාම ගුහා කුටි ආදි සුදුසු ස්ථානවල පමණක් වස් වසන මෙන් අනුදැන වදාළහ. මෙම කුමන ස්ථායක වස් විසූවද යම් හෙයකින් සිව්පා සතුන්ගෙන්, විෂකුරු සර්පයන්ගෙන්, සොර සතුරන්ගෙන්, ගින්නෙන්, ජලයෙන් උවදුරු ඇතිවේ නම් එබඳු ස්ථාන අත හැර ගියද ඇවැත් සිදු නොවන බවද වදාළහ. වස් විසූ භික්ෂුව හොඳින් වස් ආරක්ෂා කරගැනීමට අපොහොසත් වුව හොත් වස් ඡේදනය වීමෙන් කඨිනයක් ලැබීමට නුසුදුස්සකු බවට පත් වෙයි. එබැවින් වස් හොඳින් ආරක්ෂා කර ගත යුතුය. වස් විසූ ස්ථානයෙන් ඉවතට යාම අවශ්‍යය වුවහොත් සතිකරණ නම් විනය කර්මය අනුව පිටව ගොස් සත් දිනකින් වුවද ආපසු පැමිණිය හැකි වෙයි. එසේ සතිකරණයෙන් ඉවත යන භික්ෂුව 'සෙච්මේ අන්තරායෝ න භවිස්සති සත්තාහබ්බන්තරේ පටි නිවස්සාමි' යන වාක්‍යය කීමෙන් හෝ සිතීමෙන් පිටත යාහැකිය. 'මහාවග්ග පාලියෙ' වස්සුප්පනායික්ඛන්ධකයේ එන පරිදි හිතුමතේ හැම කරුණකදීම වස්පලෙන් බැහැර යාමට නොහැක.

1. භික්ෂු නමකගේ 2. භික්ෂුණියකගේ 3. ශික්ෂ මානවකයකුගේ 4. සාමණේරයකුගේ 5. සාමණේරියකගේ 6. උපාසකයකුගේ 7. උපාසිකාවකගේ යන හත් දෙනාගේ සමගි සන්ධානයක් උදෙසා හෝ ඔවුන්ගේ අසනීපයකදී සත්හාකරණයෙන් බැහැර යාමට හැකිය. එසේම ඉහත සඳහන් අයගේ මවගේ, පියාගේ, සහෝදරයාගේ, සහෝදරියගේ, නෑදෑයාගේ කිසියම් අවශ්‍යතාවක් සඳහා සතිකරණයෙන් පිටව යාමට හැකියාව ඇත.

වස් තුන් මාසය ඇතුළත භික්ෂූන් වහන්සේලා එම විහාරස්ථානවල වැඩ සිටිමින් බණ භාවනාවේ යෙදෙති. ශාස්ත්‍රීය කටයුතුවල නියැලෙති. දායක දායිකාවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරති. නොයෙක් පිංකම්, පෙරහැර, බෝධි පූජා, සිල් වැඩ සටහන්, භාවනා වැඩසටහන් සංවිධාන කරති. දායක දායිකාවෝ වෙනත් කාලවලට වඩා භික්ෂුන් වහන්සේලාගේ අවශ්‍යතා සොයා බලති. සිව්පසයෙන් උපස්ථාන කරති. ශාසනික කටයුතුවලට උනන්දු වෙති. මේ නිසා පැවිදි ගිහි පිරිසට වැඩි වැඩියෙන් කුසල් රැස් කර ගැනීමට වස් කාලයෙහි හැකි වෙයි. වස්ඡේදනය නොවූ භික්ෂූන් තුන් මසකට පසුව වප් පුර පසළොස්වක දින වස් පවාරණය කරති. පසු වස් එළඹි භික්ෂූන් වහන්සේලා පවාරණය කළ යුත්තේ ඉල් පුර පසළොස්වක දිනයේය. පවාරණයේදී අනුගමනය කළ යුතු විනය කර්මයන් ඇත.

සීමා මාලකයකට රැස්වී ආපත්ති දේශනාවෙන් පිරිසිදු වී වැඩිමහලු පිළිවෙලින් හිඳ 'සංඝං භන්තේ පවාරේමි දිට්ඨෙනවා, සුතේනවා, පරිසංකායවා වදතුමං භන්තේ සංඝෝ අනුකම්පං උපාදාය පස්සන්තෝ පටිකරිස්සාමි' යන වාක්‍යය ප්‍රකාශ කළ යුතුය. වස් කාලය තුළ තමන්ගෙන් සිදුවූ වරදක් දැකීමෙන්, ඇසීමෙන්, සැකයෙන් හෝ දැන ගන්නට ඇත්නම් ප්‍රකාශ කරන ලෙස සංඝයාට දැනුම් දීම මෙහි සාමාන්‍ය අර්ථය වෙයි. එවන් වරදක් නොමැති නම් සංඝයා තුෂ්ණිම්භූත වෙති. මෙසේ පවාරණය කළ භික්ෂුවකට කඨින චීවරයක්ලැබීමට බලය ඇත.

වස් විසීම වනාහී පැවිදි උතුමන්ට මෙන්ම, ගිහි පිංවතුනටද ඉතා වැදගත් චාරිත්‍ර ධර්මයක් වශයෙන්ද සැලකිය හැකිය. එසේ වැදගත් වන්නේ මෙම දෙපිරිසටම වස් කාලය කායික, මානසික සංවර්ධනයක් ඇති කර ගැනීමට උපයෝගි කර ගත හැකි නිසාය. වස් කාලය තුළ සැදැහැවත් ගිහි පිංවතුන් විසින් එම භික්ෂූන් වහන්සේලාට සිව්පසය පූජා කරති. දායක දායිකාවන් නිතර විහාරස්ථානවලට පැමිණෙති. එසේ පැමිණෙන්නේ තම ආරාධනයෙන් වස් විසූ භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතාවන් ගැන සොයා බැලීමටය. එසේ පැමිණෙන විට නිකම්ම එන්නේද නැත. මල්, පහන්, දැහැත්, ගිලන්පස වැනි පූජාවන් කිරීමට සූදානම්ව පැමිණෙති. එසේ පැමිණ මළු පෙත්මං අමදිති. විහාරස්ථානය සහ අවට පරිසරය සුද්ධ පවිත්‍ර කරති. මල් පහන් ගිලන්පස බුද්ධ පූජාවන් පවත්වා, අනතුරුව භික්ෂූන් වහන්සේලා සමග පිළිසඳර කථා කරති. භික්ෂූන් වහන්සේලාද ධර්ම දේශනා, අනුශාසනා පවත්වමින් තව තවත් දායක දායිකාවන්ගේ ශ්‍රද්ධා භක්තිය වැඩි වන ආකාරයට කටයුතු කරති. ඒ අනුව වස් කාලය තුළ වෙනත් කාලවලට වඩා ගිහි පැවිදි සම්බන්ධතාවයන් වැඩිදියුණු බවට පත් වෙයි.

භික්ෂූන් වහන්සේලා දායක දායිකාවන් කෙරෙහි මහත් කරුණා මෛත්‍රියෙන් කටයුතු කරති. ඔවුනට හැකි පරිදි දිනපතා හෝ සති පතා ධර්ම දේශනා, බෝධි පූජා ආදිය පවත්වති. ආගමික අංශයෙන් කළ යුතු සියලු කටයුතු ඉතා හොඳින් කර දෙමින් කායික මානසික සැනසිල්ල ලබා දීමට උත්සුක වෙති. ආගමික කටයුතුවලට යොමු වන පිංවතුන්ට ආධ්‍යාත්මික වශයෙන් සැනසිල්ලක් ලබා ගත හැකි බව අමුතුවෙන් සඳහන් කළ යුතු නොවේ. වස් කාලය තුළ විහාරස්ථානවල ඉදි කිරීම් කටයුතු, නව කම් ආදියද කරති. මෙවැනි කරුණු නිසා වස්සාන සමයෙහි විහාරස්ථානවල නව ආලෝකයක් උදා වන බව පැවසිය හැක.

වස් අවසානයෙහි පවාරණ කටයුතු සිදු වෙයි. එය දීර්ඝව විස්තර කළ යුතු, වැදගත් විනය කර්මයකි. වස්සච්ඡේදනය නොවූ, මහා පවාරණයෙන් පවාරණය කළ භික්ෂූන් වහන්සේ නමක් කඨින චීවරයක් ලැබීමට සුදුස්සකු බවට පත් වෙයි. කඨින පිංකමක් යනු වසරකට එක් තැනක, එක් වරක් පමණක් සිදු කළ හැකි මහත් ආනිසංස ලැබෙන පිංකමක් බව සඳහන් කළ හැකිය. ඒ නිසාම සැදැහැවත් බොදු ජනතාව කඨින පිංකමක දායකත්වය ලැබීමට මහත් උනන්දුවක් දක්වති.

මහින්දාගමනයත් සමග ලංකාවේ භික්ෂූන් වස් විසීම ආරම්භ වූ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි. මෙම වැදගත් සම්ප්‍රදාය හේතු කොට එදා මෙදාතුර බුදු දහම පැවතීමටත්, සාරධර්ම අනුගමනය කරන බෞද්ධ සමාජයක් බිහි වීමටත්, සිරිලක ධර්ම දීපයක් බවට පත් වීමටත් හේතු වූ බව පැහැදිළිය.

## ආනයන සඳහා සීමා පනවයි

ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල තවදුරටත් අවප්‍රමාණය වෙමින් පවතින නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකය විශාල පීඩනයකට ලක්ව ඇති බව නොරහසකි. මෙම තත්ත්වය පාලනය කරගැනීම සඳහා සැප්තැම්බර් 29 වෙනි දා මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි ආනයන සම්බන්ධයෙන් සීමා පැනවීමටත් තවත් ක්‍රියා මාර්ග කිහිපයක් ගැනීමටත් ලංකාවේ රජය තීරණය කොට ඇත.

ඒ සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද නිවේදනයක මෙසේ සඳහන් විය.

■ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තීරු බදු රහිත වාහන බලපත් නිකුත් කිරීම වසරක කාලයක් සඳහා අත්හිටවනු ලැබේ.

■ රජයේ අමාත්‍යවරුන්ට, දෙපාර්තමේන්තුවලට, සංස්ථාපිත මණ්ඩලවලට මෙන්ම රාජ්‍ය ව්‍යවසායක වෙනුවෙන් වාහන ආනයනය කිරීම නැවත දන්වන තුරු අත්හිටවනු ලැබේ.

■ සහනදායී පදනමක් මත වාහන ආනයනය කිරීමට රාජ්‍ය සේවයකයන් සඳහා නිකුත් කරන ලද බලපත් මාස 6 ක කාලයක් සඳහා අත්හිටවනු ලැබේ. මෙම කාලය තුළදී සහනදායී පදනම මත නිකුත් කරන බලපත් වෙනුවෙන් ණයවර ලිපි විවෘත කරනු නොලැබේ.

■ දෙමුහුන් (හයිබ්‍රිඩ්) වාහන සඳහා වාහනයේ වටිනාකම අනුව ණය අනුපාතය 70:30 සිට 50:50 දක්වා සංශෝධනය කෙරේ.

■ බස්රථ, ලොරි සහ ගිලන් රථ හැර වෙනත් වාහන වෙනුවෙන් ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේදී 200% ක මුල්‍ය සීමාවක් පනවා තිබේ.

■ ශීතකරණ, වායු සමීකරණ, රූපවාහිනී යන්ත්‍ර, සුවඳවිලවුන්, ජංගම සහ ස්ථාවර දුරකතන, රෙදි සෝදන යන්ත්‍ර, පාවහන් සහ වාහන ටයර් ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමේදී 100% ක මුල්‍ය සීමාවක් පනවා තිබේ.

මෙම නියමයන් 29 වැනිදා සිට ක්‍රියාත්මක වන නමුත් විනිමය අනුපාත සම්බන්ධයෙන් රජය දැඩි විමසිල්ලෙන් සිටින අතරම ඉතා ඉක්මනින් අවශ්‍ය පියවර ගනු ලබනු ඇත.

## බෙලිහුල්ඔය සිට ලෝකාන්තයට කේබල් කාර් !

සමනලවැව ජලාශය ආසන්නයේ බෙලිහුල්ඔය සිට ලෝකාන්තය තෙක් කේබල් කාර් ව්‍යාපෘතියක් ඇරඹීමේ සූදානමක් පවතින බව සඳහන් වේ. මෙම සේවාව ඩුබායි රජයේ ආධාර යටතේ නුදුරේදීම ක්‍රියාත්මක කෙරෙන බව සබරගමු ආණ්ඩුකාරවරිය ප්‍රකාශ කර ඇත.

ඇය මේ බව ප්‍රකාශ කර ඇත්තේ සබරගමුවේ උසම ගම්මානය වූ නැග්රුක් ගම්මානයට පැමිණි අවස්ථාවකදීය. නැග්රුක් ගම්මානය හරහා ලෝකාන්තයට පිවිසිය හැකි මාර්ගයක් ඇතත් එය අතිදුෂ්කර වූවකි. මෙහිදී අදහස් දක්වා ඇති ආණ්ඩුකාරවරිය පවසා ඇත්තේ, දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගෙන ඇති බෙලිහුල්ඔය ප්‍රදේශයේ සිට ලෝකාන්තයට යා හැකි මගක් ඇති බවත් මෙම දුෂ්කර මාර්ගය භාවිතය අපහසු නිසා බෙලිහුල්ඔය සිට ලෝකාන්තය දක්වා කේබල් කාර් සේවයක් ආරම්භ කිරීමට සබරගමුව පළාත් සභාව ඩුබායි රාජ්‍ය සමග සාකච්ඡා කර තිබෙන බවත්ය.

එමගින් මෙම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය විශාල වශයෙන් දියුණු කළ හැකි බව ඇය පෙන්වා දේ. මේ සඳහා සබරගමුව විශ්වවිද්‍යාලයේ විද්වතුන්ගේද ආශිර්වාදය ලැබෙන බව ඇය වැඩිදුරටත් පවසා ඇත. මෙම වැඩපිළිවෙළට සමගාමීව සමනල වැවේ සංචාරක බෝට්ටු සේවයක්ද ඇරඹීමටත් අදහස් කර ඇත.

## අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් සංවර්ධන කෙරේ

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ගුවන් ගමන් සේවා ක්‍රමවත් කිරීම සඳහා අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් 6 ක් වඩාත් ඵලදායී ලෙස යොදාගැනීමට කළ හැකි ක්‍රම උපායන සැලසුම් සම්බන්ධයෙන් පසුගියදා සාකච්ඡාවක් සිදුකොට ඇත. ඒ අනුව රත්මලාන, මඩකලපුව, පලාලි, සීගිරිය, කොග්ගල හා දිගන යන අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් සංවර්ධනය කිරීම පිළිබඳව රජයේ අවධානය යොමු වී ඇත.

එහිදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් භුක්ති විඳින රත්මලාන ගුවන් තොටුපොළ භූමියේ අක්කර 25 ක පමණ භූමි භාගය නැවතත් ලබාගෙන එහි සිවිල් ගුවන් යානා මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම මේ වන විට ආරම්භ කොට ඇත.

ප්‍රාදේශීය ගුවන් තොටුපොළ සංවර්ධන වැඩපිළිවෙළ යටතේ සංචාරකයින් විශාල ප්‍රමාණයක් පැමිණෙන සීගිරිය ගුවන් තොටුපොළෙහි ධාවන පථය පිළිසකර කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතු බවත් කොග්ගල ගුවන් තොටුපොළේ ධාවන පථයද අලුත්වැඩියා කළ යුතු බවත් ඉහත සාකච්ඡාවේදී සඳහන් වී ඇත.

පසුගිය රජය කාලයේදී ඉදිකිරීම් ආරම්භ කොට දැනට අතරමග නවතා දමා ඇති දිගන ගුවන් තොටුපොළ පිළිබඳව පූර්ණ සකයතා අධ්‍යයනයක් සිදු කොට වාර්තාවක් සකස් කරන ලෙසත් දැනටම මිලියන 197 ක් වියදම් කොට ඇති එම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යා හැකිද යන්න සොයා බැලීමට කටයුතු කරන ලෙසත් මෙහිදී යෝජනා විය.

ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණීම ඉහළ යාමත් සමග අභ්‍යන්තර ගුවන් සේවා කටයුතු පුළුල් කිරීමේ අවශ්‍යතාව පවතින බවත් ඒ සඳහා ගුවන් තොටුපොළවල් දියුණු කිරීමේ කටයුතු මේ වසර තුළ ආරම්භ කළ යුතු බවත් ගුවන් සේවා අධිකාරියේ සහ ගුවන් තොටුපොළ සමාගමේ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇතැයිද වාර්තා වේ.

## රටින් පිටවීම තහනම් වූ ලාංකිකයින්

ශ්‍රී ලාංකිකයින් 62,338 දෙනෙකුට ශ්‍රී ලංකාවෙන් පිටවීම තහනම් කර ඇතැයි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු පවසා සිටියි.

දහස් ගණනක් වූ මේ අය අතර ආරක්ෂක අංශවල පහළ මට්ටමේ සිට ඉහළ මට්ටම දක්වා වූ විවිධ නිලයන්ට අයත් 30,000 ක පමණ පිරිසක් සිටින බව සඳහන් වේ. හමුදා අංශවලට අයත් පිරිසට අමතරව දේශපාලනඥයන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, දෙමළ ඩයස්පෝරාවට හිතවත් පිරිස්, ආගමික අන්තවාදීන් ඇතුළු නොයෙකුත් අපරාධවලට සම්බන්ධ වූවන් සිටී. ශ්‍රී ලංකාවේ අධිකරණ සහ හමුදා අධිකරණ මගින් ලබා දී ඇති නියෝග මත මෙම පිරිස මේ ආකාරයට අසාදු ලේඛනගත කර ඇත.

මොවුන් රටින් පිටවීම වැළැක්වීම සඳහා රජයේ බුද්ධි අංශ කණ්ඩායම්, ගුවන් තොටුපොළ සිවිල් ගුවන් සේවා බලධාරීන්, ආගමන විගමන නිලධාරීන් ඒකාබද්ධව මෙහෙයුම් ක්‍රියාත්මක කරනු ලබයි. එම නිලධාරී කණ්ඩායම්වල ප්‍රයෝජනය සඳහා නවීන උපකරණ ලබා දී ඇති අතර මෙම පිරිස් සම්බන්ධයෙන් ඔවුන් සීරුවෙන් තබා ඇති බව පැවසේ.

ඒ අනුව ගුවන් ගමන්වල යෙදෙන සියලු මගීන් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලෙස අදාළ අංශ වෙත උපදෙස් දී ඇති බවද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ආරංචි මාර්ග සඳහන් කර සිටී.

## කජු සැපයුම කජු සංස්ථාවට

ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ගමන් ගත් ශ්‍රී ලංකා ජනාධිපතිවරයාට සැපයූ කජු පැකට්ටුවක් ආහාරයට ගැනීමෙන් පසු එම කජු 'මිනිසෙකුට තියා බල්ලෙකුටවත්' ආහාරයට ගත නොහැකි බව ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කර තිබුණි.

ජනාධිපතිවරයා විසින් කරන ලද එම ප්‍රකාශයත් සමඟ එතෙක් කජු ලබාගත් සැපයුම්කරුවන් වෙනස් කොට ශ්‍රී ලංකන් ගුවන් සේවයට අවශ්‍ය කජු ශ්‍රී ලංකා කජු සංස්ථාවෙන් මිල දී ගැනීමට එම සමාගම තීරණයක් ගෙන ඇත.

2016 වසර දක්වා ශ්‍රී ලංකන් ගුවන් සේවයට කජු සපයා ඇත්තේ කජු සංස්ථාව වුවත් පසුව එහි මිල ගණන් වැඩි බව පවසමින් ඩුබායි හි සැපයුම්කරුවකුගෙන් කජු මිල දී ගෙන ඇත. ලොව සෙසු රටවල කජු හා සැසඳීමේදී ශ්‍රී ලංකාවේ කජු ප්‍රණීත රසයකින් යුක්ත බව කවුරුත් දන්නා කරුණකි. එනිසාම ලංකාවේ ප්‍රධාන තරු හෝටල් සහ රාජ්‍ය ආයතන රැසක් කජු සංස්ථාවේ කජු මිල දී ගැනීම සිදුකරති. ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ව්‍යාපාරික පන්තියේ ගමන් ගන්නා මගීන් සඳහා පමණක් මෙම කජු පැකට් ලබාදෙනු ලැබේ.

මේ අතර ජනාධිපති විසින් සිදුකරන ලද මෙම කජු කතාව ලොව පුරා මාධ්‍ය මගින් ප්‍රචාරය වීමත් සමග ගුවන් සමාගමේ කීර්ති නාමයට යම් පළුද්දක් සිදු වූ බව බොහෝ දෙනෙකුගේ අදහසයි.

## ශ්‍රී ලංකාවේ දුප්පතුන් නෑ !

ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල ආදායම ඩොලර් 13,000 ක් බවත් එය කලාපයේ ඉහළම අගය බවත් මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක ප්‍රකාශ කර සිටී.

එහිදී අදහස් දැක්වූ ඇමතිවරයා පවසා ඇත්තේ, 'සමහරුන් හිතාගෙන ඉන්නෙ මේ රට ගමක්. අඩු ආදායම්ලාභීන් වෙසෙන දුප්පත් රටක් ලෙසයි. ඒත් මේ රටේ යථාර්ථය දිහා බැලුවහම මේ රට එවැනි රටක් නෙමෙයි කියා හැමෝටම පේනවා. මේ රටේ අද ඒකපුද්ගල ආදායම පිළිබඳව තිබෙන වැදගත්ම නව මිනුම් දණ්ඩ අනුව ලංකාවේ ඒකපුද්ගල ආදායම ඩොලර් 13,000 ක් වෙනවා. මෙය විශාල අගයක්. එය මේ කලාපයේ විශාලම අගය වනවා වගේම එය මිල දී ගැනීමේ හැකියාව පැත්තෙන් ලෝකයේ දියුණු රටක් යැයි හිතෙන තරම් විශාල අගයක් වනවා. ඒ නිසා මේ රට පැරණි දුප්පත් රට නෙමෙයි. මේ රටේ දුප්පත් යැයි කියන්න පුළුවන් අන්ත දුප්පත් පිරිස සියයට 6 කටත් වඩා අඩුයි. ඒ නිසා මේ රටේ විරැකියාව අද අනෙක් පැත්ත වන උගතුන් අතර පමණයි විරැකියාව තිබෙන්නේ. අද විරැකියාව සියයට 4 දක්වා අඩු වෙලා තිබෙනවා. අපේ ආර්ථික දිශානතිය දෙස බලන විට එය විශාල ජයග්‍රහනයක්.

නාගරික සංවර්ධන අධිකාරියේ 40 වන සංවත්සරය නිමිත්තෙන් සෙත්සිරිපාය පරිපාලන සංකීර්ණයේ සංවිධානය කර තිබූ උත්සවයකට සහභාගී වෙමින් ඇමතිවරයා මේ අදහස් පළ කොට තිබුණි.

ඇමතිවරයා එසේ ප්‍රකාශ කොට තිබුණද, ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල ආදායම ඩොලර් 4065 ක් බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2017 වසරේදී නිකුත් කරන ලද වාර්තාවක සඳහන් වේ. මෙය 2016 වසරේදී ඩොලර් 3857 ක් ලෙස දැක්වේ.

තවද 2018 මාර්තු මාසයේ පළවූ පුවතක සඳහන් වූයේ, විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මහජන කළමනාකරණ වාර්තාවට අනුව 2016 වසර අවසානයේදී ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ණය ප්‍රමාණය රුපියල් 417,913 ක් ලෙස සඳහන්ව ඇති බවයි. මෙය 2015 දී රුපියල් 371,462 ක් ලෙසද 2005 වසරේදී රුපියල් 108,908 ක් ලෙසද සඳහන් වී ඇත.

## අඹ වගා සංවර්ධන කලාපය

ශ්‍රී ලංකාවේ පළමු වරට අඹ වගා සංවර්ධන කලාපයක් ආරම්භ කිරීමට කටයුතු කර ඇත. දඹුල්ල වෑවල හුබස්ගමුව ප්‍රදේශයේ අක්කර 200 ක වපසරියක මෙම අඹ වගා සංවර්ධන කලාපය ආරම්භ කර ඇති අතර එහි මේ වන විට අඹ පැළ 15,000 ක් රෝපණය කර ඇත.

අඹ වගාව ව්‍යාප්ත කිරීම මගින් අඹ අපනයනය ඉහළ නැංවීම ඉලක්ක කොට මෙම ව්‍යාපෘතිය අරඹා ඇති අතර එය කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නංවයි.

ගොවීන් 100 දෙනෙකුට මින් ප්‍රතිලාභ හිමි වන අතර අඹ වගාවට අවශ්‍ය උපාංග සහ පුහුණුව එහිදී ඔවුන්ට ලබාදෙනු ඇත.

මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර යාපනයේ ස්ථාපිත කිරීමට නියමිතව ඇත.

Dasatha
2018 ඔක්තෝබර් OCTOBER 2018

Published by Dasatha Publications
Publisher - Gamini Abeysinghe
Consultant Editor - Sirisena Vithanage
Editor in Chief - Chamari Abeysinghe
Graphic Design & Layout - Sampath Ranaweera
Creative graphics - Jagath Hewapanna
Web Master - Dhanushka Bandara

114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the financial support of the Government of Canada.
«Nous reconnaissons l'appui financier du gouvernement du Canada'
www.canada.ca

# ගෝලීය ආර්ථිකය හමුවේ පීඩා විඳින ශ්‍රී ලාංකේය ජනතාව

වර්තමාන ලෝකයේ 'ආර්ථිකය' යනු අරුම පුදුම හැසුරුමක් සහිත විෂයයකි. අතීතයේ සිට කිසිදු හැල හොල්මනකින් තොරව එදිනෙදා මිනිසුන්ගේ ජීවන කටයුතු සරලව සිදුකරමින් ඉදිරියට ගිය ආර්ථිකය කිසිවකුගේ කතාබහට ලක් වූ විෂයයක් නොවීය. එහෙත් 1776 දී ඇඩම් ස්මිත් විසින් 'ජාතීන්ගේ ධනය' (The Wealth of Nations) නම් කෘතිය එළි දැක්වීමත් සමග එය නව මගකට පිවිසියේය. එතැන් සිට ජෝන් මොනාඩ් කේන් ආදි ආර්ථික විද්‍යාඥයන්ගේ ආර්ථිකය විෂයයෙහි වූ නව සොයා ගැනීම් හා පෙන්වා දීම් හේතුවෙන් එය දිනෙන් දින සංකීර්ණ විෂයයක් බවට පත් වූයේය. 1867 දී කාල් මාක්ස්ගේ ප්‍රාග්ධනය ( Das Kapital) කෘතිය බිහි වීමත් සමග එය එතෙක් ආ මගින් ඈත්ව නොසිතූ විරූ නව අරුතින් බර විෂයයක් බවට පත් විය. ලෝකයේ ධනවාදී සහ සමාජවාදී යනුවෙන් පැහැදිලි ආර්ථික භේදයක් සහිත ආර්ථිකයක් බිහි වූයේ එතැන් සිටය. 1776 සිට 1867 දක්වා වූ ශත වර්ෂය තුළ සිදු වූ ආර්ථිකයේ මේ සියලු ප්‍රවණතාවන්ට හේතු වූයේ එතෙක් පැවති රජවරුන්ගේ වැඩවසම් කෲර පාලනයෙන් ආර්ථිකය මුදාගෙන නව දේශපාලන විපර්යාසයකට ලෝකය භාජන වීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

'ආර්ථිකය' යන්නේ වඩාත්ම වැදගත් කම මතුවන්නේ කොතැනදීද? යන ප්‍රශ්නය මෙහිදී මතු වේ. එයට දිය හැකි කෙටිම පිළිතුර නම් 'මිනිස් ජීවිතයේ මුල්ම ප්‍රාණ වායුවේ පටන් අවසන් ප්‍රාණ වායුව තෙක් නිරන්තරව රේඛාවක් මෙන් බැඳී පවත්නා ජීවන අවශ්‍යතාවන් සපුරා ගැනීමේ අවස්ථාවේදීය' යන්නයි. එවිට එය මිනිසකුගේ ජීවන කාලය පුරාවටම ඔහු හා එක්ව ගමන් ගන්නක් වෙයි. මිනිසකුට එය මග හැර පැවතීමට නොහැකි වූවක් වෙයි.

ආර්ථිකයේ අතීතය පිළිබඳවත් මිනිසා සහ එහි බැඳීම පිළිබඳවත් මේ පැහැදිලි අවබෝධය මත සිට දැන් අපි වර්තමාන තුන්වන ලෝකය (වඩාත් නම්බුකාර වචනයෙන් කියන්නේ නම් සංවර්ධනය වෙමින් පවතින ලෝකය) දෙසට හැරෙමු. මේ රටවල් සියල්ලකම පාහේ වර්තමානයේ පැන නැග ඇති තත්ත්වය නම් අනවබෝධයෙන් කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස තුන්වෙනි තත්ත්වයෙන් නැතහොත් සංවර්ධනය වෙමින් පවතින තත්ත්වයෙන් මිදී දෙවන ලෝක තත්ත්වයට හෝ ළං වීම කෙසේ වෙතත් දැනට සිටින තත්ත්වය වත් රැක ගැනීම පවා බැරි තත්ත්වයකට පත්ව තිබීමයි. මෙය සොයා ඈත රටවලට අප යා යුතු නැත. අපගේම මවුබිම වන ශ්‍රී ලංකාවම මෙයට හොඳ නිදසුනක් වෙයි.

1948 දී නිදහස ළඟා කර ගැනීමත් සමග මෙතෙක් රටෙහි ආර්ථිකය ඉදිරියට ඇදුණු ආකාරය විමසා බැලීමෙන් මෙය පසක් කර ගැනීම අපහසු නොවේ. ඉහත කී කාලය තුළ නව ආර්ථ විශ්ලේෂණ කොතෙක් තිබුණද ඒ කිසිවක් ගණනකටවත් නොගත් ශ්‍රී ලංකාවේ පාලකයෝ ස්වකීය 'හිතුමතයේ ආර්ථික දැක්මක්' මත පිහිටා කටයුතු කිරීමේ ඵල විපාක දැන් පෙනෙන්නට ඇත. තවත් තේරෙන බසින් කිව හොත් මෙතෙක් රටේ පහළ වූ කොළ පාට, නිල් පාට, රතු පාට සියලු පාලකයෝ ගෝලීය ආර්ථික ප්‍රවණතා සැලකිල්ලට නොගෙන එදිනෙදා පා කරමින්, ජනතාව රවටමින් බලය පමණක් පරමාර්ථ කොට ගැනීම නිසා දවසින් දවස ණය කන්දකට යට වෙමින්, බදු බරින් ජනතාව පෙළමින් සිටින තත්ත්වයකට පත්ව තිබෙන බව පැහැදිලිය.

මේ යටතේ ආර්ථික විද්‍යානුකූලව අපමණ කරුණු ගෙන හැර පෑ හැකි වුවත් එක් කරුණක් ගැන පමණක් මෙහි ලා අවධාරණය කරනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකාව නිෂ්පාදන ආර්ථිකයකට පසුබිම් වූ විවිධ අමුද්‍රව්‍යයන්ගෙන් පෝෂිත රටකි. ලංකාව ආක්‍රමණය කළ බටහිර ජාතීන් එය ආක්‍රමණය කළේම මෙහි වූ ඒ අමුද්‍රව්‍ය පිළිබඳ ලොබින් බව ඉතිහාසය කියයි. එහෙත් නිදහස ලත් දා පටන් මෙතෙක් එකදු පාලකයෙකුදු ඒවා දෙස ඇස් හැර බැලුවේවත් නැතැයි කිවහොත් එය අසත්‍යයක් නොවේ.

කෘෂිකාර්මික පාරාදීසයක්ව පැවති මේ රටේ එය රටේ නැගිටීම සඳහා ආධාරකයක් කරගත හැකිව තිබුණද ගල්ඔය වැනි උත්සාහයන් කීපයක් ඉඳහිට අසන්නට ලැබුනද එම උත්සාහයන් පවා දේශපාලන මඩ ගොහොරුවෙහි එරුණු ඊළඟට ආ පාලකයන් විසින් වැඩි දියුණු කර ඉදිරියට ගෙන යනු වෙනුවට අත හැර දැමූ අයුරු ඉතිහාසයෙන් පැහැදිලි වේ. 'රටින් කටට' යන ආනයන මූලික පරිහානිදායක අදහසෙන් මිදී රට තුළ වන අමුද්‍රව්‍යයන්ගෙන් ප්‍රයෝජන ගෙන රට නංවන්නට සිතූ එකදු පාලකයකු ගැන අසන්නට ලැබේද? මෙවැනි නිදසුන් අපමණය.

ගෝලීය ආර්ථිකය හමුවේ පැන නැගෙන ප්‍රවණතාවනට යට වෙමින් ඒ සියල්ලෙහිදී හුදෙක් ජනතාවගෙන් උදුරා ගන්නා බදු මුදලින්ම රට ගෙන යන්නට තැත් කරන පාලකයන් දැන්වත් මේ තත්ත්වය හරිහැටි තේරුම් ගෙන කටයුතු කරන්නේ නම් මැනවැයි නොකියා වෙන කුමක් කියන්නද?

# දවසින් දවස ජනතාවගෙන් ඈත් වන ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැති ඇමතිවරු

■ දූරදර්ශි විසිනි

පාර්ලිමේන්තුව යනු රටක ඇති උත්තරීතර ආයතනය යයි කියනු ලැබේ. 'උත්තරීතර' යන්නෙන්ම ඊට වඩා ප්‍රධාන වූත් විශාල වූත් ආයතනයක් නැති බව හැඟවෙයි. සිංහල භාෂාවේ 'තර' යන තද්ධිත ප්‍රත්‍යයෙන් කියැවෙනුයේ 'ඒ වර්ගයේ ප්‍රධාන' යන්නයි. ඒ අනුව රටේ ඇති පාලන ආයතන අතුරෙන් 'ප්‍රධාන' යන අරුත ඊට හිමි වෙයි. පාර්ලිමේන්තුව උත්තරීතර නම් එය නියෝජනය කරන පුද්ගලයෝද උත්තරීතරයෝමය. මහජනතාව විසින් සිය කැමැත්තෙන් තමන්ගේ රටේ පාලනය ගෙන යනු සඳහා පාර්ලිමේන්තුවට තෝරා එවන්නන් හෙයින් ඔවුහු තවදුරටත් උත්තරීතරයෝ වන්නාහුය.

අතීතයෙහි එනම්, 1948 නිදහස ලත් දා පටන් සිය ගණනක් මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව නියෝජනය කළහ. ඔවුන් අතරින් කෙනෙකු දෙන්නෙකු හැරුන විට සෙසු සියල්ලෝම මේ උත්තරීතර බව රැක ගන්නෝ වූහ. ඔවුහු තමන් පත් කොට එවූ ජනතාවට ආදරය කළහ. ගරු කළහ. ඔවුන්ගේ දුක සැප තම දුක සැපට වඩා සීරුවෙන් විමසා බැලූහ. ඔවුන්ගේ දුගී බව නැති කිරීමට, ඔවුන්ට රැකියා සපයා දී සැපවත් කරන්නට, ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවනු සඳහා පාසල් වැඩි දියුණු කොට ඒවාට අවශ්‍ය ගුරු අඩුපාඩු, ගොඩනැගිලි පහසුකම් සපුරා ලන්නට, කෙටියෙන්ම කිව හොත් තම ඡන්ද කොට්ඨාසයට (එකල එය හැඳින්වූයේ ආසනය නමිනි.) අයත් ජනයාගේ ළඟම හිතවතා වන්නට ඔවුහු සැදී පැහැදී සිටියහ. මොරටුවේ සෝමවීර චන්ද්‍රසිරි, දඹුල්ලේ ටී. බී. තෙන්නකෝන්, මිහින්තලේ පතිරාජ තෙන්නකෝන්, වත්තල ඒ. ඩී. ජේ. එල්. ලියෝ ආදි මන්ත්‍රීවරුන් බොහොමයක් ජනතාවත් සමග ළඟින් ගැටෙමින් ඔවුන් අතරම සිටි අතර තවත් සමහරෙක් ජනතාවට එතරම්ම සමීප නොවූවද පෙර කී ජනතා ප්‍රශ්න පිළිබඳව නිරතුරුවම ඇස ගසා ගෙන සිටිමින් ඒවා විසඳා දීමට උත්සුක වූහ. එකල පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා ගෙන බැලුව හොත් මේ සෑම මන්ත්‍රීවරයෙක්ම පාර්ලිමේන්තුවේදී තම කොට්ඨාසයේ ජනතාව වෙනුවෙන් කැපවූ සැටි, ඔවුන්ගේ ප්‍රශ්න පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඒවා විසඳාලන්නට කැස කැවූ සැටි, ඒ වෙනුවෙන් පාර්ලිමේන්තුවේදී අරගල කළ සැටි, කොට්ඨාසයේ ප්‍රශ්න උදෙසාත් පොදු ජාතික ප්‍රශ්න උදෙසාත් නිතිපතා පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට සහභාගි වූ සැටි දැක ගත හැකිය.

මෙනිසාම ජනතාවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාත් අතර වූයේ පුදුම සහගත බැඳීමකි. ජනතාවගේ දුකේදීත් සැපේදීත් ඔවුන් හා එක්ව සිටි මන්ත්‍රීවරු ලක්ෂ ගණනක් වූ ඡන්දදායකයන්ගෙන් බහුතරයක් නමින් ඇමතීමට තරම් සමීපව සිටියහ. එහි ප්‍රතිඵලය වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කෙරෙහි සාතිශය ගෞරව සම්ප්‍රයුක්ත බවක් (භයක් නොවේ) ඔවුන් තුළ ඇති වීමයි. ඡන්දයකින් පසු බහුතරයක් මන්ත්‍රීවරු පක්ෂ භේදය අමතක කොට තම ඡන්ද කොට්ඨාසයේ ජනතාව තමන්ගේ කොට සලකන්නට වූහ. ජනතාවද ඡන්දයෙන් පසු 'අපේ මන්ත්‍රී තුමා' යි කට පුරා කියන්නට පුරුදුව සිටියහ.

තවද කිව යුත්තක් ඇත. එදා මේ මන්ත්‍රීවරුන්ට අද මෙන් ලක්ෂ ගණනින් වැටුප් නොලැබුණෝය. විශ්‍රාම වැටුප් නොලැබුණෝය. අර දීමනා, මේ දීමනා නොලැබුණෝය. බද්දෙන් තොරව වාහන ගෙන්වා ගැනීමට කාර් පර්මිට් නොලැබුණෝය. මන්ත්‍රී ධුරය වෙනුවෙන් දරන්නට වන සියලු වියදම් තම අතින්ම දරන්නට ඔවුන්ට සිදු වී තිබුණෝය. මේ නිසාම මන්ත්‍රී ධුරය නිම වන විට තම ගේ දොර පවා උකසට බැඳෙන අයද එකල මන්ත්‍රීවරුන් අතර වූහ. බණ්ඩාරනායක මහතා මිය යන විට ඔහුගේ රොස්මිඩ් බංගලාව උකසට බැඳී තිබුණෝලු. ඩඩ්ලි සේනානායක මහතා මිය යන විට ඔහුගේ බැංකු ගිණුමේ තිබුණේ රුපියල් සිය ගණනකැයි කියනු ලැබේ. සෙසු දුප්පත් මන්ත්‍රීවරුන් ගැන කියනුම කවරේද? එහෙත් ජනතාව මන්ත්‍රීකම නොවූවත් ඔවුන්ට දැක්වූයේ අතිශය ගෞරවයකි. සෝමවීර චන්ද්‍රසිරි, ටී. බී. තෙන්නකෝන් වැනි අය පැරදුණද මිය ගිය පසු දින ගණන් පෙළ ගැසී ජනයා ඔවුන්ගේ දේහයනට ගෞරව කිරීම ඊට උදාහරණ වෙයි.

ඒ එදා තත්ත්වයයි. අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට අඩුව ඇත්තේ කුමක්ද? වැටුප, විශ්‍රාම වැටුප, ගෙවල් කුලී, දුරකථන දීමනා, ඉන්ධන දීමනා, වසරින් දෙකෙන් ලක්ෂ ගණන් මිල වන වාහන බද්දෙන් තොරව ගෙන්වා ගැනීමේ පර්මිට් ආදී මෙකී නොකී සියල්ලක්ම ඔවුන්ට ලැබේ.

එසේ තිබියදීත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කෙරේ රටේ ජනතාවගේ ලැදිකම, ගෞරවය එන්න එන්නටම පිරිහෙමින් පවතින බව රහසක් නොවේ. මේ බව සනාථ කෙරෙන සාධක කීපයක්ම දැක්විය හැකිය. ඉන් ප්‍රධානම දෙය නම් එන්න එන්නම ඡන්දයකදී ලියාපදිංචි ජනයාගෙන් ඡන්දය දෙන ජන සංඛ්‍යාව අඩු වීමයි. 'ඡන්දය දීමෙන් පලක් නැත' යන මතය එන්න එන්නම ජනතාව අතර තහවුරු වෙමින් පැවතීමයි. ඒ හැරත් අලුත්ම වාර්තාවනට අනුව ඡන්දය දීම සඳහා ලියාපදිංචි වන්නන්ගේ (විශේෂයෙන්ම තරුණයන්ගේ) සංඛ්‍යාවද සීඝ්‍රයෙන් අඩු වෙමින් පවතී. උගතුන් යයි සැලකෙන පිරිස් 'මන්ත්‍රීවරුන් වීමට' තරග බිමට නොබැසීමේ ප්‍රවණතාවද මන්ත්‍රීකම හෑල්ලුවට ගොස් ඇති තරම පෙන්වන්නකි.

22 වන පිටුව බලන්න




# කියවීමේ කලාව

■ චින්තා පවිත්‍රානි

ඔක්තෝබර් මාසය ශ්‍රී ලංකාව තුළ 'ජාතික කියවීමේ මාසය' ලෙස නම් කොට ඇත. මෙවැනි මාසයක අවශ්‍යතාව පිළිබඳ යෝජනාව රජයට ඉදිරිපත් කර ඇත්තේ මහාචාර්ය තිස්ස කාරියවසම් විසිනි. ඒ අනුව 2004 ඔක්තෝබර් මාසයේ සිට ජාතික කියවීමේ මාසයක් පැවැත්වේ. සැප්තැම්බර් සාහිත්‍ය මාසයේදී මිල දී ගන්නා පොත්පත් කියවීමට පෙළඹවීමක් ඇති කිරීමද 'ඔක්තෝබරය' කියවීමේ මාසය ලෙස නම් කිරීමට විශේෂ හේතුවක් වී ඇත.

ලිවීම මෙන්ම කියවීමද කලාවකි. විවිධ දාර්ශනිකයන්, ලේඛකයන් හා දේශපාලනඥයන් යනාදීන් නොයෙක් ආකාරයට පොත් කියවීමට නැඹුරුව සිටි ආකාරය හඳුනාගත හැකිය. මෙහිදී නොයෙක් ආකාරයට යන්නෙන් අදහස් කෙරෙන්නේ විවිධ විද්වතුන්ගේ කියවීමේ ක්‍රමවේද ඒකීය නොවන බවයි. ඇතැම්හු පොත් කියවීමට දැඩිසේ ඇබ්බැහිව සිටියෝය. අයෙක් දෛනික රාජකාරි කටයුතු නිමා වූ පසු පොතක් කියවා නින්දට යෑමට පුරුදුව සිටියහ.

අප පොත් කියවන්නේ කුමක් පිණිසද? කියවිය යුත්තේ කුමන පොත්ද? පොත් මිල දී ගැනීම අත්‍යවශ්‍ය සාධකයක්ද? යනාදී වශයෙන් ඇතැමුන්ට කියවීමේ සංස්කෘතිය හා සම්බන්ධ නොයෙක් ගැටලු පවතී.

වත්මන් සමාජයෙහි බොහෝ විට පොත් කියවීම අධ්‍යාපනයෙහි යෙදෙන දරුවන්ට පමණක් අදාළ වූවක් ලෙස සැලකීමේ ප්‍රවණතාවක් පවතී. නව තාක්ෂණය මිනිස් සංහතිය වෙත සම්ප්‍රේෂණය වීම සාධනීය ලක්ෂණයකි. එහෙත් තාක්ෂණික මෙවලම් අතර සිරගත වූ මිනිසා ශිෂ්ටාචාරයේ ඉතා වැදගත් අංග නොතකා හැරීම ඛේදයකි. භෞතික සංවර්ධනය මෙන්ම මිනිස් චින්තනය හරවත් පදනමක් යටතේ දියුණු කිරීමද අත්‍යවශ්‍යය. ඒ සඳහා අනුගමනය කළ හැකි වැදගත්ම ක්‍රියාමාර්ගය වන්නේ පොත් කියවීමේ සංස්කෘතියට සමාජය හුරු කිරීමයි. මෙරට විසූ විශිෂ්ට විචාරකයකු වූ සුචරිත ගම්ලත් කියවීමේ අගය මෙසේ පහදයි.

'පුරාණ වීර කාව්‍ය, අන්‍යාලාප කතා, ගී සින්දු, චිරාගත සුභාෂිත යන මේවා සිත් කාවදින ලෙස විශාල ලෙස දැනුම සපයයි. ඒවා අතීතයට ආලෝක ධාරා විහිදුවයි. අනුභූතීන් පොදු බවට පත් කරයි. ඥාන මණ්ඩලය පෘථුල කරයි. අපට බාහිර ලෝකය සමග සබඳතා පිහිටුවා ගත හැකි වන්නේ මෙබඳු සාහිත්‍ය කෘති සමග සම්පර්කයට පත් වීමෙන් පමණි.'

දැනුම සම්පාදනය ඔස්සේ ඥාන මණ්ඩලය පුළුල් කිරීම, විවිධ අත්දැකීම් අත්විඳීමට හැකියාව ලැබීම යනාදී වශයෙන් කියවීමේ ආනිශංසන පවතී. අප බාහිර ලෝකය සමග සබඳතා ගොඩනගා ගැනීමට නම් සමාජයට පිවිස නොයෙක් පුද්ගලයන් සමග කටයුතු කළ යුතුය. විවිධ ප්‍රදේශවල සංචාරය කළ යුතුය. එහෙයින් දෛනික ජීවිතයේ නොයෙක් කටයුතුවල ගැලී දිවිගෙවන මිනිසාට නොයෙක් පුද්ගලයන්, විවිධ ප්‍රදේශ හා සම්බන්ධ අත්දැකීම් උකහාගත හැක්කේ කියවීමෙනි. එසේ වුවද පොත්පත් හෝ අන්තර්ජාලය ඔස්සේ කියවීමේදී ඒවායේ සඳහන් සියල්ලක්ම සපුරා සත්‍යය ලෙස පිළිගත යුතු නොවේ. කියවීමේදී පවා තාර්කික චින්තනය මෙහෙයවා තමනට අවැසි දෑ පමණක් උකහාගත යුතුවේ.

ඉතා දුෂ්කර ජීවන අරගලයක් මධ්‍යයේ වුවද කියවීම සඳහා දැඩි කැපවීමෙන් තමා අත තිබූ මුදල වියදම් කළ පුද්ගලයෝද වූහ. අප පොත් මිල දී ගත යුත්තේ මන්ද? එසේ මිල දී ගන්නා පොත් නොකියවා රාක්කයේ තැන්පත් කරන්නෝ කීදෙනෙක් වෙත්ද? යනාදි ගැටලු අප අබිමුව පවතී. පොතක මිල හා වටිනාකම මනාව තහවුරු කෙරෙන සංසිද්ධි ඇමරිකානු කතුවරියක වූ පර්ල් එස් බක් ලියූ Dragon Seed කෘතියෙහි සඳහන් වේ. ටී. අන්ද්‍රාදි එබඳු අවස්ථාවක් මෙසේ සිංහලයට පරිවර්තනය කරයි.

පොතක මිල සහ වටිනාකම

"පොතේ මිල කීයද?" ලාඕ ඇසීය.

"පොඩි රිදී කාසි තුනයි" පොත් වෙළෙන්දා කීවේය.

"මගෙ අම්මෝ.... පොතකට එච්චර ගාණක්"

ඔහු හඬ නගා කීවේය.

"පොතකට ඇයි නොගෙවන්නේ" පොත් වෙළෙන්දා කීවේය.

"ඔහේ ඌරු මස් කෑල්ලකටත් ඒතරම්ම වියදම් කරනවා. ඔහේ ඒක කනවා. එච්චරයි. ඒක ඉවරයි. ඉතිරි වෙන දේවල් ඉඳුල් විතරයි. ඒත් ඔහේ ඔහේගෙ හිතට ඇතුල් කරන පොතක්, හිත ඇතුළෙ රඳා පවතිනවා. ඔහේට ඒක අමතක වුණොත් ඒක ආයෙත් කියවන්න ඔහේට පුළුවන්. කවුද දන්නෙ ඔහේ ඒකෙන් මොන මොනවා හිතාවිද කියල"

පොතක වටිනාකම එහි මුදල්මය අගයට වඩා ඉහළින් පවතින්නක් බව මේ අනුව පෙනියයි. බොහෝ විද්වතුන් තම චින්තන පරාසය වෙනස් කළේ මේ මේ කෘති යැයි ප්‍රකාශ කෙරෙන අවස්ථා අප දැක ඇත. එහෙයින් පොතක් වෙනුවෙන් මුදල් වැය කිරීම කිසියම් ආහාරයක්, ද්‍රව්‍යයක් මිල දී ගැනීමට වඩා වැදගත් ආධ්‍යාත්මික ආයෝජනයකි.

පොත් මිල දී ගැනීමේදී හුදු වින්දනය හා ආස්වාදය සම්පාදනය කෙරෙන කෘති කෙරෙහි බොහෝ දෙනෙක් අවධානය යොමු කරති. එහෙත් අවශ්‍යයෙන්ම ඉගෙන ගැනීමට යමක් පවතින කෘති තමන් සතු කරගැනීමට උත්සුකවීම වැදගත්ය. සාහිත්‍යයික, ආගමික, දේශපාලනික, විද්‍යාත්මක යනාදි කවර ක්ෂේත්‍රයකට අයත් කෘතියක් වුවද මිල දී ගැනීමේදී එයින් අපට ලැබෙන දෑ කුමක්දැයි තමාගෙන්ම ප්‍රශ්න කිරීම වැදගත්ය. විශිෂ්ට ලේඛකයකු වූ ජී. බී. සේනානායක තමා පොත් කියවීම කෙරෙහි දැක්වූ නැඹුරුව මෙසේ පැහැදිලි කරයි.

'මම අවුරුදු 6-7 කාලය සිටම බොහෝ සෙයින් පොත් කියවීමි. මේවා නවකතා, කෙටිකතා ආදියම නොවීය. එසේම සොයාගත හැකි සෑම වර්ගයේම සිංහල පොත් කියවීමි. මෙසේ කියවීම නිසාදෝ තේරුම්ගන්ට අහිත් බොහෝ බාලයන්ට නැති ශක්තියක් මට ඇතිවිය.'

කියවීමෙන් දැනුම සම්පාදනය මතු නොව ධාරණ ශක්තිය, වටහා ගැනීමේ ශක්‍යතාව යනාදියද පුළුල් වන බව පැහැදිලි කරුණකි. භෞතික ශරීරයේ ක්‍රියාකාරීත්ව හා වර්ධනය පිණිස ආහාර ගැනීම වැදගත් වන අයුරින්ම අධ්‍යාත්මයේ සම්ප්‍රසාරණය පිණිස කියවීම අවශ්‍යය. 'කියවීම මිනිසා සම්පූර්ණ කරති' යි පැවසෙන්නේ එහෙයිනි.

වත්මන් කාර්යබහුල ජීවන රටාව තුළ මිනිසාට කියවීමට වේලාවක් නැති බවටද මැසිවිලි නැගේ. එහෙත් එදිනෙදා ජීවන කටයුතු අතරතුර මේ සඳහා කාලය සොයා ගැනීම එතරම්ම අපහසු නොවේ. බොහෝ වියත්හු ස්වකීය කතාබහ අතරතුර 'මේ කෘතියේ මෙසේ කියවෙනවා' යනාදී වශයෙන් පවසති. ඔවුන්ගේ ඥාන මණ්ඩලය පුළුල් වී ඇත්තේ කියවීමෙන්ම බව ඒ අනුව හඳුනාගත හැකිය. වර්තමානයේ පුස්තකාල අසල ඇති වෙළෙඳපොළවල්, රූපලාවන්‍යාගාර ආදිය තුළ මෙන්ම මගතොටේ නිකරුණේ සැරිසරමින් බොහෝ මිනිසුන් සිටින නමුත් පුස්තකාල තුළ ඇත්තේ ඉතා අඩු පිරිසකි. ඇතැම් විට නැති තරම්ය. මෙයින් සනාථ වන්නේ කියවීම දෛනික ජීවිතයෙන් බැහැර කළ මිනිස් සමාජයක ස්වරූපයයි. බුද්ධිමතුන් අඩු වන වට සමාජ ප්‍රගමනය සුබවාදී අතකට නැඹුරු නොවේ. ප්‍රබල චින්තන විමංසන ශක්‍යතාවකින් තොරවූවෝ යථා තතු නිසි පරිදි නොදකිති.

මාර්ටින් වික්‍රමසිංහ වැනි ගත්කතුවරයින් ලේඛකයකු වීමේ ක්‍රියා පිළිවෙත පැහැදිලි කිරීමේදීද පොත්පත් කියවීමෙන් ලබාගන්නා දැනුම උසස් කොට සලකයි.

'ලේඛකයකුවීම සඳහා තම චරිතය හදා වඩාගත හැක්කේ අතෘප්තිකර ආශාවෙන් උගැන්මෙනි. පොතින් පතින් ලබන දැනුම ඇසීමෙන් බැලීමෙන් ලබන දැනුම, අත්දැකීමෙන් ලබන දැනුම යන තුනම උගැන්ම වෙයි. ඒ උගැන්ම ලබන කෙනා තුළ ලේඛකයකු වීමට අතෘප්තිකර ආශාවක් තිබිය යුතුය.'

මේ ආදී වශයෙන් බලන කල කියවීම අප එකිනෙකා දියුණු කරගත යුතු කලාවක් බව පැහැදිලි වේ, එහිදී අන්‍යයන්ගෙන් ලැබෙන පිටුබලය සීමිතය. පොත් කියවිය යුත්තේ තමන්මය. එහි ප්‍රතිඵලයද තමුන්ටය. මිල මුදල් ආදිය සොරාගත හැකි නමුදු අපගේ අධ්‍යාත්මික සමෘද්ධිය කිසිවකුටත් පැහැරගත හැකි නොවේ. විඥානමය දායාද මතු භව දක්වා වුවද විකාශනය වීමේ ශක්‍යතාවෙන් පරිපූර්ණය.

# වසර 55කට පසු භෞතික විද්‍යාව සඳහා නොබෙල් ත්‍යාගය කාන්තාවකට

(බී.බී.සී. සිංහල පුවත්)

වසර 55 කට පසු භෞතික විද්‍යාව සඳහා නොබෙල් ත්‍යාගය කාන්තාවකට හිමි වී තිබේ. කැනඩාවේ ජීවත් වන ආචාර්ය ඩෝනා ස්ට්‍රික්ලෑන්ඩ් (Donna Strickland) මෙම සම්මානය දිනාගත් තෙවෙනි කාන්තාව බවට ඉතිහාසගත වන අතර 1903 වර්ෂයේදී මාරි කියුරි සහ 1963 දී මරියා ගෝපර්ට්-මේයර් (Maria Goeppert-Mayer) මෙම සම්මානයෙන් පිදුම් ලැබූහ.

ඩෝනා ස්ට්‍රික්ලෑන්ඩ් ට මෙම වසරේ ලැබුණ ත්‍යාගය එක්සත් ජනපදයේ ආතර් ඇෂ්කින් සහ ප්‍රංශයේ Gerard Mourou අතර සමසේ බෙදිණි.

භෞතික විද්‍යාවේ ඇති ලේසර් ක්‍රම පිළිබඳ සිදුකළ නව සොයාගැනීම් වෙනුවෙන් ඔවුන්ට නොබෙල් ත්‍යාගය හිමි වී ඇත. ජෛව විද්‍යාත්මක ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමට භාවිත කළ හැකි 'දෘශ්‍ය අඬුවක්' (optical tweezers) ලෙස හැඳින්වෙන ලේසර් ක්‍රමයක් වැඩිදියුණු කිරීමට ආචාර්ය ඩෝනා ස්ට්‍රික්ලෑන්ඩ් කටයුතු කර තිබේ.

මෙකී ලේසර් ක්‍රමය මගින් මෙතෙක් සොයාගත් කෙටිම සහ වේගවත්ම ලේසර් කිරණ නිර්මාණය කිරීමට මඟ පාදනු ලැබේ. ඩෝනා ස්ට්‍රික්ලෑන්ඩ් සහ Gerard Mourou úiska Chirped Pulse Amplification (CPA) ලෙස හැඳින්වෙන ලේසර් ක්‍රමවේදයක් වැඩිදියුණු කරනු ලැබීය. මෙය පිළිකා සඳහා මෙන්ම වසරකට සිදු කෙරෙන මිලියන ගණනක් ලේසර් අක්ෂි ශල්‍යකර්ම සඳහා ප්‍රයෝජනවත් වනු ඇත. මෙතෙක් කාලයක් කාන්තාවකට මෙම ත්‍යාගය හිමි නොවීම ගැන තමන් 'පුදුමයට පත් වෙන' බව ආචාර්ය ඩෝනා ස්ට්‍රික්ලෑන්ඩ් බීබීසී වෙත පැවසීය.

"මට සෑම අවස්ථාවකදීම පුරුෂයින්ට හා සමාන සැලකුම් ලැබුණා. මා සමග පුරුෂයන් දෙදෙනෙක්ද මෙම ත්‍යාගය දිනාගෙන තිබෙනවා. ඒ දෙදෙනාටත් මේ ත්‍යාගය එක සමානව අයිති වෙනවා," යැයි ඇය තවදුරටත් පැවසුවාය.

ජිනීවාහි විද්‍යාගාරයක පැවති සම්මන්ත්‍රණයකදී එක්තරා භෞතික විද්‍යාඥයෙකු සිදු කළ "ඉතා අප්‍රසන්න" දේශනයකින් දින කීපයකට පසු මෙම ත්‍යාග ප්‍රදානය සිදු විය. භෞතික විද්‍යාව "ගොඩනගා ඇත්තේ පුරුෂයින්" යනුවෙන් සඳහන් කළ ඔහු, පිරිමි විද්‍යාඥයන්ට වෙනස් කොට සැලකීමක් සිදුවන බවද පැවසීය. එම දේශනයෙන් පසු ඔහු පර්යේෂණ මධ්‍යස්ථානයෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබිණි.

එම භෞතික විද්‍යාඥයා 'මෝඩ' අදහස් පළ කර ඇති අතර තමන් ඒ කිසිවක් 'පෞද්ගලිකව' අදාළ කර නොගත් බව ආචාර්ය ඩෝනා ස්ට්‍රික්ලෑන්ඩ් පැවසීය.

භෞතික විද්‍යාව සඳහා නොබෙල් ත්‍යාගයට අවසන් වරට හිමිකම් කී කාන්තාවන් වන්නේ, ජර්මනියේ ඉපදුණු ඇමෙරිකානු භෞතික විද්‍යාඥවරියක වන මරියා ගෝපර්ට්-මේයර් ය. පරමාණුවල ඇති න්‍යෂ්ටික ශක්තිය පිළිබඳ සිදුකළ සොයාගැනීම් වෙනුවෙන් ඇයට මෙම සම්මානය හිමි විය. රේඩියම් සොයාගැනීම වෙනුවෙන් පෝලන්ත ජාතික භෞතික විද්‍යාඥරියක් වන මාරි කියුරි 1903 දී නොබෙල් ත්‍යාගයෙන් පිදුම් ලැබුවාය. රේඩියම් සොයාගැනීමේ පරීක්ෂණවලට එක් වූ සිය සැමියා වන පියරි කියුරි සහ Antoine Henri Becquerel අතර එම ත්‍යාගය සමසේ බෙදිණි.

මෙම ත්‍යාගය ඇමරිකානු ඩොලර් මිලියනයකට ආසන්න වටිනාකමකින් යුක්තය.

"මුලින්ම ඔබට සිතෙයි එය ඇත්තටම පිස්සුවක් කියලා. මගේ මනසට ආපු පළමුවෙනි සිතුවිල්ලත්



එයයි. ඒ වගේ, මෙය සැබෑවක්ද කියලත් සිතෙනවා" යැයි කැනඩාවේ 'වෝටර්ලු' විශ්වවිද්‍යාලයට අනුයුක්තව සේවයේ නියුතු ආචාර්ය ඩෝනා ස්ට්‍රික්ලෑන්ඩ් සිය ජයග්‍රණය ගැන එසේ පැවසීය.

"මේ තෑග්ග Gerard සමග බෙදා ගැනීම ගැන කියනවානම්, ඔහු තමයි මගේ වැඩ නිරීක්ෂණය කළේ. ඒ වගේම ඔහු මගේ උපදේශකවරයා. CPA ලේසර් ක්‍රමවේදය ඔහු ඉතා ඉහළ තැනකට රැගෙන ගියා. ඔහුට මෙම ත්‍යාගය ලැබිය යුතුමයි. ඒ වගේම ආතර් ඇෂ්කින්ට ලැබුණ ජයග්‍රහණය ගැන මම ඉතාමත් සතුටු වෙනවා."

"මම සිතන්නේ ඔහු මින් පෙරත් ඉතා විශාල සොයාගැනීම් ගණනාවක් සිදු කර තිබෙනවා. ඒ දේවල් භාවිත කරමින් අනිකුත් පුද්ගලයන් විශිෂ්ට දේවල් සිදු කරනවා. අවසානයේදී ඔහුගේ සේවය ඇගයීම ගැන ඉතාමත් සතුටුයි" ඇය පැවසුවාය.

# ඉරානයට එරෙහි සම්බාධක ලිහිල් කරන්නැයි ඇමෙරිකාවට නියෝගයක්

(බී.බී.සී. සිංහල පුවත්)

න්‍යෂ්ටික ගිවිසුමෙන් ඉවත් වීමෙන් අනතුරුව පසුගිය වසරේ ඉරානයට එරෙහිව යළිත් වරක් පනවන ලද සම්බාධක ලිහිල් කරන ලෙසට ජාත්‍යන්තර අධිකරණය (The International Court of Justice) ඇමෙරිකාවට නියෝග කර තිබේ.

එම අධිකරණය නියෝග කර ඇත්තේ, ආහාර සහ ඖෂධ ආදි 'මානුෂික' ද්‍රව්‍ය ඉරානයට අපනයනය කිරීමට ඉඩ දෙන ලෙසය.

කෙසේ වෙතත්, මෙය ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් වන හෙයින් මේ සම්බන්ධයෙන් නියෝග නිකුත් කිරීමට ජාත්‍යන්තර අධිකරණයට බලයක් නොමැති බවට ඇමෙරිකාව තර්ක කර තිබේ. හේග් නුවර පිහිටි ජාත්‍යන්තර අධිකරණයට නියෝග නිකුත් කළ හැකි වුවද ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලපෑම් කිරීමේ බලයක් නොමැත.

එය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධානතම නීති ආයතනය වන අතර එහි සාමාජික රටවල් අතර පවතින නීතිමය ගැටුම් නිරාකරණය කරයි.

කෙසේ වෙතත්, ඇමෙරිකාව සහ ඉරානය මීට පෙර අවස්ථා කීපයකදී ම ජාත්‍යන්තර අධිකරණයේ නියෝග කඩ කර තිබේ.

බදාදා (03) මෙම නියෝගය නිකුත් කරමින් ජාත්‍යන්තර අධිකරණයේ සභාපති විනිසුරු අබ්දුකාවි යූසුෆ් පැවසුවේ, "මානුෂික අවශ්‍යතා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඉරානයට අපනයනය කිරීම සඳහා වන බාධක ඇමෙරිකාව ඉවත් කළ යුතු" බවය.

ඇමෙරිකාව, ඉරානයට එරෙහිව පනවා ඇති සම්බාධක නීති විරෝධී බව මෙම නියෝගයෙන් තහවුරු වන බව ඉරාන විදේශ අමාත්‍යංශය පවසා තිබේ.

ඩොනල්ඩ් ට්‍රම්ප් ඉරානයට එරෙහිව පනවා තිබූ සම්බාධක තවත් දැඩි කිරීම හේතුවෙන් ඉරාන ආර්ථිකයද කඩා වැටී තිබේ. එරට මුදල් ඒකකය වූ රියාල් හි අගයද සීග්‍රයෙන් පහත වැටී තිබේ.

අදාළ නියෝගය අනුව සම්බාධක ඉවත් කරන ලෙස දන්වා ඇත්තේ, ඖෂධ, වෛද්‍ය සැපයුම් සහ උපකරණ, ආහාර, කෘෂිකාර්මික නිෂ්පාදන සහ ගුවන් ආරක්ෂණ උපකරණ යන ද්‍රව්‍යවලය.

ඇමෙරිකානු බලපෑම් අනුව ඉරානය සමග අපනයන ගනුදෙනු අත්හිටුවා ඇති යුරෝපීය සමාග ම්වලට ඉරානය සමග යළි වෙළෙඳ ගනුදෙනු කිරීම සඳහා දිරි ගැන්වීමක් මෙම නියෝගයෙන් ලැබී ඇතැයි ආර්ථික විශ්ලේෂකයෝ පෙන්වා දෙති.

1 වන පිටුවෙන්

## United States...

තිබුණි.

ට්‍රම්ප් ජනාධිපති ලෙස පත්වීමත් සමග ඇමරිකාව-කැනඩාව-මැක්සිකෝව මේ පිළිබඳව සාකච්ඡා වට රැසක් පවත්වනු ලැබූ අතර එහි ප්‍රතිඵල ලෙස 2018 අගෝස්තු 27 වෙනි දින ඇමරිකාව හා මැක්සිකෝව අතර ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුමක් අත්සන් කරනු ලැබුණි. එහෙත් මෙම ගිවිසුමෙහි තිබූ ඇතැම් වගන්ති හා එකඟ වීමට නොහැකි බව පැවසූ කැනඩාව එවර එම ගිවිසුම අත්සන් කිරීමෙන් වැළකී සිටියහ. එතැන් සිට නැවතත් ඇමරිකාව හා කැනඩාව අතර, නව ගිවිසුමෙහි කරුණු සම්බන්ධයෙන් දිගටම සාකච්ඡා සිදුකෙරුණි. එකඟතාවක් නොමැතිව සිදුකෙරෙන මෙම සාකච්ඡාවන් අතරතුරදී ඉහත ගිවිසුමට කැනඩාව එක්වන්නේද නැද්ද යන්න දැනුම් දීම සඳහා අවසන් දිනයක් ලබාදීමට ඇමරිකාව පියවර ගෙන තිබුණි. එසේ ලබා දී තිබූ දිනය ඔක්තෝබර් 01 දා වූ අතර එම දිනයට පෙර ගිවිසුමට එකඟ නොවුවහොත් ඇමරිකාව සහ මැක්සිකෝව අතර අත්සන් කළ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම ඉදිරියට ගෙන යාමට කටයුතු කරන බව ට්‍රම්ප් රජය කැනේඩියානු රජයට දන්වා තිබුණි.

මේ පිළිබඳව සැලකිලිමත් වූ කැනඩා රජය, කැනේඩියානු විදේශ ඇමතිනියගේ මැදිහත් වීමෙන් සති කීපයක් පුරා ඇමරිකාව සමග සාකච්ඡා වට කීපයක් පැවැත්වූ අතර එහිදී දෙපාර්ශ්වයම දැවැන්ත කේවල් කිරීම් සිදුකරනු ලැබුණි. අවසන, සැප්තැම්බර් 30 වන දින කැනඩාව, එක්සත් ජනපදය හා මැක්සිකෝව සමග තාවකාලිකව මෙම වෙළඳ ගිවිසුමට එක්වන බව නිවේදනය කර තිබුණි.

එම ගිවිසුමේදී ප්‍රධාන වශයෙන් කැනඩාව සහ ඇමරිකාව අතර සිදුවන වෙළඳ ගනුදෙනු සම්බන්ධයෙන් සහන රැසක් ලැබී ඇති බවක් පැවසෙතත් අලුතෙන් සාකච්ඡා කොට කැනඩාවේ අත්සනින් සහතික කළ කොන්දේසි සහ ලබාදෙන සහන පිළිබඳ තවමත් පවතින්නේ දැඩි දෙගිඩියාවකි. මෙතෙක් උතුරු ඇමරිකාවේ නිදහස් වෙළඳ ගිවිසුම - North American Free Trade Agreement (NAFTA) ලෙස ඉහත රටවල් තුන අතර පැවති ගිවිසුමට ඒ සමගම අලුත් නමක්ද ලැබුණු අතර එය මෙතැන් පටන් එක්සත් ජනපද-මැක්සිකෝ-කැනඩා වෙළඳ ගිවිසුම - United States-Mexico-Canada Agreement - USMCA ලෙස හැඳින්වෙනු ඇත.

## වේන් ගෙනා නීති...

148 වෙනි පනත සංශෝධනය කිරීම පිළිබඳව මාධ්‍ය වෙත අදහස් දක්වමින් ෆෝඩ් පැවසූවේ, 'බිල් 148 ඉවත් කිරීම කළ යුතු දෙයක්. මේ පනත ගෙන ඒමෙන් පසු සේවකයින් 60,000 කට පමණ රැකියා අහිමි වී ඔවුන් අසරණ වුණා. කර්මාන්ත කරුවන්, ව්‍යාපාරිකයන් දැඩි අසීරුතාවන්ට පත් වුණා. කර්මාන්ත, සමාගම්, ව්‍යාපාර ආරක්ෂා කර ගැනීම තුළින් පමණයි රැකියා සුරක්ෂිතතාව සැලසෙන්නේ' යනුවෙනි.

මේ පිළිබඳව තවදුරටත් කරුණු පැහැදිලි කළ ෆෝඩ්, 'මෙම පනත නිසා අපි හැමෝම ණයකරුවන් වුණා. සමස්ත ලෝකයේම ලොකුම ණයකරුවා බවට ඔන්ටේරියෝව පත් වුණා. ඔන්ටේරියෝ ජනතාව අමාරුවේ දමා ලිබරල් රජය මේ කළ දේට ස්තූතිය පළ කළ යුතුයි.' යනුවෙන්ද පැවසීය.

මෙම පනත පවතින තෙක් ඔන්ටේරියෝව තුළ ව්‍යාපාර අරඹන ලෙස පිටස්තර ලෝකයට ආරාධනා කළ නොහැකි තත්ත්වයක් පවතින බවත් ආදායමට වැඩි වියදමක් ඇති තැනක ව්‍යාපාර කිරීමට කිසිවෙකුත් කැමති නැති බවත් ෆෝඩ් පෙන්වා දේ.

148 වෙනි පනත 2017 නොවැම්බර් මාසයේදී ලිබරල් රජය විසින් සම්මත කර ක්‍රියාත්මක කළ අතර එහිදී ඔන්ටේරියෝවේ අවම වැටුප ඩොලර් 14 දක්වා ඉහළ දැමීම සිදුකෙරුණි.

මෙවර 148 වෙනි පනත සංශෝධනය කිරීමේදී වර්තමානයේ අවම වැටුප ලෙස දැක්වෙන ඩොලර් 14 අඩු කිරීමට කටයුතු නොකරන වන බව ෆෝඩ් රජය පවසයි. නමුත් එම පනතෙහි ඇතැම් ස්ථාන විශාල වශයෙන් වෙනස්කම්වලට භාජන කිරීම සඳහා අදාළ අංශ වෙතින් උපදෙස් ලබාගනිමින් පවතින බව සඳහන් කරයි. කෙසේ වෙතත් මෙම සංශෝධන ඉදිරි සති කීපය තුළදී සිදුකොට පාර්ලිමේන්තුව වෙත ඉක්මනින් ගෙනවිත් නව පනතක් ලෙස සම්මත කොට ක්‍රියාත්මක කිරීමට ෆෝඩ් රජය බලාපොරොත්තු වේ.

# Tutoring
## From Grade 08 to 12

| | |
|---|---|
| Mathematics<br>Physics<br>Programming<br>(Java, C#) | Grade 12 Mathematics<br>Advance Functions<br>Limits<br>Calculus |

- Supporting for homework and tests
- Full attention for improving knowledge
- Home Visits possible

**Experience and qualified teacher for excellent results**

Contact
Kithsiri Jayasinghe
(BSc. , MSc. Mathematics & Comp. Science)

Email: jayakithsiri@hotmail.com

Phone - 647 705 1606 / 647 946 9504






දැන් ලෝකයේ ඕනෑම
රූපවාහිනී නාලිකාවක් සජීවීව ඔබේ
ආලින්දයේ රූපවාහිනියෙන් නරඹන්න
මසකට $ 15.00 පමණී
500 කට අධික නාලිකා සජීවීව
1000 කට අධික නවීණ 2D සහ 3D චිත්‍රපට
අමතන්න

දිල්රුක් - 647 403 2259



# TRICO
TRICO MARITIME

(Sole Authorized Agent of
Trico Maritime (Pvt) Ltd. Sri Lanka)

*SRI LANKA'S BEST AND LARGEST CLEARING FACILITIES IN THREE MAJOR CITIES SINCE 1980*

*special service to*
Colombo, Jaffna, Kilinochchi, Batticaloa, Trincomalee, Vavuniya & Mannar

COLOMBO
GALLE
KURUNEGALA

The first Customs Bonded Warehouse for Personal Effects and gift items clearance in Sri Lanka

**Serving People Worldwide Reliably for 35 Years**




**DOOR TO DOOR SERVICE**
**to any part of Sri Lanka**

Our Canadian Agents

**TORONTO: DERRICK ANTON / SUTHAN**
**647.833.3020 | 289.892.4289**

OTTAWA : 613 513 6106 (SAMAN) • MONTREAL: 514 884 8550 (VICKIE / NOEL) • VANCOUVER: 604 771 0026 (Sunny)
CALGARY: 403 971 6721 (SAMAN) • WINNIPEG: 204 800 2364 (MANGALIKA) • ALBERTA : 403 971 6721 (SAMAN)

Trico Maritime Customer Services & Warehouses in Sri Lanka

| HEAD OFFICE | COLOMBO WAREHOUSE | KURUNEGALA WAREHOUSE | GALLE WAREHOUSE |
|---|---|---|---|
| Trico Maritime (Pvt) Ltd<br>50K Cyril Perera Mawatha<br>Colombo 13<br>Tel: 2345580 / 2345581<br>Fax: 2432000 | Trico Maritime (Pvt) Ltd<br>414/17 K. Cyril Perera Mawatha<br>Colombo 13<br>Tel: 2448270 / 2440114<br>Fax: 2432000 | Trico Maritime (Pvt) Ltd<br>Humbara Road Sandagala<br>Uhumeeya<br>Tel: 073 2238924 / 037 2238925<br>Fax: 037 2238967 | Trico Maritime<br>Pro Cargo Distribution (Pvt) Ltd<br>No. 331 Matara Rd, Kangoda, Galle<br>Tel: 091 2234842<br>Fax: 2234841 |

Trico Maritime Freight Forwarding Canada Inc.
151 Nashdene Rd, Unit #5, Scarborough On. M1V 4B9
Intersection: Markham Road/Nashdene Road

Tel: 413 335 8800
Fax: 416 335 8848

email: info@tricomaritime.ca
www.tricomaritime.ca



# සීගිරියටත් වඩා පැරණි
# පිදුරංගල විහාරය

■ කුසුම්සිරි කොඩිතුවක්කු

වෛතිහාසික පිදුරංගල රජමහා විහාරස්ථානයේ පිදුරංගල ගල මත නැගුණු තරුණයක් පිරිසක් එහි සිට අඩ නිරුවත් ඡායාරූප ගෙන ඒවා අන්තර්ජාලයට මුදා හැරීම පිළිබඳ පුවතක් මේ දිනවල ශ්‍රී ලංකාවේ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යවලත් අන්තර්ජාලයේත් බෙහෙවින් කතාබහට ලක් වේ. එම තරුණයන් අත්අඩංගුවට ගෙන මේ වන විට නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති බවද පැවසේ. කෙසේ වුවත් අප මේ සැරසෙන්නේ එම ක්‍රියාවෙහි හොඳ නරක විවේචනය කිරීමට නොවේ. එම තරුණයින්ගේ ක්‍රියා කලාපයත් සමග වැඩියෙන් කතාබහට ලක්වෙමින් ඇති පිදුරංගල විහාරය පිළිබඳව තොරතුරු බිඳක් ඔබට ගෙන ඒමටයි.

සීගිරියට උතුරු දෙසින් පිහිටා ඇති පිදුරංගල විහාරය, සීගිරි ඉතිහාසයට වඩාත්ම සමීප ආරාමය ලෙස හැඳින්විය හැකිය. සීගිරි බිතුසිතුවම් පිළිබඳව මුල් වරට අදහස් දැක්වූ එච්. සී. පී. බෙල් මහතාගේ මතය වූයේද ඒවායින් නිරූපනය වනුයේ පිදුරංගල විහාරය වැඳීමට යන කාශ්‍යප රජුගේ අන්තංපුර ස්ත්‍රීන් බවයි.

## පිදුරංගල දාගැබ

වර්තමානයේ පිදුරංගල නමින් හැඳින්වෙන මෙම විහාරය, අතීතයේ කවර නමකින් හැඳින්වීද යන්න අවිනිශ්චිත වුවත්, සීගිරි රාජධානි සමයෙහි රාජ්‍ය අනුග්‍රහය නොමඳව ලැබූ ප්‍රමුඛ පෙළේ ආගමික මධ්‍යස්ථානයක්ව පැවැති බව නිසැකය. පිදුරංගල විහාරයේ ඉතිහාසය හඳුනා ගැනීමෙහි ලා සාහිත්‍යමය මූලාශ්‍රයන්ගෙන් එතරම් පිටිවහලක් නොලැබුණත්, මේ ආශ්‍රිත පුරාවිද්‍යාත්මක සාධක අනුසාරයෙන් විහාරයේ ආරම්භය, වර්ධනය හා පරිහානිය පිළිබඳව පැහැදිලි කාලානුක්‍රමණයක් ගොඩනඟා ගැනීම උගහට නොවේ.

වර්තමානයේ ප්‍රදේශවාසීන් අතර පිදුරංගල වඩාත් ප්‍රචලිතව ඇත්තේ කාශ්‍යප රජු විසින් කරවන ලද විහාරයක් ලෙසිනි. ජනප්‍රවාදගත තොරතුරු අනුව, කාශ්‍යප රජු ආරක්ෂාව පතා සීගිරි පර්වතයට පැමිණෙන විට, ඒ ආශ්‍රිතව භික්ෂූන්වහන්සේලා වැඩ විසූ බවත්, පසුව උන්වහන්සේලා වෙනුවෙන් සීගිරි පර්වතය තදාශ්‍රිත ප්‍රදේශයෙන් පිටත අංග සම්පූර්ණ විහාරයක් කොට පූජා කළ බවත් පැවැසේ. එලෙස ආරණ්‍ය පූජා කිරීම හේතුවෙන් 'පිදු ආරණ්‍ය ගල' යන්න, 'පිදු+අරන්ගල' වී පසු 'පිදුරංගල' වූ බවත් පැවැසේ.

පිදුරංගල පිළිබඳව ඇති අනෙක් ජනප්‍රවාදයද කාශ්‍යප රජු සම්බන්ධ වූවකි. ඒ අනුව කාශ්‍යප රජු මෙහි විහාර කර්මාන්තය නිම කිරීමට පෙර, මුගලන් රජු යුද කිරීමට පැමිණි හෙයින්, විහාරයේ ඉතිරි කටයුතු සඳහා රත්රන් පූජාවක් කොට, එය මෙම පර්වතයෙහි නිධානයක් ලෙස තැන්පත් කර තැබූ බවත්, ඒ අනුව 'රනින් පිදු ගල' යන්න පසුව 'පිදුරංගල' වූ බවද සඳහන් වේ. මහාවංශයෙහි සඳහන් වන ආකාරයට I වන කාශ්‍යප රජු (ක්‍රි.ව. 477-495), සිය දියණිවරුන් වූ බෝධි, උත්පලවණ්ණා යන දෙදෙනාගේ නම් යොදා විහාර දෙකක් කරවා තිබේ. ඉන් එකක් අනුරාධපුරයේ පිහිටුවා ඇති අතර එය වර්තමානයේ වෙස්සගිරිය ලෙසින් හඳුනාගෙන තිබේ. එහි තිබී හමු වූ ශිලා ලේඛන කිහිපයකම එම ස්ථානයෙහි මුල් නාමය 'බෝ උපුල්වන් කසුප් ගිරි වෙහෙර' ලෙසින් සඳහන් වේ. ඒ අනුව, එය කසුප් රජු විසින් සිය දියණිවරුන්ගේ නම් යොදා අනුරාධපුරයේ කරවූ විහාරය බව නිසැකය.

එනමින්ම, සීගිරියට සමීපව කරවන ලදැයි මහාවංශයෙහි සඳහන් අනෙක් විහාරය පිළිබඳ පැහැදිලි අභිලේඛනමය සාධක මෙතෙක් හසු වී නොමැති වුවත් පිහිටීම හා කාලය සනාථ කරගත හැකි වෙනත් සාධකද අනුව එය, පිදුරංගල විහාරය බව සිතිය හැකිය.

තවත් මතයකට අනුව, මෙය කාශ්‍යප රජුගේ සොහොයුරු මුගලන් රජු විසින් කරවා අභයගිරි වාසී භික්ෂූන්ට පූජා කරන ලදැයි මහා වංශයෙහි සඳහන් සීගිරි දළ්හ විහාරය යැයිද සැලකේ. කෙසේ වෙතත්, සීගිරි ශිලා උද්‍යානය ආශ්‍රිත ප්‍රදේශයෙහි ඇති සංඝාරාම නටබුන් අතර, කාශ්‍යප යුගයෙන් පසු කාලයට අයත් ඉදිකිරීම් කීපයක්ද දැකිය හැකි වන බැවින්, මුගලන් රජුගේ විහාර කර්මාන්තය ඒ ආශ්‍රිතව වී යැයිද සිතිය හැකිය.

දැනට හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව, පිදුරංගල ආරාමීය ඉතිහාසය, කාශ්‍යප රජ සමයට වඩා වසර 700 ක් තරම් ඈතට දිවයන බව පෙනේ. ඒ අනුව, ක්‍රි.පූ. 3 වැනි සියවස තරම් ඈත අතීතයේ පවා, පිදුරංගල පර්වතය ආශ්‍රිතව සංඝාරාමයක් බිහිව තිබූ බවට සාධක ලැබී තිබේ. ඊට අයත් කටාරම් කෙටූ ගල්ලෙන් 14 ක් දැනට හඳුනාගෙන ඇති අතර ඒවා පූජා කිරීම පිළිබඳව කාලවකවානු සනාථ කරගත හැකි ශිලා ලේඛන 05 ක්ද දැකිය හැකිවේ.

ඉන් ලිපි හතරක්ම ක්‍රි.පූ. 3 - ක්‍රි.ව. 1 සියවස්වලට අයත් (පූර්ව බ්‍රාහ්මී) ලිපි වන අතර ඉතිරි ලිපිය ක්‍රි.ව. 5-7 සියවස්වලට අයත් වන්නකි.

හුදෙක් ලෙන් පූජා කිරීම පිළිබඳව තොරතුරු අන්තර්ගත මෙම ලිපිවලින් හෙළිවන තොරතුරු අනුව, මුල්කාලීනව පිදුරංගල විහාරයෙහි වැඩ විසූ භික්ෂූන්වහන්සේලාට ගල්ලෙන් සකස් කරවා පූජා කළ දායක දායිකාවන් තිදෙනෙකි. එනම්, තිස්සා දේවිය (නිශ දේවිය), කානිට්ඨ තිස්ස (කණික නිශ) හා ස්වාමි වූ ඵුස්ස (බත පුශ) යි.

ලිපි සඳහන් ලෙන් අතරින්, ලෙන් දෙකක්ම පූජා කර ඇත්තේ තිස්සා දේවියයි. එම ලිපිවල සඳහන් වන ආකාරයට ඇය, කොලගම ශිවගේ පුත්‍රයකු වූ ඔකඩිම (මද්දුම) ගේ දියණියයි. තවත් ලිපියකට අනුව ඇය, ගරෙදිඩගම විමනාදගේ භාර්යාව ලෙසින්ද හඳුනාගත හැකි වේ. මෙම තොරතුරු අනුව, ආරම්භක අවධියේදී පිදුරංගල විහාරයේ ප්‍රමුඛ පෙළේ දායිකාවක් ලෙස තිස්සා දේවිය හඳුන්වා දිය හැකි වේ. සෙනරත් පරණවිතාන මහතා, සිය 'පුරා විදු පරියේසන' නම් ග්‍රන්ථයෙහි පිදුරංගල විහාරයේ ඇති සුමනා දේවිය නම් කාන්තාවක් පිදූ ලෙන් පිළිබඳව සඳහන් කර තිබුණද, ලෙන් ලිපි අතරෙහි එවැනි නාමයක් හඳුනාගත නොහැකි නිසා, එනමින් සඳහන් කර ඇත්තේ තිස්සා දේවිය විය යුතු වේ.

මීට අමතරව, තවත් ගල්ලෙනක පූරාක්ෂර විද්‍යාව අනුව ක්‍රි.ව. 5-7 සියවස්වලට දින නියම කළ හැකි ලිපියක්ද වේ. මෙම වකවානුවට අයත් ලෙන් ලිපි ඉතා විරල බැවින් මෙය, සුවිශේෂ ලිපියක් ලෙස හැඳින්විය හැකිය. මහාචාර්ය සිරිමල් රණවැල්ල මහතා විසින්, ක්‍රි.ව. 1-2 සියවස්වලට අයත් යැයි සඳහන් කර ඇති මෙම ලිපිය, ඒ මහතා කියවා පරිවර්තනය කර ඇත්තේ, 'කටවිය ග්‍රාමයෙහි රිසමන අලය විසින් කරවූ ලෙන් ගෘහය' ලෙසිනි. එහෙත් එල්ලාවල මේධානන්ද හිමියන් එය කියවා පරිවර්තනය කර ඇත්තේ, 'කටයක ග්‍රාමයෙහි අභය නම් ශ්‍රමණයන් කරවූ ලෙන් ගෘහය' යනුවෙනි. උන්වහන්සේද මෙම ලිපිය, ක්‍රි.ව. 6-7 සියවස්වලට අයත් වන්නක් බව සඳහන් කර තිබේ.

ක්‍රි.පූ. 3 වෙනි සියවසේදී පිදුරංගල ආශ්‍රිතව ලෙන් විහාර සංකීර්ණය බිහිවීමට ප්‍රථම, මෙම ලෙන් ආශ්‍රිතව ප්‍රාග් ඓතිහාසික මානවයින්ද වාසය කර ඇති බවට 1989-91 වර්ෂවලදී කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම් අනුසාරයෙන් සනාථ වීය. එය පිදුරංගල ඉතිහාසය තුළ මානව ක්‍රියාකාරිත්වයන් පිළිබඳ මුල්ම සාධකයද වෙයි.

ක්‍රි.පූ. 3 වෙනි සියවසේදී බිහි වූ පිදුරංගල විහාරය, වඩාත් සංවර්ධිත තත්ත්වයකට පත්ව ඇත්තේ ක්‍රි.ව. 5-7 සියවස්වලදී බව හඳුනාගත හැකි වේ. මේ සඳහා කාශ්‍යප රජුගේ අනුග්‍රහය නොමඳව ලැබෙන්නට ඇතැයි සිතිය හැකිය. කාශ්‍යප රජු සිය දියණියන් දෙදෙනාගේ නම්ද යොදා සීගිරියට උතුරින් විහාරයක් කරවූ ලෙසින් සඳහන් කර ඇත්තේ යථොක්ත සංවර්ධන කටයුතු විය යුතුය.

පිදුරංගල පර්වතය පාමුල, දාගැබ, බෝධිඝරය, පිළිමගෙය, පොහොයගෙය හා මණ්ඩපය යන ගොඩනැගිලිවලින් සැදී 'පබ්බත විහාර' හෝ 'පංචායතන' නම් ආරාම සැලැස්මට අයත් විහාර සංකීර්ණයක්ද දැකිය හැකි වේ. මෙහි ශිලා ලේඛන කීපයක්ද දක්නට ලැබෙන අතර ඒවා, ක්‍රි.ව. 5-7 සියවස්වලට දින නියම කළ හැකිය. මෙම පූජනීය ගොඩනැගිලි සහිත පරිශ්‍රය වටා ප්‍රාකාරයක්ද ඇති අතර ඒ අවට ගොඩනැගිලි රැසකම නෂ්ටාවශේෂ දැකිය හැකි වේ.

මෙම ආගමික ගොඩනැගිලි පරිශ්‍රයට අයත් දාගැබ 1951 දී මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා යටතේ කැණීමට භාජනය කර තිබේ. එම කැණීමේදී හමු වූ ගඩොල්, සීගිරියේ ප්‍රධාන ඉදිකිරීම් අවධියට අයත් ගඩොල්වලට සමාන බැවින්, මෙම දාගැබද සීගිරියේ නිර්මාණ අවධිය හා සමකාලීන බව ඔහුගේ මතය විය. මෙම කැණීමේදී ක්‍රි.ව. 5 වෙනි සියවසට අයත් රෝම කාසියක් හා විශාල අඟුරු ස්තරයක්ද හමුවිය. මෙම අඟුරු ස්තරයට අනුව මෙම දාගැබ කාශ්‍යප රජු ආදාහනය කළ ස්ථානයෙහි ඉදිකරන ලද්දක් බව පරණවිතාන මහතාගේ අදහස විය.

ඒ අනුව, කාශ්‍යප රජු විසින් ආරම්භ කරන ලද මෙම විහාර කර්මාන්තය නිමවීමට පෙර, ඔහු මියයන්නට ඇතැයිද ඔහුගේ ආදාහන කටයුතු මෙම ස්ථානයෙහිම සිදුකොට, මෙම දාගැබද ඒ මතම ඉදිකරන්නට ඇතැයිද සිතිය හැකිය. ඇතැම් විට, මෙම දාගැබ කාශ්‍යප රජුගෙන් පසුව රජ පැමිණි මුගලන් රජු විසින් කරවන ලද්දක්ද විය හැකිය.

පිදුරංගල පර්වතය මුදුනෙහිද දාගැබ් යැයි සිතිය හැකි, ගරා වැටුණු ගඩොල් ගොඩැලි දෙකක් දක්නට ලැබෙන අතර ඒවා පිදුරංගල මුල්ම ආරාමීය අවධියට අයත් ඉදිකිරීම් සේ සැලකිය හැකිය. පැරණි ලෙන් විහාර ආශ්‍රිත පර්වත මස්තකයන්හි මෙවැනි දාගැබ් සුලභ ලක්ෂණයක් වුවත් එක ළඟ දාගැබ් දෙකක් දක්නට ලැබෙනුයේ කලාතුරෙකිනි. සීගිරියට සමීපව පිහිටි කළුදිය පොකුණ සංඝාරාමය හෙවත් දක්ඛිනගිරි විහාරය ආශ්‍රිත පර්වත මස්තකයෙහිද මෙවැනි දාගැබ් දෙකක් දැකිය හැකිය.

පර්වතය පාමුල පිහිටි විහාර සංකීර්ණයෙහි ඇති පිළිමගෙය, 2000-2001 වර්ෂවලදී මධ්‍යම සංස්කෘතික අරමුදලේ සීගිරිය ව්‍යාපෘතිය මඟින් කැණීමට භාජනය කරන ලදුව දැනට තහවුරු කොට තිබේ. මෙහි දොරටුවෙහි ක්‍රි.ව. 5-7 සියවස්වලට අයත් වහරල ලිපි හතක් සහිත ගල් පුවරුවක්ද දැකිය හැකිය.

දැනට මෙම පිළිමගෙය

14 වන පිටුව බලන්න




SPECIAL RATE
ON RENEWALS
&
INSURED
MORTGAGES
ANTON DHARMASEELAN
MORTGAGE AGENT
LIC #M14000425
Available Till Midnight
Including Weekends & Holidays
CALL ME FIRST FOR ALL
YOUR MORTGAGE NEEDS
PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY
416 704 1200
MAJOR BANKS - BEST RATES
ANTON@MYHOMEMLS.CA
MORTGAGE ALLIANCE
FAX: 1-800-566-3068

## කැනේඩියානු සංචාරයක මතකය .....



# රොකී කඳුවැටිය වටේ රවුමක් -6

## ලැව්ගිනි මැද්දේ උණු දිය උල්පතකින් නාන්නට ගිය ගමනක් ............

■ සටහන අනුරුද්ධ වැලිගමගේ
සේයාරූ- හෙසඳී වැලිගමගේ

බොහෝවිට ලැව්ගිනි ඇතිවන්නේ මිනිස් ක්‍රියාකාරකම් නිසා. කඳුවුරු බිම්වල ඉතිරි කර යන නොනිමුණු ගින්දර, සිගරට් කොට ගිම්හානයේදී වියැළී තිබෙන කැළෑ අවුලුවනවා. කැනඩාවේ බ්‍රිටිෂ් කොලොම්බියා සහ ඇල්බර්ටා පළාත්වල පමණක් වසරකට එවන් ගිනි 800 කට වඩා ඇවිලෙනවා. බලධාරීන් කෙතරම් වෙහෙස වුවත් එමගින් විනාශ වන, වන සම්පත අතිමහත්. ඒ වගේම ඒ ගස් යළි වගාවට අඩුම තරමේ අවුරුදු 20 කට වැඩි කලක් යනවා.

සංචාරක මතකයට ලැව්ගිනි බලපෑවේ රොකී කඳුවැටිය වටා යන ගමනේ කිහිප තැනකදීම අපට ක්‍රියාත්මක ලැව් ගිනි සේම ලැව් ගිනිවලින් විනාශ වූ පරිසර පද්ධති දකින්නට ලැබුණු නිසාත් ලැව් ගිනි හේතුවෙන් අපට යන්නට තිබු කෙටි දුර මාර්ග වසා තිබූ නිසා රවුමකින් ගොස් ගමන නිමාකරන්නට සිදුවූ නිසාත්. මෙවන් ගමනකට කාල කළමනාකරණය කරද්දී අපට ඒ ගැනත් හිතන්නට වෙනවා.

අපි ආයෙමත් ගමන පටන් ගත්තා. අද උදෙන්ම යන්නේ උණුවතුර ළිඳකට. ට්‍රාන්ස් කැනඩා අධිවේගී මාර්ගයේ ගෝල්ඩන්වලින් අංක 95 මාර්ගයෙන් හෝ බැන්ෆ්වල සිට එනවා නම් අංක 93 මාර්ගයෙන් මෙතැනට ළඟාවෙන්න පුළුවන්. අපි ආපසු යද්දී කෙටි අංක 93 මාර්ගය ලැව් ගිනි නිසා වසා තිබූ බැවින් අපේ ගමන කිලෝමීටර 110 කින් පමණ දික්වුණා. පැය 2 ක පමණ කාලයක් සහ ඉන්ධන අපතේ ගියා.

### රේඩියම් උණු වතුර ළිඳ
### Radium Hot springs



රොකී කඳු කලාපයේ උණු වතුර ළිං රැසක්ම තිබෙනවා. මගේ මිත්‍රයා මහීතේජ යෝජනා කළේ රේඩියම් උණුවතුර ළිඳ ඒ අතරින් හොඳම එක විදිහටයි. රේඩියම් උණුවතුර ළිං පිහිටා ඇත්තේ Kootenay ජාතික උද්‍යානය අද්දර ‘රේඩියම්’ ගම්මානයේ. ඇත්තටම කියනවා නම් අපි තාමත් ඉන්නේ බ්‍රිටිෂ් කොලොම්බියා පළාතේ.

රේඩියම් මුලද්‍රව්‍ය සමග බැදෙන රේඩොන් (Radon) ඉතා සුළු ප්‍රමාණයක් තිබෙන නිසායි මෙයට රේඩියම් යන නම ලැබී තිබෙන්නේ.

අනෙකුත් උණුවතුර ළිං සේම මේ ගැනත් මුලින්ම දැනගෙන තිබෙන්නේ ස්වදේශිකයින් (Indigenous). ඒ කාලයේ හැටියට මේ වනගත පළාත්වල පිටතින් මිනිසුන් වැඩිපුර ගැවසුණේ නෑ. කැනේඩියන් පැසිෆික් දුම්රිය මාර්ගය තැනීමට පැමිණි සේවකයින්ට මේ ගැන දැනගන්න ලැබී තිබෙන්නේ මෙම ස්වදේශික ජනයාගෙන්.

කලින් කලට වැඩි දියුණු වෙමින් පැමිණි මේ පරිශ්‍රය සැබැවින්ම යන්නට කදිම තැනක්. මෙහි නාන තටාක 2 ක් තිබෙනවා. ඉන් එකක පාලිත උෂ්ණත්වය සෙල්සියස් අංශක 44 ක් අනෙක සෙල්සියස් 29 ක්.

අපි ආයෙමත් ගමනේ. ගෝල්ඩන් හරහා ට්‍රාන්ස් කැනඩා අධිවේගී මාර්ගය දිගේ ලුවිස් විල කරා යන්නයි අපේ බලාපොරොත්තුව.

### ලුවිස් විල - Lake Louise



බැන්ෆ් කලාපයේ හැම්ලට් (Hamlet) ලෙසින් නම් ලබන ලුවිස් විල ප්‍රදේශය ලෝ පුරා පතල සංචාරක ප්‍රදේශයක් මුලින් Laggan ලෙසින් නම් ලද මේ ප්‍රදේශය ලුවිස් නම ලැබුවේ වික්ටෝරියා රැජිනගේ හතරවන දියණිය ලුවිස් කැරොලිනා ඇල්බර්ටා (Louise Carolina Alberta) නිසා. ඇයගේ සැමියා කලක් කැනඩාවේ ආණ්ඩුකාරවරයා වූ ජෝන් කැම්බෙල්. (Jhon Campbell)

ග්ලැසියර් කඳු පසුබිමේ පෙනෙන ලුවිස් විල නිල්පාට දියෙන් පිරී ඉතිරී මවන්නේ ඉතාමත් දර්ශණීය දසුනක්. මාළු බාන්නට, බෝට්ටු පදින්නට, ඇවිදින්නට සේම බයිසිකල් පදින්නටත් ලොව වටා සංචාරකයින් මෙහි ඇදෙන නිසා මෙහි නවාතැන් මිලෙන් අධිකයි. ග්‍රිස්ලි වලසුන් (Grizzly bear) දැකිය හැකි ගොන්ඩෝලා චාරිකාව ඇතුළු විනෝදාස්වාදය ගෙන දෙන අංග රැසක් මේ ප්‍රදේශයේ තිබෙනවා.

### මොරෙයින් විල - Moraine Lake



ලුවිස් විලේ සිට විනාඩි 20 ක පමණ දුරින් මොරෙයින් විල පිහිටා තිබෙනවා. කඳු මුදුන් 10 නිම්නයේ පිහිටා ඇති මෙය තවත් දර්ශණීය ග්ලැසියර දිය පිරි විලක්. ගස්වල කොටන් දියේ ගසාගෙන විත් එකතු වූ විල් කොනේ ගල්තලාවක් මතට නැග පැය ගණනක් වුවත් ගත කරන්නට පුළුවන්. බෝට්ටු පදින්නට, ඇවිදින්නට, කඳවුරු බිමක මේ තරම් ලස්සන තවත් තැනක් නැහැ.

### ජොන්ස්ටන් ආගාධය සහ දියඇලි
### Jhonston Canyon lower & Upper Falls

අප රොකී කඳු ගමනේදී මුලින් දුටු බෝ විල දියෙන් පුරවන බෝ ගංගාව මේ ප්‍රදේශයේදී අලංකාර දිය ඇලි දෙකක් මවනවා. ඒ පහළ ඇල්ල සහ ඉහළ ඇල්ල විදිහට.

දිය පහර දිගේ ඉදිරියට යන මාර්ගය හරිම දැකුම්කළුයි. ගමන අවසානයේදී ඔබට කුඩා ගුහාවකින් එබී දිය ඇල්ල දකින්න පුළුවන්. ඇල්ලෙන් විසිරෙන දිය පහර මවන මීදුම සහ පින්න ඔබව තෙත් කරාවි.

ඔබ දුම්රිය වැනි පොදු ප්‍රවාහන මාධ්‍යයක් පාවිච්චි කරන්නේ නම් මේ සංචාරක ඉසව් සදහා ඔබව ගෙන යන Parks Canad බස්රථ දුම්රියපොළ සහ බැන්ෆ් නගරයේ ස්ථාන කිහිපයක සිට ක්‍රියාත්මක වෙනවා .

මේ ප්‍රදේශයේත් බයිසිකල් පදින්නට සහ ඇවිදින්නට trails සකස් කර තිබෙන්නේ මෙය බැන්ෆ් වන රක්ෂිතයේ පිහිටා තිබෙන නිසා.

මේ ලිපි පෙළ හරහා ඔබ කැනේඩියානු පරිසරයේ රුව, ගුණ විඳින්නට ඇතැයි සිතනවා. අන්තර්ජාලයෙන් තවත් විස්තර සොයාගෙන ඔබම මේ ගමන ගියොත් අපට වචනවලින් කුඩා ඉඩක සටහන් තබන්නට බැරි බොහෝ දේ ඔබේම පසිඳුරන්ගෙන් විදින්නට පුළුවන් වේවි.



**මීළඟ කලාපයෙන් ජුරාසික් පාක් සිට එලන්ගේ ජනප්‍රිය රූපවාහිනී වැඩසටහන් තැනෙන හොලිවුඩ් පුරයට යමු.**

**ඔබේ ඉල්ලීම් සහ තොරතුරු සඳහා අලුත් විද්‍යුත් ලිපිනයක් පටන් ගත්තා.**
dasatha.sancharayakamathakaya@gmail.com
**විස්තර සඳහා ලියන්න. ඉඩ ලැබෙන පරිදි පිළිතුරු ලියන්නම්.**





# ළමා පිටුව - CHILDREN'S CORNER

## ගොවියාගේ තෑග්ග



එකමත් එක රටක ගොවිරාළ කෙනෙක් හිටියා. මේ ගොවිරාළ හරිම කඩිසරයි. ධෛර්යවන්තයි. මහන්සි වී වැඩ කළා. වැඩ පටන් ගැනීමට කලින් කොරටුව පුරා ඇවිදිමින් ගස් වැල් සමග ආදරයෙන් කතාබස් කිරීම මේ ගොවිරාළගේ පුරුද්දක්. එදාත් එහෙම කතා කරමින් ගිහින් කොමඩු යාය ළඟ නතර වුණා.

“මොනවා.... මේක නම් හරිම පුදුමයක්... මෙපමණ විශාල කොමඩු ගෙඩියක්...”

ගොවිරාළට ඇස් අදහගන්න බෑ. කොමඩු වැලේ මහ විශාල පැණි කොමඩු ගෙඩියක්. ඇත්තටම ඒක යෝධ කොමඩු ගෙඩියක්. ගමරාළ තනියම කියෙව්වා.

“මේ තරම් ලොකු කොමඩු ගෙඩියක් මේ පළාතේ නෙවෙයි මේ රටේ නෙවෙයි මේ ලෝකේවත් නැතිව ඇති. මම දැන් මොකද මේකට කරන්නේ...”

ගොවිරාළ කල්පනා කළා. ඒත් ඔහුට කිසිම දෙයක් ඔළුවට ආවෙ නෑ. ඒ නිසා එයා ගෙදර දිව්වා.

“හාමිනේ.... හාමිනේ.... මෙහාට ආව නම්....”

“මොකදෑ මේ කලබලය. ඇයි මේ ආයෙමත් ආවේ...”

“මහා පුදුමයක් පෙන්වන්ට ඉක්මනට යමුකො මගේ කොරටුවට.”

ගොවිරාළ එයාගේ හාමිනේවත් එක්කගෙන ආයෙමත් කොරටුවට ආවා. කොමඩු ගෙඩිය දැක්ක ගමන් ගොවි ගෙදර හාමිනේත් කතා කරගන්න බැරි තරම් පුදුම වුණා.

“අප්පේ.... මේ යෝදයා කොහොමද අපේ වත්තෙ එල ගත්තේ..... අම්ම මුත්ත කාලෙවත් මේ වගේ ලොකු කොමඩු ගෙඩියක් මම දැකලා නෑ” හාමිනේට කියවුණා.

“ඕවා ඉතිං මගේ උත්සාහය තමයි... ” ගොවිරාළ උජාරුවෙන් කිව්වා.

“හා හා දැන් පුදුම වුණා ඇති. කියමුකො බලන්න මොකද දැන් අපි මේ යෝද කොමඩුවට කරන්නේ... මේක අපි පොළට ගිහින් විකුණමුද?” ගොවිරාළ ඇසුවා.

“මෙච්චර ලොකු කොමඩු ගෙඩියක් ගන්න තරම් වත්කමක් තියෙන කෙනෙක් පොළට එන එකක් නෑ. එහෙම වුණොත් අපිට අඩු ගානකට මේක දෙන්න වෙයි” ගම හාමිනේ කොමඩු ගෙඩිය පොළට ගෙනියන්න එකඟ වුණේ නෑ.

“එහෙමනම් අපි මේක රටේ පළතුරු දැක්මට තියමු. එතකොට ලොකු මුදලක් වගේම ලොකු තෑග්ගකුත් ලැබේවි”

“ඒක කොහොමද කරන්නෙ.. එහෙම එකක් අද හෙට නෑ නොවැ. කල් ගියොත් මේක ගහේම කුණු වෙලා යාවි” ගොවිරාළ ගෙනාව ඒ යෝජනාවත් හරි යන එකක් නොවෙන බව හාමිනේ පෙන්නල දුන්නා.

“එහෙම නොවෙයි, අපි මේක රජතුමාට තෑග්ගක් විදියට දෙමු. මේ රටේ හැදුණු ලොකුම කොමඩු ගෙඩිය දුන්නම රජතුමා අපි ගැන සතුටු වෙයි.”

“අන්න ඒ අදහස හොඳයි. අපි හෙට උදෙන්ම රජ මාලිගාවට යමු” කියා ගොවියාත් ඊට එකඟ වුණා.

ඒ රටේ රජ්ජුරුවන්ට අමුතු පුරුද්දක් තිබුණා. ඒ රාත්‍රියට වෙස් වළාගෙන රටේ ගමක් ගමක් පාසා ඇවිදීම. මෙහෙම ඇවිදීමෙන් රටවැසියන්ගේ සැබෑම තොරතුරු, දුක සැප රජුගේ ඇස් දෙකෙන්ම දැක බලාගත්තා. එදාත් ඒ වගේ වෙස් වළාගෙන ඇවිදින දවසක්.

එදා රජතුමා ගියේ ගොවිරාළගේ ගෙදර තිබුණු පැත්තෙන්. ගොවි ගෙදර ළඟමනෙ කොරටුව තියෙන්නෙ. එහෙම යද්දී කොරටුවේ තිබුණු අර මහ විශාල කොමඩු ගෙඩිය හඳ එළියට දිලිසි දිලිසි තියෙනවා දැක්කා. මේ යෝද කොමඩුව දැක්කම පුදුම වුණු රජු කොමඩුවේ අයිතිකාරයා සමග කතා කරන්නට හිතුවා. ඒ අසළම තිබුණු ගොවි ගෙදර දොරට තට්ටු කළා. පසුවදා රජ මාළිගාවට යන ගමන ගැන සිත සිතා නින්දත් නොනින්දත් අතර හිටිය ගොවියා ඇවිත් දොර ඇරියා. දොර ළඟ හිඟන්නෙක් වගේ මිනිහෙක්....

“මොකද මොකද මේ මහ රෑ දොරවල්වලට තඩි බාන්නේ... ”

“අනේ උන්නැහේ මම අසරණ මිනිහෙක්. මට උපකාරයක් කරන්න”

“මොනවද ඕන... කියමුකො බලන්න”

“මම දැක්කා ඔහේගේ වත්තේ ලොකු කොමඩු ගෙඩියක් තියෙනවා. මට ඒක දෙනවද?”

“මොකක් කිව්වේ...? ඒක කොහොමද තමුසෙට දෙන්නේ... ඒක කරන්න බෑ... යනවා යනවා... මට කරදර නොකර යන තැනක යනවා” තරහින් වෙව්ලමින් ගොවියා කිව්වා.

“අනේ ඉතිං අසරණ මිනිහෙක් යමක් ඉල්ලුවාම ඔහොම එළවගන්න හොඳද? මට පිහිට වෙන්න”

“ඒක කොහොමද තමුසෙට දෙන්නෙ... ඒක මම හෙට අපේ රජ්ජුරුවන් වහන්සේට තෑගි කොරන්න ඉන්නෙ. හෙට උදෑසනම මායි මගේ මායියයි රජ ගෙදරට යනවා”

වෙස් වළාගෙන හිටිය රජතුමාට මේක ඇසුණම හරිම සතුටුයි. ඒක නොපෙන්වා රජතුමා මෙහෙම ඇසුවා.

“අනේ හොඳයි... ඒත් රජතුමා මේක එපා කිව්වොත්?”

“එහෙම වුණොත් රජා වුණත් මම වැඳ වැටෙන්න යන්නෙ නෑ.. කොමඩු ගෙඩියත් අරන් ආපහු එනවා....” කියූ ගොවියා ‘දඩාස්’ ගා දොර වසාගත්තා.

ගොවියා කතා කළ විදිය ගැන පුදුම වෙමින් රජුත් මාලිගාවට ආවා.

ඔන්න පහුවදා පාන්දරම ගොවිරාළ අර යෝද කොමඩුවත් කරපින්නාගෙන හාමිනේත් එක්ක රජ මාළිගාවට ගියා. රජතුමා ළඟට ගියා විතරයි ගොවිරාළ බයෙන් බිරාන්ත වුණා. ඉස්සරින්දා රෑ තමන්ගේ නිවසට ආවේ රජ්ජුරුවෝ බව ගොවිරාළ ඇඳින ගත්තා. ඒත් ඒ බව රජ්ජුරුවන්ට ඇඟවෙන්නෙ නැතිවෙන්න ගොවියා හැසිරුණා. රජු ළඟට ගිහින් අවසර ගෙන මෙහෙම කිව්වා.

“අවසරයි දේවයන් වහන්ස, අපි ආවෙ මේ කොමඩු ගෙඩිය ඔබ වහන්සේට තෑගි කොරන්න. මේ වගේ යෝද කොමඩු ගෙඩියක් ඔබවහන්සේ මීට පෙර දැකලවත් නැතිව ඇති.”

රජතුමාත් ගොවියා ගැන වැඩි සැලකිල්ලක් නොදක්වා...

“හොඳයි... මම දැන් මේ කොමඩු ගෙඩියට කැමති නැති බව කිව්වොත්...?” කියා ඇසුවා.

ගොවියාත් කලබල වුණේ නෑ... හීනියට හිනාවක් මුවට නංවාගෙන.....

“තරහ අවසර මහරජතුමනි, ඔබ වහන්සේ මෙයට අකමැතියි වුණොත් මම කියන දේ ඔබතුමා දැනටමත් දන්නවනේ” යි පැවසුවා.

රජතුමාට සිනා ගියා. සිනා වෙවී මේ විදියට කිව්වා.

“හොඳයි හොඳයි උඹ දක්ෂයෙක්. හොඳ ගොවියෙක්. මං උඹේ තෑග්ග සතුටින් පිළිග න්නවා. මේක තමයි මට ලැබුණු වටිනාම හොඳම තෑග්ග”

ගොවිරාළටත් ගොවි හාමිනේටත් හරිම සතුටුයි. රජුට වැඳ වැටෙමින් ඔවුන් යන්නට හැරුණා. එතකොටම රජතුමා මහා සද්දෙන් මෙහෙම කිව්වා.

“ඇමතිය, මේ ගොවිරාළට ඇතෙක් බරට වස්තුව ලබාදෙන්න කියා මා අණ කරනවා. ඒ මේ යෝද කොමඩු ගෙඩිය මට ගෙනවිත් දුන් නිසා නොවෙයි. ඔහු තැනට සුදුසු නුවණින් කටයුතු කරන්නෙකු සහ නිර්භීත පුද්ගලයෙකු නිසා.”

රජුගේ කතාවට රාජසභාවම අත්පොළසන් දුන්නා. ගොවිරාළයි හාමිනෙයි හරිම සතුටින් තමන්ට ලැබුණු වස්තු සම්භාරයත් රැගෙන ගම බලා පිටත් වුණා.

## පුංචි අපට ගී

### සුළඟක් වී මං යනවා

සුළඟක් වී මං යනවා
දුර අහසේ ඇවිදින්නට
අප්පච්චී කොහොමද
මං අල්ලන්නේ

අහසක් සේ දූ යන මඟ
පුළුන් වලා අතුරනවා
එහෙමයි මගෙ දෝණී
මං රැකගන්නේ
පණ වාගෙයි මගෙ දූ
මං රැකගන්නේ

මහ ගංවතුරක් වීලා හරි වේගෙන් මං ගලනව
ලොකු ගස් වැල් කඳු වැටි හෙම උදුරා පොළොවට
දමනව
අප්පච්චී කොහොමද
මං වළකන්නේ

මං මහ මුහුදක් වෙනවා දූ එනතුරු තනි රකිනව
ආදරයෙන් මඟ බලනවා තුරුළට ගෙන සනසවනවා
මං ළඟ නොවැ දූ
හැමදා සැනසෙන්නේ

මං බොරු තරහක් ගන්නව ඇස් රතු වෙනකල් අඬනව
තුරුළට අරගෙන හිටියත් නැළවෙන් නැතුවම ඉන්නව
අප්පච්චී කොහොමද
මං නළවන්නේ

දූටත් වැඩියෙන් හයියෙන් එතකොට නම් මට ඇඬෙනව
දූගෙ කඳුළු මං ගන්නවා දූ නැළවෙන කල් අඬනවා
මං ඇඬුවම දූ
නොවැ මා නළවන්නේ

පද පෙළ: ආනන්ද හේවාරංහිඳගේ
තනුව හා සංගීතය: රෝහණ ධර්මකීර්ති
ගායනය: එඩ්වඩ් ජයකොඩි
නතාෂා පෙරේරා








කාලෙත් එක්ක ගොඩක් දේවල් වෙනස් වෙලා. දැන් උපන් දින සුබ පැතුම් තැපැල් කළ කාලෙ ඉවරයි. ඒක මුහුණු පොතට බාර වෙලා. සුවඳ කැවූ පාට පාට කොළවල මුතු අකුරින් ලියැවුණු පෙම්පත් නැති වෙලා. කෙටි පණිවුඩ ඒ රාජකාරිය කරනවා. පුටුවෙ හරිබරි ගැහිලා පත්තර බලපු අය පරිගණක තිරේට එබිලා එහෙමත් නැත්නම් ජංගම දුරකථනයේ මූණත දිහා බලලා පත්තර කියවනවා.

එතකොට මුද්‍රිත පොතපත වෙනුවට ආ විකල්පය තමයි 'බ්ලොග් අඩවි'- Blog Sites' පහුගිය දවසක සිංහල බ්ලොග් අඩවි දිහා බලද්දි ඇස ගැටුණු අපූරු අලුත් බ්ලොග් අඩවියක් තමයි 'අහස් ගව්වෙන් එහා ලෝකය......'

අහස් ගව්වෙන් එහා ලෝකය මව්බිමෙන් බැහැරව ජීවත් වන ශ්‍රී ලාංකිකයෙක් ලෝකය දිහා බලන අපූරු ඇහැක් විදිහට හඳුන්වන්නත් පුළුවන්. එහි විශේෂත්වය ඒ තුළ ලිඛිත තොරතුරු, සේයා රූවලට අමතරව ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය දෙකම සම්බන්ධ කරන ගුවන් විදුලි සහ රූපවාහිනී වැඩසටහන් අඩංගු වීමයි. අහස් ගව්වෙන් එහා ලෝකය රචකයා තමන් ගැන හදුන්වා දෙන්නේ මෙහෙමයි.

'මං රස්සාවට ලියන්නෙක් නෙවෙයි. උසස් පෙළට ජීව විද්‍යා විෂය ධාරාවෙන් ඉගෙන ගෙන ලංකාවෙ බැංකුවක ඉලක්කම් එක්ක ඔට්ටු වෙච්ච මං කැනඩාවෙත් රස්සාවට කරන්නෙ ඒකයි.'

'මම ලියන කියන එක පටන් ගත්තෙ හතරෙ පන්තියෙදි විජය පත්තරෙන්. ලේක්හවුසියේ මිහිර, විදුනැණ, නවයුගය, සිළුමිණ (විශ්ව මහිම පිටුව), කල්පනා, පෙරමග සහ දෙසතියට විශේෂාංග ලේඛකයෙක් විදිහට ලිව්වෙ ඊට පස්සෙ.'

'මාතර රාහුලේ ඉගෙන ගත්ත කාලෙ ශ්‍රී ලංකා ගුවන් විදුලියේ රුහුණු සේවයට සම්බන්ධ වුණේ 'රුහුණු ළමා රඟමඩලේ' ළමා ශිල්පියෙක් විදිහට හඬ කවන්න, පිටපත් ලියන්න. කොළඹ ඩී. ඇස් එකට ආවට පස්සෙ ජාතික රූපවාහිනියේ ළමා ගී ලියන්නත්, ටෙක් නිර්මාණ පදනමේ වීඩියෝ නිෂ්පාදන වැඩමුළුවකටත් සහභාගී වෙන්නත් පුළුවන් වුණා.

1996-2001 කාලෙදි සිරස, එම් ටී වී සහ ශක්ති ටී වීවල සති අන්ත පුවත් නිෂ්පාදකවරයා විදිහට වැඩ කරන්නත් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ජන සන්නිවේදන ඩිප්ලෝමාව ගන්නත් හැකිවුණේ මාධ්‍ය ගැන තිබුණු උනන්දුව නිසා.



පවුල් වෙලා, කැනඩාවට ඇවිත් ටිකක් පිළිවෙලක් වුණාට පස්සෙ ආයෙමත් ලියන්න, හඬ කවන්න රූප මාධ්‍යයෙන් යමක් කරන්න පටන් ගත්තෙ ඒ ගැන තියෙන ආසාව හින්දා.'

මේ බ්ලොග් අඩවියේ රචකයා 'දසත' කියවන ඔබට අමුත්තෙක් නොවෙයි. වසර 2 ක් තිස්සෙ 'දසත සංචාරයක මතකය' ලිපි පෙළ තුළින් ඔබව ලෝකය වටා සංචාරයක ගෙනයන්නෙ ඔහුයි. නමින් 'අනුරුද්ධ වැලිගමගේ'.

අනුරුද්ධ කැනඩාවෙන් වෙබ් ගත වන වසන්ත ලංකාතිලකයන්ගේ 'සවන' ගුවන් විදුලියට 'දින නැති දිනපොත' නමින් රේඩියෝ කෙටිකතාවක් කරනවා. හැම සෙනසුරාදාවකම හවස 4 ට ඔබට අලුත් කථාවක් අහන්න පුළුවන්.

## සීගිරියටත් වඩා...

10 වන පිටුවෙන්

තුළ පද්මාසනයක් හැරුණු විට, ප්‍රතිමා කිසිවක් දැකිය නොහැකිය. මෙම විහාර සංකීර්ණයට අයත් බෝධිඝරයෙහි කැණීම් කටයුතු සීගිරිය ව්‍යාපෘතිය මගින් මේ දිනවල සිදු කෙරෙමින් පවතින අතර දැනට එම සැලැස්ම පිළිබඳ පැහැදිලි සාධක රැසක්ම හඳුනාගත හැකිව තිබේ.

මේ හැරුණු විට, පර්වත මුදුනට සමීපව නැගෙනහිර දෙසට මුහුණ ලා ඇති මීටර් 90 ක් පමණ දිගැති සුවිශාල ගල් ලෙනක කෙළවරෙහි මීටර් 12 ක් පමණ දිගැති ගඩොලින් හා බදාමයෙන් කළ සැතපෙන පිළිමයක්ද දක්නට ලැබේ. නිදන් සොරුන් විසින්, හිසට, උදරයට හා දෙපාවලට හානි කරන ලදුව දැනට තහවුරු කොට ඇති මෙම පිළිමය, අනුරාධපුර යුගයට අයත්, දැනට ඉතිරිව ඇති ගඩොලින් හා බදාමයෙන් කළ පිළිම අතළොස්ස අතරින් එකකි. මෙම පිළිමයද සීගිරි මාළිගය හා සමකාලීන යැයි සෙනරත් පරණවිතාන මහතාගේ අදහසයි. අමරාවතී සම්ප්‍රදායය අනුව නිර්මාණ කර ඇති මෙම පිළිමයෙහි මිනුම් ප්‍රමාණයන් උත්තම නව තාල ක්‍රමය හා සැසඳේ.

මෙම පිළිමය ඉදිරිපස ගල් තලාවෙහි ක්‍රි.ව. 5-7 සියවස්වලට අයත් ශිලා ලේඛනයක්ද දැකිය හැකි වන අතර දොලගනයුනක නම් ගමෙහි වබ නම් උළු වඩුවෙකු විසින් කරන ලද කහවණු සහ වී පූජාවක් පිළිබඳව එහි සඳහන් වේ.

මෙම පිළිබඳ සහිත ලෙනෙහි සෙසු කොටස, කුටිවලට වෙන් කර ඇති අතර සම්පූර්ණ ලෙනෙහිම එවැනි කුටි 12 ක් හඳුනාගත හැකිවේ. ඒ සෑම කුටියකම බිත්තිවල සිතුවම් ඇඳ තිබූ බව සනාථ කෙරෙන වර්ණ සහිත බදාම කොටස්ද තැනින් තැන ශේෂව පවතී.

දැනට විහාරගෙය ලෙස භාවිතයට ගැනෙන තිස්සා දේවිය විසින් පිදූ ගල්ලෙන, ආශ්‍රිත විහාර කර්මාන්තයෙහි මූලාරම්භය මහනුවර යුගයේදී සිදුවී ඇති අතර එම පිළිම සහ සිතුවම් බොහොමයක්ම දැනට වසර 70 කට පමණ ඉහතදී නවීකරණය කොට නව අංගඳ එක්කොට තිබේ. මෙහි ඇති මීටර් 3 ක් පමණ උසැති, වර්ණාලේපිත හිටි පිළිම දෙක, හුණුගලින් නිමවා ඇති අතර ඒවා ක්‍රි.ව. 8-9 සියවස්වලට අයත් බව පෙනේ. මෙම පිළිම දෙක, යාබද පබ්බත විහාර සංකීර්ණයෙහි තිබී, මහනුවර යුගයේදී මෙම ස්ථානයට රැගෙන එන්නට ඇතැයි පරණවිතාන මහතාගේ අදහසයි. මෙම ලෙන තුළ මහනුවර යුගයට අයත් විෂ්ණු හා සමන් දේව ප්‍රතිමා දැනුදු පැරණි තත්ත්වයෙන්ම දැකිය හැකිය. ලෙනෙහි එක් කෙළවරෙක ඇති විෂ්ණු දේවාලය, ප්‍රදේශවාසීන්ගේ ඉමහත් භක්ත්‍යාදරයට පාත්‍රව ඇත්තකි.

මුල්කාලීනව පිදුරංගල විහාර සංකීර්ණයෙන් හමුවී ඇති පුරා වස්තු දැනට අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයෙහි තැන්පත් කොට ඇති අතර, කිරිගරුඬෙන් කළ කැටයම් එලක තුන ඒ අතරින් සුවිශේෂී නිර්මාණ වේ. බුද්ධ චරිතයේ අවස්ථා නිරූපනය කෙරෙන මෙම එලක ක්‍රි.ව. 4-5 සියවස්වලට අයත් බවත්, ඒවා දකුණු ඉන්දියාවේ ආන්ද්‍ර දේශයෙන් මෙරටට ගෙන්වන්නට ඇති බවත් පරණවිතාන මහතා සඳහන් කරයි.

මෙසේ සියවස් ගණනාවක ඉතිහාසය කැටිකර ගත් පිදුරංගල විහාරය අදද විශාල ශාසනික සේවාවක් ඉටුකරමින් සීගිරි ඉතිහාසය තුළ සැඟවුණු ආගමික පසුබිම පිළිබඳව වැදගත් තොරතුරු රැසක්ම අප හමුවේ ගෙනහැර පායි.



# සංඝ භේදය



■ **දයා සරත්චන්ද්‍ර** (B.Sc, B.Ed, M.Sc, Ph.D)

දසත ජූලි කලාපයේ පළ වූ 'බුදු දහම ලෙස මුළා විය හැකි සද්ධම්ම ප්‍රතිරූපකයෝ' ලිපිය කියවූ කිහිප දෙනෙක්ම පටිච්චසමුප්පාදය පටි+ඉච්ඡ+සම+උප්පාද ලෙස කඩා පටිච්චසමුප්පාදය යනු කැමැත්තෙන් බැඳීම ලෙසත්, අනිච්ච යනු අනි+ඉච්ඡ ලෙස කඩා කැමති නොවීම වැනි අර්ථයක් ලෙසත් ප්‍රකාශ කරන අයත්, ඒ බව ප්‍රචාරය කිරීමට උදවු කරන අයත් පාප කර්මයක් කරගන්නවා නොවේදැයි මගෙන් විමසූහ. එබැවින් ධර්මධර ස්වාමීන් වහන්සේලා කීප නමක් ඇතුළු සූත්‍ර දේශනා පිළිබඳව සොයා බලන කීප දෙනෙකු සමගින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව 'සංඝ භේදය' යනු කුමක්දැයි කෙටි ලිපියක් ලිවීමට අදහස් කළෙමි.

ආනන්තරිය කර්ම පහෙන් (5) එකක් වන (පංචානන්තරිය කර්ම) සංඝ භේදය යනු සංඝයා වහන්සේලා දෙනමක් නොහොඳ නෝක්කාඩු කිරීම නොවේ. බුදුරජාණන් වහන්සේ නොවදාරන ලද දෙයක් බුද්ධ දේශනාව ලෙස ප්‍රචලිත කොට භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකාවන් බුද්ධ දේශනාවෙන් බැහැර කිරීම සංඝභේදය වේ.

ඔබ බෞද්ධ පරිසරයක හැදී වැඩුණේ නම් යම් කිසිවෙකු අතින් සිදුවිය හැකි ඉතාමත්ම බලවත් පාපකර්මයන් 5 න් එකක් වන සංඝ භේදය ගැන අසා ඇතුවාට සැකයක් නැත. අප කිසිවෙකුත් දැන දැන නම් සංඝ භේද පාපකර්මයට දායක නොවේ. එහෙත් අප නොදැනුවත්වම මෙම පාපකර්මය කිරීම සඳහා දායක වී ඇතිදැයි සොයා බැලීමේ කාලය පැමිණ තිබෙන බව කණගාටුවෙන් යුතුව වුවද මතක් කළ යුතුව ඇත. සංඝභේදය නොවූවත්, සංඝභේදය සඳහා උදවු දීමම බලවත් පාප කර්මයක් බව සංඝයා වහන්සේලා කීප නමක්ගේම අදහස විය.

ඛුද්දක නිකායේ සංඝ භේද සූත්‍රයේදී (ඉතිවුත්ත පාලි) බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කොට ඇත. 'මහණෙනි' ලෝකයේ එකම අකුසල ධර්මයක් බොහෝ දෙනාට අවැඩ පිණිස, බොහෝ දෙනාට නොසැප පිණිස, බොහෝ දෙනාට අනර්ථය පිණිස, දෙවි මිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස උපදී. කවර ධර්මයක්ද යත් සංඝ භේදය වේ'

සංඝයා වහන්සේලා දෙනමක් භේද කිරීම සංඝ භේදය ලෙස බොහෝ දෙනෙක් සිතන නමුත් එවැන්නක් බුදුරජාණන් වහන්සේ දේශනා කර නැත. අංගුත්තර නිකායේ උපාලි සංඝ භේද සූත්‍රයේදී (දසක නිපාතය) උපාලි මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විචාලහ. "ස්වාමිනි, සංඝ භේදය, සංඝ භේදය යැයි කියයි. කොපමණකින් සංඝයා බිදුණේ වේද?" බුදුරජාණන් වහන්සේගේ පිළිතුර වූයේ, "උපාලිය මේ ශාසනයෙහි මහන තෙම අධර්මය ධර්මය යැයි ප්‍රකාශ කරත්ද, ධර්මය අධර්මය යැයි ප්‍රකාශ කරත්ද, විනය නොවූවක් විනය යැයි ප්‍රකාශ කරත්ද, තථාගතයන් වහන්සේ විසින් නොවදාරන ලද දෙයක් වදාරන දෙයක් ලෙසද, නොකියන ලද්දක් කියන ලද්දක් ලෙසද ප්‍රකාශ කරත්ද....." ආදි වශයෙන් දස ආකාරයකට බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මයත්, විනයත් විකෘත කිරීම සංඝභේදය බවයි.

මෙසේ ධර්මය සහ විනය විකෘතව දේශනා කිරීම නිසා සංඝයා භේද වීම නිමිති කොට "ඔවුනොවුන් විවාදයෝ වෙති. එකිනෙකා භය ඉපදවීම් වෙති. ඔවුනොවුන්ගේ පිරිහෙලා කියන ගර්හාවෝ වෙති. ඔවුනොවුන් බැහැර කිරීම් වෙති. ඒ සංඝ භේදය හේතු කොටගෙන නොපැහැදුනු අය නොපහදිත්. පැහැදුනා වූ සමහරුන්ගේ පැහැදීමේ වෙනස් බව වෙත්" යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාළ සේක. (ඛුද්දක නිකාය. ඉතිවුත්ත පාලි)

බුදුරජාණන් වහන්සේ විස්තර කොට වදාළ මෙම සංඝ භේදය අද බෞද්ධ සමාජය තුළ සිදු නොවන්නේද? පටිච්චසමුප්පාදය, වෙනත් වචනවලින් කිවහොත් ඉධප්පච්චතාවය නැතිනම් හේතුව ඇති විට පමණක්ම, ආකාලිකවම ඵලය පවතී යන ධර්මතාවය, එසේත් නැතිනම් නාමරූප - විඤ්ඤාණ එකිනෙකට ප්‍රත්‍ය බව, පටි+ඉච්ඡ+සම+උප්පාද ලෙස කඩා පටි යනු බැඳීම ලෙසත් ඉච්ඡ යනු කැමැත්ත බවත් පවසා පටිච්චසමුප්පාදය යනු කැමැත්තෙන් බැඳීම ලෙස ධර්මය නොදන්නා අය අතර විකෘත ධර්මයක් ප්‍රචලිත කිරීමට කටයුතු කරන අයගේ උත්සාහය සංඝ භේදය නොවේද? දිනක් ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසූහ. " ස්වාමීනි, කොපමණකින් වනාහී පටිච්ච සමුප්පාදයෙහි දක්ෂ වූ භික්ෂුවකැයි කීමට සුදුසු වේද?" බුද්ධ දේශනාව වූයේ "ආනන්ද, මේ ශාසනයෙහි මහණ තෙම මෙසේ දැනගනීද, මෙය ඇති කල්හි මෙය වේ. මෙය ඉපදීමෙන් මෙය උපදී. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ. එනම් අවිද්‍යාව ඇති කල්හි සංස්කාරයෝ වෙති. ආදි වශයෙනි. (බහුධාතුක සූත්‍රය - මජ්ඣිම නිකාය)

නිරපේක්ෂතාවයේ මග, ආලෝකෝ උදපාදි, ධර්මයයි ඔබයි, සංදේශනාව වැනි ශධඹඔඹර්ඃ නම්වලින් එකම මූලාශ්‍රයකින් බිහි වූ කණ්ඩායමක් විසින් පටි+ඉච්ඡ ලෙස අධර්මය පැතිරවීමට කරන උත්සාහය මගින් සංඝභේදය නම් මහා පාපකර්මයට දායක වීමට කීප දෙනෙක්ම කරන උත්සාහය නම් ඉතාම කණගාටුදායකය. ඉතාම ධර්මධර ස්වාමීන් වහන්සේ නමක් මෙවැනි වෙබ් අඩවි සහ ශධඹඔඹර්ඃ කිහිපයක් නරඹා ධර්ම දේශනාවකදී දේශනා කළේ පටි+ඉච්ඡ හෝ අනි+ඉච්ඡ ලෙස කරන දේශනාවන් විෂ සහිත කෝටුවක වටේට අයිස්ක්‍රීම් තවරා නොමිලයේම ගෙනැවිත් දෙන රසකැවිල්ලක් ලෙස සැලකිය යුතු බවයි.

තම තමාගේ නම ඉස්මතු කිරීමට උත්සාහ කරමින් අද කාලයේ කරන ධර්ම ප්‍රචාරක කටයුතුවලදී තම කණ්ඩායම පමණක් පිරිසිදු බුදු දහම දේශනා කරන බව පැවසීම අද බෞද්ධ විලාසිතාවක් බවට පත්ව ඇත. බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළේ යම් යම් පුද්ගලයින්ගේ ප්‍රඥාව වැඩී ඇති ආකාරය අනුවය. මුල්ම ධර්ම දේශනාව වූ 'ධම්මචක්කප්පවත්තන' සූත්‍රය දේශනා කළේ කිසි දිනක ධර්මය අසා නොතිබූ පුද්ගලයින් පස් දෙනෙකුටය. එහෙත් දෙවැනි ධර්ම දේශනාව ලෙස අප දන්න 'අනන්තලක්ඛණ' සූත්‍ර දේශනාව සිදුකළේ පළමු ධර්ම දේශනාව අසා සෝවාන් මග දක්වා ප්‍රඥාව දියුණු කරගත් ආර්යයන් වහන්සේලා පස් නමකටය. මේ නිසා බුදුරජාණන් වහන්සේ මහා පරිනිබ්බාන සූත්‍රයේදී අප සැමට ධර්මය-අධර්මය තෝරා ගැනීම සඳහා කළ අවවාදය අනුව අප අසන ඕනෑම ධර්ම කාරණාවක් සූත්‍ර ධර්මයක කොටසකට නොව සම්පූර්ණ සූත්‍ර ධර්මයකටම ගලපා බැලීම සහ දේශනාව සිදුකිරීමට හේතු වූ නිධාන කථාව විමසා බැලීම අනිවාර්ය වේ. සමහර විට යම් සූත්‍ර දේශනාවක එකම වචනයක් හෝ නොසලකා හැරීමෙන් සම්පූර්ණයෙන්ම වැරදි අදහසක් ලැබිය හැකිය. නිරපේක්ෂතාවයේ මග සහ ආලෝකෝ උදපාදි ශධඹඔඹර්ඃ දේශනාවලදී බොහෝ සූත්‍ර දේශනාවල ඇති සමුදය, නිරෝධය, ආශ්වාදය, ආදීනව, නිස්රණය වන එක දිගට ඇති වචන 5 න් මුල් වචන දෙක අතහැර අර්ථ කථනයන් දීමට කරන උත්සාහයන් හෝ සමුදය නිරෝධයට විකෘත අර්ථ දෙන අවස්ථා හෝ මම නිරීක්ෂණය කළෙමි. නිස්සරණය සඳහා බුද්ධ දේශනාව වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෞකික ලෙස ප්‍රථමයෙනුත්, සත්‍ය ඥානය ලැබූ පසු ලෝකෝත්තර ලෙසත් වැඩීම කළ යුතු බවත් පිළිබඳව නම් කිසිදු සඳහනක් නැත.

ත්‍රිපිටකයේ සඳහන් නොවන නමුත් වහරක හිමියන්ට බුදුරජාණන් වහන්සේලා 13 නමකට පෙරදී ලැබුණු දහමක් නැවත මතුවීමක් ලෙස දක්වමින් පටිච්චසමුප්පාදය පටි+ඉච්ඡ+සම+උප්පාද ලෙස කඩා විකෘති අදහසක් දීමට උත්සාහ කිරීමක් නිරපේක්ෂතාවයේ මග, ආලෝකෝ උදපාදි, ධර්මයයි ඔබයි සහ සංදේශනාව වැනි දේශනාවලදී සිදු කෙරේ. වලස්මුල්ලේ අභය හිමි කරන මෙම ප්‍රකාශය 'වැසී තිබූ ඒ නිවන් මග ????' ලෙස YOUTUBE වීඩියෝවක vaharakapalana වීඩියෝව ඇති පිටුව තුළ ඇත. මෙය බුදුරජාණන් වහන්සේ දේශනා නොකළ දෙයක් දේශනා කළ දෙයක් ලෙස ප්‍රචාරය කිරීමකි. සෑම බුදුරජාණන් වහන්සේ නමක්ම දේශනා කරන්නේ එකම දහමකි.

මෙසේ පටිච්චසමුප්පාදයට විකෘති අරුත් දෙන්නේද, තවත් බොහෝ පාලි වචන දෙකට තුනට කඩා සිංහල වචනවලට ගැළපීමට උත්සාහ කරන්නේද කුමන හේතුවක් නිසා විය හැකිදැයි සංඝයා වහන්සේලා කීප නමක් සමගම සාකච්ඡා කළෙමි. මෙහිදී විය හැකි යැයි සිතිය හැකි හේතූන් 3 ක් මතු විය. පළමුවැන්න බලගතු භූත ආත්ම වැනි නොපෙනෙන බලවේගයක් විසින් සියුම් ලෙස නොමගට හැරවීමයි. මෙයට සමාන සිද්ධියක් බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහ නාහිමියන් විසින් උන්වහන්සේගේ 'අපට නොපෙනෙන ලෝකය' නමැති පොතේ විස්තර කර තිබූ බවට මතකයක් ඇත. දෙවැන්න මුලාවෙන් හෝ ලබාගත්තා යැයි සිතන මාර්ග ඵලයක් හෝ ධ්‍යානයක් සත්‍ය දෙයක් නොවන බව පිළිගැනීමට ඇති නොකැමැත්තයි. මෙවැනි වැඩසටහන්වලට සම්බන්ධ බොහෝදෙනා තමන් අරහත් බව හෝ සෝවාන් හෝ අනාගාමි බවට ඉතාම ආසන්න බව හෝ වැනි කතාන්දර ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇත. තුන්වැනි හේතුව විය හැක්කේ තමන්ගේ භක්තියක් ඇති වචන මාලාවකට නොකඩවා ටික වේලාවක් සවන් දීමෙන් ලැබිය හැකි ස්වයං මෝහනයක් හෝ පහළ මට්ටමේ මිථ්‍යා සමාධියකින් (මිච්ඡා දිට්ඨි සමාධි) ලැබෙන තාවකාලික ශාරීරික සහ මානසික සුවයයි. මෙම සුවය නිවන් මග ලෙස වරදවා තේරුම් ගැනීම විය හැකිය. පළමු, දෙවැනි සහ තුන්වැනි ධ්‍යානවලදී ලැබිය යුතු ප්‍රීති, සුඛ, ඒකග්ගතා ලෙස තමන් ලැබූ යම්තම් සමාධිය වරදවා වටහා ගත්තා විය හැකිය.

රන් පදක්කම් 11 ක් දිනූ කැනඩාවේ වෛද්‍යවරියක් තමාගෙන් ධර්මය අසා නිවන් **22 වන පිටුව බලන්න**

**කැනඩාව නම් උතුරු ඇමෙරිකානු රාජ්‍යය - 5**

# කැනඩාවේ පුරවැසිභාවය සඳහා දත යුතු නවතම රෙගුලාසි



■ ආනන්ද විජේසිංහ විසිනි

(මෙහි මුල් කොටස පසුගිය කලාපයේ පළ කෙරුණි)

## ඔටාවාහි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල

වික්ටෝරියා මහ රැජිණ දවස ජනප්‍රියව තිබූ ගොතික් (පුනරුත්ථාපිත) ගෘහනිර්මාණ ශිල්පය සහ ආදිවාසී, ප්‍රංශ සහ ඉංග්‍රිසි සභ්‍යත්වයන් පිළිබිඹු කෙරෙන කුලුනු, ආරුක්කු, සැකිලි සහ අඳුරුවන් වීදුරු ආදිය 1860 දී තනා නිම කරන ලද මෙම ගොඩනැගිල්ලේ දක්නට ලැබේ.

## රාජ්‍ය (නිල) භාෂාවන්

ඉංග්‍රිසි සහ ප්‍රංශ භාෂා දෙක කැනේඩියානුවන්ගේ නිල භාෂාවන් ලෙස පවතී.

## ජාතික ගීය O Canada!

ප්‍රථමයෙන් 1880 වසරේදී කූබෙක් නගරයේ ගයන ලද මෙම ගීය, 1980 දී කැනඩාවේ ජාතික ගීය වශයෙන් පිළිග න්නා ලදුව, ඉංග්‍රිසි හෝ ප්‍රංශ බස වහරන පුරවැසියෝ තම භාෂාවේ වචන යොදා වර්තමානයේදී ගායනා කරති.

## ගෞරව නාම ප්‍රදානය

සුවිශේෂී පුද්ගලයින්හට ප්‍රදානය කරණු ලබන 'නම්බු නාම' හෙවත් ගෞරවාන්විත නාම ප්‍රදානයන්ද කැනඩාව සංකේතවත් කරයි.

## ජාතික නිවාඩු දින සහ අනෙකුත් වැදගත් දිනයන්

පහත සඳහන් දිනයන් කැනඩාවේ විවිධ අවස්ථා සංකේතවත් කරයි.

ජනවාරි 1 - අලුත් අවුරුදු දිනය
ජනවාරි 11 - ශ්‍රීමත් ජෝන් මැක්ඩොනල්ඩ් දිනය
මහ සිකුරාදා - පාස්කු ඉරුදින පූර්ව සිකුරාදා දිනය
පාස්කු සඳුදා - පාස්කු ඉරුදිනට පසු දිනය
අප්‍රේල් 9 - වයිමි (අනුස්මරණ) දිනය
මැයි 25 පූර්ව සඳුදා - වික්ටෝරියා දිනය
ජුනි 24 - බැප්ටිස් ජෝන් දිනය
ජූලි 1 - කැනඩා නිදහස් දිනය (කැනඩා දිනය)
සැප්තැම්බර් 1 වෙනි සඳුදා - කම්කරු දිනය
ඔක්තෝබර් 2 වෙනි සඳුදා - තුතිපුද දිනය
නොවැම්බර් 11 - යුදවිරු සමරු (සිහිකිරීමේ) දිනය
නොවැම්බර් 20 - ශ්‍රීමත් විල්ෆ්‍රඩ් ලෝරියර් දිනය
දෙසැම්බර් 25 - නත්තල් දිනය
දෙසැම්බර් 26 - 'බොක්සිං' දවස

ඉහත සඳහන්කළ පරිදි, ජාතික ගීය මෙහිලා ඇතුළත් කළොත් ප්‍රයෝජනවත් වේ යැයි සිතූ හෙයින් එය ද මෙසේ (ඉංග්‍රීරිසි බසින්) සඳහන් කරමි:

### The National Anthem of Canada

O Canada!
Our home and native land!
True patriot love in all of us command.

With glowing hearts we see thee rise,
The True North strong and free!

From far and wide,
O Canada, we stand on guard for thee.

God keep our land glorious and free!
O Canada, we stand on guard for thee.
O Canada, we stand on guard for thee.

## වත්මන් කැනඩාව

### සමාජ/ආර්ථික වර්ධනය

දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ඇමෙරිකා එක්සත් ජනපදය හා සබැඳි මිත්‍රශීලි වාණිජ සහයෝගිතාවයේ සහ අප්‍රතිහත ධෛර්ය සම්පන්න ජනතාවකගේ වෙරවීරියේ ප්‍රතිඵලයක් වශයෙන් කැනඩාවේ ආර්ථිකය ඉහළ යන්නට විය. 1947 දී ඇල්බර්ටා ප්‍රාන්තයේ ඛනිජ තෙල් සම්පත මතු වීමෙන් අනතුරුව, එවක ලොව ඉදිරි පෙළ කාර්මික රටවල් හා උරෙනුර සිටි ආර්ථික ශක්තියෙන් සමන්විත පොහොසත් රටක් බවට පරිවර්තනය වීම ආරම්භ විය. කැනඩාව අද ලෝකයේ බලවත් ජාතීන් අතර අතිශයින් ශක්තිමත් ආර්ථිකයකින් ආඪ්‍ය වූද, නිදහස්, නිවහල්, සාමකාමී පරිසරයෙකින් සමන්විත වූද, වචනයේ පරිසමාප්තාර්ථයෙන් සෞභාග්‍යවත් යැයි නොවක්වැ කිවයුතු රාජ්‍යයෙකි.

### යහසාධක රාජ්‍යයක්

සෞභාග්‍ය සම්පන්න භාවයේ හිරු උදාවත් සමග මහජන සෞඛ්‍ය සේවා, වියපත් වූවන්(ජ්‍යෙෂ්ඨයන්) සඳහා රක්ෂණ, විරැකියා රක්ෂණ ක්‍රමය, කැනේඩියානු/කූබෙක් විශ්‍රාම වැටුප් ක්‍රමය සහ ප්‍රාන්ත හා ටෙරිටරි රජයයන් විසින් මහජන මුදලින් සැපැයෙන අධ්‍යාපන ක්‍රමය ආදි මහජනානුග්‍රාහි යහසාදන ව්‍යාපෘති දියත් විනි. අවශේෂ ජනතා යහසාධන අපමණය.

### ජාත්‍යන්තර ප්‍රතිපත්තිය:

නවසීලන්තය, ඕස්ට්‍රේලියාව වැනි වෙනත් රටවල් මෙන් අන්තර්ජාතික නිරතයන් කැපී පෙනෙන සේ ක්‍රමයෙන් වර්ධනය වූ අතර කැනඩාව, ප්‍රජාතාන්ත්‍රික බටහිර රටවල් අතර ආරක්ෂක හමුදා සංධානය වූ නේටෝ (NATO) මෙන්මැ ඇමෙරිකා එක්සත් ජනපදයේ උතුරු ඇමෙරිකානු අභ්‍යවකාශ රැකවරණාධිකාරය වූ නොරාඩ් (NORAD) යන සංවිධාන හා සම්බන්ධ වී ඇති අතර, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙහෙයවනු ලබන සාමහමුදා මෙහෙයුම් දායකත්වයෙහි ලා ඉදිරියෙන් සිටී.

### කැනඩාව සහ කූබෙක්



සියයට අසූවකට අධික ප්‍රංශ සම්භවයක් සහිත පුරවැසි ජනතාවකගෙන් සමන්විත සුවිසල් කූබෙක් ප්‍රාන්තයේ කලක් පැවැති බෙදී-වෙන්වීමේ ප්‍රවණතාවය, මෙකල්හි බොහෝ දුරට සමනය වූ අතීත තත්ත්වයක් සේ පෙනේ. වර්ෂ 1969 දී සම්මත වූ සමස්ත ෆෙඩරල් රාජ්‍යය හරහා ඉංග්‍රිසි, ප්‍රංශ යන භාෂා ද්වයම පිළිගන්නා ලද රාජ්‍ය භාෂා ආඥා පනතෙන් අනතුරුව කැඩී යාමේ තර්ජනයට එරෙහි කූබෙක් ජනතා විරුද්ධත්වය ක්‍රමයෙන් ජයගත් බවක්ද පෙනෙන්නට තිබේ. 1980 වසරේදී ප්‍රාන්තය ඇතුළත දියත් වූ ජනමත විචාරය පරාජයට පත්වීමෙන් වුවද ගම්‍ය වනුයේ එයයි. එතෙකුදු වුව මේ උණුසුම තවමත් මුළුමනින් නිවී ගොස් නැති කුබෙක් පිළිබඳ සප්‍රාණික දේශපාලන පසුබිමෙකි.

### සාමාජගත විපරිනාමය

අඩසිය වසරකට පෙර, ඇතැම් ආසියානු සම්භවික සංක්‍රමණිකයින්ට සර්වජන ඡන්ද බලය නොතිබුණි. වර්ෂ 1948 දී ජපාන ජාතික කැනේඩියානුවෝ ඡන්ද බලය ලැබූහ. ආදිවාසීන් හෙවත් ස්වදේශිකයින් (ඇබොරිජිනල්ස්) ඡන්ද බලය ලද්දේ 1960 වසරේදීය. අද වයස 18 ඉක්මැ වූ සියලු කැනේඩියානුවෝ ඡන්දය දෙති. රට තුළ වෘත්තීය ප්‍රවාහයේ කාන්තා සංයුතිය අතිශයින් ඉහළ තලයක පවතින අතර එය අඛණ්ඩව තව තවත් ඉහළ යමින් පවතී.

කොමියුනිස්ට්වාදී සහ වෙනත් දේශපාලනමය වධ-හිංසාවලට ලක් වූ හෝ බියෙන් හෝ එසේත් නැතහොත් ආර්ථික නිල්ල සොයා සරණාගත-ව්‍යාජයෙන් රටවලින් පැන එන දසදහස් සංඛ්‍යාත ජනතාවන්ට කැනඩාව අගනා ක්ෂේම භූමියක් වී ඇතැයි කිව යුතුය. වර්ෂ 1975 දී වියට්නාම් යුද්ධයෙන් පලා ගිය වියට්නාමිකයින් 50,000 ක් මෙහි සරණාගතයින් සේ පිළිගන්නා ලදී.

ශ්‍රී ලංකාවෙන් අසූව දසකයේ සිට දෙදහසේ දසකය දක්වා විවිධ ආකාරයෙන් වරින්වර සංක්‍රමණය වූ දමිළ ජාතික සරණාගත සංඛ්‍යාව 250,000 ඉක්මවා ඉහළ ගොස් තිබුණි. (මේ පිළිබඳ විකිපීඩියා ආදි ඉලෙක්ට්‍රොනික වාර්තාද බලන්න). කැනඩාවේ ප්‍රධාන ආර්ථික මහනගරය වූ ටොරොන්ටෝ හි විශාලතම ජනවර්ගය චීන ජාතිකයින් වන නමුදු ශ්‍රී ලාංකික දමිළ සංක්‍රමණික සංඛ්‍යාවද දෙසීයයක් පමණ වූ ජනවර්ග හා සාපේක්ෂව ගත් විට අතිවිශාලය. 'මාර්කම්' හි නගරසභික ධුරයෙකින් ආරම්භ වූ ශ්‍රී ලාංකික දමිළ සංක්‍රමණිකයන්ගේ දේශපාලන ක්‍රියාකාරකම්, පාර්ලිමේන්තු මන්ත්‍රි ධූර දක්වා දැන් ව්‍යාප්ත වී තිබේ. දෙමළ උරුමයේ සැමරුම් දිනයක් පවා (Tamil Heritage Day) රජය විසින් පිළිගෙන තිබේ. එය දමිළ සංස්කෘතික දිනයක් හෙම නොව, 'කැනඩාවේ දමිළ උරුමයක්' පිළිබඳ සමරු දිනයක් බව නමින්මැ පෙනේ.

මෙවන් තත්ත්වයක් දිගින් දිගටම පවත්නා අතර වත්මන් සිරියානු යුදපිටියෙන් ගැලැවී ගත් බව කියන 30,000 ක සිරියානුවන් කණ්ඩායමක් ඉතා මෑතකදී (2017 ජනවාරි) කැනඩා අගමැති ජස්ටින් ට්‍රෑඩෝ විසින් ක්ෂණිකව පිළිගන්නා ලද ආකාරය මේ පිළිබඳ ජීවමාන එක් හොඳම නිදර්ශනයක් පමණි. මෙනයින් බලන විට කැනඩාවේ ජනගහනයෙන් තුනෙන් එකක් පමණ වූ, ඉංග්‍රිසි හෝ ප්‍රංශ නොවන්නා වූ විවිධ රටවලින් 19 - 21 වැනි ශතවර්ෂය පුරා සංක්‍රමණය වූවන්ගේ විවිධාකාර සාඩම්බර සංස්කෘති ඒ ඒ ආකාරයෙන් මැ පවත්වාගෙන යන සමාජයක් කැනඩාව තුළ නිර්මාණය වී ඇත. ශ්‍රී ලංකාවෙන් සංක්‍රමික දමිළ 'ඩයස්පෝරාව' මේ පිළිබඳ හොඳම සාක්ෂියයි.

### විශිෂ්ඨ සොයාගැණීම් හා නිපැයුම්

කැනේඩියානුවන් විසින් ලොව ප්‍රථම වරට කරන ලද විශිෂ්ට සොයාගැනීම් අතරින් ප්‍රසිද්ධියක් උසුලන කීපයක් පමණක් පහත දැක්වේ:

- ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් - ටෙලිෆෝනය
- ජෝසෆ් ආර්මන්ඩ් බොම්බාඩියර් - ස්නෝ මොබයිල් (Snow Mobile) ශීත සෘතුවේදී හිම මත ලිස්සා යන ස්වයංක්‍රිය වාහනයකි.
- ශ්‍රීමත් සැන්ෆඩ් ෆ්ලෙමිං - ලෝක වේලා අඩවි ක්‍රමය
- මැතිව් ඉවාන්ස් සහ හෙන්රි වුඩ්වර්ඩ් - විදුලි බුබුල (පසුව මේ සොයාගැනීමේ හිමිකරු බලපත්‍රය තෝමස් එඩිසන්ට විකුණන ලදී)
- රෙජිනෝල්ඩ් ෆෙසෙන්ඩන් - ප්‍රථම ගුවන්විදුලි පණිවුඩය යවමින් ගුවන්විදුලිය සොයාගැනීමට දායක විය
- දොස්තර විල්ඩර් පෙන්ෆීල්ඩ් - 'විශිෂ්ඨ ජීවමාන කැනේඩියානුවා' යන විරුදාවලිය ලබා, මොන්ට්‍රියල් හි මැක්ගිල් විශ්වවිද්‍යාලයේ මොළයේ සැත්කම් නියමුවා
- දොස්තර ජෝන් ඒ. හොප්ස් - හෘද රෝගීන්ගේ හෘද ස්පන්ධන වේග-පාලකයක් නිෂ්පාදනය කළ වෛද්‍යවරයා.

(ලියුම්කරු මේ සුන්දර රටේ කළ චාරිකා පිළිබඳවද පාඨක භවතුන්ට ප්‍රයෝජනවත් විය හැකි තොරතුරු මී ළඟ නිකුතුවේ සිට පළකිරීමට අදහස් කරයි)

**(මතු සම්බන්ධයි)**


Majestic City
Sri Lankan
සාප්පු සංකීර්ණය
Shop | Dine | Entertainment
COMPLETION AUGUST 2019
Prime locations: Markham/ McNicoll
Signage
Signage
Majestic City
Five Plus
LEASING OPPORTUNITY
CRISH (KUMA)
PROJECT MANAGER
Tel : 647-218-3698
www.majesticcity.ca
info@majesticcity.ca

# නොදැනීම දෑස් අන්ධ කරවන ග්ලූකෝමාව




**2018 වසරේ 'ලෝක අක්ෂි දිනය' (World Sight Day) ඔක්තෝබර් 11 වෙනි දිනට යෙදී ඇත. ජාත්‍යන්තර සිංහ සමාජ පදනම විසින් 2000 වසරේ ඔක්තෝබර් 12 වන දින මෙම දිනය පළමුවරට ප්‍රකාශයට පත් කරනු ලැබූ අතර 2004 වසරේ සිට සෑම වසරකම ඔක්තෝබර් දෙවන සතියේ යෙදෙන බ්‍රහස්පතින්දාව ලෝක අක්ෂි දිනය ලෙස නම් කෙරුණි. මෙවර අක්ෂි දිනයේ තේමාව, 'Eye Care Everywhere - සෑම තැනකම අක්ෂි සත්කාර' යන්නයි.**

■ **අමල් උඩවත්ත**

ඇස් රෝග ගණනාවක් අතරින් ග්ලූකෝමාව තවත් එක් ඇස් රෝගයකි. එහෙත් බොහෝ දෙනකුට නොදැනෙන පරිදි ඇසේ දුර්වලතාවක් හටගෙන ක්‍රමයෙන් නොපෙනී ගොස් අවසානයේදී සම්පූර්ණයෙන්ම දෑස නොපෙනීමට ග්ලූකෝමාව නම් රෝගී තත්ත්වය හේතු වෙයි. ලෝක තත්ත්වය පිළිබඳව විමසුවද ශ්‍රී ලංකාවේ තත්ත්වය විමසුවද දෑස් අන්ධ වීමට හේතු වන රෝග අතරින් ප්‍රධාන රෝගයක් ලෙසට ග්ලූකෝමාව පත් වී ඇති බැව් පැහැදිලි වන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් පෙන්වා දෙන දත්තවලට අනුවය.

මෙවැනි අක්ෂි රෝගවලින් දෑස ආරක්ෂා කර ගැනීම අත්‍යවශ්‍ය බැවින් අක්ෂි වෛද්‍ය අසේල අබේධීර සමග ග්ලූකෝමාව පිළිබඳව කරන ලද සාකච්ඡාවකින් මේ ලිපිය සැකසෙයි.

## ග්ලූකෝමාව යනු කුමක්ද?

අප දන්නවා මිනිස් ඇස, තරලයකින් පිරුණු ගෝලයක් බව. මේ තරලය නැත්නම් දියරය අක්ෂි ගෝලය තුළ පවතින්නේ නියත පීඩනයක් යටතේයි. මේ දියරය ඇස වටා ගමන් කරන අතරේ ටිකෙන් ටික පිටතට ගලා යෑමත් සිදු වනවා. ඒ ගලා යන ප්‍රමාණය අනුව දියරය අලුතෙන් නිපදවීමත් සිදු කෙරෙනවා. කිසියම් විදියකින් දියරය පිටතට ගලා ඒමේ යාන්ත්‍රණයේ අවහිරතාවක් හේතුවෙන් පිටතට ගලා යෑම නතර වුවොත් ඇස තුළ දියරය එකතු වීම නිසා පීඩනය වැඩි වී දෘෂ්ටික ස්නායුවට ටිකෙන් ටික හෝ ආබාධ සිදුවිය හැකි තත්ත්වයක් උදා වෙනවා. මේ නිසා දෘෂ්ටික ස්නායුවේ ක්‍රියාවලිය ක්‍රමයෙන් දුර්වල වෙනවා. කෙටියෙන් හඳුන්වනවා නම් ඇසේ පීඩනය වැඩි වීම නිසා දෘෂ්ටික ස්නායුවට හානි සිදු වී ඇසේ පෙනීම අඩු වීම ග්ලූකෝමාව කියලයි හඳුන්වන්නේ.

## ඇසේ පෙනීම අඩු වීම සාමාන්‍යයෙන් දැනෙන දෙයක්ද?




නෑ. පෙනීමේ අඩු වීම සාමාන්‍යයෙන් දැනෙන දෙයක් නෙවෙයි. පූර්ව රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ නෑ. ටිකෙන් ටික දෘෂ්ටික ස්නායුවට හානි සිදු වුවත් පෙනීම හොඳටම දුර්වල වෙනකම් දැනෙන්නේ නෑ. පෙනීමේ අඩුවක් නොවුණත් කාලයක් මේ රෝගය තිබෙන්න පුළුවන්. පෙනීම අඩු බව දැනෙන්නේ අවුරුදු ගණනක් ගියාට පසුවයි.

## ග්ලූකෝමාව වැළඳීමට වයස් සීමාවක් තිබෙනවාද?

ග්ලූකෝමාව වැළඳෙන්නේ අවුරුදු 40 ට වැඩි අයටයි. මෙයින් අවුරුදු 40 ට වැඩි සියලු දෙනාටම ග්ලූකෝමාව වැළඳෙනවා කියන එක අදහස් කරන්නේ නෑ. පවුලේ කාට හෝ ග්ලූකෝමාව වැළඳී තිබුණොත්, දියවැඩියාව තිබෙනවා නම් සහ පෙර සිදු වූ තුවාලයක් නිසාත් ග්ලූකෝමාව වැළඳෙන්න ඉඩ තිබෙනවා. වයස අවුරුදු 60 ට වැඩි අයට ග්ලූකෝමාව වැළඳීමට වැඩි අවදානමක් තිබෙනවා.

## අවිදුර දෘෂ්ටිකත්වය නැත්නම් ළඟ පෙනුණත් දුර නොපෙනීම තිබෙන අයට ග්ලූකෝමාව වැළඳීමේ වැඩි ඉඩකඩක් තිබිය හැකි ද?

අවිදුර දෘෂ්ටිකත්වය තිබෙන අය ඝනකම් වීදුරුවක් සහිත කණ්ණාඩි පැළඳීම සිදු කරනවා. මේ අය අතර ග්ලූකෝමාව තිබෙන අය ඉන්න පුළුවන්. ඝනකම් වීදුරු පළඳින නිසා ග්ලූකෝමාව ඇති වෙනවා කියන එක වත්, ඝනකම් වීදුරු පළඳින සියලු දෙනා ග්ලූකෝමාව වැළඳුණු අය කියා වත් වර්ග කෙරෙන්නේ නෑ. අවිදුර දෘෂ්ටිකත්වය තිබෙන අයට ග්ලූකෝමාව වැළඳීමට වැඩි අවදානමක් තිබෙනවා කියන එකයි මෙහිදී අදහස් කෙරෙන්නේ.

## ග්ලූකෝමාව හඳුනා ගන්නේ කෙසේ ද?

වෛද්‍යවරුන් හැටියට අපි කියන්නේ අවුරුදු 40 ට වැඩි සියලු දෙනාම මේ රෝගයට ගොදුරු වීමට අවදානමක් ඇති බැවින් ඇස් පරීක්ෂා කරවා ගැනීම අත්‍යවශ්‍ය බවයි. හතළිස් ඇඳිරිය නිසා ඇස් පෙනීමේ දුර්වලතාවක් ඇති වෙනවා. වයස අවුරුදු 38, 39, 40 වයස් කාණ්ඩවල ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම හතළිස් ඇඳිරියට ලක් වෙන්න ඉඩ තිබෙනවා. මෙහිදී සිදු වන්නේ ළඟ පෙනීම දුර්වල වීම. මේ අය බොහෝ විට කරන්නේ කණ්ණාඩි සාප්පුවකට ගොස් ඇස් පෙනීම පරීක්ෂා කරවාගෙන ඒ දුර්වලතාව මඟහරින්න උපැස් යුවලක් මිල දී ගැනීමයි. නැත්නම් කියවීම පහසු කරවන උපැස් යුවලක් මිල දී ගැනීමයි. මෙහිදී අප ඇස් පූර්ණ පරීක්ෂාවකට ලක් කරන්නේ නෑ. ඒ නිසා ඇස් පෙනීමේ දුර්වලතාවට හේතුව සොයා ගන්න ලැබෙන්නේ නෑ.

## එසේ නම් කළ යුත්තේ කුමක්ද?

වයස අවුරුදු 38, 39, 40 වැනි වයස් සීමාවේදී ඇසේ ළඟ පෙනීමේ දුර්වලතාවක් හෙවත් හතළිස් ඇඳිරිය ඇති වුවොත් රෝහලකට පැමිණ ඇස් පරීක්ෂා කරවා ගැනීමයි. අක්ෂි වෛද්‍යවරයා මැනැවින් ඇස් පරීක්ෂාවට ලක් කරනවා. මෙහිදී ග්ලූකෝමාව සඳහා ඇස් පරීක්ෂා කරනවා වගේම දියවැඩියාව නිසා ඇස් පෙනීම දුර්වල වෙලාද කියාත් පරීක්ෂා කරනවා. ඇසේ දෘෂ්ටිවිතානයට සිදු වූ හානියක් නිසා ඇස් පෙනීම දුර්වල වෙලාද, ඇසේ සුද ඇති වෙලාද, ඇති වෙමින් පවතිනවාද යන්න පරීක්ෂා කරනවා වගේම වෙනත් කවර හෝ රෝගයක් නිසා ඇසේ පෙනීමේ දුර්වලතාවක් ඇති වෙලාද කියලත් පරීක්ෂා කරනවා. මේ ආකාරයට අක්ෂි රෝග ගැන පරීක්ෂාවට ලක් කරලයි උපැස් යුවලක් ගැනීමට අවසර දෙන්නේ. මේ අවස්ථාවේදී ඇසේ රෝගී තත්ත්වයක් හඳුනා ගන්න ලැබුණොත් මුලින්ම කරන්නේ ඒ රෝගය සඳහා ප්‍රතිකාර කිරීමයි. මේ තමයි සියලුම අක්ෂි රෝග හඳුනා ගැනීමට තිබෙන හොඳම අවස්ථාව. මෙහිදී ග්ලූකෝමාව තිබෙන බව හෙළි වුණොත් ඊට අවශ්‍ය ප්‍රතිකාර අනිවාර්යයෙන්ම ලබා දෙනවා. පෞද්ගලික ආයතනයකින් නැත්නම් ඇස් කණ්ණාඩි සපයන දෘෂ්ටි විශේෂඥයකුගෙන් ඇස් පරීක්ෂා කරවා ගැනීමේදී රෝග පිළිබඳ පරීක්ෂාවක් නොකෙරෙන නිසා ග්ලූකෝමා වැනි තත්ත්වයක් හඳුනා ගන්න ලැබෙන්නේ නෑ. එය ඇසේ පෙනීම තවත් දුර්වල වීමට හේතුවක්.

## වෛද්‍යවරයකු ග්ලූකෝමාව සඳහා ඇස් පරීක්ෂා කිරීමේදී භාවිත කරන ක්‍රමවේද මොනවාද?

ඖෂධීය දියරයක් ඇසට දමා ඇසේ බබා විශාල කිරීමෙන් ග්ලූකෝමාව හඳුනා ගැනීමට හැකියාව තිබෙනවා. ග්ලූකෝමාව ඇතැයි යන්න මෙයින් තහවුරු වුවොත් තවදුරටත් පරීක්ෂා කරල සත්‍ය වශයෙන්ම හඳුනා ගන්න හැකියාව තිබෙනවා. ඒ කියන්නේ ඇසේ පීඩනය මනින උපකරණය මගින් වඩාත් හොඳින් ඒ බව තහවුරු කරගන්න පුළුවන්.

## මොකක්ද මේ ඇසේ පීඩනය? සාමාන්‍ය රුධිර පීඩනය මේ සඳහා බලපානවාද?

බොහෝ දෙනා සිතන දෙයක් තමයි අධිරුධිර පීඩනය ඇසේ පීඩනයට බලපෑමක් ඇති කරනව කියල. නෑ එහෙම දෙයක් වෙන්නේ නෑ. ඇසේ පීඩනය කලින් පැහැදිලි කළා වගේ ඇති වන දෙයක්. අධික රුධිර පීඩනය වෙනත් දෙයක්. මේ දෙකේ සම්බන්ධයක් නෑ. නිරෝගී ඇසක පීඩනය රසදිය මිලි මීටර් 20 ක් විය යුතුයි. ඊට වඩා වැඩි විය යුතු නෑ. ඇසේ පීඩනය රසදිය මිලි මීටර් 20 ට වඩා වැඩි නම් ග්ලූකෝමාව ඇති බවට සැක කරනවා. තවත් පරීක්ෂණ ගණනාවකට යොමු කරල තහවුරු කර ගන්නවා.

## ප්‍රතිකාර කාලයක් තිස්සේ සිදු කළ යුතුද?

වෛද්‍යවරයකු ග්ලූකෝමාව ඇති බව නිර්දේශ කළොත් වෛද්‍ය උපදෙස් අනුව ජීවිත කාලය පුරාම නිවැරැදිව නිසි කාල සීමාවම ප්‍රතිකාර ලබා දිය යුතුයි. මේ ප්‍රතිකාර අතරමඟදී නවතා දැමුවොත් හෝ නිසි පරිදි නොකළොත් ග්ලූකෝමා තත්ත්වය උත්සන්න වී ඇස් අන්ධ විය හැකියි.

## ප්‍රතිකාරවලින් සිදු කරන්නේ කුමක්ද?

ග්ලූකෝමාව හඳුනා ගන්නා විට තිබුණ තත්ත්වය තවදුරටත් වර්ධනය වීම වැළැක්වීමයි ප්‍රතිකාරවලින් කෙරෙන්නේ. ඒ කියන්නේ නැති වී ගිය පෙනීම නැවත ලබා දෙන්න බැරි වුණත් තවදුරටත් අන්ධ වීම වළක්වන්න ප්‍රතිකාරවලින් පුළුවන්. සමහර අවස්ථාවලදී ශල්‍යකර්ම කරලත් පෙනීම ආරක්ෂා කර දෙනවා.

**22 වන පිටුව බලන්න**



# වැඩිහිටියා සහ සංවර්ධනය

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1990 දෙසැම්බර් 14 වන දින ඡන්ද විමසීමකින් සම්මත කර 45/106 වගන්තියට ඇතුළත් කර ඇති පරිදි සෑම වසරකම ඔක්තෝබර් 01 වන දිනය අන්තර්ජාතික වැඩිහිටි දිනය -International Day of Older Persons ලෙස නම් කර ඇත. 1991 ඔක්තෝබර් 01 දා ලොව පුරා මුල් වරට මෙම දිනය සමරනු ලැබුණි.

■ ශ්‍රී මේඝ විජේරත්න

ජනගහන විද්‍යාඥයින් විසින් 20 වන ශත වර්ෂය 'තරුණයින්ගේ ශත වර්ෂය' ලෙස ප්‍රකාශ කළහ. ඉඩම් හිමි සමාජයක වැඩිහිටියන්ගේ බලපෑම පහත වැටුණු අතර කාර්මීකරණය සහ ශක්තිමත් භාවයෙන් තරුණයන් සමාජයේ බලධාරී ජන කාණ්ඩය බවට පත් වූහ. කෙසේ වෙතත් 1980 ගණන්වල සිට මෙම තත්ත්වය වෙනස් වීමට භාජන විණි. ලෝකයේ සංවර්ධිත රාජ්‍ය සිය වයස අවුරුදු 65 ට වැඩි ජන කොට්ඨාශය වර්ධනය වීමේ ක්‍රියාදාමයට ආපසු හැරවිය නොහැකි සේ අවතීර්ණ වී ඇත. ජපානය වැනි රටවල දැනටමත් වැඩිහිටි ජන ස්ථරය රටේ මුළු ජනගහණයෙන් 20% දක්වා වර්ධනය වී තිබේ. සාමාන්‍යයෙන් විශ්වාසය තැබිය හැකි ජනගහණ විද්‍යාත්මක අනාවැකිවලට අනුව වසර 2050 වන විට ලෝක ජනගහනයෙන් අඩක්ම වසර 50 ඉක්ම වූ පිරිස වනු ඇත.

සංවර්ධිත සමාජවල වැඩිහිටියන් හුදෙක් වයසින් වැඩෙනවා පමණක් නොව ඉතා ශීඝ්‍රයෙන් ධනවත් වන සහ සමාජයේ බෙහෙවින් බලපෑම් කළ හැකි ජන ස්ථරයද බවට පත් වෙමින් සිටිති. වැඩිහිටියන්ගේ බලය මතුවීමට තුඩුදුන් එක් හේතුවක් වන්නේ උපත් අනුපාතය කැපී පෙනෙන අන්දමින් පහත වැටීමයි. යුරෝපයේ සෑම රටකම පාහේ උපත් අනුපාතය යථාවත් කිරීමේ මට්ටමට වඩා පහත වැටී ඇත. ඉතාලියේ සාඵල්‍යතා අනුපාතය එක් කාන්තාවකට දරුවන් 1.3 දක්වා පහත වැටී ඇත. ජර්මනිය, ග්‍රීසිය,ඉතාලිය සහ ස්පාඤ්ඤය වැනි රටවල අවුරුදු 60 ට වැඩි ජනගහනය අවුරුදු 20 ට වැඩි ජනගහනයට වඩා විශාල වන අතර ඉතා දැඩි ලෙස දැනට වර්ධනය වෙමින් පවතින ජනගහන විද්‍යාත්මක විප්ලවය ඉන් පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ දේශපාලන න්‍යාය පත්‍රයේ වැඩිහිටි ප්‍රතිපත්තියට හිමිවිය යුතු වැදගත්කම තවම හිමි වී නැතත් නිහඬ ජනගහන විද්‍යාත්මක පීඩනය සිදුවෙමින් පවතී. වයස අවුරුදු 20 ට අඩු ජනගහනයේ පහත වැටීම අපගේ ජනසංගණන සංඛ්‍යාලේඛන දෙස වුවමනාවෙන් බලන්නකුට පැහැදිලිව පෙනී යන්නකි. වර්ෂ 1971 දී අපගේ ජනගහනයෙන් 50% ක් වයස අවුරුදු 20 ට අඩු තරුණ ජනගහනයෙන් සමන්විත වූ අතර වර්ෂ 1981 එම තරුණ ජනගහනය 41% දක්වා පහත වැටුණි. වර්ෂ 2002 ජන සංගනණයේදී තවදුරටත් එම සංඛ්‍යාව 32% දක්වා පහත වැටුණි. අපගේ සාඵල්‍යතා අනුපාතය යථාවත් කළ නොහැකි තරමටම පහත වැටී ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ මිලියන දෙකක් ඡන්දදායක ප්‍රතිශතයෙන් 1/6 ක් පිරිස වැඩිහිටියන් වේ.

තරුණ ජනගහනයේ අඩුවීම පළමු වසරට අඩු සිසුන් පිරිසක් අයදුම් කිරීමට හේතු වී තිබේ. වර්ෂ 1992 දී ළමුන් 387,000 ක් පළමු වසරට අයදුම් කළ අතර 2003 දී මෙම සංඛ්‍යාව 300,000 දක්වා පහත වැටුණි. 500 කට අධික ප්‍රාථමික පාසල් සංඛ්‍යාවක් වසා දැමීමට සිදුවීම උපත් අනුපාතය පහත වැටීමේ ශුද්ධ ප්‍රතිඵලය විය. නුදුරු අනාගතයේදීම ශ්‍රී ලංකානු ප්‍රතිපත්ති සම්පාදකයන්ට ඇතැම් ස්කැන්ඩිනේවියානු රටවල මෙන් මෙරටේද දීර්ඝ කාලීන සංවර්ධනය සහතික කර ගැනීම වෙනුවෙන් දරුවන් බිහිකිරීම සඳහා තරුණ දෙමාපියන් දිරිමත් කිරීම පිළිබඳ සිතා බැලීමට සිදුවනු ඇත. රජයේ සහ සෞඛ්‍ය ආරක්ෂක අංශවල දැනටමත් ආරම්භ කොට ඇති පරිදි අපගේ පුහුණු ශ්‍රම බලකායෙන් ප්‍රමාණවත් ස්ථරයක් අනෙකුත් රටවලින් ආනයනය කිරීමට සිදුවනු ඇත.

පසුගිය දශක කිහිපය තුළ මෙන් නොව වර්තමානයේ වැඩිහිටි ජනගහනය බොහෝ රටවල ආර්ථික දේහය පාලනය කරනු ලබයි. මුල් ශත වර්ෂවලදී වැඩිහිටියන් ඉඩම් හිමිකම තුළින් බලය නතු කරගත් අතර ආර්ථිකයන් කාර්මිකකරණය වීම නිසා කාර්මීකරණයට ලක් වූ ආර්ථිකයන් තුළ තරුණයන්ට එම අවස්ථාව අහිමි විණිඩ එහෙත් දැනුම මත පදනම් වූ අනාගත ආර්ථිකයන්හි අධිපතිවාදී ආර්ථික බලය ලෙස වැඩිහිටියන් නැවතත් එළිදකිනු ඇත.

වයස අවුරුදු 50 ට වැඩි වූවන් මිලියන 80 ක් පමණ සිටින ඇමරිකා එක්සත් ජනපදයේ මෙම තත්ත්වය දැනටමත් සිදුවෙමින් පවතියි. මෙම වියපත් ඇමරිකානුවන් වාර්ෂික ආදායම ලෙස ඇමරිකානු ඩොලර් මිලියන දෙකක් උපයන අතර මූල්‍ය වත්කම්වලින් 70% ක් හෝ දළ වශයෙන් ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 07 ක්ම පාලනය කරති. වැඩිහිටියන්ගේ ශුද්ධ ගෘහීය ආදායම සාමාන්‍ය තරුණ නිවැසියන්ගේ ආදායමට වඩා 2 1/2 ගුණයකින් වැඩිය. ඡන්දය පාවිච්චි කිරීමේදී වැඩිහිටි ජනගහනයෙන් 70% ක් ඡන්දය පාවිච්චි කරන අතර තරුණ ඡන්දදායකයන්ගෙන් ඡන්දය පාවිච්චි කරනු ලබන්නේ 33% ක් පමණි.

ශ්‍රී ලංකාවේ තත්ත්වයන්ද මෙම ගෝලීය ප්‍රවනතාවන් අනුගමනය කිරීමට බැඳී ඇත. දැනටමත් මිලියන දෙකක් වන වැඩිහිටියන්ගෙන් ඡන්දදායක ප්‍රතිශතයෙන් 1/6 ක් සමන්විත වන අතර ඔවුන්ගෙන් 90% ක්ම ඡන්දය ප්‍රකාශ කරති. ඡන්දයේදී නුදුරු අනාගතයේදීම වැඩිහිටි සහයෝගිතාවය ලබා ගැනීමට නම් දේශපාලන පක්ෂවලට වැඩිහිටියන්ට බලය ලබාදීමේ ප්‍රතිපත්ති පිළිබඳ අවධානය යොමු කිරීමට බල කෙරෙනු ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථික අංශයෙන් 90% ක්ම පාලනය කරනු ලබන්නේ වෘද්ධ ව්‍යාපාරික පුරෝගාමීන්ගේ ප්‍රධාන පෙළේ පවුල් සංස්ථා මගිනි. විශ්‍රාම අරමුදල්ද ශ්‍රී ලංකාවේ බොහොමයක් සුපිරි වෙළඳ සමාගම්වල බහුතරයක් කොටස් පාලනය කරන්නා බවට පත්වී ඇත.

වැඩිහිටි ජාතික සභාවේ පළමු තීරණයන්ගෙන් එකක් නම් දිවයින පුරා සිටින වැඩිහිටියන් වැඩිහිටි සමාජ බවට පත් කිරීමයි. මේ දක්වා ගම් මට්ටමේ වැඩිහිටි සමාජ 2500 ක් රටේ බොහෝ පළාත්වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සමාජ සේවා කාර්යාල මෙන්ම ග්‍රාම සේවකවරුන්ගේ සහාය ඇතිව සංවිධානය කර ඇත. වැඩිහිටි සමාජවලින් දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ සංවිධාන සමන්විත වේ.

වැඩිහිටි සමාජ බලාපොරොත්තු වන්නේ කුමක් කිරීමටද? වැඩිහිටි සමාජයක ප්‍රාථමික අරමුණ වන්නේ මෙම වර්ධනය වන වැදගත් සමාජ ස්ථරය කිසිදු දේශපාලනමය බෙදීමකින් තොරව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කළ 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නීතියෙන් සුරක්ෂිත කරන ලද ඔවුන් සතු අයිතිවාසිකම් සහ වගකීම් වටහා ගැනීම සඳහා සංවිධානය කිරීමයි. දෙවන අරමුණ වන්නේ වැඩිහිටියන් ශක්ති හීන කොටසක් ලෙස කොටු කර නොතබා සංවර්ධන ක්‍රියාදාමයට නැවත ඇතුළු කිරීම සඳහා ක්‍රම සහ විධි පිළිබඳ ගවේශනය කිරීමයි. වර්ෂ 2002 අප්‍රේල් මැඩ්රිඩ් හිදී පවත්වන ලද දෙවන සම්මේලනයේදී මැඩ්රිඩ් ජාත්‍යන්තර වැඩ පිළිවෙළ සම්මත කරගත් අතර වැඩිහිටියන් පුණ්‍ය වැඩපිළිවෙලින් ඉවත් කොට සංවර්ධන වැඩ පිළිවෙලට ඇතුළු කරන ලදී. සංවර්ධනයට දායක වන ආකාරය පිළිබඳ පහළ මට්ටමේ සාකච්ඡා කිරීමට වැඩිහිටියන්ට අවස්ථාව ලබාදෙන බලවේගය වැඩිහිටි සමාජ වේ.

වැඩිහිටි සමාජවලට වැඩිහිටි සෞඛ්‍යාබද්ධ හුදෙකලා බව අඩු කර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් නිර්මාණය කිරීමෙන් අලුත් පන්නයේ ක්‍රම ඇති කර ගත හැක. ඔවුන්ගේ ප්‍රයෝජනවත් ජීවිතය නොවැදගත් බවට පත් වී ඇතැයි අශුභවාදී ලෙස සිතන වැඩිහිටියන්ට තමා වඩ වඩාත් හුදෙකලා වෙමින් සිටින බවට හැඟීමක් ඇති වේ. මෙනිසා ඔවුන් නොසලකා හරින ලද කොට්ඨාශයක්ය යන හැඟීම අඩු කිරීම සඳහා වැඩිහිටි සමාජ මගින් ක්‍රීඩා සංස්කෘතික හා නිර්මාණාත්මක කර්තව්‍යයන් සංවිධානය කළ යුතුය. අලුතින් පිහිටුවා ඇති වැඩිහිටි දිවා මධ්‍යස්ථාන මගින් වැඩිහිටියන්ගේ සමාජ-මනෝ අවශ්‍යතා සැපයිය යුතුව ඇත.

වැඩිහිටි ජාතික සභාව මගින් වැඩිහිටියන්ගේ අවශ්‍යතාවන් තක්සේරු කිරීමේ පෘථුල සමීක්ෂණයක් දියත් කොට ඇත. වැඩිහිටි හිතකාමී ප්‍රතිපත්ති වර්ධනය කිරීම සඳහා දත්ත මත පදනම් වූ වැඩිහිටියන් සම්බන්ධ පෘථුල සැලැස්මක් අවශ්‍යය. වැඩිහිටියන් සඳහා මානුෂීය වැඩ සටහන්වලට මූල්‍යාධාර සැපයීමට ජාත්‍යන්තර සහයෝගය පහසු කරලීම සඳහා මෙවැනි සමීක්ෂණ මූලාරම්භකරණය කළ යුතු බව මැඩ්රිඩ් ජාත්‍යන්තර වැඩ පිළිවෙළින් නිර්දේශ කොට ඇත.

මේ දක්වා දිළිඳු රටවල වැඩිහිටි ගැටලු සම්බන්ධව කටයුතු කිරීමෙහි ලා සත්‍ය ලෙසම ජාත්‍යන්තර සහාය ලැබී ඇති බව නොපෙනේ. මන්දයත් මෙවැනි දේවල් සංවර්ධිත රටවල ප්‍රතිපත්තිවලට අභියෝග ලෙස සැලකෙන නිසාය. ප්‍රමාණවත් ජාතික ආදායම් මට්ටමක් නැතත් ශ්‍රී ලංකාවේ මෙන් මිනිස් හිතකාමී සෞඛ්‍ය හා අධ්‍යාපනික ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන් රටවල්වල වැඩිහිටි ජනස්ථරයේ වැඩිවීම සිදුවන බව වර්තමානයේ පිළිගැනීම වී ඇත. කෙසේ වෙතත් මෙවැනි මානුෂීය සංවර්ධන ආදර්ශයන් පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර සහයෝගය අත්‍යවශ්‍යය.

# රැකියාව අහිමි වීම සහ බංකොලොත්භාවයට පත්වීමට ඔබට බලපාන හේතු සහ ඊළඟට කළ යුත්තේ කුමක්ද?

මෙම අධික තරගකාරී ලෝකයේ තම පැවැත්ම සඳහා සෑම අයෙකුම මුදල් ඉපයිය යුතුය. රැකියා සඳහා ඉල්ලුම සෑම විටම පවතින අතර අවශ්‍යතාවය ඇති අය සඳහා ඔවුන් ඉතා වටිනාකමක් බවට පත්වේ. ඇත්ත වශයෙන්ම එසේ විය යුත්තේ මෙම ලෝකයේ ඕනෑම පුද්ගලයෙකුගේ පැවැත්ම එම ඉල්ලුම විසින් රඳවා තබා ගනු ලබන නිසාය. මෙම වාතාවරණයෙහිදී තවමත් තම රැකියා අහිමි වීමෙන් සියල්ල අවසන් වන පුද්ගලයින් සිටින අතර මෙම ක්‍රියාවලිය මගින් ඔවුන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන් හට විවිධ අහිතකර බලපෑම් එල්ල විය හැකිය. නවතම ප්‍රශ්න සමුදායක් මෙම පුද්ගලයන් වෙනුවෙන් මග බලා සිටින අතර බංකොලොත්භාවය මෙම දිනවල නැගී එන ගැටලුවක්ව පවතී.

කෙසේ වෙතත් රැකියාව අහිමි වීමත් සමඟම නැගී එන මෙම ගැටලුවත් සමග ගණුදෙනු කරන ආකාරය සඳහා යොමුවීමට පෙර, ඕනෑම අයෙකුට රැකියාව අහිමි වීමට වඩාත් මූලික වන යම් හේතූන් දැක්වීම සඳහා අපට ඉඩ ලබාදෙන්න.

පහත ලැයිස්තුවෙහි දැක්වෙන ලෙස:

දුර්වල ක්‍රියාකාරිත්වය - එය සැබැවින්ම ලයිස්තුවේ ඉහළින්ම පවතින අතර ඔබගේ රැකියාව රඳා පවතින්නේ එය මත වීම එයට හේතුව වේ.

විෂමාචාරය - මෙය ඊළඟ හේතුව වන අතර ඔබ, ඔබ වෙනුවෙන් සම්පාදනය කර ඇති නීති රීතිවලට අවනත නොවන විට අනිවාර්යෙන්ම ඒ ඒ සඳහා ප්‍රතිවිපාක පවතී.

සේවක කප්පාදුව - විශේෂයෙන්ම ක්‍රියාකාරීත්වය හොඳින් සිදු නොවන සමාගම්වල ඇති ප්‍රමුඛතම ගැටලුවකි.

දේශපාලන හේතූන් - ඇත්ත වශයෙන්ම, සමාගම තුළ ඔබගේ තනතුර සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීම ඔබට අවාසියක් විය හැක.

යමෙකුගේ රැකියාවේ වටිනාකමට හේතු වන සාමාන්‍ය සහ පොදු කරුණු කීපයක් පවතී. කෙසේ වෙතත්, ඔබ ඔබේ පාඩුව දරාගත් පසුවද මුහුණ දීමට ප්‍රශ්න රැසක් ඇත. ඒ අතරින් අවුරුදු ගණනාවක් පුරාවට විශේෂිතව කැපී පෙනෙන මෙන්ම ජනතාව දැනුවත් කළ යුතු කරුණ වන්නේ බංකොලොත්භාවය වේ. සාමාන්‍යයෙන් එය සමඟ කටයුතු කරන ආකාරය සහ එය වෙනුවෙන් කුමන පියවරක් තැබිය යුතුද යන්න පිළිබඳව මිනිසුන් හට පැහැදිලි අවබෝධයක් නොමැත.

ආරම්භයක් ලෙස, ඔබ බංකොලොත්භාවය යනු කුමක්ද යන්න තේරුම් ගත යුතුය. බංකොලොත්භාවය යනු තම මූල්‍යමය අවශ්‍යතා සපුරා ගැනීමට පුද්ගලයෙකු හට ඇති නොහැකියාව වන අතර එම නිසා යම් පුද්ගලයකුගෙන්, සමාගමකින් හෝ යම්කිසි ආයතනයකින් ලබාගෙන ඇති ණය මුදලක් ගෙවා ගැනීමට නොහැකි වීමයි. යමෙකුගේ රැකියාව අහිමි වීම යනු ඔහු සතුව ඇති ක්‍රමානුකූල ආදායම නතර වීම වන අතර, එය එම පුද්ගලයාව අනිවාර්යෙන්ම බංකොලොත්භාවය කරා රැගෙන යනු ඇත.

## ඊළඟට ගත යුතු වැදගත්ම පියවර කුමක්ද?

බංකොලොත්භාවය සහ බුන්වත්භාවයට පත්වීම එක් දෙයක් වුවද ඒ සමග ගණුදෙනු කිරීමේදී පවතින ණයවලින් මිදීමට ඔබගේ ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. මිනිසාගෙන් මිනිසාට තත්ත්වය වෙනස් වන නිසා සැමටම එක් ක්‍රමයක් අර්ථ දැක්විය නොහැකි නමුත් ඒ වෙනුවෙන් සුදුසු සහ බුද්ධිමත් ආකාරයෙන් ගණුදෙනු කළ යුතුය. කෙසේ වෙතත්, බංකොලොත්භාවය පිළිබඳව ගණුදෙනු කිරීමේදී තවත් ප්‍රශ්න ඇති කර නොගෙන පවතින ගැටලු විසඳා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදයෙහි පොදු පියවර කිහිපයක් පවතී.

බංකොලොත්භාවයෙන් පහසුවෙන් මිදීමට සහ ඔබගේ සියලුම ණයවලින් නිදහස් වීම සඳහා ශක්තියක් ලබා ගැනීමට පහත පියවර අනුගමනය කරන්න.

## ඔබගේ වත්කම් තක්සේරු කරන්න

'පළමු දේ පළමුව'. එම නිසා රැකියාවක් නොමැති පුද්ගලයෙකු වන විට ඔබගේ මූල්‍යමය තත්ත්වය පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සඳහා ඔබ ඔබගේ වත්කම් පිළිබඳව විස්තරාත්මකව විමසිය යුතුය. ඔබගේ වත්කම් පිළිබඳව තේරුම් ගන්නා අතරම ඔබට ඔබගේ ණය ගෙවීම මගින් උපකාර කළ හැකි අය පිළිබඳවද තොරතුරු සොයා බලන්න.

## දැරීමට හැකි අයවැයක් සකසා ගන්න

ඔබගේ අවශ්‍යතාවයන් ගැන සලකා ඉතිරි මුදල් ඔබේ සියලුම අත්‍යවශ්‍ය වියදම් ආවරණය කළ හැකි වන ලෙසට කළමනාකරණය කරගන්න. ඔබගේ පැවැත්මට ඇති මූලික අවශ්‍යතාවයන් සහ අත්‍යවශ්‍ය දේ සඳහා මුදල් වෙන් කිරීමට වාර්තා සකසන්න. එසේ කිරීමෙන් අනතුරුව ඔබගේ ණය ගෙවීම සඳහා උපකාර වන සියලුම වත්කම් සහ මුදල් ලැයිස්තුවක් නිර්මාණය කරගත හැකිය. ණය බරින් නිදහස් වී ස්ථාවරව සිටීම ඔබගේ එකම අභිප්‍රාය නම් එය මේ අයුරින් සිදුකළ යුතුය.

## ණය පිළිබඳ සැලකිලිමත්ව සිටින්න

දැන්, ඔබගේ වත්කම් සහ අත්‍යවශ්‍ය දේ සඳහා වියදම් පිළිබඳ පැහැදිලි අදහසක් ඔබ සතුය. එම නිසා දැන් ඔබගේ විරැකියා සමයේදී වුවද ඔබගේ ණයෙන් යම් ප්‍රමාණයක් නිදහස් කළ හැකිය. ඔබ ණය ගෙවීම වෙනුවෙන් වෙන් කරන ලද මුදලින් හැකිතාක් ප්‍රමාණයක් නියමිත වේලාවට ගෙවන්න. එය ඔබගේ ණය බර අඩු කිරීමට උපකාර වන අතර අවසානයේදී බංකොලොත් බවින් මිදුණු පසුව ඔබ ළඟ මුදලක් ඉතිරි වනු ඇත.

තවදුරටත්, අයහපත් අත්දැකීම් ඇති නම් ඒවාගේ ප්‍රතිවිපාකද ඇතුළත් වන ලෙසට සාදන ණය වාර්තාවෙහි ඔබගේ මූල්‍යමය තත්ත්වය පිළිබඳ වඩාත් යහපත් ප්‍රතිරූපයක් ඇති කිරීමටද උපකාරී වේ. යහපත් වාර්තාවක් සැමවිටම ඔබගේ ඊළඟ රැකියා අවස්ථාව සඳහා යහපත් පෙනුමක් ලබාදෙයි.

## ප්‍රමුඛතාකරණය

මෙම තත්ත්වයන් යටතේ ජීවත් වන අතරතුර ඔබ අත්පත් කරගත යුතු වඩාත්ම වැදගත් ගුණාත්මක භාවය වන්නේ නිවැරදි ලෙස ප්‍රමුඛතාකරණය සිදු කිරීමයි. ඔබ ඔබගේ සැබෑ අවශ්‍යතා ප්‍රමුඛතාකරණය කළ යුතු නමුත් ඔබ ණය ගෙවීමේදී එය නැවතත් ප්‍රමුඛතාකරණය කිරීමට අවශ්‍ය වේ. එවැනි තත්ත්වයන් යටතේ ඔබ පළමුව කුඩා ණය ගෙවීමට තෝරාගත යුතු අතර, එමගින් ඔබගේ මනසෙහි ඇති ණය ප්‍රමාණය අඩු කරනු ඇත. මෙය දෙස බැලිය හැකි තවත් ආකාරයක් නම්, වැඩි පොලී අනුපාතිකයන් සහිත ණය දෙස අවධානය යොමු කිරීමයි. මේ ආකාරයට ඔබ ගෙවිය යුතු පොලී ප්‍රමාණය අඩුකර ගත හැකිය. මෙය නැවතත් දිගු කලකදී යම් මුදලක් ඉතිරි කර ගැනීමට උපකාරී වනු ඇත.

## ණය හිමියන් සම්බන්ධ කර ගන්න

මෙය ගත යුතු තවත් වැදගත් පියවරකි. ඔබගේ ණය හිමියන් අමතා ඔබගේ තත්ත්වය ඔවුන්ට පැහැදිලි කරන්න. ඔබගේ මූල්‍යමය තත්ත්වයන් සහ වටිනාකම ඔවුනට පැහැදිලි වූ විටදී ඔබට ඔබගේ ගිවිසුම සංශෝධනය කිරීම සඳහා ඉල්ලුම් කළ හැකිය. මෙය පොලී අනුපාතිකයේ හෝ මුදල් ප්‍රමාණයේ අඩු කිරීමක් ලෙස හෝ ණය පියවීම සඳහා ලබාදී ඇති කාලය දීර්ඝ කිරීමක් විය හැකිය.

## තවදුරටත් ණය ලබා ගැනීමෙන් වළකින්න

මෙම තත්ත්වයේදී කිසිදු අවස්ථාවක තවත් අලුත් ණයක් වෙතට යොමු වීමට ඔබට ඉඩ ලබා නොදෙන්න. එයින් ඔබට සිදුවන යහපතක් නොමැත. එය චර්යානුගත කර ගැනීමට ඔබට ලැබෙන ඕනෑම කුඩා රැකියාවක් කරන්න. නමුත් කිසිදු අවස්ථාවක ණයට මුදල් ලබා නොගන්න. මක්නිසාද යත් එමගින් ඔබගේ තත්ත්වය තවත් නරක අතට හැරෙනු ඇති අතර බංකොලොත්භාවය මිදීමට නොහැකිව එය උගුලක් බවට පත්වනු ඇත.

එබැවින්, ඔබ මෙවන් අවාසනාවන්ත තත්ත්වයකට පත් වුවහොත් මෙම සුළු උපක්‍රමයන් මතක තබාගන්න. දුෂ්කර කාලයන් අතරතුරේදී වුවද ණය ගෙවීම සඳහා අවධානය යොමු කිරීම නිවැරදි මාර්ගය බව ඔබ ඔබගේ සිහියේ තබා ගන්න. මෙම ආකාරයන්ට කටයුතු කිරීමෙන් ඔබගේ ගැටලුවලට තරමක් ඉක්මනින් පිළිතුරු සැපයෙනු ඇත.

**ඕනෑම මූල්‍යමය ගැටලුවක් සඳහා** gtacredit.com **වෙබ් අඩවියට පිවිසෙන්න හෝ** 416 650 5400 **අමතන්න.**

# ආයු බෝ වේවා !
# 'තීන්දුව කල් දමාගැනීමට පුළුවන්'



■ තුසිත මලලසේකර

යුරෝපීය ඇඳුමින් සැරසී ටයි පටියක්ද පැළඳ සිටි වයස 40 ක් පමණ පෙනුමැති ඔහු මා දුටුවේ වෛද්‍යවරයකුගේ සායනයකදීය. වෛද්‍යවරයා ඔහුගේ රුධිර පීඩනය මැන "ඔයා ගේ බ්ලඩ් ප්‍රෙෂර් එක හුඟක් වැඩියිනේ" යි පවසනු ඇසිණි.

ඊළඟට මා දුටුවේ වෛද්‍යවරයා අසල ක්ලාන්තව බිම ඇද වැටුණු රෝගියාය. බැලූ බැල්මට පෞද්ගලික අංශයේ විධායක නිලධාරියකු යැයි නිගමනය කළ හැකි ඔහුට වෛද්‍යවරයාගේ ප්‍රකාශය 'මරණ තීන්දුවක්' වූවා විය හැකිය. සිය කළණ බිරිඳ, චූටි දූ පුතුන්, ගත් නිවාස ණය, වාහන බද්ද, මේ සියල්ල මතකයට නැගෙන්නට ඇත.

"ප්‍රෙෂර් එක වැඩියි - ඊළඟට මරණය" ලෙස දෝංකාර දුන් තම සිත ඉදිරියේ ඔහු කම්පනයට පත් වන්නට ඇත. එහෙත් එය එසේ විය යුතු නැත.

වෛද්‍ය සඟරාවක මා කියවූ මේ වාක්‍යය බලන්න.

'පිළිකාව සුව කළ හැකියි. අධික රුධිර පීඩනය, දියවැඩියාව පාලනය කළ හැකියි. හෘදයාබාධ සඳහා පිළියම් කළ හැකියි.'

එසේ නම් සමහර විට 'මරණ තීන්දුවක් සේ' පෙනිය හැකි වෛද්‍යවරයාගේ රෝග විනිශ්චයට මුහුණ දීමට අපට නොහැකිද?

"මෙයා ජීවත් වෙන්නෙ තව තුන් මාසයයි. නැත්නම් අවුරුද්දයි. එහෙමත් නැතිනම් වැඩිම වුණොත් අවුරුදු 5 යි." වැනි තීන්දු අවසාන තීන්දුම නොවේ. ඔබට අභියාචනා කළ හැකිය. එසේ අභියාචනා කර තීන්දුව කල් දමා ගත් ධෛර්ය සම්පන්න අය අප අතරද සිටිති.

මේ අභියාචනයට පෙර මෙවැනි 'තීන්දුවක්' හමුවේ අප පියවර 4 කට යොමුවන බව මනෝ වෛද්‍ය මතයයි. ඉන් පළමුවැන්න 'කම්පනය' සහ/හෝ 'ප්‍රතික්ෂේප කිරීම' යි.

".....පිස්සු ද මට එහෙම වෙන්න විදියක් නැහැ. මට කොහොමද එහෙම වෙන්නේ.....? අපේ පරම්පරාවල කාටවත් මේ වගේ ලෙඩ නැහැ....." වැනි අදහසක් පළ කරමින් වෛද්‍යවරයාගෙන් වෛද්‍යවරයා වෙත යමින් සහ සමහර වෙලාවට සනාථ නොකළ ප්‍රතිකාර සපයන හොර වෙදුන් වෙත යෑමට මේ අවස්ථාවේදී පෙලඹීම සාමාන්‍ය දෙයකි. තවත් සමහර වෙලාවට මුලදී සඳහන් කළ රෝගියා මෙන් කම්පනයට පත් වීමටද පිළිවන.

දෙවැනි අදියර, තරහව සහ ඒ හා සමගම වරදක් කළාක් වැනි හැඟීමක් ඇති වීමයි.

තමන් සමගම තම හිත මිතුරන්, පවුලේ අය මෙන්ම සමාජය කෙරෙහිද වෛර කිරීමක් මෙහිදී දැකිය හැකිය.

"ඇයි....මම ඔච්චර කල් තෙල් කෑම කෑවේ?"

"ඇයි මගේ බිරිඳ මට තෙම්පරාදු කළ කෑම දුන්නේ?"

"ඇයි මම ඒ හදිස්සියේ හම්බ වෙච්ච කෙනත් එක්ක අනාරක්ෂිත ලිංගික සම්බන්ධතාවක් පැවැත්වූවේ?"

සමහර විට මේ අය සෞඛ්‍ය සේවකයන් සහ තමන්ට සහන සලසන අයටද වෛර කරති.

තෙවැනි අදියර යම් මානසික අවපීඩනයකට නැතිනම් විෂාදයකට පත් වීමයි. තමන් වැටී සිටින තත්ත්වය, වැළඳී තිබෙන රෝගය ගැන බොහෝ සේ පසුතැවෙන, දුක් වන, හඬන මේ

**22 වන පිටුව බලන්න**

LESSON 14

Hope you are progressing well in learning new French words and grammar! Last lesson has laid the very foundation to conducting a basic conversation at a French restaurant. By now you have a certain knowledge about how French conversations and grammar work. There were some exercises given in order for you to put what you learnt so far in to practice. If there are questions with regard to any of the lessons or if you want your exercises to be corrected, you can email them to kumudu4444@gmail.com.

This month's Dasatha issue presents you all the question words in French language. You will soon be able to ask questions and hold a proper conversation once you learn these words. The grammar lesson continues as usual to improve your grammar knowledge and to help you construct sentences using correct grammar. Exercises will help you put what you learnt so far in to practice. Enjoy learning! Thank you!




## Le Vocabulaire (ලවොකැබියුලෑර්) - Vocabulary



The vocabulary section of this month's Dasatha issue presents a lesson on the vocabulary used for asking questions. When conversing with a person you would definitely need to know the question words of a language. Even if you come across a situation in which you would run out of words, you can just point out at the thing and just ask the question word. Therefore, you would be able to express yourself even without having a rich vocabulary.

Qui? (Who?) - කී
Qu'est-ce que? (What?) - කෙස්ක
Quand? (When?) - කොං
Où? (Where?) – ඌ
Pourquoi? (Why?) – පුකුවා
Comment? (How?) - කොමොං
Combien? (How much/How many?) - කොම්බියැං
Quelle? (Which?) – කෙල්
Y a-t-il? (Is there? Are there?) – යතිල්

**Let us use these question words in some sentences:**

À quelle heure le restaurant ferme ? - What time does the restaurant close?-. (ආකෙල්අර් ල රෙස්තොරොං ෆැර්ම්)

Où habite ta fille? - Where does your [informal] daughter live? (ඌඅබිලත් තාෆී)

Quand est la réunion? - When is the meeting? (කොං ඒ ලා රෙයුනියොං)

Comment est-ce que je vais au bureau ? - How do I get to the office? (කොමොං එස්ක ෂ වෙ ඕ බියුරෝ)

Où est la banque? - Where is the bank? (ඌ ඒ ලා බොංක්)

Quand faut-il régler la note ? - When is checkout time? (කොං ෆෝතිල් රේග්ලේ ලා නෝත්)

**Here is a conversation where you could see the correct use of question words:**

Hélène : Qui est cet homme ? (Who is that man?) – කී ඒ සෙලත් ඔම්
Françoise : C'est mon frère. (He's my brother.) – සෙ මොං ෆ්‍රෑර
Hélène : Qui sont ces filles ? (Who are these girls?) - කී සොං සෙ ෆී
Françoise : Ce sont mes amies. (They are my friends.) – එල් සොං මෙස් අමී
Hélène : Où vas-tu ? (Where are you [informal] going?) - ඌ වතියු
Françoise : Je vais au cinéma. (I am going to the cinema.) - ෂ වෙ ඕ සිනෙමා
Hélène : Où sont les livres ? (Where are the books?) - ඌ සොං ලෙ ලීව්‍ර
Françoise : Ils sont sur la table. (They are on the table.) - ඉල් සොං සියුර් ලා තාබ්ල
Hélène : Où se trouve le musée ? (Where is the museum?) - ඌ ස තෲව් ල මියුසේ
Françoise : Il se trouve au cinquième étage. (It is on the 5th floor.) - ඉල් ස තෲව් ඕ සැන්කියෙම් එතාෂ්
Hélène : Quand partons-nous? (When do we leave?) – කොං පර්තොං නූ
Françoise : Nous partons demain. (We will leave tomorrow.) – නූ පර්තොං දමැං
Hélène : Combien coûte cette robe ? (How many suitcases do you have?) – කොම්බියැං කූත් සෙත් රෝබ්
Françoise : Elle coûte vingt dollars. (It costs 20 dollars.) – එල් කූත් වැංග් දොලාර්
Hélène : Qu'est-ce que tu fais ? (What are you doing?) – කෙස්කතියු ෆෙ
Françoise : Je fais un gâteau. (I am making a cake.) – ෂ ෆෙ අන් ගතො
Hélène : Comment vas-tu ? (How are you?) – කොමොං වාතියු
Françoise : Je vais très bien. (I am making a cake.) – ෂ වෙ ත්‍රෙ බියැං)

** By inverting the subject pronoun and the verb of a sentence you can turn a normal statement in to a question or simply use the question word 'Est-ce que' in front of the statement.*

Ex: Elle mange une pomme. (She is eating an apple.) – එල් මොංෂ් යුන් පොම්
Mange-t-elle une pomme ? (Is she eating an apple?) – මොංෂ් තෙල් යුන් පොම්
Est-ce qu'elle mange une pomme ? (Is she eating an apple?) එස්කෙල් මොංෂ් යුන් පොම්

## Grammaire (ග්‍රාමෑර්) Grammar



Hope you studied the lesson on possessive adjective presented in the last issue of Dasatha! Now you must be able to construct sentences to indicate possession. In this issue, we are going to learn the expressions that go with the verb 'Avoir' in French language. These expressions are very important when constructing proper sentences.

**Avoir Expressions**

Avoir is used in many idiomatic expressions in French:

| | |
|---|---|
| Avoir besoin de | - to need |
| Avoir envie de | - to want (to do something),<br>- to feel like (doing something) |
| Avoir l'intention de | - to intend to (do something) |
| Avoir faim | - to be hungry |
| Avoir soif | - to be thirsty |
| Avoir chaud | - to be hot |
| Avoir froid | - to be cold |
| Avoir honte (de) | - to be ashamed (of) |
| Avoir mal (à la tête, à la gorge, aux yeux) | - to hurt (to have a headache, to have a sore throat, to have sore eyes) |
| Avoir raison | - to be right |
| Avoir tort | - to be wrong |
| Avoir sommeil | - to be sleepy |

Ex: J'ai vingt ans. (I am 20 years old)
J'ai faim (I am hungry)
J'ai mal à la tête (I have a headache)

## Exercices (එක්සැර්සිස්) – Exercises

**Translate in to French**

1.) What is the date today?
2.) Are they friends?
3.) Why are you eating an apple?
4.) He is my cousin's son.
5.) Their aunt is my grandmother.
6.) We are not making a pizza.
7.) The small black cat is under the big green table.
8.) When are you singing?
9.) Who is your sister?
10.) They like my friend who is a doctor.
11.) The book that my father gives me is hard to read.
12.) The birthdays are very amusing.
13.) The animals are at the zoo.
14.) We like the castles on the beach.
15.) How much is that cake?

**Fill in the blank with the correct form of être.**

1.Edouard ______ un escargot français.
2.Tex et Tammy ______ des tatous.
3.Les étudiants de Tex: Nous ne ______ pas français.
4.Tammy: Je ______ étudiante à l'université du Texas.
5.Joe-Bob demande: Tu ______ américain?
6.Tex, vous ______ professeur?
7.Joe-Bob: Tu ______ d'où?
8.Tex: Je ______ intelligent.
9.Joe-Bob et Corey, vous n'______ pas des dentistes!
10. Joe-Bob et Corey ______ américains.
11. Joe-Bob ______ de College Station.
12. Rita: Je ne ______ pas coiffeuse.

**Fill in the blank with the correct interrogative word: où, quand, comment , combien, pourquoi.**

1. Bette : ____________ est-ce que tu vas en vacances cet été? En France?
2. Tex : _______________ est-ce que je ne suis pas bigame ('bigamous')?
3. Tammy : ______________ est-ce qu'on fait des crêpes? J'ai besoin d'une recette.
4. Corey : ______________ est-ce que le film commence? A 9 heures?
5. Tex : ______________ est-ce que ça coûte? $20?
6. Tammy : Tex, ______________ est-ce que tu vas m'épouser ('marry me')? En 2010?
7. Tex : Tammy, ______________ est-ce que tu trouves mes poèmes? Bons ou mauvais?
8. Fiona : _________ est-ce que vous allez manger ce soir? Au MacDo?
9. Edouard : Ah Tex, bonjour. ___________ vas-tu aujourd'hui?
10. Tammy : _____________ est-ce que Bette pèse? Elle a grossi!
11.Tex : _______________ est-ce qu'Edouard parle avec un accent français? Parce qu'il est français!
12. Tammy : C'est ______________ l'anniversaire de Tex?

**Kumudu Abeywardena**
Masters (French Literature), BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com

## දවසින් දවස...

7 වන පිටුවෙන්

මෙසේ වූයේ ඇයි ? යන්න ආපසු හැරී බැලිය යුතු ප්‍රශ්නයකි. එයට දැක්විය හැකි පිළිතුරු රාශියකි. ප්‍රධානම එක නම් ඡන්දයක් දිනාගැනීමෙන් පසු ජනතාවත් මන්ත්‍රීවරයාත් අතර ඇති වන දුරස්ථතාවයි. ඡන්දය දිනා ගැනීමට පෙර ජනතාවගේ සේවකයා වන මන්ත්‍රීවරයා දිනා ගැනීමෙන් පසු ජනතාවගේ ස්වාමියා වී ඡන්ද දායකයා තම සේවකයා බවට පත් කර ගැනීමයි. ඡන්දයට පෙර දුන් පොරොන්දු කෙසේ වෙතත් නිවස තුළ සිටිද්දී 'මන්ත්‍රී තුමා ගෙදර නැහැ' යි බිරිඳ ලවා, සේවකයින් ලවා කියවන තැනට පත්ව තිබීමයි. ඡන්ද දායකයන් දුටු විට ඔවුන් 'නයාට අඳු කොළ' සේ වීමයි.

ජනතා ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුවද තමන් පාර්ලිමේන්තුවට තේරී පත් වූයේ කුමක් සඳහාද? ඒ කවුරුන් උදෙසාද යන්නවත් මන්ත්‍රීවරයාට අමතක වීම තවත් කරුණකි. පසුගිය දිනක 'මැති සබේ කට්ටි පනින මැති ඇමතින්ට වැටක්' යන ශීර්ෂය යටතේ පුවත්පතක පළ වූ වාර්තාව ඊට කදිම සාධකයකි. ඉන් කියැවුණේ වාචික ප්‍රශ්න ඇසීම හා පිළිතුරු දීම මගහරින, පාර්ලිමේන්තු සභා වාරයන්ට නොපැමිණෙන මැති ඇමතිවරුන්ට එරෙහිව කටයුතු කළ හැකි ස්ථාවර නියෝග පාර්ලිමේන්තුවට ගෙන ඒමට කටයුතු යොදමින් සිටින බවයි. ජනතාවට බලපාන ප්‍රශ්න ඇසීමට හෝ පිළිතුරු දීමට මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට පැමිණ සිටිය යුතුය. එහෙත් දිනකට රුපියල් ලක්ෂ 45 ක් වැය කොට පවත්වනු ලබන පාර්ලිමේන්තුවට අවුරුද්දකට ඇතැම් මන්ත්‍රීවරුන් පැමිණ ඇත්තේ දෙතුන් වරක් පමණක් බවද එම වාර්තාවේ කියැවිණි. එපමණක්ද නොවේ, වසර 5 කට පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරුන් වසර 5 පුරාම වචනයක් වත් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කර ගැනීමෙන් වැළකී සිටින්නේ ගොළුවන් ලෙසිනි.

රජයේ සේවකයකු එක් දිනක් සේවයට වාර්තා නොකළ හොත් හේතු විමසද්දී වැටුප් ලබන, විශ්‍රාම වැටුප් ලබන මේ අය අවුරුද්ද පුරාම නොපැමිණියත් ප්‍රශ්න කරන කෙනෙක් නොසිටීම ඔවුන්ගේ භාග්‍යයක්ද? ජනතාවගේ අභාග්‍යයක්ද?

පෙර පාර්ලිමේන්තුව ජනතාවට බලපාන ප්‍රශ්න අසන තැන වී තිබුණද අද පාර්ලිමේන්තුව තමන්ගේ වැටුප්, විශ්‍රාම වැටුප්, පර්මිට් ආදිය ගැන ප්‍රශ්න අසන තැන බවට ඔවුන් විසින් පත් කොටගෙන තිබීමද ජනතා ගෞරවය කෙලෙසීමට තවත් හේතුවකි.

අපේ රටට හරි හමන් ව්‍යවස්ථාවක් නැත. හරිහමන් මැතිවරණ ක්‍රමයක් නැත. පාර්ලිමේන්තුව තුළ ඒ එකක්වත් සම්මත කරගත නොහැකිව ඇත්තේ එතුළ කාකොටා ගැනීම හැර අන් කිසිවක් නොකෙරෙන නිසාය. ජනතාවගේ ඇත් වීමට, ජනතාවගේ කලකිරීමට එයද ප්‍රධාන හේතුවක් නොවන්නේද? එබැවින් ඉදිරියේදී වත් මේ පිළිබඳව මන්ත්‍රීන්ගේ අවධානය යොමුවන්නේ නම් මැනවැයි යෝජනා කරනු කැමැත්තෙමු.

## සංඝ භේදය...

15 වන පිටුවෙන්

දුටු බව නිරපේක්ෂතාවයේ මග YOUTUBE වීඩියෝවක් තුළ නොබෝදා ප්‍රචාරය ඇති ආකාරය ඔබට බලාගත හැකිය. ධර්මය සොයමින් තැනින් තැන යන කවුරුන් අතට හෝ මයික්‍රොෆෝනය දී තමාගේ අධ්‍යාපන සුදුසුකම් ආදිය බලෙන් මෙන් ප්‍රකාශ කරවාගෙන තමන් ධර්මය දුන් බව ප්‍රසිද්ධ කිරීම නම් හාස්‍යජනකය. අධ්‍යාපන සුදුසුකම් හෝ රන් පදක්කම් ප්‍රමාණය මත නොව ක්‍රමානුකූලව දියුණු වූ ප්‍රඥාවන් මගින් පමණක් බුද්ධ ධර්මය තේරුම් ගත හැකිය. බුද්ධ කාලයේදී පසේනදී කොසොල් රජතුමා වැනි මහා පරිපාලකයින් හෝ බොහෝ ලෙස බුදුරජුන්ට දන් පැන් පූජා කළ මල්ලිකා දේවිය වැනි අය හෝ බුදු දහම අවබෝධ කළේ නැත. එහෙත් සංසාරයේ දිගු කලක් ක්‍රම ක්‍රමයෙන් ඥානය මුහුකුරා ගිය නමුත් දුගී දුප්පත් ලෙස බුද්ධ කාලයේදී උපත ලද සුනීත, සෝපාක, පුණ්ණා දාසිය, කුජ්ජුත්තරා වැනි අය ධර්මය අවබෝධ කිරීමට වාසනාවන්ත වූහ. බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි අථක්කාවචර වූ එනම් තර්කයට ගෝචර නොවන්නා වූ බුදු දහම ගෝචර වන්නේ ක්‍රමානුකූලව දියුණු වූ ප්‍රඥා ඉන්ද්‍රිය තුළින් පමණකි. එසේ නොමැතිව සද්ධාවෙන්, කල්පනාවෙන් හෝ තර්කයෙන් තොරව කෝසම්බිය සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි මෙම ධර්මය දැකිය නොහැකිය. අංගුත්තර නිකායේ කාම ගුණ සූත්‍රය සහ සංයුක්ත නිකායේ කෝසම්බිය සූත්‍රයන් කියවා බලන්න.

පරිවර්තනයේදී සිදු වූ සුළු සුළු දෝශ හේතුවෙන් නිවන් මග වැසී ගොස් තිබූ බවත් තමන් දේශනා කරන පටි+ඉච්ඡ+සම+උප්පාද සහ අනි+ඉච්ඡ මගින් නිවන් මග විවර වූ බවත් පවසමින් 'අනිච්ච' ඇති තැන්වල අනිච්ඡ සහ 'පටිච්ච' ඇති තැන්වල පටිච්ඡ යොදා අලුත් විකෘති අධර්ම පිටකයක් මුද්‍රණය කිරීමට මුදල් එකතු කිරීමක් අන්තර්ජාලයේ වෙබ් අඩවි තුළ දුටුවෙමි. මෙය නම් බුදුදහම කනපිට හරවන මහා විකෘතියක් බව සූත්‍ර දේශනා හදාරන අය දනිති. 'අබ' වෙනුවට 'අඹ' යෙදුවා වැනිය. මෙම මුද්‍රණය නම් බොහෝ දෙනා ධර්ම මාර්ගයෙන් ඉවත් කළ හැකි බලවත් පාප කර්මයක් බවට සැකයක් නැත. නොයෙකුත් භාෂාවලින් පරිවර්තනයන් තිබිය හැකිය. එහෙත් බුද්ධ වචනය වූ පාලි භාෂාවේ වචන නම් අවශ්‍ය පරිදි වෙනස් කිරීම ප්‍රඥාගෝචර දෙයක් නොවේ. මෙම විකෘත පිටකය මුද්‍රණය සඳහා රුපියල් කෝටියකට අධික මුදලක් වැය වන නිසා ආධාර කරන ලෙස කර ඇති ඉල්ලීම් අන්තර්ජාලයේ තිබේ. ටොරොන්ටෝවේ කණ්ඩායමක්ද මෙම විකෘත පිටකය මුද්‍රණය සඳහා ඩොලර් හත්දහසකට අධික ප්‍රමාණයක් එකතු කර ලබාදුන් බව තම වෙබ් අඩවියේ ඉතා සතුටින් මෙන් ප්‍රකාශ කර ඇත. මේ අය තමන් මහා පාපකර්මයට දායක වී ඇති බව නොදනිති. බුදුරජාණන් වහන්සේ නොවදාරන ලද දෙයක් වදාරන ලද දෙයක් ලෙස ප්‍රකාශ කොට සංඝයා අතර වාද විවාද ඇති කරවා භේද භින්න කිරීම 'සංඝ භේදය' බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.

## නොදැනීම දැස්...

18 වන පිටුවෙන්

### පෙනීම අඩු වන ආකාරය පැහැදිලි කරන්න පුළුවන්ද?

අපි යමක් දෙස කෙළින් බලන විට ඉදිරිය පෙනෙනවා වගේම දෙපසත් පේනවා. මෙය නිරෝගී ඇසක ස්වභාවයක්. යම් අයකු ඉදිරිය බලන විට දෙපස නොපෙනේ නම් එය ඇසේ දුර්වලතාවක්. මෝටර් රථයක් පදවන රියදුරකුට ඉදිරිය හොඳින් පෙනෙනවා වගේම දෙපසත් හොඳින් පෙනීම තිබිය යුතුයි. කිසියම් රියදුරකුට දෙපසින් එන වාහන නොපෙනේ නම් හා ඒ දුර්වලතාවේ වර්ධනයක් සිදුවන්නේ නම් එය ග්ලුකෝමා තත්ත්වයක් ලෙස හඳුන්වන්න පුළුවන්. මේ ආකාරයට කෙනකුගේ ඇසට දෙපස නොපෙනී ඉදිරිය පමණක් පෙනීම හා මෙය ක්‍රමයෙන් වර්ධනය වී ඉදිරියේ ඇති දේ පමණක් පෙනීම ග්ලුකෝමා තත්ත්වයක්. මේ තත්ත්වය වඩාත් වර්ධනය වීම නිසා ඉදිරියේ ඇති දේ පමණක් පෙනීම හඳුන්වන්නේ Tunnel Vision කියලයි. එසේ හඳුන්වන්නේ බිංගෙයක් තුළින් බලන කොට ඉදිරිය දකින ආකාරයට පෙනෙන නිසයි. මේ වන විට ඇසේ පෙනීම බොහෝ දුරට දුර්වල වී අවසන්. එය තවදුරටත් වර්ධනය වී ඇස් නොපෙනී යනවා. ඒ කියන්නේ ග්ලුකෝමාව නිසා අන්ධ වෙනවා.

### ග්ලුකෝමාවේ ලෝක තත්ත්වය හා ශ්‍රී ලංකාවේ තත්ත්වය කුමක්ද?

ලෝක ජනගහනය මිලියන 6000 ක් පමණ වනවා. මේ ජනගහණයෙන් මිලියන 45 ක් විවිධ හේතු නිසා අන්ධ වූ අයයි. මේ මිලියන 45 ක අන්ධ ජනතාවගෙන් සියයට 10 ක් හෙවත් මිලියන 4.5 ක් ග්ලුකොමාව නිසා අන්ධ වූ අයයි. ශ්‍රී ලංකාවේ තත්ත්වය විමසීමේදී ජනගහනයෙන් 150,000 ක් පමණ දෙනා විවිධ හේතු නිසා අන්ධ වී සිටිනවා. මෙයින් සියයට 10 කට වඩා ඒ කියන්නේ 15000 ත් 20000 ත් අතර ප්‍රමාණයක් අන්ධ වී සිටින්නේ ග්ලුකෝමාව නිසයි. මෙයට අමතරව ග්ලුකෝමාව වැළඳුණු බව නො දන්නා අයත් දහස්ගණනක් ඉන්නවා.

### අපි දන්නා පරිදි ග්ලුකෝමාව ටිකෙන් ටික ඇසට නොදැනී වැළඳෙන රෝගයක්. මේක හදිසියේත් වැළඳීමට හැකියාව තිබෙනවා ද?

ග්ලුකෝමාව හදිසියේ වැළඳීම ඉතාම කලාතුරකින් සිදුවන්න ඉඩ තිබෙනවා. මේ තත්ත්වය Acute Glaucome කියලයි හඳුන්වන්නේ. මේ තත්ත්වය ඇති වුණොත් ඇසේ ඉතාම අධික වේදනාවක් හටගන්නවා. ඇස් රතු වීම, හිසේ තදබල වේදනාව, වමනය දැමීම වැනි රෝග ලක්ෂණ මතු වෙනවා. මේ ක්ෂණික ග්ලුකෝමා තත්ත්වය ග්ලුකෝමා රෝගීන් දහස් ගණනකින් එක් අයකුට ඉතාම කලාතුරකින් ඇති විය හැකියි. මෙවන් අවස්ථාවකදී අක්ෂි රෝග විශේෂඥ වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාර ගැනීම අත්‍යවශ්‍යයි. වෙනත් රෝගයක් කියා විවිධ ප්‍රතිකාර කිරීම රෝගය උත්සන්න වීමට හේතුවක් වෙයි.

### මෙසේ සිදු වීමට හේතුවක් තිබෙනවාද?

ඇසේ දියරය පිටතට ගැලීම හදිසියේ නැවතීම ප්‍රධාන හේතුවක්. ඇසට විෂබීජයක් යෑමෙන් හෝ තුවාලයක් වීමෙන් හෝ දියරය පිටතට ගැලීම හදිසියේ නැවතිය හැකියි. මේ නිසා ඇසේ පීඩනය සැණින් වැඩිවීම සිදුවන නිසා ඉහත කී රෝග ලක්ෂණ සැණින් මතු වෙනවා.

### ළමයින්ට ග්ලුකෝමාව ඇති වෙනවද?

නෑ. ළමයින්ට ග්ලුකෝමාව ඇති වෙන්නේ නෑ. ඒ ගැන බිය විය යුතු නෑ. ඇසට තුවාල වීමෙන් පරෙස්සම් කර ගැනීමයි අවශ්‍ය වෙන්නේ. හැබැයි ළමයින්ට වැළඳෙන විශේෂ ග්ලුකෝමා රෝගයක් වෙනම තිබෙනවා. මේක උපතින් ම ලැබෙන දෙයක්. මෙය සහජ ග්ලුකෝමාව -Congenital glaucom' කියලයි හඳුන්වන්නේ. මේ ළමයි ග්ලුකෝමාව සමගයි උපදින්නේ.

## ආයු බෝ වේවා !...

20 වන පිටුවෙන්

අදියරේදී සමාජයෙන් පලා යෑමට උත්සාහ දරනු දක්නට ලැබේ. සමහර විට සියදිවි නසා ගැනීමට පවා යොමු විය හැකිය.

අවසන් නැත්නම් හතර වැනි අදියර ලෙස මනෝ වෛද්‍යවරුන් සලකන්නේ පිළිගැනීමය. තමන් මුහුණ දී සිටින තත්ත්වයේ ඇති ධනාත්මක, හිතකර පැත්ත දෙස බැලීමට සමත්වීම මෙහි ඇති විශේෂත්වයයි. මෙවැනි ව්‍යසනයකට මුහුණ දුන් එකම තැනැත්තා තමන් පමණක් නොවන බව හේ පිළිගනියි. මරණය ගැන සිතීමට නම් ජීවත් වීම ගැන සිතීම ප්‍රයෝජනවත් බව වටහා ගනියි. සිටින ටික කාලයේදී තමන්ට, තම පවුලට පමණක් නොව තමන් වැනි අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ දී සිටින අයටද සහාය වීමට පවා කෙනකු ඉදිරිපත් වන්නේ මේ අදියරේදීය.

මේ අදියර 4 මේ පිළිවෙළටම සෑම කෙනකුටම බල නොපාන්නට ඉඩ තිබේ. ඒවා එහා මෙහා විය හැකිය. අද තම තත්ත්වය පිළිගත් අයකු හෙට ඉන් පලා යෑමටද යොමු විය හැකිය. කම්පනයට පත් විය හැකිය. එහෙත් මෙහිදී වැදගත් වන්නේ 'තීන්දුව' ලැබීමෙන් පසු හැකි ඉක්මනට 4 වැනි අදියරට පත්වීමට - පිළිගැනීමේ තත්ත්වයට පත්වීමට උත්සාහ දැරීම ය. ඒ සඳහා ඔහුට/ඇයට අවශ්‍ය සහාය සහ ශක්තිය සැපයීම සෙසු අයගේ වගකීම වේ.

තමන් මුහුණ පා සිටින තත්ත්වයේ යථාර්ථය සිහිපත් වූ විට ඒ තත්ත්වය රැක ගැනීම සඳහා උදව් අවශ්‍යය. පළමුව ඔබට ඇති විකල්ප විමසිය යුතුය. සමහර විට අදාළ රෝගය හා සම්බන්ධ ඉහළම දැනුම ඇති විශේෂඥයෙකු හමුවීම ඔබට ප්‍රයෝජනවත් විය හැකිය. අන්තර්ජාලයේ විශ්වාසදායි වෙබ් පිටුවක් වෙත යොමුව අදාළ රෝගය සහ එහි ප්‍රගමනය ගැන තව තවත් තොරතුරු විමසා දැනගන්නට පිළිවන.

ඔබට උදව් වන සහායක කණ්ඩායමක් වට කරගන්න. එහිදී ඔබේ වෛද්‍යවරයා, සෞඛ්‍ය සේවකයා, බිරිඳ හා පවුලේ අය මෙන්ම දැන උගත් මිතුරු මිතුරියන්ද එම කණ්ඩායමට එක්කර ගැනීමට උත්සාහ කරන්න.

ඔබට සිතෙන දේ, හැඟෙන දේ, අවශ්‍ය දේ වෛද්‍යවරයාට පමණක් නොව හිත මිතුරු අයකුටද නොසඟවා පළ කරන්න. ඔබේ බර සැහැල්ලු කරගන්න. ඔබගේ දේපළ, බැංකු පොත්පත් ආදිය කවරදාක හෝ ඔබේ දරුවන්ට ලබා දීමට සිදු වන බව පිළිගන්න. දැන්ම එය කළහොත් ඔබට ඇති වගකීම් අඩු වනු නිසැකය. ලබාගත් ණය-තුරුස්වලින් මිදෙන්නට නොහැකි නම් ඒවා ගැන පවුලේ අය දැනුවත් කරන්න. විවාහයට ආසන්න දූ පුතුන් සිටී නම් ඔවුන්ගෙන් නිදහස් වීමද මෙයට ඇතුළත්ය.

නිකරුණේ නොසිටින්න. හැකියාව ඇත්නම්, වෛද්‍ය නිර්දේශ ලැබේ නම් දැනට නියැළෙන රැකියාවේ දිගටම රැඳෙන්න. නැතිනම් විකල්ප රැකියාවක් හෝ කාලය ගත කළ හැකි විනෝදාංශයක් හෝ තෝරා ගන්න. හැකි පමණ අනුන්ට උදව් කරන්න. පිහිට වන්න. ආගමික හා ආධ්‍යාත්මික වත් පිළිවෙත්හි යෙදෙන්න. භාවනා හා යාඥා ආදියෙහි නිරත වීමෙන් සිත අවනත කරගන්න. රෝගය යටපත් කරන්නටත් මේ ක්‍රියා උදව් වේවි.

රෝගය හා ගැටෙන්න. අන්තිම මොහොත දක්වා රෝගයට ඔබ යටපත් කිරීමට ඉඩ නො දෙන්න. එය අභිබවා යෑම සඳහා ඖෂධීය ප්‍රතිකාර හා නිර්දේශිත පිළියම් එලෙසම කරගෙන යන්න. නිසි පෝෂණය ලබන්න. ආහාර රුචිය නැති වුවද හිතේ සවියෙන් පෝෂ්‍යදායි ආහාර ලබාගන්න.

මේ සියල්ල තීන්දුව කල් දමා ගැනීම සඳහා ඔබ භාරගන්නා අභියෝගයේ අංගයයන්ය. අද වගේම හෙටත් ජීවත් වීමට ඒවා ඔබට උදව් වේවි.

TB

TISSA BOYAGODA, LLM

KNOW YOUR RIGHTS



## TISSA BOYAGODA, LLM

Barrister, Solicitor & Notary Public

Former Staff Lawyer in Criminal and Family Law with Manitoba Legal Aid, Former Judge, Sri lanka

**Areas of Practice**

- Criminal Law
- Family Law
- Real Estate
- Immigration Matters
- Civil Litigation
- Small Claim Court Matters
- Power of Attorneys
- Last Wills
- Notarizations

GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED

1965 Britannia Road West, Suite 208
Mississauga, ON, L5M 4Y4

100 Consilium Place, Suite 200
Scarborough, ON, M1H 3E3

TEL: 416.627.6090
FAX: 289.997.3426
EMAIL: tboyagoda@gmail.com

www.tissaboyagodalaw.com

# MONEY PROBLEMS?™

ඔබගේ සියලුම ණය
එක් කුඩා මාසික වාරිකයකින්
ගෙවන්න

**ඔබගෙන්ම විමසන්න....**



- ඔබගේ බැංකු අයිරාව (overdraft) සෑම විටම භාවිත කරන්නේද?
- ඔබ රැකියාවේ නිරතව සිටින විටත් නිවසේ පසුවන විටත් නිරතුරුව ණය හිමියන්ගේ තර්ජන හිරිහැරවලට ලක්වන්නේද?
- ඔබ නිවාස කුලිය, නිවාස උගස් වාරිකය හෝ වාහන සඳහා වන ගෙවීම් වෙනුවෙන් බලවත් පරිශ්‍රමයක් දරන්නේද?
- ඔබගේ විවාහය සම්බන්ධයෙන් හෝ සෞඛ්‍ය ගැටලු නිසා මූල්‍යමය ගැටලුවලට මුහුණ පා සිටීද?
- ඔබගේ ණය තක්සේරුව (credit rating) සෑම විටම අන්තරාකාරී මට්ටමක තිබේ යැයි ඔබ සිතනවාද?
- ඔබගේ වාහනය, නිවස, RRSP, ව්‍යාපාර කොටස් හා වෙනත් වත්කම් කොයි මොහොතක හෝ අහිමි වේ යැයි බියෙන් පසුවෙත්ද?
- ඔබට විරුද්ධව උසාවි නියෝග පනවා ඇත්ද?
- ඔබ කැනඩා රජය හා සම්බන්ධිත ආදායම් බදු ගැටලුවලින් පීඩාවට පත්වී සිටීද?

gta™ credit

**ඉහත ප්‍රශ්නවලින් එකකට හෝ පිළිතුර 'ඔව්' යන්න නම් ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට වහාම අප හමුවන්න**

**Scarborough / Downtown Toronto: 416-489-2000**
**Mississauga / Brampton: 416-650-5400**





| Scarborough | Toronto/Downtown | North York | Mississauga | Brampton |
|---|---|---|---|---|
| 201-4433 Sheppard Ave. E | 800-120 Eglinton Ave. E | 306-1280 Finch Ave. W | 110-93 Dundas Street E. | 201-7990 Kennedy Rd. South, |
| Scarborough, ON, M1S 1V3 | Toronto, ON, M4P 1E2 | North York, ON, M3J 3K6 | Mississauga, ON, L5A 1W7 | Brampton, Ontario, L6W 0B3 |

**Mark Shamly**
Sinhalese Consultant

*Proudly Served over 10,000 clients since 2004*
**Visit : GtaCredit.Com**

**Ajay Oberoi**
Government Certified Counsellor

# මානවසිංහයන්ගෙන් 'අ' යන්න කියවූයෙමි



**ඔක්තෝබර් 04 වෙනි දිනට යෙදෙන මානවසිංහ ගුණසමරුව නිමිත්තෙනි**

■ සුනිල් ලීලානන්ද පෙරේරා

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් ගැන මගේ මුල්ම සහ එකම ගුණසමරු ලිපිය පුවත්පතක පළ වූයේ මෙයට තිස්හතර වසරකට පමණ පෙරය. එම ගුණ සමරු ලිපිය 1984 සැප්තැම්බර් 30 වන දින ඉරිදා දිවයින පුවත්පතේ පළවී තිබිණි. ඒ මා කැලණිය විශ්වවිද්‍යාලයෙන් පිටව තරුණ උපාධිධාරියකු වශයෙන් මහවැලි අමාත්‍යාංශයේ ප්‍රවෘත්ති නිලධාරියකු හැටියට බැඳුණු අලුතය. එම ලිපිය පළව මේ වන විට වසර 34 ක් ගෙවී ගොස් හමාරය. දැන් මා සිටින්නේ සිහිනෙන් ගොක්කොළ පෙනෙන වයසේය. සමහර විට මගේ ජීවිත කාලය තුළ මේ එතුමන් පිළිබඳ තබන අවසන් සටහන වීමටද පුළුවන. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් වෙතින් ජීවිතයේ පළමුවරට අකුරු කියවූ අයිතිය හැර එතුමන් පිළිබඳව මෙබඳු සටහනක් තබන්නට අන් කිසිදු සුදුසුකමක් එදා මෙන් අද දවසේද මා සන්තක නොවේ.

## පළමු ගුරුවරයා

අදින් පනස් වසරකට පමණ පෙර ගමක හැඩ රුව ගුණ මැකී නොගිය බොරලැස්ගමුවේ කිසියම් චාම් නිවසක පැවැති උත්සවයක් යැයි කිව හැකි අවස්ථාවක් මගේ මතකයේ පවතී. පෙරදිග අහස මත ළා අරුණැල්ල යාන්තමින් විසිරෙයි. කළුවැල් කපුරු දල්වන ලද කුටියේ සරස්වතී රුව අභියස කුඩා මම හිඳගෙන උනිමි. ජීවිතයේ මුල්වරට ඒ මා අකුරු කියවූ දාය. අතිශය පැහැදුල් ඒ උදෑසන මට නමෝවිත්තියෙන් අයනු කියවූ ඒ මහා පුරුෂයාගේ ප්‍රසන්න මුහුණුවර පනස්වසක් ඇවෑමෙන් අදත් මසිත ජීවත් වේ. ඔහු නමින් ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන්ය.

බොරලැස්ගමුව පෙදෙස්වාසියකු වූ මගේ පියා දෙවන ලෝක යුද්‍ධ සමයේ පළමුව ආරක්ෂාව පතා රත්නපුරට පැමිණ පසුව යස ඉසුරු සොයා එහි පැළපදියම් වූවෙක් විය. බොරලැස්ගමුවේ ජී. එච්. පෙරේරා සහ ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ වැන්නවුන් සමීපව ඇසුරු කළ ඔහු කිසියම් දිනක සිය දෙටු පුතුට තම සම්භාවනීය මිතුරා වූ මානවසිංහයන් වෙතින් අකුරු කියවිය යුතු යැයි සිතුවා විය හැක.

ව්‍යාපාරිකයකු වූ අපේ තාත්තා සියලු වැඩ නිමවා මැදි රැයට එළඹෙන යාමයේ සිය කුරුමිණි අකුරුවලින් කුඩා පොතක ගනුදෙනු සටහන් කරනු මම දැක ඇත්තෙමි. ගනුදෙනු පිළිබඳ අප්‍රමාණ උනන්දුවක් දැක්වූ අපේ තාත්තා පුදුමයට මෙන් පෙර කී මහා කවීන් දෙදෙනාගේ කවි ගී ඇතුළු අනෙකුත් නිර්මාණයන් පිළිබඳවද ඊටත් වඩා ආලවන්ත විය. එම මහා කවීන් දෙදෙනා හා ඔවුන් ඇසුරේ වැඩුණු අප්‍රමාණික රස පුවත් පිළිබඳ තාත්තාගේ මතකය පුදුමසහගත විය.

තවමත් මසිත ජීවත්වන මගේ පළමු ගුරුවරයා හෙවත් මානවසිංහයන් පිළිබඳ මසිත නොමැකෙන සිතුවමක් වේ. ඔහුගේ මුව මඬල සරා සඳ මඬල සේ පැහැපත්ය. ඔහු සමවන් දසන් පෙන්වා සිනාසෙන්නේ මහත් හඬකිනි. ඔහුගේ උඩුකය වැසී ඇත්තේ ශ්‍රී නේරුතුමා පළඳින ආකාරයේ කළුවන් දිග ලෝගුවකිනි.

අපේ තාත්තා මානවසිංහ පවුලේ ඉතා කිට්ටුවන්තයකු වූවා සේම ව්‍යාපාරිකයකුට නොසරිලන සේ මේ මහා කවියාගේ අනුගාමිකයකුද විය. බොරලැස්ගමුවේ උපන්ගම හා නොබිඳුණු සබඳකම් පැවැත් වූ තාත්තා ඉඩ ලද විටක කුඩා අපද රැගෙන නෑගම් යන විට නොවැරදීම බොරලැස්ගමුවේ මානවසිංහ නිවසට ගොඩව යෑමටද අමතක නොකළේය. අප ඒ ගමන් ගියේ ගුණපාල මුදලාලිගේ සුදු පාට බේබි ඔස්ටින් කාර් එකෙන්ය. රත්නපුරයේ සිට බොරලැස්ගමුවට ගොස් ආපසු රෑ මැදියම රත්නපුරයට පැමිණෙන ඒ ගමනට අය කළ කාර් කුලිය රුපියල් 40 ක් හෝ පනහකි. එහෙත් කාර් කුලියෙන් තවත් කීයක් හෝ අඩුකර ගැනීමට කාරයෙන් බැස මහා රෑ තවත් විනාඩි දහයක් පහළොවක් ගුණපාල මුදලාලි සමග තර්ක විතර්ක කිරීමේ පුරුද්දක් අපේ තාත්තාට විය.

## ආච්චි අම්මගේ නිවස

අප ඒ දවස්වල සිටියේ රත්නපුර නගරයෙන් සැතපුම් හත අටක් ඉහත්තාවේ ගලබඩ නමැති එකල හද්දා පිටිසර ගම්මානයක ආච්චි අම්මලාගේ නිවසේය. සුද්දන් සතු දැවැන්ත තේ වතු යායෙන් තුන් පැත්තකින් වට වූ අර්ධද්වීපයක් වන් මේ ගම්මානයේ එක් කඳුතුඩකට සීමා වූ ආච්චි අම්මලාගේ ගෙදර සිරිකතගේ වාස භවන සේ විය. තේ වතුයාය සහ ආච්චි අම්මලාගේ ඉඩම වෙන් වූයේ දැවැන්ත ගහ කොළින් නිර්මාණය වූ අපූරු මායිමකිනි. ඒ බොහොමයක් අඹ සහ කොස් ගස්ය.

වරෙක ආච්චි අම්මලාගේ නිවසට පැමිණ මානවසිංහ මහතා ඒ හැම ගසකටම අපේ පැරණි නෑ සියන් තැබූ නම් ගොත් විචාරමින් මහත් සොම්නසක් විඳි අයුරු මේ දැන් වගේ මට මතකය. ආච්චි අම්මලාගේ වත්තේ පොල් සහ කොස් කැඩීමේ රාජකාරිය පැවැරී තිබුණේ කිසියම් නුහුගුණ ගතියක් නිසා කොතෙකුත් තනියෙන් කියවන, එනිසාම කුඩා අප පිස්සු ආතා යැයි නම් කළ අපේම මුත්තනුවන් කෙනෙකුටය. ගස් නැගීමේ විශේෂඥයකු වූ ඔහු ඇතුළු සෑම තරාතිරමකම ගස් නගින්නන් නැගීම ප්‍රතික්ෂේප කළ නැටවි රිටක් සේ උස කොස් ගස කවුරුත් හැඳින්වූයේ 'මට බැරි ගහ' ලෙසය. වටකුරු කොස් ගහට එනම පටබැඳී තිබුණේ එහි එලගන්නා හැම කොස් ගෙඩියක්ම ඉතා වටකුරු වූ බැවිනි. දික්ගෙඩි ගහේ එල ගත්තේ ඊට ඉඳුරාම වෙනස් දිගැටි කොස් පොලොස්ය. එසේම පොල් අඹ ගහ, මී අඹ ගහ සහ කොහු අඹ ගහ වශයෙන්ද මහ ගෙදර අඹ ගස්වලට අපර නම් පට බැඳී තිබිණි.

අප්පු ආතා හෙවත් පිස්සු ආතාගේ ලොකු අයියා පෙන දමමින් ගෙන යන කිතුල් රා මුට්ටි සෑම සැන්දෑවක්ම එකළ අපේ වැඩිහිටියෝ රසවතුන් කළහ.

මානවසිංහ මහතාද එතුමන්ගේ බිරිය වූ සිරිමතී නැන්දාද විටෙක දෙකක නොව කීපවරක් ආච්චි අම්මලාගේ නිවසට ආහ. ඇළ දොළවල නාමින්ද නොයෙක් එල වැල බුදිමින්ද මානවසිංහයන් එදා ඒ පාළු පිටිසර ගම්මානයේ සාන්ත සුවය විඳගත්තේ දැහැනකට සමවැදුනකු ලෙසිනි. එතුමන් අප නිවසේ සිටි දිනවල පැවති මාර්ග දුෂ්කරතා පවා නොතකමින් අගනුවරින් කීප පොළක් හදිසි කටයුතුවලට ඔහු මුණගැසීමට ආවා මතකය. පසු කලෙක මා තාත්තාගෙන් දැනගත් පරිදි ඒ මහත්වරු එකල ලංකාදීප කතු මඬුල්ලේ සේවය කළ නම් ගිය උදවියයි.

ආච්චි අම්මලාගේ මහ ගෙදර පැට්‍රල් ලාම්පුවක් දල්වන්නේ කිසියම් සුවිශේෂ දිනයක හෝ සුවිශේෂ අමුත්තෙකුගේ සම්ප්‍රාප්තිය නිමිත්තෙනි. බොරළු අතුරා කදිමට පිළියෙල කළ ඉදිරිපස මිදුලේ පෙට්‍රල් ලාම්පුවේ කහවන් එළිය තැවරෙයි. මළ හිරුගේ දොම්නස් කාන්තිය තවමත් ඈත දුර කඳුවැටිවල තැවරිලාය. අඩි පාර තේ යායේ කොනකට වැටුණු තැන වට මට ගලින් හෙබි අපූරු ඉසව්වක් විය. මානවසිංහයන් බොහෝ සැඳෑවල එම වට මට ගල්කුලක් මතට වී ඈත කඳු තුඩු දෙස බලමින් එදා මිමිනූ ගීත වංග ජන ගී වෙතැයි දැන් මට සිතේ.

## බෙඩ් ෆෝඩ් ලොරි රථය

අපේ තාත්තා මුල් වරට මිල දී ගත්තේ මිල්ටරි මොඩ්ල් බෙඩ් ෆෝඩ් ලොරියක්ය. පසුකලක කෑලිවලට ගලවා වත්තේ පසෙක පොඩිසිංඤදමරම් අකුලක වැසී ගොස් යකඩ ගොඩක් බවට පත් වූ එම ලොරිරථය ඊටත් පසුකලෙක පංචිකාවත්තෙ නාඩාර්ලාට අලෙවි කෙරිණි. යකඩවලට කැඩීමට තවත් ලොරියක ඈඳා ඇදන් ගිය ඒ අපූරු වාහනයට කටක් තිබුණේ නම් මානවසිංහයන් පිළිබඳ කීමට බොහෝ කරුණු කාරණා එම හිත් පිත් නැති යකඩ ගොඩටද තිබිණි.

1959 අප මුල්වරට කතරගම ගියේ සී. එල්. 792 දරන ඒ මිල්ටරි මොඩ්ල් බෙඩ් ෆෝඩ් ලොරියේය. ලොරියේ බඳ දෙපස පොල් ගෙඩි අකුරෙන් සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් සුනිල් යනුවෙන් නම් කර තිබිණි. අබල දුබල රියේ වහලේ සිදුරු අතරින් වැසි දිය කාන්දු වෙනවාට ඉටි රෙදි කීපයක් දමා කිටි කිටියේ රෑන් ඇද තිබිණි.

කතරගම ගමනට අප සමග මානවසිංහ මැතිතුමා සහ එම මැතිනියත් ඔවුන්ගේ දූ දරුවන් කීපදෙනෙකුද එක් වීය. එවකට අවුරුදු 12 ක 13 ක පමණ හීන්දෑරි කොලුවකු වූ උදය මානවසිංහද මේ දීර්ඝ වන්දනා ගමනට එක්වුණා මතකය. කොන්ක්‍රීට්වලින් සහ විවිධ විච්චූරණවලින් තොර කතරගම පුරවරය එදා අදට වඩා සිය දහස් වරකින් සුන්දරය. පූජා නගරය යන බෝඩ් ලෑලි නොතිබුණද කොයි කවුරුත් හැසිරුණේ පූජා භූමියකට උචිත අයුරිනි. කතරගම දෙවිඳුන්ට මෙන්ම කතරගම වන ගැබටත් පෙම් බැඳි මානවසිංහයන් එදා පසුවූයේ මහත් සතුටකිනි. රිදී පැහැගත් මැණික් ගඟ දෙපස වන ගහනය තෙරපි තෙරපී මතුවෙයි. අසමානව අතුපතර විහිදී ගිය යෝධ කුඹුක් ගසින් සෙවන ලද ඇතැම් තැනක නොගැඹුරු දියේ එතුමා වැතිරෙයි. සෙල්ල කතරගම දෙස උඩුගම් බලා අප කැඳවා ගිය ඔහු ස්කන්ධ පුරාණයත්, සංස්කෘතවේද සාහිත්‍යයේ නෙක රස මුසු තැනුත් විවරණය කළේ නව නළුරස මතුකරමිනි. අප ආපසු එන ගමනේදී මානවසිංහන් සිය ජාත භූමිය වූ රුහුණේ කිසියම් අපක්‍රට ගම්මානයකටද අප කැන්දන් ගියේය. මුල්කිරිගල පුරාණ ලෙන් ආරාමයටද අප රැගෙන ගිය ඔහු මුල්කිරිගල වෙහෙරවාසී නාහිමියන්ගේ ගරු බුහුමනටද ලක්විය. පුරාණ රුහුණට ආවේණික කිසියම් පැණි කැවුම් වෙසෙසකින් උන්වහන්සේ අප සැවොමට සංග්‍රහයක්ද කළහ.

## වාපි මේබලා

මානවසිංහයන්ට කොතැනත්, කවර කලෙකත් පැවසීමට බොහෝ මධුර කරුණු කාරණා තිබිණි. අභාග්‍යයකට මෙන් ඒ මධුර භාෂිතයන් ග්‍රහණය කර ගැන්මට හෝ අඩු තරමින් මතකයේ රඳවා ගන්නට හෝ එවක මා මුහුකුරා නොසිටියේ මගේම අවාසනාවකට විය හැක.

මානවසිංහ යුවළ බොරලැස්ගමුවේ ඉදිකළ නව නිවස 'වාපි මේබලා' නම් විය. නිවස මුළුමනින්ම කලාග ාරයක් බඳුය. හැටේ දශකයේ මුල එනිවසට ගෙවදුණ දා පැවැති සාදය මට තාමත් මතකය. නිවස ඉදිරිපිට නාරි රූ සතරකින් සමන්විත කුඩා පොකුණ පනස් වසකට පෙර එදා දුටු අයුරින් අදත් මසිත සිතුවම්ව පවතී.එහෙත් මේ මෑතක මානවසිංහ මැතිඳුන්ගේ දෙටු පුත් අකාලයේ මිය ගිය ප්‍රභාත් මානවසිංහ මහතාගේ මළගෙදරට ගිය මම සිය ගණනක් ජනී ජනයා අතර ඒ පොකුණ තිබූ ඉසව්වවත් සොයා ගැනීමට නොහැකිව මොහොතකට අතරමං වීමි.

ඔවුන් නිවසට ගෙවදුණු දා පෙර කී කුඩා පොකුණේ මියගිය කුඩා මසෙකු පාවෙමින් තිබිණි. බොහෝ වේලාවක් උඹ ගොඩලෑමට වලි කෑ උදය අයියා පසුව කුඩා අපි හැමෝගෙම උදව්වෙන් මියගිය කුඩ මසු වෙනුවෙන් අවමඟුලක්ද පැවැත්වීය. ඒ විල්තෙර කුඩා කෝටුවකින් කණින ලද වළක මජ්ටකයා මිහිදන් කර හාත්පස මල් පියලි අතුරමිනි.

## අභිමානය

පත්තර ගැන කතා කරන විට මානවසිංහයන් එදා ලංකාදීපයට සැපයු වගතුග තීරය ගැන අපේ තාත්තා කථා කළේ අප්‍රමාණ ගෞරවයකින් හා අභිමානයකිනි. සර් ඔලිවර් ගුණතිලක එකල ආණ්ඩුකාරවරයා සහ මානවසිංහයන් අතර කිසියම් සාදයකදී හුවමාරු වූ අදහස් එතුමා පිළිබඳ සෑම සඳහනකදීම තාත්තාගේ මුවින් පිටවන්නේ නිරායාසයෙනි. "ඔලිවර් ගුණතිලක කියලා තිබෙනවා ආණ්ඩුව අසීරු තත්ත්වයක තිබෙන නිසා පත්තරවලින් ආණ්ඩුවට ගහන්න එපා කියලා. විශේෂයෙන් වගතුග තීරයෙන්."

මානවසිංහයන්ට මේ යෝජනාව දැනිල තිබෙන්නේ කන්න බොන්න දීල කළ නොමනා යෝජනාවක් හැටියට. මානවසිංහයන්ට හොඳටම කේන්ති ගොස් ඔලිවර් ගුණතිලකට මෙසේ කියා තිබේ.

"මේ ගොයියෝ ඕවට විතරක්

**44 වන පිටුව බලන්න**

# ALPC
AHANGAMA LAW
PROFESSIONAL CORPORATION



- Real Estate Law
- Immigration Law
- Corporate Law
- Wills and Estates
- Family Law
  Simple Divorce/ Separation and Marriage Agreements

4465 Sheppard Avenue East
Unit 21, Toronto, ON
M1S 5H9
Canada

Tel: 647-977-2263
Cell: 647-215-7642
Fax: 647-977-2264
E-mail: info@ahangamalaw.com

**Anoshan Ahangama**
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC

# LAL LAW OFFICE



- Real Estate
- Mortgages
- Immigration Law
- Family Law
- Tax Law



**Lal Handapangoda**
Barrister & Solicitor

90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com

# EVERYTHING MORTGAGES
LIC#12755
www.everythingmortgages.ca



### We'll Target The Best Rates!
Why won't your bank give you the best interest rate? Call our team today or apply online and learn how we can negotiate a better rate than your banks can offer you! We work hard to give you the best options so you can make an informed decision.

### Mortgage Renewals and Refinancing
First Time Homebuyer? Mortgage coming up for renewal? We can help you save money!

### Investment Properties
Looking to invest in a second piece of property? Thinking about a vacation or recreational property? We can help!

### Safe and Secure Application
Use our easy to comlpete online mortgage application form if you're looking to buy, renew, refinance or need a pre-approval for your next property purchase.

**Manzeel Patel**
Mortgage Broker - M11002628

**Direct: 647-272-8355**

Suite 704 – 1500 Don Mills Road,
Toronto, ON M3B 3L7

T 416 - 840 - 6368
F 416 - 850 - 5153

info@everythingmortgages.ca
www.everythingmortgages.ca

RMG · Meridian · MERIX Lendwise · Scotiabank · Paradigm · Alterna · Equitable Bank · blueprint · Bridgewater Bank · MCAP · Industrial Alliance · radius financial · ICICI Bank · National Bank Financial Group · Canadiana Financial Corp · CMLS Financial · First National Financial LP · B2B Bank · Optimum Mortgage · TD · XCEED · Street Capital · Fisgard · Home Trust · HomEquity · KC Savings

# ANOMA PERERA

**Barrister, Solicitor & Notary Public**
**(Attorney-at-Law, Sri Lanka)**

- **REAL ESTATE - Residential & Commercial**
- **WILLS & POWERS OF ATTORNEY**

**EVENING & WEEK END CONSULTATIONS**
**AVAILABLE BY APPOINTMENT**



## ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

# IMPERIAL MORTGAGES INC.



**Residential Mortgages, Commercial Mortgage,**
**Refinancing, Second Mortgage,**
**First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

## Abby Sri Haran

**Senior Mortgage Specialist**

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782

# Kindfulness and Gratitude - 2018





# හොරෙන් ඔප්පු හැදීම සහ බලෙන් ඔප්පු ලිවීම

■ මිත්‍ර ශ්‍රී කරුණානායක

වර්තමානයේ ශ්‍රී ලංකාව පුරා ඇති ලොකු සහ පොඩි ඉඩම් නඩු ප්‍රමාණය ලක්ෂ ගාණකි. ඒවා ඒ ඒ අදාළ දිස්ත්‍රික් උසාවිවල ඇසෙමින් පවතී. සමහර ඒවා පසෙක දමා ගොඩ ගැසී ඇත. කෙසේ වෙතත් ඉඩම් නඩුවක පැටලීම හෝ ඉඩම් නඩුවක් දැමීම කල්ප ගාණක් ගතවෙන, අතේ සල්ලි ටික සතේට බහින, හිතට නිවනක් නැති, මනසට සහනයක් නැති මහා කුණ්ඩවාලයක් බව නොදන්නා කෙනෙක් නැත. එය එහෙම වුවත් අදටත් දිනකට සිය ගණනින් අලුත් ඉඩම් නඩු දමති. දැන දැන අමාරුවේ වැටෙති.

අප රට තුළ ඇති ඉඩම් ආශ්‍රිත නඩු අතරින් හොර ඔප්පු හැදීම පිළිබඳ නඩු සහ නිරෝධා හෙවත් තහනම් නියෝග නඩු යන දෙක අද අපේ උසාවි ආශ්‍රයේ වැඩිපුර දකින්නට ඇත. මෙවැනි නඩු අරන් අධිකරණයට එන සමහර අයගේ කතා අහද්දී අපට සිතෙන්නේ අපේ රටේ ඉන්නා ඉඩම් හොරු කොච්චර කපටිද කොච්චර ජඩද කොච්චර අධමද කියායි.

'මං ඉඩමක් අරන් දාලා ආයෙත් රට ගියා මල්ලි. එහෙම ගිහින් දහ දුක් විඳල එක එකාගේ කුණු රෙදි හෝදල කොඳු කඩාගෙන සල්ලි හම්බ කරන් ආයෙත් ආවේ අරන් දාලා ගිය ඉඩමෙ පොඩි ගෙයක් හදාගෙන දුවල දෙන්නත් එක්ක සන්තෝෂෙන් ඉන්න. කොහෙද මං නැති අවුරුදු ටිකට අල්ලපු ඉඩමෙ එකා හොර ඔප්පුවක් හදල මගේ ඉඩමත් එයාගෙ නමට හරෝගෙන. මං අවුරුදු දහයක් විතර රට හිටිය නිසා කවුරුත් ආවේ නැහැනෙ ඉඩම බලන්න. ඉතිං ඌ හිතන්න ඇති මං ආයෙ එන්නෙ නැහැ කියල. දැන් ඉතිං නඩු යනවා. ඒත් උන් ඔක්කොම ගාණට එකතුවෙලා මගේ අත්සන හොරාට ගහල තියෙනවා මටත් වඩා හොඳට.' මට මේ කතාව කියන්නේ පාදුක්කේ මාලනී අක්කායි. මෙය මා දන්නා සහ අසා ඇති කතා අතරින් අඩුම බරක් ඇති පර්චස් විස්සක සිල්ලර කතාවකි. නමුත් ඉඩමේ ප්‍රමාණයත් වටිනාකමත් නොව මෙහි ඇති කඳුළ සහ වේදනාව අක්කර ගණන් හෝ වර්ග සැතපුම් ගණනින් දැනෙන නිසා ඇගේ කතාවෙන්ම මම ලිපිය ආරම්භ කරමි.

මාලනීට ඉන්නේ කුඩා දියණියන් දෙදෙනෙකි. සැමියා මිය යාම නිසා ඇය තෝරා ගත්තේ සයිප්‍රස් රටේ සාත්තු සේවා රස්සාවයි. තම සිඟිති දියණියන් දෙදෙනා සැමියාගේ මවට බාර දී මාලිනි රට යන්නේ සිතේ සතුටකින් නොවේ.

'හොර අස්සන් ගහල ඉඩම ලියා ගත්ත එක නෙමේ මහත්තයො ලොකුම දුක උසාවි ගානේ රස්තියාදුවයි. නඩු කල් යන එකයි. පෙරකදෝරු මහත්තුරුන්ගේ ගාස්තුවයි නේ. එක නඩු වාරයකට රුපියල් දහදාහක් විතර ගෙවන්න ඕනි. අමතරව අර ලියවිලි මේ ලියවිලි වාර්තා පත් ඉරු පිඹුරුපත් එහෙම ගන්න තව දාස් ගණන් යනවා. මං හම්බකරන් ආව ඔක්කොම දැන් වියදං වෙලා ඉවරයි මේ නඩුවටම.'

'පෙරකදෝරු මහත්තය කියන්නෙ නඩුව දෙකෙන් එකක් වෙන්න තව අඩුගාණේ අවුරුදු දෙකක් වත් යාවි කියලයි'

අප රටේ ඉඩම් නඩුවල සාමාන්‍ය තත්ත්වය එය බව බොහෝ අය දනී. නඩු කියනවට වඩා හොඳයි එල්ලිලා මැරෙනව කියා සමහරු කියන්නේ මේ නිසාය.

අද සමහරු හිතන්නෙවත් නැහැ තමන්ගෙ ඉඩමට තර්ජනයක් තියෙනව කියල. මෙහෙම කිව්වෙ එක්තරා ඉඩම් ලියාපදිංචි කාර්යාලයක වැඩ කරන මා හිතවත් සුළු සේවකයෙක්. එයාගේ රාජකාරිය තමයි සර්ච් කරන්න පිඹුරුපත් ගන්න පිටතින් එන අයට අදාළ පොත් පත් ලේඛන ආදිය හොයල දෙන එක.

'ඒවා කරන්නේ ඉතාම නීත්‍යානුකූල අන්දමට. රජයට ගෙවිය යුතු ගාණත් ගෙවල ඉස්සර වගේ ආවට ගියාට අපි ඉල්ලන ඔක්කොටම පොත් දෙන්නෙ නැහැ බලන්න. නියමිත බලය තියෙන පිළිගත් නොතාරිස්ලා හරි අදාළ අයගෙන් අවසර අනුමැතිය ලැබී තියෙන අයට විතරයි ඒව දෙන්නෙ. ඒත් සමහර අය ඉල්ලන්නෙ මොනාද දන්නවද ඔප්පුවල අලවල තියෙන අවුරුදු සියකට වඩා පරණ මුද්දර. මැරිච්ච නොතාරිස් මහත්තුරුන්ගේ පරණ ෆයිල් ඉරිල මැකිල ගිය පරණම පරණ ඔප්පු වගේ දේවල්. මුං ඔක්කොම හොරු මහත්තයො. නිකන් හරි එහෙම පරණ ඒව එයාලට හම්බවුණොත් අනිවාර්යෙන්ම හොර ඔප්පුවක් හදනව. එසේ මෙසේ ඉඩංවලට නෙමෙයි එයාලා ඔප්පු ගහන්නේ මිලියන ගණන් වටින කොළඹ හතේ අටේ තියෙන පරණ වලව්වලටයි. මන්දිරවලටයි. බංගලාවලටයි.'

මා හිතවතා කියන පරිදි පරණ තැඹිලි වල්ලේ මුද්දරයක් හෝ මව් රැජිනගේ ඔටුන්න දැමූ හිස සහිත මුද්දරයක් අඩුම ගාණේ පනස් දාහකට ඩීල් කළ හැකිය. අකුරු නොපෙනෙන අංක මැකුණු ඇන්ටික් ඔප්පුවක් සමහරවිට ලක්ෂයක් හමාරක් දී හෝ මිලට ගන්න බයර්ලා හොයා ගත හැකිය. නමුත් නීතියටත් ඉහළ බලයටත් ඇති බය නිසාත් නිකං හෝ පත්තු වී ඇතුළට යන්න වුණොත් දරු පවුලට යන කළ නිසාත් මගේ හිතවතා හොර වැඩවලට උනන්දුවක් නැත.

අද ඕනි තරං තියෙනව ඔහේ පාලුවට ගිය ඉඩං සහ ගෙවල්. සමහරවිට ඒවයෙ කවුරු හරි පදිංචි වෙලා ඉන්නව. ඇත්තටම ඒ නියම අයිතිකාරයො නෙමේ. ඉඩම බලා කියා ගන්න ගත්ත රැකවල්ලු, ගෙදර කාලයක් හිටපු වැඩකාර පවුල්, එහෙමත් නැත්නං දුරින් නෑ වෙන කෙනෙක්. ඒ අය අල්ල ගත්තම හරි ලේසියි හොර ඔප්පුවක් හදල ඒ ගේ හරි ඉඩම හරි තමන්ගෙ නමට ලියා ගන්න. මේවා අද අනන්තවත් හොර රහසෙ අපේ රටේ සිද්ධවෙනව.

මෙවැනි හොර ඔප්පු ඔස්තාද් කෙනෙක් වන රාජගිරියේ ප්‍රොක්ටර් නසීර් හෙවත් ප්‍රොකී මට මුලිච්චි කෙරෙව්වේ මා මිතුරු ඉන්දික විසිනි. ඔහු මට ප්‍රොකී හඳුන්වා දෙන්නට පෙර කියා සිටියේ 'මචං මූට ප්‍රොක්ටර් කිව්වට මූ අටවත් පාස් නැහැ. ඒත් හොර ඔප්පු ගහන්න නං මාස්ටර් ඩිග්‍රි, ඩොක්ටර් රේට් ඔක්කොම තියෙනව. උඹට තියෙන්නේ කට වහගෙන ගොනා වගේ පාඩුවේ මෙයා එක්ක ගිහින් දෙන දෙයක් කාලා වෙන දේ බලා ගෙන ඩීටේල්ස් අල්ල ගන්නය' කියායි.

නිවසින් ලොකු බෑගයක් කරේ එල්ලාගෙන එන ප්‍රොකී මගට ඇවිත් කොහෝ හෝ ආපනශාලාවක වොෂ් රූම් එකකට රිංගා බෑගයේ ඇති කලුකෝට් බෑය ඇඳගෙන ටයි පටිය පැළඳ ගනී. එතැන් සිට ඔහු යළි හවස හෝ කවදා හෝ ගෙදර යනතෙක්ම ලෝයර් හෙවත් ප්‍රොක්ටර් නසීර්ය. ලංකාව පුරා ඇති ඉඩම් කාර්යාලවල දිස්ත්‍රික් උසාවිවල ගැවසෙමින් ඔහු ඉඩම් සම්බන්ධව සර්ච් දමයි. පත්ඉරු සොයයි. පිඹුරුපත් ලබා ගනී. වීථි රේඛා වාර්තා ගනී. නමුත් තමා නීතිඥයෙක් බවට කාටවත් නොකියන්නට වග බලා ගන්නේ නිකං හරි මාට්ටු වුණොත් පරිප්පුව ඩබල් බව අත්දැකීමෙන් දන්නා නිසාය.

දිනක් මටත් ප්‍රොකා සමග සුපිරි වාහනයක නැගී කොළඹ හතේ කුරුඳුවත්ත සහ බොරැල්ල අතර ඇති මාවත් පාරවල් ලේන් අස්සේ රිංගමින් එක්තරා ගෙයක් සෙවීමේ මෙහෙයුමට සම්බන්ධවීමට අවස්ථාව උදා විය. අප අතේ තිබුණේ මෙයට වසර 15 කට පමණ පෙර ගන්නා ලද කලු සුදු ඡායාරූපයක් සහ අතට දියවුණු ඔප්පුවක මුල් පිටුවේ ජායා පිටපතකි. අප කීපදෙනෙක් එදා වාහනයේ නැගී වීථි මාවත් සහ පටුමගවල් අතරින් ගමන් කරද්දී හම්බන්තොට සිට කොළඹ පැමිණ වසර දහයකින් රාජගිරියේ ප්‍රොක්ටර් බවට පෙරලුණු මේ ප්‍රොකාගේ කොළඹ හතේ ඇති ගෙවල් පිළිබඳ දැනුම ගැන මට ඇත්තටම පුදුම සිතුනි. කොළඹ ඉපිද කොළඹ හැදී වැඩී කොළඹම ජීවත් වන අපට වඩා ඔහු දැන් කොළඹ ගැන දනී.

'අර ගෙදර අයිතිකාර ගෑනිට දැන් අසූවකට ළඟයි. ටිකක් මොලේ කවල්... දරුවො නැහැ. මහත්තයා මැරිල තනියම ඉන්නෙ බංගලාව ඔහොම ජරා වාස වෙලා තිබුණට කෝටි ගාණක බූදලයක් තියෙනව.'

'අන්න අර සොල්දර ගෙදර අයිතිකාරයො මැරිල. අයිතිය බූදල් වෙලා දරුවො ඔක්කොම ඉන්නෙ ඇමෙරිකාවෙයි, කැනඩාවෙයි. එක පුතෙක් ඉන්නව ජල්තර කාරයෙක්. එයා කැමතියි ජෙනුයින් ඩීඩ් එකකින් වැඩේ ඉවරයක් කරන්න (ජෙනුයින් ඩීඩ් යනු හොර ඔප්පු සංස්කෘතියේ මගඩි ඔප්පුවට කියන නමයි) ජෙනුයින් යනු හොයන්න බැරි විදියට ලෙසටම හදන හොර ඔප්පුවයි.

'මේ තියෙන්නේ අහවල් මුදලිතුමාගේ මන්දිරය. එයා මේක සුද්දගෙ කාලෙ අරන් තියෙන්නේ බොහොම සුළු ගාණකට අයිතිකාරයගේ දුවවයි බෑනවයි රවට්ටලා උගස් ගන්නව කියල සින්නක්කර ලියවගෙන. ඒක දැනගත්තම කෙල්ල ඇවිත් උඩ තට්ටුවට ගිහින් එල්ලිල මැරිල තියෙනව. එදා ඉඳන් අද වෙනකං මේ බංගලාවෙ අට දෙනෙකුට වඩා මැරිල තියෙනව. ඒක නිසා කවුරුත් කැමති නැහැ මේක ගන්න.'

ප්‍රොකා කොළඹ හතේ ගෙවල් පිළිබඳ විස්තර ප්‍රචාරය ගෙන එන්නේ ප්‍රේමසර ඈපාසිංහ ක්‍රිකට් විචාරය කරනවාටත් වඩා පැහැදිලිවයි. ඇත්තටම ඔහු පෙන්වන ඒවා ගෙවල් නොව මන්දිරය. නිවාස නොව බංගලාය. මේවායෙන් බහුතරයක් ජරාවාසයට ගොස් බිත්ති පුපුරා පදාස ගණන් හැලී ගොස් දුර්වර්ණව පාසි බැඳී අභාවයට ගොස් ඇත බිත්ති සහ තාප්ප අතරින් කපුටු බෝ ගස් සහ මහ නුග ගස් පැල වී මුල් මතු වී ඇත. බිත්ති පුපුරා ගොස් ඇත. විශාල ගෙවත්තක් සහ මැද මිදුලක් තිබුණද ඒවා වල් වැදී ගොසිනි. කිසි නඩත්තුවක් නැති මේවා දිස්වෙන්නේ හොල්මං ඉන්න භූත බංගලා මෙනි.

ප්‍රොකා මෙන් තව හොර ඔප්පුකාරයෝ සිය ගණනක් මේ ජඩ වැඩේ අපුරුවට කරගෙන යන්නේ තව බොහෝ දෙනෙකුගේ සහයෙන් බව කිව යුතුය. හැමෝම නොවුණත් හැම තැනම නොවුණත් සමහර ඉඩම් නිලධාරීන් කාර්යාල සහ පෙරකදෝරුවරු නොතාරිස්වරු මේ වැඩේට හවුල්ය. අද සමාජයේ මෙසේ හොර ඔප්පු හැදී අත යටින් විකිනෙන්නේ කොළඹ හතේ මන්දිර පමණක් නොව මා මුලින්ම සඳහන් කළ පාදුක්කේ මාලනී අක්කා වැනි අසරණියන්ගේද ඉඩකඩම්ය.

හොරෙන් ඔප්පු හදනවා මෙන්ම බලෙන් ඔප්පු ලියා ගැනීමද අද අප රටේ අඩුවැඩියේ සිදුවෙයි. මෙය බොහෝ විට වෙන්නේ පාතාල හෙවත් සංවිධානාත්මක අපරාධ කල්ලි වන ආධාරය සහ අනුග්‍රහය ඇතිවයි.

'සර් මා අතින් ගෑනු ළමයෙක් අනාථ වුණා. හැබැයි දෙන්නගෙම කැමැත්ත මත අපි දෙන්න කසාද බඳින්න කැමතියි. එයා ඒක එයාලගෙ අයියාට කිව්වාම අයියා කෙරුවෙ මාව කට්ටියක් දාලා උස්සල නුගේගොඩ ගෙදරක දවස් ගාණක් තිස්සෙ හිරකරන් ඉඳල මගේ ඉඩමකට බලෙන් අස්සන් අරන් එයාගෙ නමට ලියව ගත්තා. දැන් මට කෙල්ලත් නැහැ ඉඩමත් නැහැ පොලීසි ගියොත් මාව මරණව කියල තර්ජනය කරනව.'

මෙවැනි හා මීට සමාන කතා අප අනන්තවත් අසන්නෙමු. බොහෝ පාතාලයෝ කරන්නේ ඉඩම් හිමියා පැහැරගෙන ගොස් දස වධ දී ඔහුගේ ඉඩමක් තමාගේ හෝ අදාළ අයගේ නමට බලෙන් ලියවා ගැනීමයි. පොලිසි ගියොත් මරණ බවට තර්ජනය කරයි. යම් හෙයකින් අසාධාරණට ලක්වූ පාර්ශ්වය පොලිසි ගියොත් එතරම් බය වෙන්නට දෙයක් නැත. අප රටේ පවතින නීතියට අනුව පැහැරගෙන යෑම, ශරීර හිංසා කිරීම, මරණ තර්ජනය කිරීම යන වරදට ඇපයක් මත හෝ දඩයක් මත චූදිතයා ඉතා ඉක්මනින් එළියට එන අතර හොර අස්සන් හෝ බලෙන් අස්සන් ගැනීම යන කාරණාවේ නඩුව වෙනම කතාවකි. එය දිස්ත්‍රික් උසාවියක ඉබි ගමනේ විහාග වෙයි. පැහැරගෙන ගිය අන්දම හෝ හොර අස්සන් ගැසූ බවට සාක්ෂි නැති නිසා නඩුව ඔප්පු කර ගැනීම ඉතා අසීරුය. අනික අස්සම හොර නැති නිසාත් නොතාරිස් කෙනෙකු එය ඇත්ත අස්සමක් බවට සහතික කර ඇති නිසාත් දක්ෂ ප්‍රසිද්ධ නීතිඥ මහත්තයෙක් හෝ සමාගමක් නඩුවේ චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නිසාත් අසාධාරණයට ලක්වූ පාර්ශවයට කට උත්තර නැත.

අප රටේ අනාදිමත් කාලයක සිට සිදුවන ඉඩම් කොල්ල නගරයට වඩා සිද්ධ වෙන්නේ ගම්වලයි. එකල සිටි නොතාරිස්වරු, අද්වකාත්වරු, ගොඩ පෙරකදෝරුවරු, මුදලි මුහම්දිරම්වරු, ආරච්චිවරු අක්කර ගණන් ඉඩකඩම් ලියාගෙන ඇත්තේ දුප්පත් මෝඩ නූගත් ගැමියන් රවටා ඉතා සුළු මුදලක් දී කණ අස්සන හෙවත් ඇඟිලි සළකුණ අරගෙන බව කවුරුත් දනී. උගස් ගන්නවා කියා සින්නක්කර ලියවා ගැනීම මෙහි ඇති ක්‍රමවේදයයි. අද අප රටේ සිටින හොර නීතිඥයින් හොර නොතාරිස්ලා කවුද කියා දන්නෝ දනිති.

Century 21 Leading Edge Realty Inc. Brokerage | invis Canada's Mortgage Experts™



**THUSITH WEERASURIYA**

REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT

416 616 2402
THUSITH.WEE@GMAIL.COM
WWW.THUSITH.COM

"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"

Bus: 905-405-8484 Fax: 905-405-8881
www.Century21LeadingEdge.ca
7071 Airport Rd Suite 201, Mississauga, ON L4T 4J3
*Independently owned and operated.

Markham 165 Main St N. | Scarborough 1825 Markham Rd. | Ajax 527 Kingston Rd. W | Toronto North 1053 McNicoll Ave.
Yorkville 1300 Bay St. | Stouffville 6393 Main St. | Whitby 408 Dundas St. W | Don Mills 801 York Mills Rd.

Designed@niukraids.ca















**කෙටිකාලීන සුව පහසු නවාතැන් පහසුකම්**

අනුරාධපුර අති පූජනීය ජයශ්‍රී මා බෝධීන් වහන්සේ
සහ රුවන්වැලි මහසෑ සමීඳුන්ට
විනාඩි 10 ක දුරින් පිහිටා ඇති මනරම් සුඛෝපභෝගී

**රජරට හවුස්**

991/2, පියවර 2, (සර්වෝදය අසල)

දිනක කුලිය කැනේඩියානු ඩොලර් 100 ක් පමණි.
නව නිවසේ සම්පූර්ණ දෙවන මහල
වෙන් වූ ඇතුළු වීමේ දොරටු (separate entrance) සහිත
වායු සමනය කරන ලද කාමර 3 ක්
දස දෙනෙකුට නවාතැන් පහසුකම් සහිතයි
නව ඇඳ ඇතිරිලි සපයනු ලැබේ.
ආහාර පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය උපකරණ
ගෑස්, පානීය ජලය, සහ අයිස් නොමිලේ සැපයේ.
චන්ද්‍රිකා තාක්ෂණික රූපවාහිනිය/අන්තර්ජාල පහසුකම්

වැඩි විස්තර සඳහා පිවිසෙන්න
**www.rajaratahouse.com**

Email: booking@rajaratahouse.com / TEL: අරුණ +1-613-631-0105 (කැනඩාව) / සන්ධ්‍යා +94 77 393 8001 (ශ්‍රී ලංකාව)

# ටයි පටිය විලාසිතාවක් පමණක්ද...?



කලිසම, කමිසය සමඟ වූ ටයි පටිය පුද්ගල පෞරුෂයේ එක් ලක්ෂණයක්. රැකියාවන්හිදී තමන්ගේ තරාතිරම ප්‍රදර්ශනය කිරීමේ සංකේතයක් බවට පත්ව ඇති ටයිපටිය තවමත් අපේ රටේ පුරුෂ පක්ෂයේ පෞරුෂය වෙනුවෙන් සීමා වී ඇත. බාලිකා පාසල් නිල ඇඳුමේ එක් අංගයක් වශයෙන් ටයි පටිය යොදා ගැනීම හැරුන විට කාන්තාවන් වෙනුවෙන් ටයි පැළඳීමේ තොරතුරු කිසිදු තැනකින් වාර්තා වී නැත. වෛද්‍යවරුන්, පරිපාලන සහ විධායක නිළධාරීන් තමන්ගේ තනතුරේ වටිනාකම වෙනුවෙන් ටයි පටි පැළඳිය යුතු වුණත් මෙම වෘත්තීන්හි නියැලෙන කාන්තාවන් වෙනුවෙන් ඇඳුම සමඟ බද්ධවුණ සංකේතයන් නොමැත.

ශ්‍රී ලංකාවට ටයි පටිය පිළිබඳ සංකල්පයන් ඇති වූයේ පෘතුගීසි ආභාෂයෙන්ය. කන්ද උඩරට රජවරුන්ගේ ඇඳුම් කට්ටලයට එක් වූ 'මන්තේ' පැළඳුම ටයි පටියට සමානත්වයක් දක්වනු ලැබේ.

ටයි පටියේ ඉතිහාසය බොහෝ දුර අතීතයකට අයිතියි. මිසරයේ පාරාවෝ විසින් යෝසෙල්ට ලබා දෙන ලද රන් මාලයෙන් පවා පෙනෙන්නේ පුරුෂයන් අතීතයේ පටන්ම ගෙල වටා පළඳනාවන් දරන්නට කැමැත්තක් දක්වන ලද බවයි. 16 වැනි සියවස අග භාගයේදී එංගලන්තයේ සහ ප්‍රංශයේ පිරිමි උදවිය තමන්ගේ ජැකට්ටුව වටා රැළි පටියක් පැළඳ සිටියා. සුදු රෙදි වලින් නිර්මාණය කරන ලද මෙම රැළි පටියේ හැඩය රඳවා ගැනීමට කැඳ යොදා ගෙන ගොරෝසු කර ගනු ලැබුවා. කාලයක් යන විට මෙම රැලි පටිය වෙනුවට වැලමිට තෙක් වැටුණ සුදු කොලරයක් භාවිත කළ අතර එය 'වැන්ඩයික්' නමින් හඳුන්වනු ලැබුවා. ප්‍යුරිටන් ක්‍රිස්තියානි නිකාය අතර මෙම 'වැන්ඩයික්' කොලරය ඉතා ජනප්‍රිය වුණා.

1660 වසරේදී දරුණු යුද්ධයකින් අනතුරුව ඔටෝමන් අධිරාජ්‍ය ජයගත් ක්‍රොයේසියානු හමුදාව පැරිසියට පැමිණියා. මෙහිදී 14 වන ලුවී රජතුමා ඔවුන් ඉතාම ගෞරවයෙන් පිළිගනු ලැබුවා. මෙම නිළධාරින් කර වටා ලේන්සුවක් පැළඳ සිටි අතර රජතුමාට මේ ගැන තදින් සිත ඇදුනා. 14 වැනි ලුවී රජතුමා විසින් 'ක්‍රැවටිස්' නම් හමුදා ඒකකයක් නිර්මාණය කළ අතර ඔවුන්ගේ කර වටා අලංකාර ලේන්සුවක් පළඳනු ලැබුවා. මෙම නිර්මාණය ඉංග්‍රීසි ඕඩය හරහා බ්‍රිතාන්‍යයටත් පැතිරී ගියා. වර්සෙල්ස්වල ආරක්ෂක නිළධාරීන්ට තමන්ගේ ලාංඡනය ලෙස මෙම ලේන්සුව පළඳින්න යෝජනා කරනු ලැබුවා. ඒ වගේම විවිධ වර්ණවලින් කර පටි නිර්මාණය කරනු ලැබුවා. එංගලන්තයේ බ්‍රාබවෙල් කරපටිය පළඳින්න උදය වරුවම ගත කරනු ලැබුවා. අන්තිමේදී ඔහුගේ බෙල්ල පවා රිදෙන්න පටන් ගත්තා. 1820 වසරේ කරපටි පළඳින ආකාර 32 ක් ඇතුළත් පොතක් පළ කරනු ලැබුවා. අද දක්නට ලැබෙන ටයි පටිය 1850 වසරේදී නිර්මාණය වූවක්. බටහිර ජාතීන් ආසියාව යටත් කර ගැනීමෙන් පසුව කරපටිය එම රටවල් වෙතටත් ව්‍යාප්ත කරනු ලැබුවා. කරපටියේ හැඩතල කලින් කලට වෙනස් වෙමින් පැමිණියා. විටෙක මධ්‍යම ප්‍රමාණයෙන්ද, තවත් වරකදී මහතින් සහ විටෙක සිහින් ලෙසින් මේ හැඩතල වෙනස් වුණා.

17 වැනි සියවසේදී පිරිමි උදවිය අඳින ලද දිගු කබායට අතිරේකව තවත් කබායක් යටින් ඇන්දා. ඒ අතරම ගෙල වටා කරපටියක් පැළඳි අතර මෙම කරපටිය දෙතුන් වතාවක් ගෙල වටා ඔතා එහි කොන් දෙක කමිසයේ ඉදිරි පසින් එල්ලී තිබුණා. මේ කරපටිය කපු ලිනන් හෝ ලේස් වැනි රෙදි වර්ගයකින් නිර්මාණය වුණා. කරපටිය වෙනුවෙන් වටිනාකම ඉස්මතු කිරීම සඳහා මෙම රෙදිවලට වටිනාකමක් ලබා දුන්නා. බ්‍රිතාන්‍යයේ 3 වැනි ජේම්ස් රජතුමාගේ ඔටුණු පැළඳීමේ උත්සවය වෙනුවෙන් නිර්මාණය කරන ලද ගෙල වටා පැළඳි සළුව පවුම් 36 ක් සහ සිලිං දහයක් වැය කර නිර්මාණය කරනු ලැබුවා. ගෙල වටා සළු ගැට ගැසීමට සිල්ක් රිබන් පටියක් යොදා ගත්තා.

1860 කාලය වෙත්ම දිගු කොන් සහිත සළුව ජනප්‍රිය වුණ අතර ඒ වෙනුවෙන් 'ෆෝ ඉන් හෑන්ඩ්' යනුවෙන් හැඳින්වෙන විශේෂ ගැටයක් යොදා ගත්තා. ගැටය බෙල්ලට තද වුණ අතර දිගු පටි දෙක කමිසය ඉදිරියෙන් වැටී තිබුණා. මේ විදිහට කාලයේ තාලයට අලුත් වෙවී ටයි පටිය දිගු ගමනක් පැමිණ සිටිනවා.

ටයි පටිය අනිවාර්යෙන් පැළඳිය යුතු ස්ථාන තිබෙනවා. ඒ වගේම ටයි පටිය පැළඳීම අනිවාර්යෙන්ම නොවිය යුතු තැනුත් තිබෙනවා. පුද්ගලයන් වශයෙන් කළ යුතු එකම දෙය පැළඳිය යුතු තැනදී ටයි පටිය පැළඳීම වගේම අනවශ්‍ය යැයි සම්මත තැනදී ටයි පටිය නොමැතිව සහභාගිත්වය පමණයි.

ලුවිස් හැමිල්ටන් 'විම්බල්ඩන්' තරගාවලිය නරඹන්නට ගිය අවස්ථාවේදී කබාය සහ ටයි පටිය නොමැති නිසා විශේෂ ආරාධිතයන්ගේ රාජකීය කුටියට ඇතුළු වීමට අවසර ලැබුණේ නැහැ.

ලන්ඩන් නගරයේ 'ටී ඇට් ද රිට්ස්' අවන්හලට ටයි පටියක් පළඳින්නේ නැතුව පැමිණියොත් එහි ආහාර රස බලන්න අවසර නැහැ. පැරණි යුගයට අයත් මෙම අවන්හල රදල පැලැන්තියේ ඉංග්‍රීසි ජාතිකයන් අතර ප්‍රසිද්ධයි. සමාජ තත්ත්වය තුළ රැකෙන්න නම් ඒ විදිහට ඇඳුම් පැළඳුම්වලින් පාරිභෝගිකයන් සැරසී සිටීම වැදගත්.

P&O සංචාරක නෞකා සමාගමේ පවත්වනු ලබන සාදයකට පැමිණෙන විට ටයි පටිය පැළඳීම අනිවාර්යයි. ඒ වගේම බ්‍රිතාන්‍යයේ රජයේ පාසල්වල ශිෂ්‍යන්ගේ නිල ඇඳුමට ටයි පටිය අනිවාර්යයි.

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේදීත් තමන්ගේ වාර්තා කටයුතු වෙනුවෙන් පාර්ලිමේන්තුවට සම්බන්ධ වීමේදීත් පාර්ලිමේන්තුවට දක්වන ගරුත්වයක් විදිහට කබාය සහ ටයි පටිය පැළඳීම අනිවාර්යයි.

'මාර්ලිබන්' (Marylebone) ක්‍රිකට් ක්‍රීඩා සමාජයට පැමිණෙන සියලුම පිරිමින් අනිවාර්යෙන්ම ටයි පටියක් පැළඳ පැමිණිය යුතුයි. රාජකාරියේ යෙදෙන අයට නිල ඇඳුමෙනුත් විදේශිකයන්ට ජාතික ඇඳුමෙනුත් පැමිණීමට නිදහස තිබෙනවා.

රිචඩ් බ්‍රැඩ්සන් ව්‍යවසායකත්වය තුළ ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් අතර ඔහු යටතේ සමාගම් 400 ක් පමණ පාලනය වෙනවා. නමුත් ඔහුගේ ආයතනයේ සේවකයන්ට හෝ නිළධාරීන්ට ටයි පටිය ප්‍රතික්ෂේප කරනු ලැබුවා. සම්ප්‍රදායිකව පිළිග උනුන පෞරුෂය නොව ටයි පටිය පැළඳීම දෛනික රාජකාරි කටයුතුවලට මහත් හිරිහැරයක් බව රිචඩ් බ්‍රැඩ්සන්ගේ අදහසයි. ඔහු නිතරම තමාගේ උඩු සාක්කුවේ කතුරක් දමා ගෙන සිටියා. මේ කතුර තිබෙන්නේ ටයි පටි දුටු විට කපා දමන්නැයි වරක් බ්‍රැඩ්සන් සිනාසෙමින් කියා සිටියා.

# හොඳ පලතුරු හඳුනා ගන්නේ කොහොමද?

■ ගැමුණු සාලිය පෙරේරා

යමක් දුලබ බව පැවසීමට අපේ ජනවහරේ යෙදෙන්නේ, 'එය සෙවීම කළු නික සොයනවාට වඩා අපහසුයි' කියාය. අද වස විසෙන් තොර පලතුරක් වෙළෙඳපොළෙන් මිලදී ගැනීමද එතරම්ම අපහසුය. කොයි කවුරුත් පලතුරු අනුභව කරන්නේ, විනෝදයට හෝ කුසගින්නට නොවේ. එහි ඇති මහඟු පෝෂණීය හා ඖෂධීය ගුණය නිසාය.

එසේනම් පවතින වෙළෙඳපොළ වාතාවරණය හමුවේ, මේ අභියෝගය ජය ගන්නේ කෙසේද? ඒ සඳහා ඇති හොඳම විසඳුම, පලතුරු වාරයට ඒවා බහුලව ආහාරයට ගැනීමය. අඹ වාරයේදී අඹ වැඩියෙන් ගත හැකිය. නාරං, මෙරට වවන දොඩං, ජමනාරං ඇතුළු පැඟිරි කුලයේ පලතුරු වාරයට ඒවා අනුභව කළ හැකිය. පලතුරු අතිරික්තයක් පවතින විට, කෘත්‍රිම ඉදවූ පලතුරු විකිණීමක් නොවන නිසා, කෘත්‍රිම රසායනික ද්‍රව්‍ය අවම පලතුරු මිල දී ගැනීමට පලතුරු වාරය හොඳ අවස්ථාවකි.

බොහෝ විට අප පලතුරක් ගැනීමේදී අවධානය යොමු කරන්නේ,රසායනික ද්‍රව්‍ය යොදා ඉදවූ ඒවාද යන්න පිළිබඳය. ඒවා ශරීරගත වීමෙන් වන හානිය ගැනය.

එහෙත්, පලතුරක ඖෂධීය ගුණාත්මක වටිනාකම ඉහළ යන්නේ, එය ස්වභාවිකව ඉදීමට ලක් කිරීමෙනි. ජෛව රසායනික ක්‍රියාවලියක් මඟින් ඉදෙන පලතුරක ඇති ගුණය, ක්ෂණිකව කෘත්‍රිම ලෙස ඉදවීමට ලක් කරන පලතුරක දැකිය නොහැකිය. ඒ වෙනුවට එහි අන්තර්ගත වන්නේ, ශරීරයට අහිතකර බවකි. බොහෝ දෙනා නොසලකා හරින කාරණයද එයය.

මේ සඳහා අපට අනුගමනය කළ හැකි හොඳම විකල්පය, වෙළෙඳ පොළේ ඇති ඉදුණු පලතුරු මිල දී ගැනීම වෙනුවට, හොඳින් මෝරා, පැසුණු තත්ත්වයේ ඇති පලතුරු නිවෙසට රැගෙන යෑමය.

එවිට ක්ෂණික කෘත්‍රිම ඉදීමකට ලක් නොවන නිසා, ක්‍රමානුකූලව ඉදුණු පසු ආහාරයට ගැනීමෙන්, ඔබ බලාපොරොත්තු වන ඖෂධීය හා පෝෂණීය ගුණය ලැබේ.

පලතුරක් යනු, විශාල ඖෂධ ගබඩාවකි. සිරුරේ නීරෝගී බවට හේතු වන ඖෂධීය ගුණ බොහොම ඉහළින් පලතුරුවල අන්තර්ගත වේ. එසේම, විවිධ රෝගාබාධ සඳහා දිව්‍යමය ඔසු සේ ගුණ පලතුරුද ඇත.

වෙළෙඳ පොළෙන් මිල දී ගත හැකි රසායනික ද්‍රව්‍ය යෙදූ කෘත්‍රිම ඉදවීමට ලක් නොවන පලතුරක් ලෙස පැණි කොමඩු සඳහන් කළ හැකිය. එහි රත් පැහැයට හේතු වන ලයිකොබීන් නමැති ශාක රසායනය, සිරුරට ඉතා හිතකරය. එය පිළිකා, හදවත් රෝග ඇතුළු බොහෝ රෝගාබාධවලට ගුණ දෙන ඖෂධීය ගුණයෙන් ඉහළය.

තක්කාලි, රතු පැහැ පේර, ගස්ලබු ආදියෙහිද මේ ලයිකොබින් සහ ප්‍රධාන විටමින් වර්ග විශාල ප්‍රමාණයක් අන්තර්ගතව ඇත. ඔබ වෙළඳ පොළෙන් මුදල් ගෙවා ලබා ගන්නා කෘත්‍රිම රසායනික අඩංගු කිලෝ පේරවලට වඩා ගමේ එළවළු අම්මා ළඟ ඇති එවෙලේම නෙළාගත් පේර ගෙඩියක් ගුණදායකය.

ඕනෑම පලතුරක් ගුණය වඩා වැඩියෙන් ලැබෙන්නේ, එය නෙළාගත් මොහොතේ නැවුම්ව අනුභව කරන විටය. කාලය ගත වී පරණ වීමත් සමඟ පෝෂණීය හා ඖෂධී ගුණය ක්‍රම ක්‍රමයෙන් පහළ වැටේ. සුපිරි වෙළෙඳසැල්වලින් අප බොහෝවිට මිල දී ගන්නේ ඇපල්, පෙයාර්ස්, මිදි, දොඩම් ආදියයි.

එහෙත්, එම පලතුරු අවමව භාවිත කරමින් කෘත්‍රිම වස විසෙන් තොර බවට විශ්වාසයෙන් භාවිත කළ හැකි පැපොල්, දිවුල්, බෙලි, වෙරළු, උගුරැස්ස ආදි අපේ ගහ කොළේ හැදෙන පලතුරු හැකි තරම් අනුභවයට හුරු වෙනවා නම්, එය නීරෝගී දිවි පෙවෙතකට මඟ පාදයි.

අඹ, පැපොල් වැනි කහ වර්ණයෙන් යුතු පලතුරුවල බහුලව අඩංගු බීටා කැරොටින් ලුටින් නම් ඒ විටමින්ය. මේ ප්‍රභේදයන් සමට ඉතා හිතකරව ක්‍රියා කරයි. රැළි වැටීම අවම කරමින්, සමේ පැහැය රැක දෙයි. කටු අනෝදා, මුත්‍රා ගල්, ගැස්ට්‍රයිටීස්, වකුගඩු රෝග ආදිය වැළැක්වීම සඳහා ඉතා හිතකරය.

ලොවි, ජම්බු ආදිය ඉතා විශිෂ්ට ගුණයෙන් අනූන පලතුරුය. ඒවා බහුලව ඇති අවස්ථාවලදී චට්නි සෑදීම, ව්‍යාංජන ලෙස ආහාරයට ගැනීම කළ හැකිය.

පසුගිය කාලයේදී යාපනයේ මිදිවලට ඉහළ ඉල්ලුමක් ඇති වූ පසු, ඉල්ලුමට අවැසි සැපයුම වෙනුවෙන් රසායනික ද්‍රව්‍ය බොහෝ සේ යෙදීය. එසේම, දෙහි අවාරයේදී ගැට දෙහිවලට එත්‍රල් යොදා කහ පැහැ කොට විකුණයි. වැල්දොඩම් අවාරයේදීද ඒ ආකාරයෙන්ම කෘත්‍රිමව ගැට කහ පැහැ ගන්වා විකුණයි.මේ නිසා, වෙළෙඳපොළෙන් පලතුරු මිල දී ගන්නා ඔබ, මේ කරුණු ගැන දැනුම්වත් විය යුතුමය.






# ප්‍රාර්ථනා මල් පිපුණා

පද්මිණී ජයතිලක

දහවල් ආහාරයෙන් පසු තම කාමරයට වී මැහුමක් ගෙතුමක් කිරීම ලොකු මැණිකේගේ සිරිතය. නැතිනම් ඇය පුවත්පතක් කියවන්නීය. එහෙත් අද ඇය එම වේලාවේ පුෂ්පා තම කාමරයට කැඳවා ගත්තාය.

"පුෂ්පා මෙහෙ වරෙන් ඉඳගනිං ඔය බිමින්. මේ බලපං මගෙ දිහා. මම දුවල තුන්දෙනෙක් ඉන්න අම්ම කෙනෙක්. මට අද වාගේ මතකයි උඹ අම්මත් එක්ක මේ වලව්වට නවතින්න ආපු පළමු දවස. එදා වාගෙම මම උඹට අදටත් ආදරෙයි. උඹ මේ වලව්වෙ ලොකුමහත් වුණේ වැඩකාරියකට වඩා මගෙ දරුවෙක් වාගෙ. ඒක හින්ද උඹේ මෝඩකමට ඔය කරගත්ත දේවල් නිසා මම උඹව මහ පාරට ඇදල දාන්න හිතන්නෙ නැහැ. මම උඹට හොඳ මගුලක් ලෑස්ති කළා. ඌ උඹට හරිම මනාපයි. උඹේ ජීවිත කාලයම ඌ උඹව ආදරයෙන් බලාගනී. ඌ හොඳ ඇඟපත හයිය තියන මිනිහා. උඹට කවදාවත් කන්න බොන්න හිඟයක් වෙන්නෙ නැහැ. ඌ හම්බු කරයි. ජීවිත කාලෙටම උඹලට ඉන්න හිටින්න තැන මම දෙනවා. අස්වද්ද ගන්න ගොඩමඩ ඉඩමකුත් දෙනවා. උඹ දන්නවද කවුද මේ උඹට මනාප කෙනා කියල."

පුෂ්පා කිසිවක් නොකියාම ඉකිබිඳින්නට විය.

"ඔන්න එහෙනම් දැන ගනිං. ජයසේන."

"ආ... ජයසේන" ඇය දිගු සුසුමක් හෙලුවාය.

"ඔව් ජයසේන තමයි. මම දැකල තියෙනවා ඌ උදේට කිරි අරන් ආවහම උඹල දෙන්නගේ මුකුළුව. උඹත් ඌට අකමැත්තක් නැහැනෙ. දාහකින් හොයා ගන්න බැරි මිනිහෙක්. හොඳ සීලාචාර, උත්සාහවන්ත මිනිහ. අනිත් අතට මම ඌට උඹව දෙන්නෙ නිකම් නෙමෙයි. අක්කරේකට වැඩි ඉඩමකුයි පදිංචියට පොඩි ගේකුත් එක්කයි. ඒකේ අඩුපාඩු තියෙනවා. මම ඒවා ටික ටික සම්පූර්ණ කරල දෙන්නම්. උඹලට කන්න බොන්න ඇතිවෙන්න දේ ඒකෙ තියෙනවා. ජයසේන වලව්වෙ කුඹුරුවලින් අවුරුද්දට කන්න වී ටික ගෙනෙයි. උඹල දෙන්න එකතු වෙලා එළවළු ටිකක් වවා ගන්නව නම්, කිරිපට්ටියෙන් කිරි ටික හම්බු වෙනව නම්, ඉන්න ගේ දොරත් තියෙනව නම් තව මොනවද බං ගෑනියෙකුට. උඹ ඌ එක්ක ගියහම උඹේ ඔය දුප්පත් අම්මවත් ළඟට අරගෙන සලකන්න පුළුවන් වෙයි."

පුෂ්පා ඇහිපිය නොහෙලා මැණිකේ දෙස බලා සිටියාය.

"උඹේ වැරදි හින්ද, උඹට පුංචි හාමුගෙන් වැරදි සිද්ධ වුණත් මම ජීවත් වෙලා ඉන්නකල් මම උඹ ගැන සෙවිල්ලෙන් ඉන්නම්. උඹට කරදරයක් වෙන්න ඉඩ තියන්නෙ නැහැ. හැබැයි පුෂ්පො උඹ මට මෙන්න මේ ටික නම් පොරොන්දු වෙන්න ඕනි. මේ වෙච්ච කිසිම දෙයක් කිසිම කෙනෙකුගේ කනට වැටෙන්න දෙන්න බැහැ. අඩුම තරමින් ජයසේනටවත් හෙළි කරන්න බැහැ. උඹ ඌත් එක්ක ඉන්න පළවෙනි දවසෙදි උඹ ඉදුල් වෙච්ච එකියක් බව අඟවන්න එපා. උඹ කාගෙන් ඉඳුල් වුණාද කියන්න මම දන්නෙ නැහැ. උඹ ඔය දන්න මායම් ටිකක් දාල ඒ වෙලාවට ඌව රවට්ට ගනිං. උඹ පිරිසිදු ගෑනියෙක් විදිහට ඌට දැනෙන්න වැඩ ටික කර ගනිං. ඌට ඕව තේරෙන එකක් නැහැ. ඌ උඹට හරිම ආදරෙයි. උඹට කවදාවත් වැරදෙන්නෙ නැහැ."

"ඒ වගේම උඹ මෙන්න මේ ටිකත් හිතේ තියාගනිං. උඹ කිසිම දවසක මොනම හේතුවක් හින්දවත් මේ වලව්වට එහෙම එනවා නෙමෙයි. මතක තියා ගනිං මේ වලව්වෙ පස් පාගන්න උඹට ආයෙත් බැහැ හරිද? උඹට මට කියන්න දෙයක් තියෙනවනම් කරදාසි කෑල්ලක ලියල ජයසේන අතේ එවපං මගේ අතටම දෙන්න කියල. ඒකත් රහසෙ කෙරෙන්න ඕන හරිද?... හා... දැන් පලයං. ගිහිං මේ බෑග් දෙකට උඹේ තියෙන දේවල් ටික ඔක්කොම අහුරපං. අහුරල ඔය බෑග් මලු දෙක මගෙ කාමරයෙන් ගෙනත් තියපං. මේ කිසි දෙයක් කරලැයින්ට දැනෙන්න කරන්න එපා."

"හොඳමයි මැණිකෙ."

ලොකු මැණිකේගේ කාමරයෙන් පිටව ගිය ඇය තමාගේ කාමරයට ගියාය. එහි බිම පැදුරු කඩමාල්ලක් එලාගෙන වාඩි වී තමා සතු සියලු දෙය මළු දෙකට ඇසිරීමට පටන් ගත්තාය.

තමා වලව්වට පැමිණීමට පෙර ගෙවූ නැති බැරි කමින් පීඩිත වූ ජීවිතයත්, හැම ගංවතුරකටම රෙදි කඩමළු ටික ඔතාගෙන පන්සලේ බණ මඩුවේ ගුළි වී නිදාගත් හැටිත් ඇයට සිහිපත් විය. එක දිනකට එක වේලක්වත් හරිහැටියට නොලැබ තම සහෝදරයාත් සමඟ ගෙවල්වල බැලමෙහෙවරකම් කරමින් ගෙවී ගිය කාලය සිහිපත් වීමෙන් ඇගේ දෑසින් කඳුළු කඩා හැලෙන්නට විය. පුෂ්පා වැඩිවියට පත්වූ පසු වැඩි ආරක්ෂාවට වලව්වට ගේන්න තීරණය කළේ කරලැයින් නැන්දාගේ ඉල්ලීම මතය. ලොකු මැණිකේ තමාව ආදරයෙන් පිළිගෙන ක්‍රමයෙන් වලව්වේ සියලු කටයුතු තමාට පැවරූ අයුරුත් දිනෙන් දින තමා වලව්වේම කෙනෙකු බවට පත්වූ අයුරුත් සිතුවමක් සේ පෙනෙන්නට විය. තමා වලව්වට පැමිණෙන විට පුංචි හාමු කෙනෙකු එංගලන්තයේ සිටින බව ඇයගේ කනට ඇසී ඇත. එහෙත් ඒ පුංචි හාමු තමාගේ ජීවිතය මේ තරම් වෙනසක් කිරීමට සමත් වන බව ඇයට සිතුණේ නැත. මේ වන විට ඇය වලව්වට පැමිණ පස් වසරක් ඉකුත් වී ඇත. පිරිමි පුළුටක්වත් නොසිටි වලව්වේ ඇය නිදහසේ සතුටින් සහ ප්‍රීතියෙන් හොඳට කාබී තමාට පැවරුණ සියලුම වැඩකටයුතු ඉටු කළාය. එහෙත් ඇයට මේ වලව්වේ කුස්සි අම්මා කම හැර වෙන කිසිම අයිතියක් උරුම නැති බව දැන් හොඳටම පසක් වී හමාරය.

පුංචි හාමු ඇයව වසඟයට ගෙන ඇගේ සාරය උරා බිව්වද කිසිවක් නොදන්නා අයකු ලෙස දැන් හැසිරෙන අයුරු දකිනා ඇයට ඔහු පිළිබඳ කළකිරීමක් ඇති විය. ඔහුට ඇය කිහිපවරක් සිපගෙන තැලී පොඩි වී ඉවත දැමූ මලක් පමණකි. කිහිපවරක් ඇඳ ඉවත දැමූ ඇඳුමකි. ඇයගේ අවිනිශ්චිත අනාගතයට පායා එන සූර්යාලෝකය බඳු ජයසේන සැබෑ ලෙසටම ඇයට ආදරය කරන කෙනෙකු බව ඇයද හොඳින් දනී. මේ වන විට ඇය සිටින්නේ කාගේ හෝ ආදරයක් රැකවරණයක් යදිමින්ය. තවදුරටත් වලව්වේ විසීම ඇයට අකැප බව ඇයට දැන් තේරී හමාරය. ලොකු මැණිකේගේ අණට කීකරු වී ජයසේන සමඟ අලුත් ජීවිතයක් ඇරඹීමට දැන් ඇයටද අවශ්‍ය වී ඇත. බෑග් දෙක ඇසිරීමට පටන් ගත්තේ දෑසේ කඳුළු කැට පිස දමා හිත එකලස් කරගෙනය. තමා ගෙදරින් එනවිට රැගෙන ආ පබළු මාලය සහ ප්ලාස්ටික් වළලු ටික දැන් පැළඳිය නොහැක. ඒවා කුඩා වී පුෂ්පා ලොකු මහත් වී ගැහැනියක් වී ඇත. ඒත් ඇයට මේ දේවල් මහා අනර්ඝ වස්තූන්ය. ඇය සතු චීත්ත රෙදි පහත්, හැට්ට ටිකත්, පොරවන රෙද්දත් යට ඇඳුම් කිහිපයත් ඇය බෑග් දෙකට ඇසුරුවාය. රබර් සෙරෙප්පු දෙකද පත්තර පිටුවක ඔතා එක මල්ලක තැබුවාය. ඉන්පසු මලු දෙක රැගෙන ලොකු මැණිකේගේ කාමරයේ තබා නිදා ගන්නා පැදුර තබන තැන තැබුවාය.

"ආ උඹ ආවද? මෙන්න මෙතන සාරි තුනක් තියෙනවා. මේනකා මැණිකෙගෙ හැට්ට තුන හතරකුත් තියෙනවා. උඹට ඒවා අඳින්න පුළුවන් වෙයි. තව ඇඳ රෙදි දෙකකුත් තියෙනවා. ටිකක් පරණ වුණාට ඒවා පොරවන්න ගන්න පුළුවන්. මේ ටිකත් උඹේ ඔය බෑග් එකකට දාගනිං. තව මොන මොනවා හරි එකතු කරල මම ජයසේන අතේ උඹට එවන්නම් පස්සෙ. අද හවස ජයසේන එනව කිව්ව. මම ඌත් එක්ක කථාබහ කරල උඹට කරන්න ඕනි ඉතුරුහරිය කියන්නම්. දැන් පලයං. මට තේ ටිකක් හදාගෙන වරෙන්කො."

"හොඳමයි මැණිකෙ."

රාත්‍රී හතට පමණ ජයසේන වලව්වට පැමිනුණේ ඉඟිලගෙන එන සමනලයෙකු පරිද්දෙනි. මැණිකේ ඔහු ඇගේ කාමරයට අඬගසාගෙන ඇවිත්,

"වාඩි වෙයන්කො."

ජයසේන තමාට හුරු තප්පලම දාගෙන ඇගේ ඇඳ අසලින් වාඩි විය.

"ජයසේන.. උඹ අද ඉතුරු වැඩ ටික ඉවරකර ගත්තද?"

"ඍදව් නෝනා හාමු. ඔක්කොම හලි."

"එහෙනම් මම කියන දේ හොඳට අහගනිං. හෙට උදේ උඹ වෙනද කිරි ගේනවට වඩා ටිකක් කලිං වලව්වට වරෙන්. පුෂ්පා ලෑස්ති වෙලා ඉඳී උඹත් එක්ක යන්න ඒ වෙලාවට. මුරකාරයගෙ ඇහැ වහල උඹල දෙන්න පිටවෙලා පලයල්ල. උඹ ටික දොහකට කිරි ගේන්න ඕන නැහැ වලව්වට. කිරි ඕනි වුණාහම මම පණිවඩයක් එවන්නම්. දැන් මේ බෑග් දෙක අරගෙන ගිහිං උඹේ ගෙදර තියපං. එහෙම නම් මම කියපු දේවල් හොඳට තේරුම් ගත්තනෙ. මම උඹට තියෙන ලෙන්ගතුකම හින්දම තමයි මම මේකිව පිටට යන්න නොදී උඹටම දෙන්න මේ විදියට කටයුතු කරන්නෙ. නැත්නම් හෙට උදේ අටවෙන්න කලියෙන් ඒකිගෙ අම්මා එනව වලව්වට ඒකිව ගෙනියන්න. ගෙනිච්චොත් නම් ආයෙ අපිට ඒකිව හම්බුවෙන්නෙ නැහැ. ඒකිට මිනිහෙක් හොයල ඒකිගෙ අම්ම...."

"මට තේලෙනවා, තේලෙනවා. මැණිකේ. මම නොවරදවාම හෙට උදේ එනවා."

"ආ.... ඔහොම හිටපං තව විනාඩි පහකින් විතර පලයං" කියා වලව්ව ඉදිරිපසට ගිය මැණිකේ මුරකාරයාට අඬගැසුවාය. මුරකාරයා මැණිකේ ළඟට එන නිමේෂයෙන් ජයසේන බෑග් දෙකද රැගෙන පිටව ගියේය.

පුෂ්පා සුපුරුදු පරිදි රාත්‍රී නින්දට ලොකු මැණිකේගේ කාමරයට ආවාය.

"පුෂ්පා උඹ වෙනදට වඩා ටිකක් කලියෙන් නැගිටපං. ජයසේන කිරි අරන් එන්නෙ උඹවත් එක්ක යන්න බලාගෙ නම තමයි. ඌ උඹවත් එක්කගෙන මම ලෑස්ති කරල තියෙන ගෙදරට යයි. උඹල දෙන්න හොඳින් ජීවත් වෙයල්ල. කිසිම කරදරයක් වෙන්න මම ඉඩ තියන්නෙ නැහැ. මේ වෙච්ච හැමදෙයක්ම උඹ නිදන් කරපු දෙයක් වාගේ වහුං කරගෙන ඉන්න ඕනි. උඹ බය වෙන්න එපා. උඹට හොඳ කලක් යයි. ඕනදේකට මම උඹල පිටිපස්සෙන් පිහිටට ඉන්නවා"

"හොඳමයි මැණිකේ. මට සමාවෙන්න ලොකු මැණිකේ. මම මැණිකේ කියපු විදිහටම හැමදේම කරන්නම්." කියා ඇගේ පැදුරට ගුළි විය.

★ ★ ★ ★ ★

මැණිකේටද පුෂ්පාටද එදින රාත්‍රිය දිගු රාත්‍රියක් විය. දෙදෙනාටම නින්ද ආවේම නැත. පාන්දර හතර හමාරට පුෂ්පාත් මැණිකේත් නැගිට මුළුතැන්ගෙට යන විටද කරලැයින් අවදි වී සිටියාය. ඇය කිරිබතක් පිළියෙල කිරීමට සහල් ගරමින් සිටී.

"මැණිකෙ කලින්ම නැගිටලා."

"ඔව් කරලැයින් අද හුඟක් වැඩ තියෙනවා. කළුතර කට්ටියත් සෙනසුරාදා එනවනෙ. කඩේට පිලට යන්නත් තියෙනවා. ඒක හින්ද ටිකක් උදෙන්ම නැගිට්ටා."

පුෂ්පා මුහුණකට සෝදා ගැනීමට ගියාය. ඒ අතරතුර ජයසේන කිරි රැගෙන ආවේය. මැණිකේ ඔහු ළඟට ගොස් කිරි බෝතල් දෙක අතට ගෙන.

"හිටපං දැන් පුෂ්පා එයි. ඔය මුරකාරයගෙ ඇස් වහල උඹල දෙන්න පිටවෙලා පලයල්ලා. කිරි ඕනි වෙච්චදාට මම පණිවිඩේ කියන්නම්. එතකල් මේ වලව්ව පැත්තටවත් එන්න එපා." කියා මුළුතැන් ගෙට ඇතුළු විය.

පුෂ්පාට ජයසේන පැමිණි බවත්, ඔහු සමඟ යන ලෙසත් ඉඟිකර මැණිකේ ඇගේ කාමරයට ගියාය. ඊයේ රාත්‍රියේ එහෙන් මෙහෙන් ඇද දමා තිබූ අල්මාරිය අස්කිරීමට පටන් ගත්තාය.

පුෂ්පා කළුවරේම ජයසේන ළඟට ගිය අතර ඔහුද කිසිම කථා බහකින් තොරව ඇය බයිසිකලයේ පොල්ලේ වාඩි කරගෙන ඉක්මනින් පිටව ගියේය. මුරකාරයා මේ වන විට ගෙය පිටුපසට ගොස් සිටියේ බල්ලන් කූඩු වලට දැමීමටය.

පැය කාලකින් පමණ පසුව කරලැයින් මැණිකේගේ කාමරයට පැමිණ.

"ලොකු මැණිකේ... කෝ පුෂ්පා... මම කිරිබත් ටික කපන්න කියල ඒකිට කථාකළා, කථාකළා කෝ කොහෙවත් නෑනෙ. මම හිතුව මැණිකේගෙ කාමරේවත්ද කියල."

32 වන පිටුව බලන්න



# ප්‍රාර්ථනා මල්...

31 වන පිටුවෙන්

“මොනවා.... පුෂ්පා නැහැ. බලපං කරලැයින් හොඳට. ඒකි සමහර වෙලාවට උදේට බෙලිගහ යටට යනවා බෙලි අහුලන්න. මේ දවස්වල බෙලි වැටෙන හින්ද?.” කියා නිහඬ විය. තවත් විනාඩි දහයකින් පමණ නැවතත් ලොකු මැණිකේ ළඟට කරලැයින් පැමිණියාය.

“මැණිකේ... මම ඒකිව හැමතැනම බැලුව. බෙලිගහ යටත් බැලුව. වත්තෙ ජේන තෙක් මානෙක නැහැ. මම කෑ ගහපු විදිහට ඒකි කොහෙ හිටියත් ඒකිට ඇහෙන්න ඕනි. ඔහෙ නැහැ.”

“හිටපං කරලැයින් - මම එන්නම් බලන්න.” කියා ලොකු මැණිකේද ඇගේ නම කියමින් කෑ ගසමින් පුෂ්පා සොයා වලව්ව වටේ දුව ගියාය.

“යකෝ මේකි කොහෙ ගියාද? අඬගහපං කරලැයින් මුරකාරයට.” මුරකාරයා පැමිණි පසු

“උඹ පුෂ්පාව දැක්කද වලව්වෙන් හෙම එළියට බැහැල යනවා?”

“නැහැ හාමු ... ජයසේන කිරි ගෙනාවට පස්සෙ කවුරුත් මෙහෙ ආවෙ ගියෙ නැහැ. ගේට්ටුවෙන් එළියට ජයසේන ඇරෙන්න වෙන කවුරුත් ගියෙ නැහැ.”

“එතකොට මේකිට මොකද වුණේ?”

“බලපං, බලපං ඔය වත්ත පිටිපස්සෙ. යකෝ මේකි ලිඳටවත් වැටුණාද? බලපං ටිකක්.”

“හොඳමයි මැණිකෙ.”

පුෂ්පා ජයසේන සමඟ පැනලා ගිහින්ය. වලව්වේ සියලු සේවකයින් අතරද මෙම ආරංචිය පැතිර ගියේ විදුලි වේගයෙන්ය.

“අනේ හැබෑට මේකිට වෙච්ච දේ. මේ මැණිකෙ ඕකිට සැලකුවෙ තමුන්ගෙ දරුවෙකුට වගේ. මේකි කරපු දෙයක්.” කරලැයින් විස්සෝප විය. ගමේ ගෑනුන්ට මෙය හොඳ ඕපාදූපයක් විය.

“ඥාන්ඥුන්ටත් ගිය කලක්. ඕකා ඔය වලව්වෙ වැඩට නිතර නිතර ගියානෙ. ඔය කෙල්ල එක්ක තමයි එකට වැඩපල කළේ. මොනවා වුනත් ඒකි ඉටි රූපෙ වාගෙ ලස්සන කෙල්ල. තක්කෙටම ඔවුන්ව ලොකු මැණිකේ ඔය වලව් වත්තෙන් එලවල දායි. වලව් ඉඩම්වල ඉන්න දෙයිද ඔය කරල තියෙන නොසන්ඩාල වැඩේට.”



පුෂ්පා ජයසේනත් සමඟ කනත්තකෑල්ලේ මුර මඩුවේ සිටින බවට ආරංචිය වලව්වට රැගෙන ආවේ ජයසේනගේ පියා සාදිරිස්ය.

“ලොකු හාමු... අනේ මැණිකේ ඔය අපේ පාහරය ඔය කරල තියෙන වැඩේ ගැන අපි නම් හාංකවිත්තයක් දන්නෙ නැහැ. අර කනත්ත කෑල්ලෙ මුරගෙයි දැන් උන් දෙන්න ඉන්නවා. පොලිසියටවත් කියල ඕකුන්ව එලවල දාන්න මැණිකෙ. මගේ එකා වුණත් වැරැද්දක්නෙ කරල තියෙන්නේ. මැණිකෙගෙ අත් උදව්වට හිටිය ගෑනිව අරන් පැනල ගිය එක ඉවසන්න පුළුවන් වැඩක්ද? අපේ ජයසේනයගෙ විදියට මැණිකේ මෙහෙම දෙයක් කරයි කියල කවුද හිතන්නෙ.”

“ඔව් ඔව් සාදිරිස්. උඹේ කතාව සහතික ඇත්ත. ඒත් ඉතින් පුෂ්පා කොහොම වුනත් මට ජයසේනව අහක දාන්න පුලුවන්යැ. මේ වලව් වත්තෙම ඉපදුන ජීවත් වුණ එකා. මම පුෂ්පව නම් ආයෙ මගෙ පණ තියෙනතුරු මේ වලව්වට වැද්ද ගන්නෙ නැහැ. ඒත් ජයසේන. ඌත් ඒකිගෙ මායංවලට රැවටෙන්න ඇති බං. මොනව කරන්නද බං තරුණ වයසනෙ. මමත් වැරැද්දක් කළා. මම ජයසේනටයි, ඕකිටයි නිදහසේ වලව්වේ ඇතුළෙ වැඩ කරන්න දුන්නා. ඕකෙන් මේකෙන් තමයි ඔය පලහිලව් පටන් ගන්න ඇත්තෙ. ඒත් ඉතින් ඕකිට නම් මගෙන් කිසිම සමාවක් නැහැ. සාදිරිස් ඔවුන්ව ඔය කච්චේරියට අරන් ගිහිං පොතේ අත්සන් කරල ආණ්ඩුවේ රාජකාරිය කොරපං අදම. නැත්නම් ඉපදෙන එවුන්ට උප්පැන්න නැහැනෙ. ඒක කොරපංකො උඹ උඹේ යුතුකමනෙ ඒක. ඔවුන්ව මම එලවන්න යන්නේ නැහැ. මොනව වුණත් මට පුෂ්පා වාගෙ නෙමෙයි ජයසේන.”

“ඔන්න මැණිකේ එහෙනම් මම යනවා. මමවත් මගෙ මායියවත් මේවාට අනුබල දුන්නෙත් නැහැ. හාංකාවිත්තියක් දන්නෙත් නැහැ. ඔන්න මැණිකේ අපිට නම් දොස් කියන්න එපා.”

“උඹ ඔය කච්චේරියෙ අත්සන් කරන එක කරල දාපං.”

“හොඳමයි මැණිකෙ.”

ජයසේන තරම් ප්‍රීතිමත් මිනිහෙක් මේ වන විට මේ විශ්වය පුරාම නැතුව ඇති. ඔහුගේ සිනා හඬත් ඥාන්ඥුන් ගාමින් පුෂ්පා සමඟ දොඩන ආදර බසුත් මේ පුංචි ගෙයට දරාගත නොහැකි තරම් විය. පුෂ්පාද සියල්ල අමතක කර තමා ඉතාම කැමැත්තෙන් ඔහු හා සමඟ ආ බව ඔහුට ඇඟවූවාය.

පුෂ්පාගේ ඇඳුම් බෑග් දෙක ගේ ඇතුළේ තිබෙනවා දුටු විට මැණිකේ මොනතරම් සැලසුම් සහගත ලෙස පුෂ්පා වලව්වෙන් පිට කළාද යන්න ඇයට පැහැදිලි විය.

පුෂ්පා ඇලිමැලිකම් ඉවත ලා ජයසේනත් සමග ගෙය අස්පස් කරන කටයුතුවල නිරත විය. දවාලට ආහාරය පිළියෙල කිරීමට අවශ්‍ය සියලු දේ ජයසේන ගෙනත් තිබූ හෙයින් පුෂ්පා යුහුසුළුව ආහාර පිළියෙල කළේ උදෑසනට තේ කෝප්පයකින්වත් දෙදෙනාම සප්පායම් වී නොතිබූ නිසාය.

ප්‍රීතිමත් කුරුලු ජෝඩුවක් මෙන් පුෂ්පාත් ජයසේනත් තම දිවි ගමන ආරම්භ කළහ.

කනත්ත වත්තේ ඇති සොහොන්කොත් දෙකේ ඔබ්බවා ඇති මිය ගිය දෙදෙනාගේ ඡායරූප තම අතීතය මුළුමනින්ම අමතක කර සිනා සී සිටින්නා සේ පුෂ්පාද තම අතීතය අමතක කර සිනාසෙමින් කල් ගත කළාය. ලොකු මැණිකේ තමාව කොතරම් සූක්ෂම ලෙස වලව්වෙන් පිට කර දැමූවද තමාටද ඉන් සිදුව ඇත්තේ යහපතක් හෙයින් ඇය මැණිකේට වෛර නොකළාය. අඩුම තරමේ ගංවතුර ගලන කාලයට තමන්ගේ අම්මාවත්, මල්ලීවත් පංසලට නොගිහින් තමාගේ මේ පුංචි නිවහනට ගෙන්වා ගත හැකි බව සිහිවීමෙන් ඇයට ඉහේ මලක් පිපුණා වැනි සතුටක් දැනුණාය. මෙතරම් කලක් උන් හිටි තැනක් නොතිබූ ඇය දැන් ගෘහපතිනියක් වී ඇත. ඇය මැණිකේට හිතින් පින් දුන්නාය.

**ලබන කලාපයෙන් හමුවෙමු**





# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2018 ඔක්තෝබර් 01 දින සිට ඔක්තෝබර් 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)



### මේෂ ලග්නය

ලග්නාධිපති කුජ 10 වැන්නේ ගමන් කරයි. රැකී රක්ෂා දියුණුව ඇති කෙරේ. ව්‍යාපාර කටයුතුවලින් වාසි ලැබේ. අලුතෙන් ව්‍යාපාර කටයුතු ඇරඹීම ශුභ මාසයකි. රැකියා අපේක්ෂිත අයට රැකියා ලැබීමටත් තනතුරු ලැබීමටත් භාග්‍යය ඇත. අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගැනීමට හැකිවේ. ආදායම් මාර්ග ශුභ වේ.

### වෘෂභ ලග්නය

ලග්නාධිපති කිවි 6 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපක කටයුතු ඉතා සාර්ථක වේ. විභාග ජය ලැබේ. රැකියා දියුණුව ඇත. කොටස් ව්‍යාපාරවලින්ද දියුණුව ලැබේ. කරගෙන යන වැඩකටයුතුවල වෙනසක් ඇති විය හැක. එමෙන්ම පදිංචියේ වෙනසක්ද ඇතිවිය හැක. ආදායම් මාර්ග ශුභ වේ.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ 4 වැන්නේ බලවත්ව ගමන් කිරීම ශුභයි. අධ්‍යාපන කටයුතුවලට ඉතා ශුභ වේ. තරග විභාගවලින් ජය ලද හැක. කලා කුසලතාවලට මෙන්ම ක්‍රීඩාවටද දස්කම් පෑ හැක. රැකියා දියුණුව ඇති කෙරේ. ගේ දොර ඉඩකඩම් ගැනීමට අවස්ථාව ලැබේ. දියුණුව ඇති කෙරේ. ආදායම් මාර්ගවලට ශුභයි.

### කටක ලග්නය

ලග්නාධිපති සඳු 12 වැන්නේ ගමන් කරමින් මේ මාසය ඇරඹේ. හොඳ ගේ දොර, යාන වාහන ගැනීමට අවස්ථාව එළඹේ. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. අලුත් දේ ඉගෙනුමට යොමු වේ. විභාග ජය ලැබේ. රැකියා දියුණුව සැලසේ. කරන වැඩකටයුතුවලින් ශුභ ඵල ලැබේ. ධන ලාභ ඇත.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි 2 වැන්නේ ගමන් කරයි. රැකියා දියුණුව ඇති වේ. වෙළඳ ව්‍යාපාරවලින් වාසි ලැබේ. අධ්‍යාපන කටයුතුවලට ශුභ වේ. ගේ දොර, වාහන ගැනීමට ඉඩ ලැබේ. පිරිස් බලය ලැබේ. ගමන් බිමන් අධික වේ. ආදායම් මාර්ග ශුභ වේ.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ ලග්නයේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ඉතා ශුභයි. බුද්ධිමත්ව තම වැඩ කටයුතු සාර්ථකව කරගැනීමට හැක. රැකී රක්ෂා දියුණුව ඇති කරන අතර රැකියා අපේක්ෂිත අයට පත්වීම් ලැබීමට, රජයේ තනතුරු ලැබීමට ඉඩ ඇත. ධන ලාභ ඇත.

### තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු ලග්නයේ ගමන් කරයි. සතුරු කරදර අඩුය. තම මතයට වැඩ කරන අතර ඉක්මන් තීරණ ගැනීමට පෙළඹේ. රැකියා වැඩකටයුතු සාර්ථක වේ. මිතුරු ඇසුර වැඩි වේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. අදායම් මාර්ග සරු වේ.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ 3 වැන්නේ ගමන් කරයි. රැකියා ව්‍යාපාර කටයුතුවලට ශුභ වන අතර රැකියා අපේක්ෂිත අයට ලැබීමටත්, රජයේ තනතුරු ලැබීමටත්, පත්වීම් ස්ථිර වීමටත් ඉඩකඩ ඇත. අධ්‍යාපන කටයුතු ඉතා සාර්ථක වේ. විභාග ජය ලැබේ. අලුත් විෂයයන් ඉගෙනුමට, නිර්මාණ කථා ලිවීමට දක්ෂතාවය ඇති වේ. ක්‍රියා ශූරත්වය ඇත. නොඉවසිලිවත් වේ. ආදායම ශුභ වේ.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු මේ මස 11 වැනි දින 12 වැන්නට පැමිණේ. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ වන අතර විභාග ජය ලබාගත හැක. රැකියා ව්‍යාපාර දියුණු වේ. අලුතෙන් ආරම්භ කරන වැඩ කටයුතුද ශුභ වේ. ආදායම් මාර්ග ශුභ වේ. වචනය විධානාත්මක විය හැක. ලග්නයේ සඳු උපතේදී ඇත්නම් අනතුරු පීඩාවලට ලක්විය හැකි හෙයින් වඩා ප්‍රවේසමෙන් කටයුතු කරන්න.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 12 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ශුභ වේ. තරග විභාගවලින් ජය ලැබිය හැක. අලුත් විෂයයන් ඉගෙනුමට යොමු විය හැක. දෙස් විදෙස් ගමන් යාමට අවස්ථාව ලැබීමට පුළුවන. රැකියා ව්‍යාපාර දියුණුව යෙදෙන අතර තනතුරු පත්වීම් ලැබීමට අවස්ථාව යෙදේ. පදිංචියේ වෙනසක් ඇති විය හැක. සමාජසේවා කටයුතුවල යෙදේ. ශුභ ඵල ඇත.

### කුම්භ ලග්නය

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතු වැඩි දියුණු වේ. රැකීරක්ෂා කටයුතුවලට ශුභයි. තනතුරු, පත්වීම්, ප්‍රශංසා ලැබෙන කාලයකි. ගමන් බිමන්, වැඩරාජකාරි අධික වේ. පුණ්‍ය කටයුතුවල යෙදේ. ආදායම ශුභ වේ.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 8 වැන්නේ ගමන් කරන අතර මේ මස 11 වැනි දින 9 වැන්නට පැමිණේ. පින් දහම් කටයුතුවලට වඩාත් යොමු වේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. අලුත් උසස් ශාස්ත්‍ර ඉගෙනුමට යොමු වේ. විභාග ජය ලැබේ. වැඩ කටයුතු අධික වේ. රැකියා දියුණුව ඇති වේ. රැකියා බලාපොරොත්තු අයට පත්වීම් ලැබිය හැක. වැඩකටයුතු අධික වේ. පිරිස් බලය ලැබේ. ආදායම් මාර්ග ශුභ වේ.

එම්. වයි. ධර්මවිජය
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණී(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca



# තායිලන්ත සංචාරය

ගුහාවක සිර වුණු තායිලන්ත දරුවන්ගෙ ප්‍රවෘත්තිය මේ වනවිට වැඩිදෙනෙකුට අමතක වෙලා ගියත් බේරාගත් දරුවන් පසුව තාවකාලිකව මහණ වීම පිළිබඳව මතකයක් ඇති. තායිලන්තය නැතිනම් ඉස්සර සියම ලෙස හැඳින්වුණු මේ රාජ්‍යය තාවකාලික මහණ කමට ප්‍රසිද්ධයි. ඒක ඒ රටේ සම්ප්‍රදායක්. තායි වැසියන් ආදරය කරන වඩාත් ගෞරව කරන රජතුමාත් තාවකාලික මහණ දම් පුරනවා. මේ වනවිට තායි වැසියන්ගේ වැඩිම ගෞරවයට ආදරයට පාත්‍ර වුණු තායිලන්තයේ භූමිපෝල් රජතුමා මිය ගිහින්.

ආසියානු තාක්ෂණ ආයතනය (Asian Institute of Technology - AIT) සරසවියේ ඉගෙනුම ලබද්දි මට අවස්ථාවක් ලැබුන තායිලන්තයේ ඈත ගම්බද ප්‍රදේශයක තිබුණ පන්සලක් බලන්න යන්න. ඒකට අවස්ථාවක් ලැබුණ හැටිත් කිව්වොත් හොඳයි. සරසවියේ ඉගෙන ගන්න ශිෂ්‍යයෙක් එක්ක බොහොම හිතවත් කමක් තිබුණ එක් තායිලන්ත තරුණියක් තමයි අපව රැගෙන ගියේ. ඒ ලංකාවේ ශිෂ්‍යයා මම හිටිය කාලෙම සරසවියේ හිටියත් ඔහු ඉගෙන ගත්තෙ මම ඉගෙන ගත්ත විෂය නොවෙයි. ඔහු ඉගෙනගත්ත පාඨමාලාවේ සිටිය විවිධ රටවල්වලින් විශේෂයෙන් ආසියානු රටවලින් ආව සිසුන් අතර ඔහු ටිකක් ජනප්‍රියයි. මේ කියන තායිලන්ත ශිෂ්‍යාවත් ඔහු සමග හිතවත්. ශ්‍රී ලාංකිකයන් වන අපත් බුද්ධාගමේ නිසා ඇය මේ ගමන යන්න අපටත් කතා කළා.

තායි ශිෂ්‍යාව වෘත්තියෙන් ගෘහනිර්මාණ ශිල්පය සහ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව වෘත්තියක නිරත වූ අයෙක්. අප බලන්න ගිය පන්සලේ ආවස ගෙයක් ඇගේ තනි වියදමින් හදමින් හිටියේ. එහි සැලසුමත් ඇයගෙ මයි. ඇගේ කාරයේ නැඟී පැය ගණනක ගමනකින් පසු අප පන්සලට ළඟා වුණා. අප යන විට පන්සලේ ලොකු හාමුදුරුවොයි තවත් එක් හාමුදුරුනමක් පමණයි හිටියෙ මතක විදිහට. අප ලංකාවේ බව දැනගත් ලොකු හාමුදුරුවො අපත් සමග සුහඳ කතාබහක යෙදුණා පමණක් නොවෙයි බුදුදහම පිළිබඳව ප්‍රශ්ණ කිහිපයකුත් අපෙන් ඇසුව. ලොකු හාමුදුරුවන් සමග සාමිචියෙන් පසු අප පන්සල නරඹන්න වුණා. ‘පන්සලේ තවත් හාමුදුරුවරු ඉන්නවද’ කියන අපේ හිතේ තිබුණ ප්‍රශ්නයට පිළිතුර ලැබුණේ පිණ්ඩපාතය වැඩල ආපසු පන්සලට වඩින කුඩා, තරුණ, වයසක ස්වාමින්වහන්සේලා පිරිස දැක්කමයි.

එතන තාවකාලික මහණ කම ලබපු අයත් ස්ථිර ස්වාමින්වහන්සේලා ලෙස වැඩ වසන අයත් සිටියා. පින්ඩපාතයෙන් පසු දානය වළඳා යම් වෙලාවක් බණ භාවනා කිරීමෙන් පසු ස්වාමින්වහන්සේලා පන්සලේ වැඩකටයුතු කරන්න පටන් ගත්තා. කුඩා ස්වාමින්වහන්සේලා අඳනකඩය පිටින්ම වැඩ. පන්සලේ තැන් තැන්වල ගොඩගසා තිබූ ගල් සහ වැලි ගොඩවල්වලින් විල්බැරෝවලට ගල් වැලි පටවා ගනිමින් ඒවා පන්සලේ අලුතෙන් ඉදිකරන ගොඩනැඟිල්ල දෙසට ගෙනියනවා. පන්සල සුද්ද කරනවා. අතු ගානවා. තාවකාලික මහණකම ලැබූ අය මේවාට වැඩිවශයෙන් සහභාගි වුණා. තාවකාලික මහණකම ලැබූ මැදි වයසේ ස්වාමින්වහන්සේ නමක් සමග කතා කරන්න අවස්ථාවක් ලැබුණා. උන්වහන්සේ රජයේ සේවකයෙක්. විවාහකයෙක්. මාස කිහිපයකට පැවිදි වෙලා තියෙන්නෙ. ඒ සඳහා රජයෙන් නිවාඩු ලැබිලා. පවුලේ සියලුදෙනාගේ කැමැත්ත ඇතුවයි තාවකාලික මහණ දම් පුරන්නෙ.

පන්සලේ වැඩකටයුතු බලාගෙන සිටි අපට දක්නට ලැබුණු තවත් දෙයක් කිව යුතු යැයි සිතනවා. අප දැක්කා එක් තායි කාන්තාවක් බුදු පිලිමයකට ටිකක් ඈතට වෙන්නට දුම්පානය කරමින් සිටිනවා. සමහර තායි ළඳුන් එහෙමයි. ඔවුනට එය එතරම් ගානක් නෑ. දුම් පානය අහවර කළ ඇය එතන තිබූ බුදුපිළිමය තිබූ ආසනයට නැග ගත්තා. වෙන්නෙ කුමක්දැයි අප කුහුලෙන් බලා සිටියා. ඇය කලාකාරියක්. බුදුපිළිමයේ රන් ආලේප කරනවා. ඇය ඉතා දක්ෂ ලෙස එය කළා. සමහරවිට මතුපිටින් නොපෙනුණාට බුදුරජාණන් වහන්සේ පිළිබඳව භක්තිය ඇගේ සිත තුළ තිබෙන්නට ඇති කියා මට හිතුණා. තාවකාලික පැවිදි අයගේ චර්යාව පිළිබඳව ග්‍රාමීය තායි පන්සලක පරිසරය පිළිබඳව අත්දැකීමත් සමග අප නැවතත් සරසවියට පැමිණියා.

වතාවක් තායිලන්තයේ චියැංමායි ප්‍රදේශයේ පැවති පුහුණු පාඨමාලාවකට යන්න අවස්ථාව ලැබුණා. මතක



හැටියට 2007 වසරේ. පුහුණු පාඨමාලා අතරෙ නිවාඩු තියෙන දවස්වලට විවිධ ස්ථාන නරඹන්න යන්න සංචාරයන් සංවිධානය කරනවා. එක් අවස්ථාවක අපව රැගෙන ගියා ඈත කඳුකර ප්‍රදේශයක ජීවත් වන ගෝත්‍රික ජනයා බලන්න. එය ලංකාවේ ආදිවාසී වැදි ජනයා මෙන් ආදිවාසී ජනතාව ජීවත්වන ප්‍රදේශයක්.

ලංකාවේ ආදිවාසීන් බලන්න ගියත් දැන් අපට දක්නට තියෙන්නෙ නවීකරණය වූ පිරිසක්නෙ. ඒ වගේම දැන් ඔවුන් බලන්න එන අයට එක එක දේවල් විකුණල බොරුවට නටල එහෙම නැතිනම් මොකක් හරි බොරුවක් කරල සල්ලි කඩාගන්න බලන එකනෙ කරන්නෙ. මේ ගමන යද්දී මට මතකයට ආවෙ 1996 අවසාන කාලයේ හෝ 1997 වසරෙ මුල්කාලයෙදි ලංකාවේ ආදිවාසීන් බලන්න මහියංගනේ දඹානට ගිය සංචාරය. ගෙදර අයත් සමග ගිය ගමනේදි අවස්ථාව ලැබුණ එවකට සිටිය ආදිවාසි වැදිනායක තිසාහාමි සමග කතාකරන්න සහ ඡායරූපයක් ගන්න. මම විද්‍යාපති උපාධිය අවසන් කරල ලංකාවට ගිය අලුතම නිසා මා ළඟ තිබුණ තායිලන්තයෙන් අරන් ගිය ඩිජිටල් කැමරාවක්. තිසාහාමිගෙ තනි පින්තූරයක් සහ මා සමග එකට ගත් පින්තූරයත් තවමත් ළඟ තියෙනවා. තිසාහාමි කියන්නෙ බොහොම ප්‍රතාපවත් පෙනුමක් තිබුන නායකයෙක්. අප ගිය දවසෙ එතරම් සෙනඟ හිටියෙ නැති නිසා නිදහසේ කතා කරන්න සහ පින්තූර ගන්න පුළුවන් වුණා. පින්තූරවලට පෙනී සිටින්න කියල ඔවුන් අපෙන් කිසිම මුදලක් හෝ තෑගි බලාපොරොත්තු වුණේ නෑ. දැන් නම් තත්ත්වය හුඟක් වෙනස් කියලයි ආරංචි. ගෝලියකරණය වාණිජ ලෝකය සියලු දේ ගිලගෙන තියෙන්නෙ. අද අපට ජීවත්වෙන්න වෙලාතියෙන්නෙත් වාණිජ ලෝකය නැතිනම් ව්‍යාපාර ලෝකය කියන විදිහට.

අප තායිලන්තයේ නරඹන්න ගිය ප්‍රදේශයෙත් තත්ත්වය ඒ වගේමයි. ඒ ප්‍රදේශ දැන් සංචාරකයො බහුලව ගැවසෙන ප්‍රදේශ. සම්ප්‍රදායික ආදි වාසි ඇඳුමෙන් සැරසුන අය තැන් තැන්වල දක්නට පුළුවන් වුණත් සංචාරක ව්‍යාපාරය සමගම හැමදෙනාම වාණිජකරණය වෙලා. තැන් තැන්වල ඔවුන්ගේ ආදි නැටුම් නටනවා. සල්ලිවලට තමයි හැමදේම. අරුමෝසම් බඩු විකුණන කඩ හැමතැනම. හරියට කානිවල් එකකට නැතිනම් ලංකාවේ සල්පිලකට ගියා වගෙයි.

අපව රැගෙන ගිය සංචාරක බස් රථයේ විස්තර කියමින් මග පෙන්වමින් ගිය තායි තරුණියගේ විස්තර නිසා අපට පාඑවක් දැනුණෙ නැ. තායි වැසියන් විවිධ පළඟැටියන් සහ සර්පයන් වැනි සතුන් ආහාරයට ගන්නේ ඇයිදැයි යන පැනයට ඇය කදිම පිළිතුරක් දුන්නා. ඇය කියන විදිහට එක වතාවක් තායිලන්තයේ වගා බිම්වලට දරුණු ලෙස පළගැටියන්ගෙන් හානි වුණාලු. පාලනය කරගන්න බැරිවුණු තැන ගොවියන් පළගැටියන්ව කෑමට ගත්තලු. එදා ඉදන් දැන් දිගටම කනවලු. ඒ වගේම යම් සතෙක් චලනය වේද, ඇදී යයිද ඒ සතාව ආහාරයට ගත හැකි බව තායිවැසියන් විශ්වාස කරනවලු. ඒ නිසා සර්පයන්ව පවා ආහාරයට ගන්නවලු. ඇය ඒ සඳහා තායි භාෂාවෙන් කියවෙන පිරුළක් වැනි දෙයක් කිව්වත් ඒක මතකයට එන්නේ නෑ. ඇගේ කතා ඇත්ත හෝ බොරු හෝ ඇය ඒවා විස්තර කරන ආකාරය නම් අපූරුයි. ඇය කිව්ව තවත් කතාවක් තමයි තායිලන්තයේ හමුදා සේවයට එක්වීම පිලිබඳව තියෙන රස කතාවක්. හමුදා සේවයට එක්වන ගැටවරයා සම්පූර්ණ මිනිසෙකු වී ඉන්පසු එම මිනිසා සමරිසියෙකු බවට පත් වේ. (Teenage become a Man , Man become Gay)

මම විද්‍යාපති උපාධිය හදාරන කාලෙ ඒ කියන්නෙ 1995 සහ 96 කාලෙ ආසියානු තාක්ෂණික ආයතනය විශ්වවිද්‍යාලය තමයි බැංකොක්වලට කිට්ටු පැතුම්තානි නගරයේ පිහිටා තිබුණ ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් තිබුණ ආයතනය. බැංකොක් නගරයේ ඉඳන් බස් සේවා දෙකක් විශ්වවිද්‍යාලයට ආව. එයට අමතරව ගමනක් යන්න ඕන වුණොත් ටැක්සි, ටුක් ටුක් වගේම මෝටර් සයිකල් ටැක්සිත් තිබුණා. මෝටර් සයිකල, ටැක්සි ධාවනය කළේ වැඩි හරියක් කාන්තාවන්. ඒ කාලේ බැංකොක්වල අන්තර්ජාතික ගුවන් තොටුපොළ වන ඩොන්මුවාන්ග් තොටුපොළ තිබුණෙ AIT කිට්ටුව. දැන් ඒක හමුදා ගුවන්තොටුපොළක්. අලුතෙන් හැදුව ස්වර්ණභූමි ගුවන්තොටුපොල තියෙන්නෙ ටිකක් ඈතින්. ඒ දවස්වල AIT සරසවිය ළඟ තිබුණ තායිලන්තෙ රාජ්‍ය විශ්වවිද්‍යාලයකට අදාළ කැම්පස් එකක්. එක් ගොඩනැගිල්ලක් පමණයි තිබුණෙ. එතකොට අනිත් ගොඩනැගිලි හදමින් තිබුණෙ. කවුරුත් දැනගෙන හිටියෙ AIT එක. දවසක් ඒ කැම්පස් එකේ තිබුණ උත්සවයක්. මොකක් හෝ විශේෂ දිනයක ඉටිපන්දම් පා කරල අරිනව ගලායන වතුරේ. ඒ වගේම ඒ සරසවියෙ ශිෂ්‍යාවන් අතරින් රූප රාජිනිය තෝරන තරගයක් තිබ්බ. දිව්‍යලෝකයෙන් බැස්ස දිව්‍යාංගනාවො වගේ තමයි අපි ඒ වෙලාවෙ ඒක දැක්කෙ. 2006 සහ 2007 තායිලන්තයට යනකොට ගියේ ස්වර්ණභූමි ගුවන් තොටුපොළෙන්. එතකොට AIT කියන්නෙ කුඩා තැනක් වෙලා අර විශ්වවිද්‍යාලය මහා විශාල සරසවියක් වෙලා.


MELODIES FROM
THE MEADOWS
TICKET PRICE
$ 25
On NOVEMBER 3rd, 2018 @ 6:00PM
The BLACK BOX THEATRE,
Queen Elizabeth Park Community and Cultural Centre
2302 Bridge Rd, Oakville, ON L6L 3L5
CONTACT :
CHAMINDA – (647) 504-5802
SAMPATH : (647) 871-4844


රට රකින, රට හදන,
ජනතාවාදී පාලනයක්
ජ.වි.පෙ. ජාතික සංවිධායක, පාර්ලිමේන්තු මන්ත්‍රී
බිමල් රත්නායක සහෝදරයා
Toronto නගරයේදී ඔබ හමුවන
සංවාදශීලී හමුව
ඔක්.
28
උදේ
10.00ට
Earnscliffe Recreation Centre
44, Eastbourne Drive - Brampton
(Torbram Road & Clark Boulevard)
සම්බන්ධීකරණය
Nihal Premalal - 647-210-8771
Ajith Liyanage - 416-904-6776
Dr. Jayarathne - 226-979-8000
ජනතා විමුක්ති පෙරමුණ - කැනඩා කමිටුව
JVP
CANADA

## අම්මා

අම්මාගේ පපුව උඩ තරම් ඕනෙ පුතෙකුට
අඬන්න පුළුවන් තැනක් නෑ මුළු ලෝකෙම
පුතු හැඬුවොත් අම්මත් හඬනා බියට
තවමත් පුතුන් හඬනව හොරැහින් රෑට

**ගයාන් ඉන්දුල කොඩිතුවක්කු ලියූ**
**'විරාමයකට පසුව හමුවෙමු' කාව්‍ය සංග්‍රහයෙන්**

## සිත්තරානෙනි



ගතින් වියපත් සිතින් යව්වන
සිත්තරානෙනි ඔබේ තෙලිතුඩ
එදා වගෙමයි අදත් බලවත්
මවන සිත්තම් නිවයි සිත කය

දුහුල් සළුපට ඉවතලා ඇඳි
ළඳක සියුමැලි ගතේ රුසිරිය
අවදි කෙරුවා ලයේ සෙනෙහස
නිසල කරවා මනක් සලෙලුන්

මුනිඳු ගුණකඳ දෙතිස් ලක්ෂණ
එකලු කරවා මැවූ බුදුරුව
මගේ සිත මෝහනය කරවා
සසල සිතුවිලි නිසල කෙරුවා

**ආචාර්ය ජගත් රූපසිංහ**

## මාව කළා කවියෙකු

මා විඳින දුක් ගැහැට
සෝ තැවුල් වේදනා
දරාගනු බැරිම තැන
අකුරු කර ගැලපුවා
තලු මරා රස විඳින
නුඹට එය මදි වෙලා
අන්තිමට නොදැනීම
මාව කවියෙකු කළා

**ප්‍රියංකර හේරත්ගේ**

## පොඩි දුවගේ ශිෂ්‍යත්වය

ඇවිද ගිහින් මිදුල පුරා
කුරුළු පැටවු බත් කන හැටි
පෙන්න පෙන්න ඉස්සර වගෙ
හබුන් කටක් කවන්න දැන්
බැරිද අම්මෙ එක දවසක්

ප්‍රශ්න පත්තරේට ගන්න
ලකුණු ටිකක් අඩුවෙන කොට
අම්මා මට බනින හින්ද
බය හිතිලා සුර බබාල
හඳමාමගෙ එළිය දිගේ
සුරලෝකෙට ගියා වත්ද?

තුරුළු වෙලා මගේ ඇඟට
කථා කරපු බෝනික්කන්
අර බලන්න අල්මාරියෙ
කඳුළු හෙළනවා හොඳටම
මං යන්නැති හින්ද ළඟට

අම්ම කියන ඩොක්ට ප්‍රොක්ට
ඉංජිනේරු හැමදෙනාම
ශිෂ්‍යත්වය පාස් අයද
පහෙන් හයෙන් පාස් වෙලා
බැරිද අම්මෙ අම්මා ළඟ
හොඳ දරුවෙක් වෙන්න මෙමට

**ජයසිංහ අලුත්වැව**

## බලාගෙනයි ...!

සීතලට වක ගැසුණු
කෝට්ටුවක අග රැඳුණු
කෙම්යකට පැනි පිරුණු
අඩ පියනකින් වැසුණු

කදිම සුවදක් හැමුනු
කුහුඹුවන් හට දැනුණු
බාඳුරා තුළ වැටුණු
කුහුඹුවන් යළි නොඑනු

**ආරි ගමරාලලාගේ**

## හිමි රට ගොසිනි

සිය හිමි ගැන හිත හිත - නොතැවෙමි ගිය පිට රට
මිතුරන් හා සතුටින් - ඔහු ඉනු ඇත
ලෙඩවන කල දරු - කර බැඳ යමි වෙද ගෙදරට
ගිහි ගිනි ගෙයි කර වෙමි - දර වෙමි කරදර මැද

අලුයම අවදිව හකුළමි - දවසක වැඩ පැය දෙකකට
දරුවොත් පාසල් යවලා - දුවනෙමි වැඩ පොළ වෙත
ඇඳිරිය එනවිට - ගොඩ වදිනෙමි පොදු ජන රියකට

වත බල බල - හිත අනාචාරයේ හසුරන
තෙරපෙන නලියන සළෙලුන් හට බැණ
කුණු හරුපෙන් ආසිරි ලබමි

කඩපිල් බක්කියෙ මාකට්වල පෝලිම් ගැසෙමි
උරෙනුර ගැටී - හොඳ හැටි දිවි සටනේ යෙදෙමි
ජය ගෙන මිස පැරදීලා - ගෙදරට නොයමි
පාගන්නට එන අය පාගමි - හැකි වෙර දමමි

කළුවර මඩ වගුරේ වැටි වැටි - බඩවැටියෙන් ගොඩ වී
ලුහු බැඳි බේබදු රකුසන් හට බිලි නොවෙමී
රාග සිත්වලට මේ නෙත් - උල් පිහියක් කරමි

මදන වතට හිත - චක්‍රා යුධයක් කර ගසමි
එක මොහොතේ දහ දෙනෙකු නඟන වෙර
මේ මුදු දෑතට අර ගනිමි

පතිවත ඉහ තබමින් - සැතපෙන රෑ සයනේ
දවසේ ගිම් - ගිනි නිවෙනා සඳ දුක සිතුනේ
කහවනු රන් පොදි බැඳ - ඔබ එන මතු දිනයේ
සිය කෝමළ බිරිඳ කොහේ දැයි
නොතැවෙන් හිමි සඳුනේ

**යමුනා මාලිනී පෙරේරා ලියූ 'කුළී මාළිගා'**
**(1991) කාව්‍ය ග්‍රන්ථයෙන්**



## හේන් යායේ ඉස්කෝලේ

සීත දොළෙන් සීතට මුව දොවාගෙන
ඕලු විලෙන් මල් මිටියක් නෙළාගෙන
හීන් හිනාවෙන් මුව සරසවාගෙන
නුඹ හිටියා මං එනතුරු බලාගෙන

හීන් හඬින් නුඹ මිමිණූ ගී සින්දූ
තාම ඇසේ ඒ සවනට අම බින්දූ
වේවැල නුඹෙ සිනිඳු අත්තල මත රැන්දූ
මගෙ හිත මා වෙතම අපමණ දුක කැන්දූ

කිචි බිචි හඬ ඇසෙන මුත් අතොරක් නැතුව
පාළුයි දුවේ පාසල් බිම නුඹ නැතුව
ඕලු විලේ මල් පිපුණත් සුදු මතුව
මට මල් කොයින්දෝ නුඹ එන්නේ නැතුව

හීන් හිනාවෙන් මා සැනසූ දියණී
පාන්දරින් නුඹ නොදකින හිත දුකෙනී
හේන් යාය පිස නුඹෙ සීපද ඇසුණී
යාන්තමටවත් නුඹ අමතක නොවුණී

**සුනීතා එම්. කොස්වත්ත**



## කියවීම

Desktop මෙන්ම Laptop තිබුණත්
Tab වල Phone වල App ඇත
මම නම් ආස නැහැ විද්‍යුත්
ආසම දේ පොත් අතරේ

ළඟම
බෝම
කියවීම
කිමිදීම

**කෞමදී රසාංගිකා**


Andro Cakes
මංගල කේක්
ලාංකේය මංගල කේක්
මංගල හා ප්‍රිය සම්භාෂණ සඳහා තනි තනි අතුරුපස (Individual Desserts)
ඉල්ලීම අනුව නිර්මිත කේක් වර්ග (Custom Cakes)
කප් කේක් / කේක් පොප් / මැකරොන්
ප්‍රනීත ආහාර මේස (Sweet Tables)
ඩබල් චොක්ලට් ෆෞන්ටන්
චොක්ලට් වර්ග
සජීවී ද්‍රාව්‍ය නයිට්‍රජන් අයිස් ක්‍රීම් (Liquid nitrogen Icecream (Live)
සජීවී උදෑසන ආහාර මේස
ලාංකේය ක්‍රමයට බත් සහ ව්‍යංජන
සැන්විච් වර්ග
ලාංකේය බේකරි කෑම වර්ග (Pastries)
පලතුරු, චොක්ලට්, සීනිමය හා මාසිපෑන් වලින් නිර්මිත ප්‍රධාන කෑම සැරසිල්ල
(Edible Carvings for centre pieces)
සඳහා විශිෂ්ඨයන්.
25ක් වසරක අත්දැකීම් හා සහජ කුසලතාවෙන් සපිරි, ඔලිම්පික් රන් පදක්කම් ලාබී,
සූපන ආචාර්ය ශිල්පී
දිමුතු පෙරේරා
අතින් හැඩගැන්වෙන සම්මානනීය ආහාර සැරසිලි,
අප ඇන්ඩ්‍රෝ කේක් ආයතනයෙන් එළි දැක්වේ.
අප හා සම්බන්ධ වීමෙන් ඔබගේ ඊළඟ විශේෂ උත්සවය සඳහා
අපගේ විශ්වාසනීය උපදෙස් නොමිලේ ලබා ගත හැක.
Andro Cakes
www.androcakes.ca
https://www.facebook.com/chefdimu
TP: 416-857-4566
order@androcakes.ca
ටොරොන්ටෝ හා තදාසන්න ප්‍රදේශ (GTA), ඇජැක්ස්,
බර්ලිංටන්, ඕක්විල් හා මුස්කොකා දක්වා සේවා සැපයේ.
අවම ඇනවුම දස දෙනෙකු සඳහා.
තම නිවසටම ප්‍රවාහනය කෙරේ.


AirCare Plus
ONE CALL WILL FIX IT ALL
Sales | Service | Repair | Installation
Line: 416.605.8300
Email: ashokdon@live.ca
Heating & Air Conditioning
FAST, AFFORDABLE SERVICE
Ashok Hettege
Licensed H.V.A.C Technician
Furnace
Gas Piping
Hot Water Tank
Tankless Water Heater
Humidifier
Air Cleaner
Air Conditioning
Dishwasher & Fridge Water Line Installation
Gas Stove and Gas Dryer Installation
ග්‍රීෂ්ම සමය නිමා විය.
ඔබේ නිවසේ තාපන යන්ත්‍රයේ (furnace)
නිසි ක්‍රියාකාරීත්වය පිළිබඳ
සැලකිලිමත් වන්න.
එහි අත්‍යවශ්‍ය නඩත්තු කඩයුතු අලුත්වැඩියා
කටයුතු හා අලුතින් සවිකිරීම් සඳහා විමසන්න.
A MEMBER OF
CanLanka
BUSINESS ASSOCIATION
2004-2014
10
CELEBRATING
10 YEARS IN BUSINESS
SATISFACTION
100%
GUARANTEE



# ගල්ඔය සංවර්ධනය හා ප්‍රථම සිංහල-දෙමළ ගැටුම

■ ජයරත්න ගුණමුණි
ලේකම් - එතෙර අපි සංවිධානය - කැනඩා ශාඛාව

රජයේ චිත්‍රපටි අංශය වෙනුවෙන් ඩී.බී. නිහාල්සිංහ විසින් 1968 දී නිපදවන ලද 'හදවතක නිම්නය' වාර්තා චිත්‍රපටියේ පසුබිම් කථනය ගාමිණී ෆොන්සේකාගේ ගැඹුරු කටහඬින් මෙසේ ආරම්භ විය.

'අතීතයේ අඳුරින් වැසී තිබූ මේ සුන්දර නිම්නයේ හදවතට ජීව වායුව එක් වූයේ 1948 දීය. එදා අලුත් ජාතියක උපත සිදුවිය. නව යුගයක් බිහි විය. ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායක ශ්‍රීමතාණන්ගේ මග පෙන්වීම අනුව නිදහස් නිවහල් පාලන ක්‍රමයක් යටතේ ජාතියේ ප්‍රාර්ථනාවන් මුදුන්පත් කරමින් සංවර්ධන යුගයක මුල් පියවර නැංවිණ. ඒ නව ජීවිතයේ උපත සමග ඇරඹුණු විශාලතම වූද ශ්‍රේෂ්ඨතම වූද සංවර්ධන ව්‍යාපාරය ගල්ඔය සංවර්ධන ව්‍යාපාරයයි.'

නිදහසින් පසු ඇරඹි කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිවලින් ජේ.ආර්. ජයවර්ධනගේ මහවැලියට ප්‍රථම බිහිවූ විශාලතම සංවර්ධන යෝජනා ක්‍රමය ඩී.එස්. සේනානායකගේ ගල්ඔය ව්‍යාපාරය බව ඉතිහාසය පොත්වල සටහන් වුවද දෙමළ ජනයාට එරෙහි ප්‍රථම ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වූයේද මෙම ජනපදකරණය මුල් කරගෙන බව ඒ ඉතිහාසය සඳහන් නොකරයි. 1956 ජුනි 04 දා සිට දින හතරක් පුරා රාජ්‍ය අනුග්‍රහය සහිතව සිංහල මැර කල්ලි විසින් දියත් කළ ප්‍රහාරය දෙමළ වැසියන් 150 කට පමණ මරු කැඳවූ බවත් තවත් 200 කට අධික ප්‍රමාණයකට තුවාල සිදු කොට ඇති බවත් වාර්තා සඳහන් කරයි. මෙය සිදුවූයේ 1983 කුප්‍රකට කළු ජූලියට 27 අවුරුද්දකට කලින් 1956 දී ඩී.එස්. සේනානායක රජය යටතේ නොව ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක සමගි පෙරමුණු රජය කාලයේදීය.

## ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම අගමැති වූ ඩී.එස්. සේනානායකගේ යෝජනාවක් අනුව ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය ඇරඹෙන්නේ 1947 දීය. ගල්ඔය සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කරමින් ඇරඹුනු යෝජනා ක්‍රමයේ මූලික අරමුණු වූයේ ජල ගැලීම් පාලනය, ඉඩම් නොමැති වුවන්ට ඉඩම් ලබා දී කෘෂිකර්මාන්තය දියුණු කිරීම හා ජලවිදුලි නිෂ්පාදනයයි. දෙහිගල, රෝබේරු, එලිමාන, මඩොල්සීම ඉහළ කඳුකරයේ වතු මැදින් ගලාගෙන විත් නැගෙනහිර වෙරළේ කල්ලොඩායි හිදී සයුරට එක්වන පදිප්පලෙ ආරු හෙවත් ගල්ඔය ඉඟිනියාගලදී වේල්ලක් මගින් හරස් කොට ජලාශයක් ඉදි කිරීම ප්‍රථම අදියරයි. කිලොවොට් 8000 ක විදුලි උත්පාදනයක් අපේක්ෂා කෙරිණි. බ්‍රිතාන්‍ය පාලන සමයේ මුල්‍ය ලේකම්වරයා වශයෙන් කටයුතු කළ ඕස්ට්‍රේලියානු ජාතික හැරල්ඩ් ජේම්ස් හක්ස්හාන් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ඩී.එස්. සේනානායක විසින් පත්කරන ලදී. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 67.2 කි. ඉදිකිරීම් ඇමරිකාවේ මොරිසන් ක්නුඩ්සන් ඉන්ටර්නැෂනල් සමාගමට (Morrison-Knudsen International Company) පැවරිණි.

1949 දී ගල්ඔය සමාරම්භක උත්සවයේදී කතා කළ ඩී.එස්. පැවසුවේ ගල්ඔය යන වචනය අද ජනයාගේ මුවග පිළිරැව් දෙන උදාන වාක්‍යයක් බවයි. රට ස්වයංපෝෂණය කරා ඉක්මනින් ගමන් කරන බව පැවසූ ඩී.එස්. සේනානායකට, ජනපදකරණයේ යටි අරමුණු ඇති බව ෆෙඩරල් පක්ෂ නායක ජේ.වී. චෙල්වනායගම් වටහාගෙන සිටි නමුත් බොහෝ සිංහල හෝ දෙමළ නායකයින්ට මේ පිළිබඳ කිසි අදහසක් නොතිබිණි.

'ගල්ඔය යෝජනා ක්‍රමය පෙන්නුම් කරන්නේ ආණ්ඩුවේ සිංහල ජනපදකරණයට කදිම උදාහරණයකි. භාෂා ප්‍රතිපත්තියට වඩා මෙය දෙමළ ජනයාට අති භයානකය' දෙමළ ප්‍රදේශවල සිංහල ජනගහනයක් කෘතිමව ආරෝපණය කිරීමට ආණ්ඩුව ක්‍රියා කරයි' යනුවෙන් චෙල්වනායගම් අනතුරු ඇඟවීය.

## චෙල්වනායගම් ගේ අනාවැකිය

ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ සභාපති වූ එච්. ජේ. හක්ස්හාන් 1951 දී හෘදයාබාධයකින් මිය යාමත් සමග සභාපති ලෙස සිවිල් සේවයේ ප්‍රමුඛයෙකු වූ ආර්. කනගසුන්දරම් පත් විය. ද්‍රවිඩයන් තුළ මතුවෙමින් තිබූ සැක සංකා සමනය කිරීම ද්‍රවිඩ නිලධාරියකු පත් කිරීමේ ඩී.එස්. ගේ අරමුණ වූවා විය හැකිය. සිවිල් සේවකයකු වූ ෂර්ලි අමරසිංහ සහකාර කළමනාකරුවකු වශයෙන් සේවය කළ අතර මිනින්දෝරු ජනරාල් ඒ. බ්‍රොහියර්, හිටපු වාරිමාර්ග අධ්‍යක්ෂ ඩබ්ලිව්.ජේ. අලගරත්නම්, හිටපු ආහාර කොමසාරිස් එම්. එල්. ඩී. කැස්පර්ස් හා යුඇන්පී හි නීතිඥයකු වූ ඩබ්ලිව්. ඊ. වීරසූරිය යන අය මණ්ඩලයේ සෙසු සාමාජිකයින් වූහ. මණ්ඩලයේ ලේකම්වරයා වූයේ ජේ.සී.එස්. ජයරත්නම්ය.

ඩී.එස්. ගේ සැලැස්ම පිටුපස යටි අරමුණු හෝ කූටෝපායන් ඇති බව කනගසුන්දරම් කිසි විටෙකත් විශ්වාස නොකළේය. ඔහුගේ එකම අභිප්‍රාය වූයේ ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමය. මඩකලපුවේදී චෙල්වනායගම්ට අහම්බෙන් කනගසුන්දරම් මුණ ගැසිණි. චෙල්වනායගම්ගේ අනතුරු ඇඟවීමට පිළිතුරු දුන් කනගසුන්දරම් පැවසුවේ සිංහලයින්ට 1818 මුඩු බිම් ආඥා පනතින් ඉඩම් අහිමි වී සිදු වූ අසාධාරණයට පිළිතුරු ලෙස උඩරට සිංහලයින් අලුත් ජනපදවල පදිංචි කිරීමට ඩී.එස්. උත්සාහ කරන බවයි. කෑගල්ලේ ආණ්ඩුවේ ඒජන්ත සාක්ෂි සහිතව ඉදිරිපත් කළ වාර්තාවක් උපුටා දක්වමින් කනගසුන්දරම් කරුණු පැහැදිලි කළේය. චෙල්වනායගම් වාද නොකළේය. "ඉලන්දාරියා නුඹ දෙමළ ජනයාගේ හදවතට අනිමින් ඉන්නෙ කිණිසි තුඩකින්" යැයි පැවසීය.

ද්‍රවිඩ නිජබිම සිංහලයා ආක්‍රමණය කරන බව චෙල්වනායගම් පැසුවේ ආණ්ඩුව සිංහල ජාතිවාදී ප්‍රතිපත්තියක පිහිටා සිටින බව ප්‍රකාශ කිරීමටය. නමුත් ඩී.එස්. සේනානායකගේ යටි අරමුණ වී ඇත්තේ අනාගතයේ ඇති විය හැකි ජාතිවාදී ගැටුමකට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීමට නම් දෙමළ-සිංහල ජනයා වාර්ගිකව මිශ්‍ර වී සිටිය යුතු බවයි. වාමාංශිකයින්ගේ දැඩි ජනපදකරණ විරෝධය දරා සිටිය නොහැකිව මාතර පැවති රැස්වීමකදී ඩී.එස්. ප්‍රකාශ කොට ඇත්තේ අනාගතයේදී ඇතිවිය හැකි ජාතිවාදී ගැටුම අවම කිරීම තම අරමුණ බවයි. එල්.ටී.ටී.ඊ. සංවිධානය ප්‍රථමයෙන් පහර දුන් ඩොලර් ෆාම්, කෙන්ට් ෆාම් එවැනි උතුරු මායිමේ පිහිට වූ සිංහල ගම්මාන දෙකකි.

ගල්ඔය ප්‍රදේශය එවකට අයත්ව පැවතියේ මඩකලපුව දිස්ත්‍රික්කයටයි. එම ප්‍රදේශයේ පාරම්පරික දෙමළ, මුස්ලිම් හා වැදි ජනයා හා 1818 කැරැල්ලෙන් දිවි ගලවා ගත් සිංහලයින් ජීවත් වූහ. තුම්පන්කානි, වඩයම්තලාව(දඩයම්තලාව), දිවුලාන, ඉල්ලංකච්චේනෙ, සංගමන්, රාජස්කුලම, කොන්ඩට්ටුවාන්, අම්පාරෙකුලම්, පෙරියවිසාරයිත්කන්දන්, පුත්තූනගර් ආදී පුරාණ ගම්මාන හා ලාහුගල, පානම ආදී සිංහල ගම්මාන මෙම ප්‍රදේශය තුළ පිහිටා තිබිණ.

ගල්ඔය ඊළඟ පියවරේදී වෙල්ලාවේලි, බක්කිඇල්ල, මන්දූර්, අන්නමලේ, කෝමාරි, උහන, වීරගොඩ, මල්වත්තේ, වඩයම්තලාව හා අම්පාර කොට්ඨාසවල කැලෑ කපා අක්කර 120,000 ක් පුරා පැතිරුණු කොලනි 40 ක් ඉදි කෙරිණි. නව ඉඩම්වලින් 50% ක් මඩකලපුව දිස්ත්‍රික්කයේ පදිංචි කරුවන්ටත් ඉතිරිය රටේ අනෙකුත් ප්‍රදේශවල ජනයාට ලබාදෙන බවටත් ඩී.එස්. ගේ පොරොන්දු විය.

1952 දී ඩී.එස්. සේනානායක මිය ගිය පසු අගමැති වූ ඩඩ්ලි සේනානායකට කෘෂිකර්ම ඇමති වූ ඔලිවර් ගුණතිලක ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට සහාය විය. මිනින්දෝරු ජෙනරාල් බ්‍රෝහියර් ගේ වාර්තාවකට අනුව වසර 1953 වන විට මඩකලපුව දිස්ත්‍රික්කයෙන් පවුල් 852, මහනුවරින් 213, කෑගල්ලෙන් 275, හම්බන්තොටින් 175 ක් හා ඌව පළාතෙන් 250 ක් ලෙස පවුල් 1765 ක් පදිංචි කොට අවසන්ය. ඩී.එස්. සේනානායකගේ පොරොන්දු ආකාරයට 50% ක් නැගෙනහිර පළාතෙනුත් ඉතිරියෙන් 25% ක් උඩරට සිංහලයින්ට හා 25% ක් රටේ අනෙකුත් ප්‍රදේශවලින් ලෙස වෙන් කෙරිණ. නව ජනපදිකයක් වාර්ගිකව මිශ්‍ර වුවද නැගෙනහිර වෙරළේ විසූ මුස්ලිම් හා දෙමළ ජනයාගෙන් වෙන්ව ජීවත් වූහ. ගොඩින් අක්කර 2 ක් මඩින් අක්කර 3 ක් බැගින් පළමු අදියරේදී අක්කර 120,000 ක් බෙදා දුන් අතර සෙන්ට්‍රල් කෑම්ප් හි කොලනි 4, 6, 7, 11, 13, 15 දෙමළ ජනයාටද 3, 9, 10 කොලනි සිංහලයින්ටද 5, 12 මුස්ලිම් ජනයාටද වෙන් විය. ඉතිරි ඉඩම් සියල්ල සිංහලයින්ට ලබා දීම සිදු විය.

## සිංහල පමණයි

1953 හර්තාලයෙන් ඉවත් කෙරුණු ඩඩ්ලිගේ අගමැති පුටුවට ජෝන් කොතලාවල පත් වූ අතර කෘෂිකර්ම ඇමති ජේ.ආර්. ජයවර්ධන හා ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමති පී. බී. පුලන්කුලමේ යටතේ ගල්ඔය ඉදිරියට ඇදුණි. නමුත් 1956 මැතිවරණය සඳහා වෙනත් ප්‍රමුඛතා කරලියට පැමිණ තිබූ අතර භාෂා ප්‍රශ්නය මුල් තැනක් ගති. එච්.එල්. මෙත්තානන්ද ගේ සිංහල ජාතිවාදී සංවිධානය හා එක්සත් භික්ෂු පෙරමුණ 'සිංහල පමණයි' යන සටන් පාඨය පෙරට ගෙන ආහ. ඩඩ්ලිට අගමැති කම දීම නිසා එජාපයෙන් ඉවත් වී ශ්‍රීලනිප පිහිටුවා ගත් ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක තවත් පක්ෂ කීපයක් එකතුව පිහිටුවා ගත් සමගි පෙරමුණ විසින් තමන් බලයට පැමිණ පැය 24 කින් සිංහල රාජ්‍ය භාෂාව කරන බවට පොරොන්දු විය. සමගි පෙරමුණ පහසුවෙන් ජයගත් අතර එජාපයට හිමි වූයේ ආසන 8 කි. චෙල්වනායගම් ගේ ෆෙඩරල් පක්ෂය උතුරු නැගෙනහිර බලය තහවුරු කර ගති. බලයට පත් වීමත් සමග ලංකාවේ ප්‍රමුඛ ගුරුපුහුණු විද්‍යාලය සිංහල ගුරුවරුන් සඳහා පමණක් බව ආණ්ඩුව නිවේදනය කළේය. එක්සත් භික්ෂු පෙරමුණ ඉල්ලා සිටියේ රජයේ සේවයේ නියුතු සිංහල නොවන අයවලුන් සඳහා භාෂා ප්‍රවීණතා විභාගයක් පවත්වන ලෙසය.

කැබිනට් මණ්ඩලය දිවුරුම් දීමෙන් අනතුරුව භාෂා පනත ගෙන ඒමට බණ්ඩාරනායක සූදානම් වූ අතර දෙමළ භාෂාවට සමාන තත්ත්වයක් හිමි විය යුතු බව චෙල්වනායගම් ගේ අදහස විය. දෙමළ භාෂාවට යම් සහනයක් ලබා දෙන වගන්ති දෙකක් බණ්ඩාරනායක විසින් ඇතුළත් කළද මෙත්තානන්ද, එෆ්.ආර්. ජයසූරිය, කේ.එම්.පී. රාජරත්න යන පාර්ලිමේන්තු සාමාජිකයින් හා එක්සත් භික්ෂු පෙරමුණ ගෙන ආ විරෝධය නිසා එය ඉවත් කිරීමට බණ්ඩාරනායකට සිදු විය. සිංහල පමණක් රජ කරවන පනත ඉදිරිපත් කෙරිණ.

ඉංග්‍රීසියෙන් කෙටුම්පත් කළ පනත මුල් වරට කියවන දිනයේ 1956 ජුනි 05 දා සත්‍යග්‍රහයක් මගින් විරෝධය පළකිරීමට ෆෙඩරල් පක්ෂය තීරණය කළ අතර සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ පනතට විරෝධය දැක්වුවද එය මහජන විරෝධයක් කරා ගෙන යාමට ක්‍රියා කළේ නැත. එම නිසා ගාලුමුවදොර පිටියේ පැවති සත්‍යග්‍රහය හුදෙක් දෙමළ ජනයාගේ පමණක් විය. අවිහිංසාවාදයේ බලය නොදැක සිටි සිංහල පාලකයෝ පොලිසිය හා මැරයන් යොදා බිම වාඩි වී සිටි දෙමළ වැසියන්ට පහර දුනි. 100 ක් පමණ තුවාල ලැබූහ. ගාලුමුවදොර පොලිස් මර්ධනය සංවිධානාත්මක වර්ගවාදී හිංසනයකට පළමු වෙඩි මුරය විය. එදිනම සිංහල මැර කණ්ඩායම් දෙමළ කඩ සාප්පු කොල්ලකෑම හා ගිනිබත් කිරීම ඇරඹීය. ජුනි 06 දා වඩා සංවිධානාත්මක කොල්ලකෑම් හා ගිනිබත් කිරීම් සිදුවූ අතර පුද්ගලයින් 87 ක් තුවාල ලබා ඇති අතර 213 ක් පොලිස් අත්අඩංගුවට ගැනුණි.

ප්‍රචණ්ඩ හිංසනයේ කුණාටුව කොළඹින් පිටතට පැතිර යන්නට විය. එය වැළැක්වීමට අවශ්‍ය කඩිනම් පියවර පාලකයෝ නොගත්තෝය. ළඟ එන කුණාටුව ගැන කිසිත් නොදත් අම්පාර-ගල්ඔය වැසියෝ දෛනික රාජකාරිවල නිරත වූහ.

මඩකලපුවේදී රැස් වූ දෙමළ ජනයා දහස් ගණනක් භාෂා පනතට විරෝධය දැක්වූ අතර පොලිසිය කළ වෙඩි තැබීමෙන් දෙදෙනෙකු ජීවිතක්ෂයට පත් වූහ. ජුනි 11 වන දා ප්‍රචණ්ඩත්වයේ වාසුළිය ගල්ඔය නිම්නය කරා ළඟා විය.

ඉන්දීය ජාතික පශු වෛද්‍යවරයකු වූ පුල්ලිකට්ටිලි චංකා සයිමන් අම්පාර

48 වන පිටුව බලන්න


DG
CATERING SERVICE
ඔබගේ ඕනෑම උත්සව අවශ්‍යතාවකටම
Specials
Lump Rice
&
Biryani
සිංහල අච්චාරු, මාළු ඇඹුල් තියල්,
අඹ මාළු ඇතුළු සිංහල ව්‍යාංජන වර්ග
සියළුම ආකාරයේ ඩෙවල් වර්ග,
ෆ්‍රයිඩ් රයිස් හා නූඩ්ල්ස් වර්ග
Sri Lankan Foods
Hakka Chinese
Fried rice (pork/chicken/beef/veg)
For any Special Parties
416 998 4658
dgcatering@yahoo.com


Jayasinghe
Law Office
Immigration Law
Real Estate Law
Family Law
Wills & Estates Law
Power of Attorney
Notarizations
Jayasinghe R. Arachchige.MCL.
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC
ATTORNEY-AT-LAW, SRI LANKA
Office : 647 341 1540
Cell : 647 995 3996
Fax : 647 490 5132
795 Birchmount Road
Toronto ON, M1K 1R7
jayasinghera@gmail.com
For Sri Lankan Student Visa & PR Applications
Please contact:
19/2 Hekitta Road, Hendala, Wattala,Srilanka.
+94 112933996
chinthajanaki@yahoo.com


The Power Tools To Sell Your Property
Renovation Cost upto $4000.00
Free
Advertising Signage & Photos
Free
Lawyer's Fee
Free
Market Evaluation & Home Inspection
Free
Home Staging
Free
Open Houses Showing
Free
**Some conditions apply. This promotion can be discontinued without prior notice. Not intended to solicit buyers or sellers currently under contract.
Save money when selling your home!
Selling real estate is what I do. I can help you save thousands when listing your property. You will pay less and get a full service listing with no hidden fees. My home marketing strategy will attract the greatest number of potential buyers and help you sell quickly and hassle-free for the best value.
Nishantha
Donsiyambalapitiyage
Real Estate Sales Representative
Mobile: 416 417 0763
Email: nishan.don@gmail.com
Mississauga Office: 350 Burnhamthrope Dr. W. Unit 127
Scarborough Office:2250 Markham Road Unit #3 Scarbotough ON M1B2W4
Century 21
INNOVATIVE REALTY INC



# සාහිත්‍යයේ රසගුලාවක් වූ ගම්බද ජන දිවිය

■ ඇස්. බී. කරල්ලියද්ද

තොටිල්ලේ සිටම රසාස්වාදයට ඇබ්බැහි වූ මිනිසා මුළු ජීවිතය පුරාම රස වින්දනයට හුරු විය. සමාජ හා සාරධර්ම විරෝධී ජීවන රටාවන් බැහැර කළේය. තම දෙමාපිය ගුරුවරු වැඩිහිටියන්ට ගරු කිරීම පුද සත්කාර කිරීම අපට පුරුදු කළේ අපේ සංස්කෘතියයි.

රසාස්වාදය, වින්දනය සිංහලයාට උරුම වන්නේ ගැබ් ගත් දා සිටය. දරුවකු පිළිසිඳ ගැනීම යනු සිංහල දෙමාපියන් පමණක් නොව එම පවුලේ සියලුදෙනාම එකසේ සතුටු වන විශේෂතම සිද්ධියකි. ගැබ්බර මවට සැලකීම, ගරු කිරීම මෙන්ම පවුලේ එකතුවකදී එවැනි කාන්තාවකට හිමි වන ගෞරවනීය තත්ත්වය අපේ සිංහල සමාජයේ ආදියෙහිම සිට පැවත එන උසස් ගුණාංගයක් මෙන්ම සංස්කෘතික සම්ප්‍රදායද වන්නේය. මවු කුසෙහි දරුවකු පිළිසිඳ ගත් කලල අවස්ථාවේ පටන්ම සිංහල සංස්කෘතිය අනුව සැලකිය යුතු වත් පිළිවෙත්ද එදා අපේ ගැමි සමාජයේ සම්ප්‍රදායානුකූලව පැවත ඇත. ඒවා ආරම්භ වන්නේද තම තමන් අදහන ආගම ධර්මය අනුවය. එදා ගැබිණි මවුවරු නිදාගැනීමට පෙර රතන සූත්‍රය, මංගල සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය වැනි පිරිත් දේශනා සජ්ජායනා කිරීම පුරුද්දක් මෙන්ම සිරිතද විය. කුස තුළ වැඩෙන දරුවා එයින් යම් කිසි වින්දනයක් ලබනවා පමණක් නොව, ධර්මයේ ආශිර්වාදයද උරුම කර ගනී. සමහර මවුවරු වෙස්සන්තර ජාතකය, යසෝදරාවත වැනි කවි පොත් ගැබිණි අවස්ථාවේදී පරිශීලනය කරයි. එදා කාව්‍යසේකරයෙහි මෙම සිරිත් දැක්වූයේ මෙලෙසිනි.

සතුටුව එබමණුවර
තම පහුණු වේසත තුර
කී විදි අඩු නොකර

යනුවෙන් සමාජයේ එදා පැවති ගැබ් පෙළහර චාරිත්‍ර විධි දැක්වීය. මේ ආභාසය අපට දායාද කළේ අපේ සංස්කෘතික උරුමයන්ය. මෙලෙස නිසි ගැබ් පෙළහර චාරිත්‍ර විධි පවත්වා ලැබගත් දරුවා කෙබඳු වීද?

පින්වත් කුමර ඇඟ
පැහැයෙන් පතල මනරඟ
ගබගේ යහන්ළඟ
පහන් සිත්වම වීය ඇඳිරඟ

අදත් මේ චාරිත්‍රය සිංහල සමාජයේ පවතින අතර දකුණු පළාතේ ගැබ් ආරක්ෂාව සඳහා 'රට යකුන්' ශාන්ති කර්මයක් සිදු කරයි. සබරගමුව බස්නාහිර ආදී පළාත්වල 'කලහ ගැනීමේ' සිරිත ගැබ් ආරක්ෂා කිරීමයි. දරුවකු පිළිසිඳගත් පසු මව පමණක් නොව එම ගෙදර පදිංචි සියලු දෙනාගේම ක්‍රියාකාරකම් වැඩීම කෙරෙහි බලපාන බව නවීන ළමා රෝග විශේෂඥයන් විසින් අද සොයාගෙන ඇත. දරුවකු බිහි වූ දා පටන්ම ඔහුගේ කනට ඇසෙන්නේ මවගේ දරු නැලවිලි ගීයයි. දරු නැලවිලි ගී ගයමින් තොටිල්ලක බිළිඳා හොවා නිදි කරවීම ඈත ගම්බද ගෙවල්වල සුලබ දර්ශනයෙකි. දරුවන් සිටින මවුවරුන්ගේ අම්මාවරුන්ටද දෙතනේ කිරි එරීම එකල ගම්බදව සුලබව දක්නට ලැබිණි. එහෙයිනි කිරි අම්මා කීවේ. මවගේ කිරි මවගෙන් බිළිඳා රසවින්දනයට පුරුදු වෙයි. කාර්යබහුල සමාජයේ අද මෙන් දරුවන් නැලවීම සඳහා කැසට් තැටි (සී.ඩී.) ආදිය ප්‍රයෝජනයට ගෙන එදා මවුවරුන් තම තම කාර්යයන්හි යෙදී නැත. මවගේ සමීපතම උණුසුම දරුවාට නොමඳව ලබාදුන්නේය. ක්‍රමයෙන් වැඩෙන බිළිඳා නැලවිලි ගීවලින් වින්දනයක් ලැබීමට හුරුවෙයි. මෙයයි රස වින්දනයේ රසාස්වාදයේ ආරම්භය ඉන්පසුව ගැමි දිවියෙහි සෑම අවස්ථාවක් සමගම ඒ මිහිර විඳ ගනී. කොටින්ම ගැමියාගේ මුළු දිවිය රස ගුලාවක් බවට පත්වේ. ඉන් පෝෂණය වූ මිනිසා කෙරෙන් විනාශකාරී අදහස් හා ආකල්ප නිරායාසයෙන්ම බැහැර වී යයි.

එකල ලබාදුන් අධ්‍යාපනයද මිනිස් සිත රසාස්වාදය කරා යොමු කළේය. අවසාන ප්‍රතිඵලය වූයේ අහිංසාවාදී සරල ජීවන රටාවකට මිනිසා හුරුපුරුදු වීමය. තමා ජීවත්වන ගමේ සමාජයේ ප්‍රශ්න හා ගැටුම් අවම කරගැනීමට ගැමියා සමත් විය. සාමය සහජීවනය අන්‍යෝන්‍ය අදහස් ගරු කිරීම වැනි උතුම් මිනිස් ගුණාංගවලට මිනිසා යොමු වුණේ මෙවන් පසුබිමක් එදා ගැමි ගෙදර, ගම, පන්සල, පාසල කේන්ද්‍ර කොටගෙන පැවති නිසාය. බාහිරව පුණ්‍ය ග්‍රාම සංකල්ප ආදේශ කිරීමට අනවශ්‍ය වූයේ එදා බොහෝමයක් ගම් පිනට තෝතැන්නක් බඳු වූ නිසාය.

## ගැමි රස වින්දනය

තොටිල්ලේ සිටම රසාස්වාදයට ඇබ්බැහි වූ මිනිසා මුළු ජීවිතය පුරාම රස වින්දනයට හුරු විය. සමාජ හා සාරධර්ම විරෝධී ජීවන රටාවන් බැහැර කළේය. තම දෙමාපිය ගුරුවරු වැඩිහිටියන්ට ගරු කිරීම පුද සත්කාර කිරීම අපට පුරුදු කළේ අපේ සංස්කෘතියයි. අම්මා තරම් උතුම් වස්තුවක් අපට නැති බව මේ ගැමි කවියෙන් කියයි.

වැල්ලේ පිපෙන බිම්මල     වාසනාවන්
ගොල්ලේ පිපෙන පන් මල     වාසනාවන්
පෝයදාට පූන් සඳ     වාසනාවන්
ජාතිත් අපේ අම්මා     වාසනාවන්

අම්මා කෙනකුට සමච්චලයක් කිරීම අයියා පිළිකුලෙන් බැහැර කළේ මෙසේය.

මල්ලියෙ ඔහොම නොකරන් අපෙ     අම්මාට
උඹෙන් මගෙන් දෙන දේ නැත     උන්දාට
වෙන දේ නැතත් දෙතනේ කිරි     පෙව්වාට
බුදුන් වඳින ලෙස වැඳපන්     අම්මාට

මේ සරල අර්ථාන්විත ගැමි කවි දනවන්නා වූ හැඟීම් ඇති කරවීමට නූතන ටෙලිනාට්‍යයක් හෝ චිත්‍රපටයක් සමත් වේද? එදා මිනිසා තම ප්‍රශ්න දෙස බැලුවේද යම් ආදර්ශයක්ද එමගින්ම සමාජයටත්, ලබාදෙමිනි. අම්මා නැති වූ විට කුඩම්මා දරුවන්ට සලකන්නේ නැති බවට අයියා මලෝ දෙදෙනකු මොන තරම් දාර්ශනික හා අහිංසක මතයක් ඉදිරිපත් කළේද යන්න මෙම ගැමි කවිය පැහැදිලි කරයි.

මල්ලියි මමයි අමුකිරිගල්     ගියෙව්වා
අමු කොටලා බත් දුන්නයි     කුඩම්මා
මොණරු මාළු උඩුපල්ලේ     තියෙව්වා
අපට මාළු අලකොළමයි     කුඩම්මා

කුඩම්මා දුන්නේ අමුවලින් කෙටූ බත්ය. මාළුවට අලකොළය. අයියා කියන්නේ අපට නම් සැමදාම අලකොළ කා පුරුදු බවය. එහෙත් මොණර මස් මාළුවද ඇත. අද නම් මෙවැනි අසමානකම් ඉදිරිපත් කරන්නේ ද්වේශ චේතනාවක්ද සමඟය. 'කොළඹට කිරි අපට කැකිරි' මෙවැනි අසමානකම් සඳහා අද යොදාගන්නා වහරයි. ගැමියා සිය දෛනික ජීවිතයේ සෑම කාර්යයෙහිදීම ජන ගීතය යොදාගත්තේ වෙහෙස මහන්සිය මෙන්ම කාන්සියද දුරුකරවා ගැනීමටය. එබැවින් සිංහලේ අපට පැල්කවි, කරත්ත කවි, නෙළුම් කවි, පාරු කවි ආදිය නොයෙක් අංශවල ජන ගී උරුම වූයේ ලේඛන කලාව බිහිවීමට පෙර සිටම අපේ ගැමියා මෙම කවි ගී ආදිය ගායනා කළේ මතකයෙනි. පැල් රකින ගොවියා තම ගොවිතැන වන සතුන්ගෙන් බේරාගැනීම පිණිස රාත්‍රි කාලයේ ශබ්ද නඟා කට පාඩමින් කී කවි අපේ ජනවහරට එක් විය. බොහෝ විට ගසක් උඩ ඉදිකරන ලද මැස්සක රාත්‍රිය ගත කරමින් මේ කවි ගායනා කරන විට හේනේ පසෙක වන සතුන් පලවා හැරීමට දල්වන ගිනි ගොඩක්ද විය. අද මෙන් ත්‍රී ඉන් වන් ගුවන් විදුලිය වැනි විද්‍යුත් මාධ්‍ය උපකරණ එදා භාවිතයේ නොතිබුණ නිසා එම අඩුව පිරිමැසුණේ අපේ ජන ගී ගායනයෙනි. එදා කුඹුරු යායේ නෙළුම ඇරඹුණේ හූවකිනි. හූ හඬ ගොයමට බැසීමට සංඥාවයි. එසේ එක්වූයේ මුදලට නොව අත්තමටය. අත්තම ගැමියන් එකට බැඳ තැබූ රන් හුයක් මෙනි. සමහර පළාත්වල එය හඳුන්වන්නේ 'කයිය' යනුවෙනි. යායක විසි පහක් පමණ එකට එක් වී නෙළුම් කවි ගායනා කරමින් පතුරුවන ගී නාදයෙහි දෝංකාරය අදත් අපේ දෙසවන් පිනවයි. එම චමත්කාරය මැවීමට ටෙලිනාට්‍ය හෝ වේදිකා නාට්‍ය ගණනාවකට බැරිය. ගී හඬෙහි ශ්‍රවණ මාධූර්යය එහි දනවන අර්ථය ගායනා ශෛලිය මුළු ගමම රස ගුලාවකට පත් කරයි.

'ඕසේ' ඇද ගායනා කළ එම නෙළුම් කවි හා ගායනා ශෛලිය මතු පරපුරෙහි දැනගැනීම සඳහා අප රැක තබාගත යුතුය. මෙම ගී හඬ කුඹුරුවල අස්වැන්න වැඩි කරවා දීමටද හේතු වූවා නිසැකය.

අද නූතන විද්‍යාවේදීද පෙන්වා දී ඇත්තේ මිනිස් කටහඬ ඇසෙන ප්‍රමාණයේ පිහිටි ගස් ආදී වෘක්ෂලතාවල එලදාව එසේ කිසිදු මිනිස් කටහඬක් නොඇසෙන ස්ථානවල පිහිටි ගස්වල එලදාවට වඩා වැඩි බවය. මේ නෙළුම් කවිය දෙස බලන්න.

ඔක්කොම සමනල පර්වත     මුදුනේ
අප්‍රකාශ ගඟ පථය     පොදේ
දුම්බර පන්තිය     පඩරාගම්මන
හඳගනාව බින්තැන්න     වැදේ

අන්ත්‍ර වෙනසේ රටවට කර     ගොස්
සෙංකඩගල මහනුවර     වැදේ
විස්තර මහවැලි මහ ගඟ     සරණයි
යාපා පටුන මඩකලපු     වැදේ

දුම්බර කෙතේ වැට බැඳලා රැකුම්     බැලුම්
මහවැලි ගඟේ දිය බැඳලා නෙතට     ඇලුම්
දුම්බර ලියෝ කර උස්සා කරන     බැලුම්
තුන්පත් රටාවකි දුම්බර කෙතේ     නෙළුම්

ජන ජීවිතයේ සෑම අංශයකටම කවිය, ගීතය සැහැල්ල වාරම බද්ද වී තිබිණි. එයින් මතු වූ රසාලිප්ජනයෙන් අහිංසක අව්‍යාජ වින්දනයක් අපේ වැඩිහිටියන් ලබාගෙන ඇත. එය කෙනෙකුට සිත් වේදනාවක් හෝ අනියත බියක් ගෙන දීමට නොව සියලුදෙනම එකාවන්ව එහි රස මිහිර උකහා ගැනීමටය. අර්ථය සඟවා තේරවිලි කවි ගැයීමටද ගැමියා සමත් විය. මේ එවැනි කවියකි.

අත්තේ පනත්තේ කොහොඹේ ලියන්     ඇති
ඒකිගේ බඩේ දරු තුන්සිය හැටක්     ඇති
උන්ගෙන් එකෙක් ගුරු දෙවියන්ට     ජාතකී
මේ තුන් පදේ තේරුවොත් නුවණ     ඇතී

එදා ජන කවිය මෙතරම් ජීවිතයට බද්ධ වී ඇත්තේ එවකට පැවැති සමාජයේ ජන කවියට හා කවියන්ට රාජ අනුග්‍රහය ලැබුණ නිසාය. අපේ සමහර පුරාණ රජවරුන්ද කවියෝ වූහ. සමහර රජවරුන් කාව්‍යකරණයේ මෙන්ම ග්‍රන්ථකරණයේ යෙදී සාහිත්‍යයට අපරිමිත සේවාවක් ඉටු කළහ. කුමාරබාහු, පණ්ඩිත වික්‍රමබාහු, දෙවන බුවනෙකබාහු, තෙවන පණ්ඩිත වික්‍රමබාහු, පස්වන බුවනෙකබාහු, දෙවන රාජසිංහයන්ද සාහිත්‍ය සේවාවන්ට විශාල දායකත්වයක් දුන් රජවරුන්ය. රජුගේ රාජ සභාවෙහිම උෟවේ කුඩා මොහොට්ටාල, බින්තැන්නේ සාමි, ඒකනායකරාල, වේමැල්දෙනියේ මොහොට්ටාල, දුනුවිල ගජනායක නිලමේ, අත්තරගම රාජගුරු වැනි ප්‍රසිද්ධ පඬිවරුන් මෙන්ම කවීන්ද්‍ර සේවය කර ඇත. රතිරත්නාලංකාරය, මහා පතරංග ජාතකය, එකල ලියවුණු පොත් දෙකකි. පසුකල රජ පැමිණි වඩුග රජවරුන් අතරින් ශ්‍රී විජයරාජසිංහ සමයෙහිද ගීත සාහිත්‍යයක් අපට උරුම වී ඇත. ඔහුගේ අනුප්‍රාප්තිකයා වූ රාජාධි රාජසිංහ තමන් විසින්ම ලියූ ග්‍රන්ථයකි 'අසදෘෂ කාව්‍යය' රජතුමා උපන් හපන් කවියෙක් විය. කාව්‍යකරණයේ හා සාහිත්‍ය සේවාවල යෙදෙන අයවලුන්ට ගම්බිම් හා තාන්න මාන්න පුද කිරීම එකල සිරිත විය. එයින් පෙනී යන්නේ අපේ පැරණි රජවරුන් මෙම සේවාවන්වලට දැක්වූ ගෞරවය හා අනුග්‍රහයයි. ජන ජීවිතයේ සෑම අංශයකදීම රසවින්දනයක් ලබාදීම එදා සිරිත විය. එම නිසා අපේ සාහිත්‍යයට නොයෙක් අංශවලදී ගායනා කරන ලද කවි හා ගීත එක්විය. හෙනේ, පැලේ, ඔරුතොටේ කුඹුරේ, කුරහන් යායේ ආදී වශයෙන් නොයෙක් ස්ථානවලදී ගැයීමට ඒ ඒ අවස්ථාවන්ට උචිත විශේෂිත කවි සැහැලි යාදිනි ටීකා සීපද වන්නම් සුරල් ආදිය අපේ සිංහල සංස්කෘතියේ අංග බවට පත්විය.

තරුණයෙක් ගැමි ලියකගෙන් රෑට ගෙදරක නවාතැන් ඉල්ලන්නේ එදා අද මෙන් ප්‍රවාහන හා මාර්ග පහසුකම් නොතිබූ බැවින් පයින්ම ගමන්

**48 වන පිටුව බලන්න**

# සිංහල සිනමා සුරංගනා කතාවේ කුමාරයා විජය

**ඔක්තෝබර් 09 වන දිනට යෙදෙන විජය කුමාරතුංගයන්ගේ 73 වෙනි ජන්ම දිනය සිහිපත් කරමින් පළ වන්නකි.**









■ රේවත එස්. සිල්වා

සාමාන්‍ය භාෂාවෙන් කියන්නේ නම්, 'කඩවසම්' සහ 'හිත හොඳ' පිරිමියකුට ශ්‍රී ලංකාවේ දී යා හැකි උච්ඡතම ස්ථානයට ළඟා වුණේ විජය කුමාරතුංගයි. ඔහුගේ ආදරණීය මුහුණ සහ සුකුමාර රංගනය විජයව මෙරට ජනප්‍රිය සිනමාවේ 'සිහින කුමරා' බවට පත් කළේය. ඔහුගේ 'හොඳ හිත' තුළින් මතු වූ මානව දයාව විජය මෙරටේ බලගතුම දේශපාලන අසුන අසලටම රැගෙන ගියේය.

කෙසේ නමුත් මින් වසර 21 කට එපිට 1988 පෙබරවාරි 16 දින මහ දවල් සිය පොල්හේන්ගොඩ නිවස ඉදිරිපිටදී ස්වයංක්‍රීය රයිෆලයකින් එක දිගට මුහුණට වෙඩි තබා මරා දමන විට 42 වැනි වියේ පසු වූ විජය කුමාරතුංග මෙරට සමාජ කතිකාවේ එකිනෙකට වෙනස් ලෝක කිහිපයක් යා කළ ශක්තිමත් 'පාලමක්' වී සිටියේය. ජනප්‍රිය සිනමාවත්, සම්භාව්‍ය සිනමාවත්, ශ්‍රී ලංකාවේ උතුරත් දකුණත් ආදිය අතර පාලමක් බඳු වූ විජය තිරයේ සුකුමාර ප්‍රේමවන්තයාත් දේශපාලන වේදිකාවේ ප්‍රබලතම වාමවාදී කථිකයාත් අතර වූ පරස්පරයන් දියත්කර හැරියේය. ඒ මතු නොව 20 වන සියවසේ ලාංකීය ජන සමාජයේ සුරංග නා කතාවක් බඳු වූ සිය ජීවිතය තුළ විජය සීදුව ප්‍රදේශයේ සාමාන්‍ය වූ කතෝලික පවුලක් හා අති ප්‍රබල හොරගොල්ල වළව්ව අතර බේදයද බොඳ කොට දැමීය.

තමාට හයමසක් වන විට මියගිය බෙන්ජමින් කුමාරතුංග නම් සිය පියා හා මව වූ ක්ලේරා බියට්‍රිස්ට දාව 1945 ඔක්තෝබර් නව වන දා උපන් විජය තම වයස අවුරුදු 32 වන විට ලංකාවේ අග්‍රාමාත්‍යවරු දෙදෙනකුගේ දියණියක් සරණ පාවා ගෙන සිටියේය. ලංකා සමසමාජ පක්ෂයේ යෞවන අංශයෙන් ඇරැඹි සිය දේශපාලන ගමන නිමවන විට ඔහු මෙරට කැබැලි වී තිබුණු 'වම' එකතු කිරීමට සිටි එකම දේශපාලන ප්‍රතිරූපය වී සිටියේය.

මෙරට වාම දේශපාලනයේ පුරෝගාමීන් වූ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, පීටර් කේනමන් හා බර්නාඩ් සොයිසා පවා නැඟී සිටි වේදිකාවක 'එක්සත් සමාජවාදී පෙරමුණේ' එකම ජනාධිපති අපේක්ෂකයා ලෙස නිතරග යෙන් තේරී පත් වූ විජය, ඊට මාස කීපයකට පසුව එළැඹෙමින් තිබූ 1988 ජනාධිපතිවරණයේ එ. ජා. ප. අපේක්ෂක රණසිංහ ප්‍රේමදාසගේ අංක එකේ එදිරිවාදියා බවට පත් වී සිටියා යැයි කීම අතිශයෝක්තියක් නොවේ. එමෙන්ම, මේ සියලු කලබගෑනියන් මධ්‍යයේ ඔහු සබීතා පෙරේරා සමග ප්‍රේමාලිංගනයේ යෙදෙන දසුන් රැගත් සුනිල් සෝම පීරිස්ගේ 'මමයි රජා' (1988) වාණිජ චිත්‍රපටය සිනමාහල්වල තිරගත වෙමින් තිබිණි.

නමුත් මෙහිදී වඩා වැදගත් වන්නේ වෙනත් කාරණයකි. සිය මරණයට පෙර 'ක්‍රිස්තු චරිතයට' තිරයේදී පණ පෙවූ විජය ඔහුගේ නික්ම යෑමෙන් ඉක්බිතිව මෙරට පුරාවෘත්තයක් ලෙස නැඟී සිටියේය. සමහරුන් ඔහු වෙනුවෙන් සිය නිවෙස්වල පහන් දැල්වීමට පටන් ගත්තේය. 1995 නිකුත් වූ විජය ඝාතනය පිළිබඳ කොමිසන් වාර්තාවට අනුව එකල නමගිය පාතාලයේ මිනී මරන්නන් පවා 'විජය කොන්ත්‍රාත්තුව' ප්‍රතික්ෂේප කර තිබිණි. ඔහු 'රත්තරන් හදවතක්' ඇත්තකු යැයි පොදු ජනයා විසින් පිළිගනු ලැබූ නිසාවෙනි. එම වාර්තාව තවදුරටත් සඳහන් කළේ විජයගේ ඝාතකයා යැයි හඳුනාගත් ලයනල් රණසිංහ පවා විජයගේ උග්‍ර සිනමා රසිකයෙක් වීමට හොඳටම ඉඩකඩ තිබූ බවයි. අමරසිරි ජයසිංහ නම් විජය අනුගාමිකයෙක් ඔහුගේ අවමඟුලදා සිරුරට ගිනිතබාගෙන සියදිවි නසා ගත්තේ යැයි කියැවේ. එදා ආචාර්ය සරත් අමුණුගම ප්‍රකාශ කළේ විජය ඝාතනය 'සමනළයකුට වෙඩි තැබීමක්' බවයි. ප්‍රවීන සිනමා විචාරක නැසීගිය සිරිල් බී. පෙරේරාට අනුව විජය රඟ පෑ අති බහුතරයක් වූ පීඩිත පංතියෙ මිනිසුන් පිළිබඳ වාණිජ චිත්‍රපටවල චරිත, විජය කුමාරතුංග කරා ඇදී ආ ආනුභාවයට (කැරිස්මාවට) මූලබීජ සැපයීය. ඔහු එකවිටම ජනප්‍රියත්වයේ කූටප්‍රාප්තියද, මානව හිතවාදයේ ප්‍රතිමූර්තියද ශ්‍රී ලාංකීය සමාජයේ ප්‍රතිනිර්මාණය කළේය. 'විජේ අය්යා' රිදී තිරය මත ගාමිණීව, ජෝතිව, ටෝනිව, රවීන්ද්‍රව ආක්‍රමණය කරන විටම 'විජය සහෝදරයා' ගාන්ධිවාදී වේෂයකින් මෙරට දේශපාලන වේදිකාවේ වමේ හා දකුණේ සියලු චරිත 'දිය කරමින්' සිටියේය. ඔහු 'රැල්ලෙන් රැල්ලට' ගීතය ගායනා කළේය. විප්ලවීය ජවයකින් 'දඟගෙයි දඬුවම්' ද ගැයීය. සිරිල් බී. පෙරේරාට අනුව 'යුගයේ අරුම නළුවා' විජය වීය. 'ලස්සන', 'හිත හොඳ' විජය ඉතා කෙටි කලකින් අරුම පුදුම ගමනක් ගොස් තිබිණි.

## සිනමාව

සිය පියාගේ මරණින් පසු විවියන් හා රූපා යන අක්කලා දෙදෙනාත් සිඩ්නි (ජීවන් කුමාරතුංගගේ පියා) නම් අයියාත් සෙවනේ ඇති දැඩි වූ විජය, සිය අධ්‍යාපනය සඳහා මුලින් සීදුව මහා විද්‍යාලයටත් පසුව කොටහේන ශාන්ත බෙනඩික්ට් විදුහලටත් කඳාන ද මැසනඩ් විදුහලටත් ඇතුළත් විය.

හැටේ දශකය අග කලා කටයුතු සඳහා කොළඹට පැමිණෙන ඔහු ප්‍රේමසිරි කේමදාසගේ 'බැරි සිල්' ගීත නාටකයේ රඟපානවා. පසුව මුල් කාලීනව ලුවී වැන්ඩර්ස්ට්‍රාටන්ගේ 'බිඳුනු හදවත්' (1971) චිත්‍රපටයේ රඟපෑවද මුලින්ම තිරගත වන්නේ විජය විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු ලෙස ටෝනි, ස්වර්ණා මල්ලවාරච්චි ආදීන් සමග රඟ පෑ සුගතපාල සෙනරත් යාපාගේ 'හන්තානේ කතාව' (1969). ඉන් පසුව හැත්තෑව දශකයේ 'මේ දෑස කුමටද' (1972) 'තුෂාරා' (1973), 'දුලීකා' (1974) හා 'සංගීතා' (1975) ආදී චිත්‍රපට මුල්කරගෙන ජනප්‍රිය සිනමාවේ අභිනව ප්‍රවණතාවක් ආරම්භ කරනවා. සිය ආකර්ෂණීය සිනාවත්, බැල්මත්, සියුම් සුකුමාර ශරීර ඉරියව් ආදියත් සමගින් (බොහෝ විට මාලනී ෆොන්සේකා සමග) තිරයේ ලජ්ජාශීලී ප්‍රේමවන්තයා බවට පත් වන විජය, ජනප්‍රිය සිනමාවට සාපේක්ෂව එහි ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය ලෙස වටහා ගන්නා සම්භාව්‍ය සිනමාවේද ප්‍රධාන නළුවකු බවට පත්වෙනවා. 'අහස්ගව්ව' (1974), 'බඹරු ඇවිත්' (1978), 'අහසින් පොළොවට' (1978), 'පොන්මනී' (ද්‍රවිඩ භාෂීය), 'මහ ගෙදර' (1982), 'ගෝඩ් කිංග' (1976) (ඉංග්‍රීසි භාෂීය), 'බැද්දේගම' (1981), 'ගඟ අන්දර' (1980) හා 'පාර දිගේ' (1980) ආදී චිත්‍රපටවල රඟපෑමේදී ඔහුව මෙහෙය වන්නේ ධර්මසේන පතිරාජ, ලෙස්ටර් ජේම්ස් පීරිස්, තිස්ස අබේසේකර, සුමිත්‍රා පීරිස් වැනි අධ්‍යක්ෂවරුන් හා වරියන්ය. මීට සමගාමීව විජය - මාලනී ජනප්‍රිය සිනමා යුගයක් වෙනත් අන්තයකින් ගලායන අතර ඒ හරහා විජය 1983 සිට ඔහුගේ මරණය දක්වා (1988) වසර හයක් ලේක්හවුසියෙන් ප්‍රදානය කරනු ලබන 'සරසවිය' ජනප්‍රියම නළුවා සම්මානය හිමිකර ගන්නවා. වසන්ත ඔබේසේකරගේ 'කැඩපතක ඡායා' (1989) චිත්‍රපටයේ රඟපෑම උදෙසා සිය ප්‍රථම හොඳම නළුවා සම්මානය ලබන විට විජය මියගොස් අවසානයි.

## දේශපාලන ජීවිතය

ජාතික ඇඳුමකින් හා සිය බොකටු කොණ්ඩයෙන් සැරසී විජය, චන්ද්‍රිකා කුමාරතුංග හා අතිනත ගන්නේ කොළඹ රොස්මීඩ් පෙදෙසේ බණ්ඩාරනායක නිවසේදී. ඒ 1978 පෙබරවාරි 20 වන දිනය. නව යුවල මධුසමය ගත කරන්නේ ලන්ඩන් නුවර.

විජය 1977 දී කටාන ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂකයා බවට පත්වෙනවා. නමුත් ඔහු එම පක්ෂයේ වඩා ස්ථාවරත්වයට පත් වන්නේ 1982 ජනාධිපතිවරණයේදී ජේ. ආර්. ජයවර්ධන (එජාපයෙන්) හා රෝහණ විජේවීර (ජවිපෙන්) ට එරෙහිව නිදහස් පක්ෂ අපේක්ෂක හෙක්ටර් කොබ්බෑකඩුව සමග මෙහෙයවන මැතිවරණ ව්‍යාපාරය නිසයි. පදනම් විරහිත 'නැක්සලයිට්' චෝදනා හේතු කොටගෙන විජයව මේ කාලයේදීම බන්ධනාගාරගත කරනවා. ඒ වන විට ඔහු යසෝදරා දුවගේත් විමුක්ති පුතාගේත් පියා. 1983 මහර අතුරු මැතිවරණයෙන් විජය ඡන්ද 46 කින් පරාජය වුණත් එය එකල එජාප ඡන්ද දූෂණවල ප්‍රතිඵලයක් ලෙසයි බොහෝ විට සැලකෙන්නේ.

1984 ජනවාරි 22 දා කොළඹ නව නගර ශාලාවේදී විජය මූලිකත්වයෙන් පිහිටවනු ලබන 'ශ්‍රී ලංකා මහජන පක්ෂය' එකල පැවැති පාලන තන්ත්‍රය තැති ගන්වන සුළුයි. ටී. බී. ඉලංගරත්න, පී. ඩබ්. කුලරත්න, ෆීලික්ස් පෙරේරා, ඔසී අබේගුණසේකර, පොහද්දරමුල්ලේ පේමාලෝක ස්ථවිර, මාදම්පාගම අස්සජි ස්ථවිර හා අහමඩ් ඉසෙත් ආදී ඉදිරි පෙළ නායකයන් සමග එම වසරේ පවත්වන පක්ෂයේ දැවැන්ත ප්‍රථම මැයි දින රැළිය මගින් පෙන්නුම් කළේ එම මහජන පක්ෂය වැඩිකල් නොගොස් මෙරට ප්‍රධාන විපක්ෂය ලෙස නැඟී සිටින ලකුණුයි. 1988 දෙවන ජනාධිපතිවරණය ළං වන විට විජය, එජාප අපේක්ෂක ප්‍රේමදාස මහතාගේ ප්‍රබලම ප්‍රතිවාදියා වී අවසන්. ඒ විතරක් නොවෙයි, ජවිපෙ දෙවන නැඟී සිටීම උත්සන්න වී තිබූ මෙකල විජය තමාගේ දේශපාලන ස්ථාවරයන් හේතුවෙන් විශේෂයෙන්ම ජන වාර්ගික අර්බුදය පිළිබඳව ජවිපෙ ඇතුළු බොහෝ දෙනකුගේ ගෙරවුම්වලට ලක්වී සිටියා. එම නිසාදෝ ඉහත කී කොමිෂන් වාර්තාව විජය ඝාතනයන් යම් යම් ආකාරවලින් මෙම ප්‍රධාන පක්ෂ දෙකටම (එනම් එජාප හා ජවිපෙ) සම්බන්ධ වී සිටි බව හඟවනවා.

එමෙන්ම මහ දවල් වෙඩි උණ්ඩ වරුසාවක් මැද අවසන් ගමන් ගිය විජය වරක් මෙසේ පවසා තිබුණා.

"මම මැරෙන්න බය නෑ. නමුත් මම බය වෙන්නෙ මගේ පුතාට එයාගේ යාළුවන්ට කියන්න සිද්ධ වුණොත්, මගේ තාත්තා මැරුණෙ චිත්‍රපටයක් රූපගත කරද්දී මල්වත්තක ගහක් වටේ නිළියක් එක්ක නටමින් ඉන්දැද්දී හෘදයාබාධයක් හැදිල කියලා. මම ඒ වගේ මැරෙන්න නම් බයයි. මම මැරෙන්න කැමතිම විදිහ තමයි ජනතා

48 වන පිටුව බලන්න

# ආහාර ගැනීමේ අක්‍රමතා දුක්විඳ කෙට්ටු වෙමු

■ රසිකා දිල්රුක්ෂි මහතන්ත්‍රි

එක් කාලසීමාවකදී ඉහළ වටිනාකමකින් යුතුව අගය කළ යමක් කාලයක් ඇවෑමෙන් පසුව වටිනාකම හීනවී යාම සාමාන්‍ය ලෝක ධර්මතාවයයි. එනම් කාලයෙන් කාලයට යම් යම් දේ පිළිබඳව ඇති අගයයන්, පිළිගැනීම් වෙනස්වන නිසාය. ශරීර ප්‍රතිරූපය ශරීර හැඩය පිළිබඳව ඇති අදහස්ද මෙබඳුමය. උක්ත සංසිද්ධියට අනුව මිනිස් ශරීරය පිළිබඳව සමාජය තුළ ඇති ආකල්ප වෙනස්වීමකට ලක්වනු ලබයි. වසර ගණනාවකට පෙර ශරීර හැඩය පිළිබඳව සමාජය තුළ මුල් බැස තිබූ මතය වූයේ සුන්දර රූපශ්‍රීයකින් යුතු අයෙකු වීමට නම් වටකුරු, පිරුනු සිරුරකට හිමිකම් කිවයුතුය යන්නයි. නමුත් කාලයාගේ ඇවෑමෙන් මෙම මතය වෙනස් වෙමින් උස, සිහින් සිරුර පරමාදර්ශී ශරීර ප්‍රතිරූපය බවට පත්විය. විශේෂත්වය නම් එය වයස මත විශාල බලපෑමක් කරනු ලබන නිසාය. එනම් බිළිඳකු නම් පෘෂ්ටිමත්, පිරුනු දරුවකු විය යුතු බව සමාජයේ බහුතර මතයයි. එවන් බිළිඳකු දුටුවිට

"අනේ ලස්සන බබෙක් බෝලයක් වගේ" වැනි වදන් මුවගට ගලා එනුයේ නිසඟයෙන්මය. එසේම තුරුණු වියේ පසුවන්නකු නම් ඔහු-ඇය සිහින් සිරුරකට හිමිකම් කිවයුතු බව අපරදිග පමණක් නොව ශ්‍රී ලංකාව ඇතුළුව පෙරදිග රටවලද වත්මන් ආකල්පයයි.

අප රට පිළිබඳව කතා කිරීමේදී වැඩි වශයෙන්ම තරුණ පිරිස තුළ 'සිහින් සිරුර' පිළිබඳව ධනාත්මක ආකල්පයක් ඇති බව පෙනේ. ඉහළ හා මධ්‍යම පාන්තික තරුණ ළමුන් තුළ පමණක් නොව මැදිවියේ පසුවන ඇතැම් පිරිස් (විශේෂයෙන්ම කාන්තාවන්) අතරද මෙම අදහස පවතී. තරුණ පිරිස සැලකීමේදී වැඩි වශයෙන්ම නව යොවුන් වියේ පසුවන පාසල්, උසස් අධ්‍යාපනික ආයතනවලට අයත් හා අයත් නොවන බොහෝ පිරිසක් මෙම මතයේ එල්බ සිටී. එසේම එය මතයක් ලෙස පමණක් නොව ශරීර බර, හැඩය පාලනය කර ගැනීමේ අරමුණින් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීමක්ද දක්නට ලැබේ. එසේ සිහින් සිරුරක් හිමි කර ගැනීමේ ඇති වරද කුමක්ද යන්න ඔබට සිතෙනු ඇත. එය වරදක් නොවේ. එනම් අධික මේද සංචිතයක් ශරීරය තුළ තැන්පත්ව විවිධ කායික රෝගබාධයන්ට ගොදුරු වනවාට වඩා සිහින් සිරුරකට හිමිකම් කීම වඩා අගනේය. නමුත් මෙසේ උරුම කරගන්නා සිහින් සිරුර රෝගී තත්ත්වයක් නම්, එය ඔබගේ ජීවිතයට තර්ජනයක් නම් ඇති වන ප්‍රතිඵලය කුමක්ද?

මිනිස් ජීවිතයට තර්ජනාත්මකව බලපෑම් කරනු ලබන එවන් තත්ත්වයන් ප්‍රධාන වශයෙන් දෙකකි. ඒවා ආහාර ගැනීමේ අක්‍රමතා ලෙස හඳුන්වනු ලබයි. මෙම තත්ත්වයන් ස්ත්‍රී පුරුෂ යන දෙපිරිස තුළම ඇති විය හැකි අතර එහිදී තරුණ කාන්තාවන් තුළ වැඩි ප්‍රවණතාවක් ඇත. අයෝවා විශ්වවිද්‍යාලයේ මනෝ වෛද්‍ය මහාචාර්ය A. E. Anderson දක්වන පරිදි ආහාර ගැනීමේ අක්‍රමතාවයෙන් යුතු පුද්ගලයන් සැලකීමේදී පුරුෂයන්ගෙන් 10% ක් පමණ ආහාර ගැනීමේ අක්‍රමතාවලින් යුතුවේ.

මෙසේ නව යොවුන් හා තරුණ පිරිස් අතර සුලභ ආහාර ගැනීමේ අක්‍රමතා, ඒවායේ ලක්ෂණ, බලපාන හේතු, අහිතකර ප්‍රතිඵල හා කළහැකි ප්‍රතිකාර මොනවාද යන්න විමසා බැලීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතුය.

## Anorxia Nervosa

මෙහිදී සිදුවනුයේ අධික ලෙස තම ශරීරය සිහින් කර ගැනීම සඳහා නිර්දය ලෙස දිගින් දිගටම ආහාර නොගෙන හාමතේ සිටීමයි. 90% - 95% Anorexia Nervosa තත්ත්වයෙන් පෙළෙන්නන් කාන්තාවන්ය. නව යොවුන්වියේ පසුවන්නන් තුළ වැඩි වශයෙන් මෙම තත්ත්වය දක්නට ලැබේ. විශේෂයෙන්ම මුල් හා මැද නව යොවුන් වියේ පසුවන්නන් තුළ වැඩි වශයෙන් දක්නට ලැබේ. මොවුන් මනෝ විද්‍යාත්මක වශයෙන් ගැටලුවලට මුහුණ දී ඇති පිරිසකි. අඩු ආත්ම සම්මානයකින් යුතුය. ආත්ම සම්මානය යනු තමා පිළිබඳව තමන් තුළ ඇති ධනාත්මක හෝ ඍණාත්මක තක්සේරුකරණයයි. චිත්තවේගික පාලනයෙන් අඩු මානසික නොසන්සුන්භාවය, කලකිරීම ආදී ගති ස්වභාවයන්ගෙන් යුතු පිරිසකි. නිරතුරුවම සාධනය කර ගැනීමට අපහසු ඉහළ ප්‍රමිතීන් සිය ජීවිතයට පනවාගෙන ඇති අතර මේවාට ළඟාවීමට අපහසු විට ක්ලමථය හා විශාදයට පත්වෙයි. අන් අය තමාව කෙසේ අවබෝධ කරගනීද සිතන මොවුන් තම බලාපොරොත්තු ඉටුකරගත නොහැකි වූ විට තමාට පාලනය කරගත හැකි යමක් වෙත අවධානය යොමුකරයි. එසේ පාලනය කළ හැකි දෙයක් වනුයේ තම සිරුරයි.

### මොවුන් තුළින් විද්‍යාමාන වන්නා වූ ප්‍රධාන ලක්ෂණ අතර

- වයසට හා උසට සරිලන දේහ බර ලෙස නියමිත බරට වඩා 25% ක් පමණ බර අහිමිකර ගැනීම, බර වැඩිවේ යැයි හා මහත් වේ යැයි අධික බියකින් පසුවීම.
- ශරීර බර අඩු වුවද මෙම බිය තත්ත්වය පහව නොයාම
- ආහාර ගැනීම පිළිබඳ ගෙනයනු ලබන අධික පිළිවෙත.
- අසීරු ව්‍යායාමවල යෙදීම.
- පුරුෂයන් තුළ ලිංගික ප්‍රේරණ අඩුවීම හා කාන්තාවන්ගේ ඔසප් චක්‍රය අක්‍රමවත් වීම.
- නිරතුරුවම කණ්නාඩිය ඉදිරියේ පෙනී සිටිමින් තම රූපය පිළිබඳව ස්වයං විවේචනයක යෙදීම.
- නිරතුරුව තම ශරීර බර, උදරය, කලවා හා තට්ටම් ප්‍රදේශ මැන බැලීම දැක්විය හැකිය.

Anorxia Nervosa තත්ත්වයෙන් පෙළෙන සිහින් සිරුර පිළිබඳ දැඩි උනන්දුවක් දක්වන්නා වූ බොහෝ දෙනෙකුට සිය ජීවිත අහිමි වන තත්ත්වයට පත්වීමක්ද දක්නට ලැබේ. එනම් මරණ අනුපාතය සැලකීමේදී 7% ක පමණ ප්‍රතිශතයක් මියයන්නේ මෙකී Anorxia Nervosa නැමති අක්‍රමතාවයෙන් බව Romeo (1986) විසින් දක්වා ඇත. එසේම Karen Carpenter නැමැති ගායිකාව 1982 වසරේදී මියයාමට හේතු වී ඇත්තේද මෙම අක්‍රමතාවයයි. එපමණක් නොව අනුව දශකයේදී ඇමරිකානු ජිම්නාස්ටික් කණ්ඩායම නියෝජනය කළ එක් ක්‍රීඩිකාවක් වයස අවුරුදු 22 ක් තරම් අඩු ඉතා තරුණ වයසේ දී මිය යාමට හේතු වූයේද ඇය Anorxia Nervosa තත්ත්වයෙන් පෙළීමයි. ශරීර හැඩය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරනු ලබන මෙම අක්‍රමතාවයෙන් යුතු රූපකායක් කෙබඳුද යන්න ඇති ප්‍රබලතම නිදර්ශකයක් වශයෙන් ලෝක ප්‍රකට වෙළඳ බෝනික්කන් වූ Ken හා Barbie දැක්විය හැකිය. එනම් ඔවුන් නියෝජනය කරනු ලබන වයස සහ රූපශ්‍රීය යථාර්ථවාදීව සැසඳීම අපහසු වන නිසාය.

## Bulimia Nervosa

මෙම තත්ත්වය අසීමිතව ආහාර අනුභව කොට විරේක කිරීමේ සින්ඩ්‍රෝමය යන අර්ථය ඇති Binge purge Syndrome යන නාමයෙන්ද හඳුන්වනු ලබයි. මෙම තත්ත්වයට අධික ලෙස ගොදුරු වනුයේ තරුණ පිරිස්ය. විද්‍යාලවලට අයත් කාන්තාවන්ගෙන් 10% -15% ක් පමණ මෙම තත්ත්වයෙන් යුතු බව Mitchel (1987) Schlesier සහ Stropp (1984) දක්වයි. 90%-95% පමණ Bulimia Nervosa තත්ත්වය කාන්තාවන් තුළ වේ.

මෙම අක්‍රමතාවයෙහි ඇති ප්‍රධාන ලක්ෂණයක් නම් අසීමිත ආහාර ප්‍රමාණයක් ගැනීමෙන් පසු එය ශරීරයෙන් ඉවත් කිරීමයි. එහිදී වමනය කිරීම, විරේක කිරීම සහ දැඩි ව්‍යායාම ක්‍රම භාවිත කරනු ලබයි. එසේම විශාල ප්‍රමාණයෙන් ආහාර අනුභව කරනුයේ ඉතා සුළු කාල පරාසයක් තුළය. මෙහිදී 2000-3000 පමණ කැලරි ප්‍රමාණයක් අඩංගු ආහාර පරිභෝජනය සිදු කරනු ලබයි. එසේම අඩු කාලයක් තුළ ආහාර අධිකව පරිභෝජනය කිරීම පාලනය කරගැනීමේ හැකියාවක් මොවුනට නැත.

මීට අමතරව,

ශරීර හැඩය හා බර පිළිබඳව මුරණ්ඩු පිළිවෙතක් අනුගමනය කරනු ලබයි. එසේම තම ශරීර හැඩය පිළිබඳ බියකින්ද පසුවෙයි.

විශාදය, කාංසාව වැනි තත්ත්වයන්ගෙන් ඉහළය.

ලුණු, තිත්ත, පැණි හා ඇඹුල් වැනි රසයන් සඳහා දුර්වල සංවේදීතාවක් ඇත.

වැළඳුනු අය මෙන් නොව මොවුන් ආහාර ගැනීම හා බඩ විරේක කිරීමේ මෙම රටාව සාමාන්‍ය ශරීර බර ප්‍රමාණයක සිටිමින් සිදුකරන නිසා මෙම අක්‍රමතාව රෝග විනිශ්චයකට ලක්කිරීම අපහසුය.

මෙසේ Bulimia Nervosa තත්ත්වයට ගොදුරුව සිටි කාන්තාවක වශයෙන් ලෝක ප්‍රසිද්ධ ඩයනා කුමරිය දැක්විය හැකිය.

මේ ආකාරයේ ආහාර ගැනීමේ අක්‍රමතාවන් ඇතිවීම



සඳහා හේතු සාධක මොනවද යන්න විමසා බැලීමේදී කායික, පරිසරාත්මක, ප්‍රජානනික, මානසික සාධක බලපානු ලබන බව කිව හැකිය. විශේෂයෙන්ම සමාජ, සංස්කෘතික සාධකයන්ට මෙහිදී ප්‍රමුඛස්ථානයක් හිමිවේ. එනම් සමාජය තුළ මුල් බැස ඇති රූපශ්‍රීය පිළිබඳ ආකල්පය බෙහෙවින් බලපෑම් කරනු ලබන බව Brownell (1991) පවසයි. එය අප රටටද පොදුය. එනම් ලාංකිකයන් තුළ ශරීර හැඩය පිළිබඳ ඇති පරමාදර්ශය වූ සිහින් සිරුර තරුණ ළමුන් ආහාර ගැනීමෙන් වළකාලීමට, ආහාර පාලනය කිරීමට හේතු වී ඇත.

ජීව විද්‍යාත්මක වශයෙන් විමසා බැලීමේදී අප ශරීරය තුළ ඇති Serotonin නම් ස්නායු සම්ප්‍රේෂක ද්‍රව්‍ය බලපෑම් කරනු ලබයි. එසේම නිවුන් දරුවන් යොදාගෙන සිදුකර ඇති අධ්‍යයනයකින් හෙළිවී ඇත්තේ කායික වශයෙන් විවිධ ප්‍රතිවිපාකයන්ටද ගොදුරු වනු බවය. විශේෂයෙන්ම උදරයේ ආම්ලිකතාව ඉහළ යාම, ආමාශගත වණ, උගුර ආශ්‍රිතව තුවාල ඇතිවීම තත්ත්වයෙන් යුතු අය අධිකව ආහාර ගෙන වමනය කිරීම නිසා, අධික මහන්සිය, තෙහෙට්ටුව වැනි තත්ත්වයන් ඇතිවිය හැකිය. ඇතැම් විට ශරීරය අධික ලෙස දුර්වල වීමේ ප්‍රතිඵලයක් ලෙස ජීවිතය පවා අහිමි වනු ඇත.

මෙවන් තත්ත්වයකින් යුතු නව යෞවනයන් හට උපකාර කළ හැක්කේ කෙසේද යන්න විමසීමේදී විශේෂයෙන්ම නව යොවුන්වියේ පසුවන්නන් පිළිබඳ දෙමාපිය අවධානය යොමුවීම අත්‍යවශ්‍යය. ඔවුන්ගේ අසාමාන්‍ය ආහාර ගැනීමේ පුරුදු වේ නම් ඒ පිළිබඳව සොයා බලා ඔවුන්ව දැනුවත් කළ හැකිය. එසේම ඔවුන් පෙළෙමින් සිටින ක්ලමථකාරී තත්ත්වයනට මුහුණ දීමට සහ අපහසුතා මඟහරවා ගෙන ඔවුන් තුළ ඇති ආහාර ගැනීමේ අක්‍රමවත් පුරුදු වෙනස්කර ගැනීමට ප්‍රජානනික චර්යාවාදී ප්‍රතිකාර ක්‍රමය සාර්ථකව භාවිත කළ හැකිය. එසේම ඖෂධමය වශයෙන් ප්‍රති විශාදිත ඖෂධ භාවිත කළ හැකිය. ඊට අමතරව මෙවන් පුද්ගලයන්ට සහය වීම සඳහා උපකාරක කණ්ඩායම් භාවිත කළ හැකිය. මේ ආකාරයට ඖෂධ හෝ මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රම අනුගමනය කරමින් ආහාර ගැනීමේ අක්‍රමතා සහිත වූවකු ඉන් ගලවා ගැනීමට යත්න දරනවාට වඩා එවන් අක්‍රමතා ඇතිවීමට ඇති අවස්ථා අවම කළ හැකිනම් එය වඩා ප්‍රතිඵලදායක වනු ඇත. නොමැති නම් විවිධාකාරයේ හැකියාවන්ගෙන් යුතු පිරිසක් තම ශරීර ප්‍රතිරූපය පිළිබඳව ඇති දැඩි අවධානය හේතුවෙන් ඉතා අඩු වයසින්ම මිහිමතින් සමුගෙන යනු ඇත.

# කීකරු පුතා

## කෙටි කතාව

ඉන්දියානු ලේඛක අනිටා දේසායි ලියූ **Devoted son** කෙටිකතාව ඇසුරෙන් පරිවර්තනය

■ **ආචාර්ය ජගත් රූපසිංහ**

පත්තරකාරයා ගේට්ටුව ළඟට විසිකල පත්තරය අහුලාගත් රකේෂ් එතන සිටගෙනම වෛද්‍ය විද්‍යාලයට ඇතුළු වීමේ තරග විභාගයේ ප්‍රතිඵල කියෙව්වා. පත්තරය කියවමින්ම ගෙදර ආලින්දයට පියනැගූ ඔහු උදේ තේ කෝප්පය තොල ගාමින් සිටි තාත්තගේ දෙපා වැන්දා. ඉහළ සමර්ථයක්ද කියල තාත්තා ඇහුව ප්‍රශ්නෙට රකේෂ් උත්තර දුන්නෙ බොහොම සන්තෝෂයෙන්.

"විභාගෙ වැඩිම ලකුණු අරගෙන පළවෙනියා වෙලා."

නටමින් ගයමින් මුළු පවුලම සන්තෝස වුණා. මුළු දවස පුරාම නෑදෑයන්ගෙන් යහළුවන්ගෙන් සුබ පතන්නන්ගෙන් ගෙදර පිරී ගියා. නිවස පුරාම විවිධ ආකාරයේ පැණි රස කැවිලි. සමහරු මල්මාලා ගෙනෙල්ලා පළඳනවා. ගෙදර මල්වලින් සරසල. පවුලෙන් ඉහලට ඉගෙනගත්ත පළවෙනියා රකේෂ්. ඔහුව වෛද්‍ය විද්‍යාලයට යවන්න ගෙදර අය බොහෝ දේවල් කැප කළා.

"වර්ම මහත්තයා ඔබේ පුතා ඔබට විතරක් නොවෙයි මේ පලාතටම ගෞරවයක් ගෙනත් දුන්න." හැම දෙනාම රකේෂ්ගේ පියා වර්මාට සුබ පැතුවා.

"ඔහු පළමුවෙන්ම කළේ මගේ කකුල් දෙක අල්ලල වැඳපු එක." වර්ම මහත්තයා බොහොම ආඩම්බරයෙන් කිව්වා. නිවසට පැමිණි වැඩිමහලු කාන්තාවන් සතුටු කඳුළු සාරි පොටින් පිහදාගත්තා. පිරිමින් එකිනෙකා වැළඳගෙන සුබ පැතුවා.

"වර්ම මහත්තයා සතුටින් ඉන්නේ. මේ වගේ පුත්තු දැන් කාලෙ ලේසියෙන් සොයා ගන්න බෑ." එකිනෙකා කියවන්නට වුණා.

"වර්ම මහත්තයාගේ තාත්තා වගේම වර්මත් ඉස්කොලෙ ගිහින් නෑ. ඒ වුණාට පුතාට හොඳට ඉගැන්නුවා. මේ දරුවා මුළු පළාතටම නම්බුවක්." නිවසින් පිටවීමට පෙර පැමිණි සැම දෙනාගෙම කතාබහ වුණේ ඒ ගැන.

වෛද්‍ය විද්‍යාලයට ඇතුලත් වුණු රකේෂ් හොඳින් ඉගෙනගෙන අවසාන විභාගය ඉහළින්ම සමත් වුණා. ඔහු ඉදිරිපත් කළ පර්යේෂණ නිබන්ධනයවෛද්‍ය ක්ෂේත්‍රයේ ඉහළින්ම අගය කිරීමට ලක්වුණා. ඔහුගේ දක්ෂතාවය නිසාම ඔහුට වැඩිදුර අධ්‍යාපනය සඳහා ඇමරිකාවට ශිෂ්‍යත්වයක් ලැබුණා. ඔහු යූ එස් ඒ බලා පිටත් වුණා.

ගෙදරට කතාකරන හැමවිටම ඔහු ගෙදර අයට කීවේ ඇමරිකාව නොවෙයි දැන් කියන්න යූ එස් ඒ කියල. තම ඉගෙනීමේ වැඩ හොඳින් කළ රකේෂ් ඇමරිකාවේ පදිංචි නොවී නැවතත් ගමට පැමිණියා. ඔහු හැදී වැඩුනු කහපාට තීන්ත ගෑ කුඩා ගෙදරටම ආවා. රකේෂ්ගේ ආපසු පැමිණීම ගැන වඩාත් සතුටු වුණේ අම්මා. ගමේ අය කීවෙ ඇමරිකාවෙ ගිය බොහෝ ඉන්දියන් ළමයි සුදු ගෑනුන් කසාද බැඳ ඇති බව. අම්මා විසින් ගමෙන් තෝරාගත් තරුණියක් සහ විවාහ වීමටද ඔහු කැමති වුණා.

කුඩා කල සිටම රකේෂ් හොඳින් දන්නා ඇය ලස්සන යුවතියක් වුව ඇය ගමේ බොහෝ තරුණියන් මෙන් නූගත්. ඇය අහිංසක ගුණයහපත් ගෙදර වැඩකරගෙන සිටින බිරිඳක්. දරුවන් ලැබීමත් සමගම ඇය ටිකක් තරබාරු වී ඇති බව රකේෂ්ට දැනුණා.

අවුරුදු ගණනාවක් නගරයේ රෝහලක වැඩ කළ රකේෂ් පසුව එහි පරිපාලනයටද එක් වී අධ්‍යක්ෂකවරයෙක්ද වුණා. පසුව ඔහු තමාගේම සායනයක් ඩිස්පැන්සරියක් පටන්ගත්තා. තමන්ගේ අලුත්ම ඇම්බෙසඩර් වාහනයට මාපියන් නංවා ගත් රකේෂ් තමාගේ අලුත් සායනය ඇති තැන පෙන්වීමට ඔවුන් රැගෙන ගියා. දොස්තර රකේෂ් වර්මා යනුවෙන් ලොකු නාමපුවරුවක් එහි ගහල තිබුණා. කලකදී නගරයේ හොඳම සහ ධනවත්ම දොස්තරවරයා බවට රකේෂ් පත්වුණා. මේ තත්ත්වයට ළඟා වීමට ඔහු තම ජීවිත කාලයම කැප කළා.

මේ කාලය වනවිට මව සහ පියා හොඳටම මහලු වයසට පත්වෙලා හිටියා. වර්මා මහත්තයා අවුරුදු 40 ක් වැඩ කළ භූමිතෙල් විකුණන ෂෙඩ් එකෙන් විශ්‍රාම ගත්තා. ජීවිතේ අවසාන කාලයේ තම පුතාගෙන්ම ප්‍රතිකාර ලැබූ මව මිය ගියා. අම්මා කෙනෙකුට එය වාසනාවන්ත ජීවිතයක්. මිනිසුන් ඔවුන් ගැන කිවේ එසේය. රකේෂ්ගේ ජීවිතය වාසනාවන්තය. ඔහු තම දරුවන්ට බිරිඳට මෙන්ම තම දෙමාපියන්ටද එකසේ ආදරය කළා. ඔහු හිතවතුන් නෑදෑයන් සමග සතුටු වුණා. දිනෙන් දින ඔහු ඉතා දක්ෂ ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස දක්ෂතා දක්වන්නට වුණා. මුලින් ඔහුගේ දියුණුව ගැන සැවොම කතාකරන්නට වුණා. පසු වනවිට ගමේ නගරයේ මිනිසුනට එය එතරම් අලුත් දෙයක් වුණේ නෑ. පැරන්නන් බොහෝ දෙනෙක් මියගොස්. නව පරපුර දන්නේ මෑත කාලයේ දේ පමණයි. ඔවුන් රකේෂ්ගේ අතීතය නොදනී.

මවගේ මියයාමෙන් පසු වර්මා මහත්තයාගේ තත්ත්වය එන්න එන්නම දුර්වල වුණා. නිතරම ලෙඩවන්නට වුණා. ඔහුගේ ලෙඩ ගැන දන්නේ ඔහු විතරයි. ඔහු නිතරම තමාගේ ලෙඩ ගැන මැසිවිලි නැගුවා. දොස්තර පුතාටත් ඒවා අඳුනාගැනීමට අමාරු වුණා. නිතරම නිදාගන්තා. දවසෙ වැඩිහරියක්ම ඔහු ස්ප්‍රින් ඇඳේ වැතිර සිටින්නට වුණා. සමහර වෙලාවට කිසිවක් කතා නොකර නොසැලී සිටියා. එවිට මුළු පවුලම ඔහු වටේ එක් වී දුක්වෙමින් අඬන්නට වුණා. එක්වරම ඔහු නැඟී සිට බුලත් කෙළ හතරවටේටම ගැසුවා. වටේ සිටින්නන් විහිළුවට ලක් කරා. වර්මා මහතා නිතර නිතර මෙය කරන්නට වුණා.

මුනුබුරාගේ උපන්දින උත්සව දිනයේ ඔහු ඇඳේ වැතිර නිසොල්මන් විය. මෙය දුටු රකේෂ්ගේ බිරිඳ සියල්ලන්වම ඇඳ ළඟට කැදවීය. එක්වරම නැඟී සිටි වර්මා ගැසූ බුලත් කෙළ පහරින් බිරිඳගේ අලුත් සාරිය නැහැවී ගියා. උපන්දින සාදය එතනින් අවසන් විය. එදායින් පසු නිවසේ කිසිවෙකුත් වර්මා ගැන තැකීමක් කළේ නෑ. එහෙත් රකේෂ්ට එසේ බැරිය. තමාගේ තාත්තා මොනව කළත් අත්හරින්න බෑ. රකේෂ් තාත්තා ආසා කළ පිත්තල කෝප්පයට හැමදා උදෑසන තේ එක රැගෙන ආවා. දිනපතා පත්තර වර්මාට ඇසෙන සේ කියවූවා. සායනයේ සිට පැමිණි වහාම පියා ළඟ වාඩි වී කකුල් පිරිමැද්දා. මේ සියල්ලටම වර්මාගේ පිලිතුර බුලත් කෙළ ගැසීම පමණි.

රකේෂ් තාත්තට කාමරයෙන් එළියට ඇවිත් මිදුලේ වාඩි වී පිරිසුදු වාතය හුස්ම ගන්නා ලෙස ඉල්ලා සිටියා. වර්මා මේ කිසිදෙයකටවත් ප්‍රතිචාර නොදැක්වීය. දිනක් සේවකයන් ලවා වර්මාගේ ඇඳ මිදුලට ගෙන ආ රකේෂ් පියාව වත්තන් කරගෙන පහළට ගෙනවිත් මිදුලේ තැබූ ඇඳේ වාඩි කරවීය. මෙය වර්මා මහතගේ සතුටට හේතු වුවත් රකේෂ් තමාගේ කෑම පාලනය කිරීම ගැන ඔහු කිසිම සතුටක් දැක්වූයේ නෑ.

දිනත් හොඳටම ලෙඩ වූ වර්මා තමාට පැණිරස කෑම සමග කිරි දෙන ලෙස ඉල්ලීය. එවිටම රකේෂ් කාමරයට ආවා. ඔහුගේ පෙනුම වෙනදා මෙන් නොවීය.

"මින්පස්සේ රසකැවිලි මොකුත් නෑ. මේ වයසට පරිස්සම් වෙන්න ඕන. මීනා තාත්තට හාල් ටිකක් උයල කිරි ටිකක් දාල දෙයි. බැදපු කිසිදෙයක් නෑ. පැණි රස බෑ. මීටපස්සෙ." රකේෂ් තදින්ම කියා සිටියා.

දින ගණනක් රෝගීව සිටි වර්මා මහත්තයා රකේෂ්ගේ කෑගැසුමට ඇස් ඇර බැලීය. ඔහු රකේෂ් දෙස පුදුමයෙන් බැලීය. 'තාත්තා කන්න ආස කෑම එපා කියන පුතා. අහන්නත් පුදුමයි' වර්මා මහත්තයා තමාටම කියාගත්තා. ඔහු දෙස නොබැලූ රකේෂ් කාමරයේ බෙහෙත් තබා තිබූ රාක්කය පිලිවෙලකට සැකසුවා. රකේෂ්ගෙ බිරිඳ වර්මා දෙස සම්ච්චල් සිනාවක් පා කාමරයෙන් එළියට පියනැගුවා. එය වර්මා මහත්තයාව තවත් අපහසුතාවයට පත් කළා. පළමුව පැණි රස කෑම නැවතුනි. ඉන්පසු බැදපු කෑම නැවතිනි. වර්මා මහත්තයා ආසාවෙන් කෑව කෑම සියල්ලම වාගේ වරින්වර නවතා දැමුණි. දිනපතා ඔහුට ලැබුණු කෑම වූයේ පාන් පෙත්තක්, තැම්බූ පරිප්පු, තැම්බූ එළවළු. සමහර වෙලාවට තැම්බූ මාලු කෑල්ලකි. සියලු කෑම තැම්බු කෑමය.

"තාත්තා අපි දැන් පරිස්සම් වෙන්න ඕන මේ වයසේදි" රකේෂ් නිතරම කිව්වා. තමා කරන සියලු දෙය තාත්තාගේ හොඳට බව ඒත්තු ගන්නන්නට උත්සාහ කළා. ලේලිය කාමරයට නොආවත් වරින්වර දොර රෙද්දෙන් එබී බලන්නට විය. වර්මා මහත්තයා එය නුරුස්සන්නට විය.

තම මුනුබුරන්ට මුදල් දී කඩෙන් රසකැවිලි ගෙන්වා ගැනීමට වර්මා මහත්තයා උත්සාහ කළා. ඒ සඳහා ඔහු මුනුබුරන් පෙළඹවූයේ ඔවුන්ට ඉතිරි මුදල් ළඟ තබාග ැනීමට ඉඩ දීමෙනි. තමාගේ නූගත් එහෙත් ආදර බිරිඳ සෑදූ රසකැවිලි වර්මාට මතක් විය. මුනුබුරන් ලවා රසකැවිලි ගෙන්නා ගැනීම දිනක් රකේෂ්ට අසු විය. මෙයින් රකේෂ් දැඩි ලෙස කෝප විය. මුනුබුරා රකේෂ්ගෙ න් බැනුම් ඇසුවා. මවගෙන් ගුටිකෑවා. කේන්තියෙන් කාමරයට ගිය රකේෂ් කවදාවත් නැතිව පියාට දොස් කියන්නට වුණා.

"තාත්තා දැන් පුතාලටත් බොරු කියන්න හොර වැඩ කරන්න උගන්නනවද. අර ජරා පත්තර කෑල්ලෙ ඔතල ගෙනාව කැම කනවද. මම කිසිම කෙනෙකුට කඩචෝරු කන්න දෙන්නෙ නෑ. මේ ගෙදරට ගේන්න දෙන්නෙත් නෑ. හැමතැනම කොලරාව, උනසන්නිපාත, බඩේ අමාරු. තාත්තා ඒක දන්නවා. මේ ගෙදර අයටත් ඒ ලෙඩ බෝ කරන්නද හදන්නෙ."

මහලු වර්මා සුසුමක් හෙළා නැවතත් ඇඳෙහි වැතිරුනි. වර්මාට දැන් කිසිම සතුටක් නැත. පුතා උදෑසන පත්තර කියවීමත් තේ එක ගේන ඒමත් දැන් ගානක් නැත. ඉඳහිට හෝ සතුටක් ඇත්තේ ඔහුව බැලීමට පරණ හිතවතෙකු පැමිණියහොත් පමණි. එය සිදුවන්නේ කලාතුරකිනි. ඔහුගේ හිතවතුන්ද ඔහු මෙන්ම අබල දුබල නිසා ගමන් බිමන් සීමාසහිතය. වරින්වර පැමිනෙන්නේ අල්ලපු ගෙදර බාතී පමණි. අල්ලපු වත්තේ සිටින බාතී මිදුලට බැස්ස විට වර්මා මහතාවත් එළියට ගෙන තිබුණොත් ඒ පැත්තේ සිටම සමහර වෙලාවට කතා කරයි. සමහර අවස්ථාවලදී මොවුන් දෙදෙනා දෙපැත්තේ සිට හයියෙන් කරන කතා ගෙවල් දෙකේම අයට ඇසෙයි. දෙදෙනාගේම කන් ඇසීම අඩු නිසා හයියෙන් කතාකරන එක ඔවුන්ට ගානක් නැත.

සමහර දිනවල අමාරුවෙන් වර්මාගේ ගෙදරට ඇවිදින බාති මිදුලේ ඇති බංකුවේ වාඩිවෙයි. රකේෂ් ගෙදර ඇත්නම් කරනුයේ වර්මාවද එළියට ගෙනවිත් එතන වාඩිකරවීමයි. එවිට ඔවුන් දෙදෙන නිදහසේ කතා කරයි. බුලත්විට හපමින් එකිනෙකාගේ ලෙඩ ගැන කතා කරයි

"වර්ම බායි වාසනාවන්තයි. ගෙදරම දොස්තර මහත්තයෙක් ඉන්නවනෙ"

"මා දිහා බලන්න. එයා මට හරියට කන්න දෙන්නෙ නෑ." වර්මා හඬමින් පවසයි.

"මොනවා.... තමන්ගෙම පුතා හරියට කන්න දෙන්නෙ නෑ..."

"ඔව් මම පාන් කන්න ආසයි කිව්වම ඔහු කියනවා. තාත්තා දැන් ඔයා කන්න ඕන ධාන්‍ය වර්ග. එහෙම කියල ධාන්‍ය ග්‍රෑම් 200 ක් දෙනව. දෙන කෑමත් කිරල මැනල දෙන්නෙ. තරාදියකුත් තියාගෙන ඉන්නවා."

"පුදුමයි මේ නහින දෙහින කාලෙ පුතා තාත්ත කැමති කෑම නවත්වනව කියන එක. කෑම කිරල දෙනවයි කියන එක."

"පොඩ්ඩක් ඉන්න කියනකන්. අද පවුලම මාලු බැදල කෑව. මට සුවඳ ආව. මම ලේලිට කිව්ව මටත් කෑල්ලක් දෙන්න කියල. ලේලි බෑ කිව්ව."

බාති කට වෙවුලමින් පුදුමයෙන් මෙන් අසාගෙන සිටියි.

"පුතා කියල තියෙනව මට දෙන්න එපා කියල. තෙල් කෑම නෑ. බටර් නෑ."

"පුතා කොහොමද හිතන්නෙ තාත්තට මෙහෙම ජීවත්වෙන්න පුළුවන් කියල."

වර්මා හිස සෙලවිය.

"මේ තමයි පුතා මට සලකන හැටි. මම එයාට ඉගැන්නුවා. ලොකු මහත් කළා. දොස්තර කෙනෙක් කළා. මේ තමයි ලොකු දොස්තරල තමන්ගෙ තාත්තලට සලකන හැටි. දැන් පුතාගේ ලොකු වෙනසක් වෙලා. එයා කියන්නෙ මගේ හොඳටයි කියල. මේ අන්තිම කාලෙ මම කැමති කෑම නැතිව මොන හොඳක්ද."

තමාගේ දුක අසල්වැසියාට කී පසු වර්මාගේ හිතට සහනයක් ලැබිනි

වර්මා දිනෙන්දින දුර්වල විය. කෑම වෙනුවට ලැබෙනුයේ පෙති, කරල්, බොන බෙහෙත්, විටමින් ටොනික්ය. වැසිකිලි යන්න පහසුවෙන්න පෙති, රුධිර පීඩනය අඩුවෙන්න පෙති, ආහාර දිරවන්න පෙති, නොයෙකුත් පෙති කරල් වර්ග. ඒ අතරතුර සැරින් සැරේ ඉස්පිරිතාලෙටත් අරන් යනව. රකේෂ් හිතනුයේ තමා අතින් තාත්තාට විය යුතු දේ එය බවයි. සමහර දිනවල වේදනාව දැනුනත් වර්මා ඒ බව පුතුට නොකියයි. ඕව කිවුවොත් තවත් පෙති කරල් බොන්න වෙයි ඔහු හිතුවා.

වර්මා රකේෂ්ට කිව්ව තමාට නිදහසේ ඉන්න ඉඩ දෙන ලෙස. "මම පුතා වශයෙන් තාත්තව බලාගන්න ඕන" රකේෂ් ගේ පිළිතුර විය

සමහර දිනවල වර්මා මහත්තයා පෙති දෙස නොබලයි. "මට නිදහසේ ඉන්න දෙන්න.

**48 වන පිටුව බලන්න**



# ඇයි ඔබ සිනහ වෙන්නේ?

■ පරිවර්තනය - ජෝ. සෙනවිරත්න

ප්‍රථමයෙන්ම තේරුම් ගන්න ඕනෙ කාරණය තමයි මිනිසා ඇරුනහම සිනහ වෙන්න අන් කවර හෝ සතෙක් හෝ සමත් නැත යන කාරණය. සිනහව ප්‍රකාශ කරන්නේ ඉතාම ඉහළ මුදුනක්. ජීවිතයේ උසස් තත්ත්වයක්. මහමඟදී මී හරකකු සිනාසෙනවා දුටුවොත් ඔබ මැරෙන තරමට බියවෙන්න පුළුවන්. ඔබ ඒ කාරණය තවත් කෙනෙකුට කීවත් එය විශ්වාස කරනු ලබන්නේ නෑ. මොකද මෙය සිදු නොවිය හැක්කක් නිසා.

ගස්වලට සතුනට සිනහවෙන්න බැරි මොකද? සිනහව නිසා ඇතිවන ආබාධ තිබෙනවා. උදාසීන බවට පත් වූ සතකුට පමණයි සිනහ වෙන්න පුළුවන්. සතුන් සහ ගස්වැල් උදාසීන බවට පත්වෙන්නේ නෑ. සිනහවේ ප්‍රතිපක්ෂය තමයි උදාසීනත්වය. මේවා තමයි ප්‍රතිවිරුද්ධ ධ්‍රැව. මිනිසා තමයි උදාසීන වන එකම සත්වයා. උදාසීනත්වය මනුෂ්‍යත්වයේ සංකේතයක්. බල්ලන් පූසන් දිහා බලන්න. ඒ අය කොයිම වෙලාවකවත් උදාසීන වෙන්නෙ නෑ. මිනිහා ගැඹුරු උදාසීනතාවයක ගිලී සිටින බව දකින්න තිබෙනවා. ඇයි සතුන් උදාසීන නැත්තෙ? මිනිහා පමණක් උදාසීනත්වයෙන් පෙළෙන්නේ ඇයි? ඔබගේ බුද්ධිමත් බව අධික තරමට ඔබගේ උදාසීනත්වයත් වැඩියි. අඩු බුද්ධිමත් බවට උදාසීනත්වයක් අඩුයි. ඒ නිසයි ප්‍රාථමික මානවයන් වඩා සතුටින් ජීවත්වුණේ.

ශිෂ්ටසම්පන්න සමාජවලට වඩා ප්‍රාථමික සමාජවල ජනයා වඩා සතුටින් සිටි බව ඔබට දැනගන්න පුළුවන්. බර්ට්‍රම් රසල් පවා ඔවුන් ගැන ඉරිසියාවට පත්වුණා. පළමු වරට බර්ට්‍රම් රසල් ප්‍රාථමික ගෝත්‍රිකයන් මුණගැසුණු අවස්ථාවේදී ඔහුට ඉරිසියා සහගත හැඟීමක් ඇතිවුණා. මොකද ඔවුන් බොහෝ සතුටෙන් සිටියේ... කොහොමටත් උදාසීන බවක් පෙන්නුවේ නෑ. ඔවුන් ඉතාම දුප්පත්, ඇඟේ ඇඳුමක් නැති තරමයි. ඕනෑම විදිහකට සලකා බැලුවත් ඔවුනට කිසිම දෙයක් තිබුණේ නෑ. නමුත් ඔවුන් තමන්ගේ ජීවිතය ගැන උදාසීනකමකින් පෙළුණේ නෑ. ජීවිතය ඔවුනට ආශිර්වාදයක්. බොම්බේ, නිව්යෝර්ක්, ලන්ඩන් මේ හැම නගරයකම සිටින මිනිස්සු උදාසීනයි... උගත්කම වැඩි, ශිෂ්ටසම්පන්නකම වැඩි උදාසීනකම වැඩි.

ඒ නිසා රහස තේරුම් ගන්න පුළුවන්. ඔබ කොයිතරම් වැඩියෙන් හිතන්න හැකි කෙනෙක්ද, ඔබේ උදාසීනත්වය වැඩියි. මොකද සිතීම මගින් ඔබට පුළුවන් අතීතය, අනාගතය, වර්තමානය සංසන්දනය කරන්න. සිතීමෙන් ඔබට පුළුවන් බලාපොරොත්තු වෙන්න. ඔබට ඉල්ලන්න පුළුවන් මොකක්ද මේකේ තේරුම? මේ ප්‍රශ්නය නගපු වහාම උදාසීනත්වය සිතට ඇතුළු වෙනවා. මොකද ඇත්තෙන්ම මේ කිසිම දෙයක තේරුමක් ඇත්තේ නෑ. මොකක්ද මේකේ තේරුම? කියන ප්‍රශ්නය ඔබෙන් අහපුවහම එහි තේරුමක් නැතිනම් මේවායේ අර්ථ විරහිත බව ඔබට හැඟෙන්න ගන්නවා. අර්ථ විරහිතකම දැනෙද්දී ඔබ උදාසීන වෙනවා. සත්තු, ගස්, ගල් උදාසීන නෑ. ඒ අය කවමදාකවත් අහන්නේ නෑ. ජීවිතයේ අර්ථය මොකක්ද? ජීවිතයේ අරමුණු මොනවාද? ඔවුන් ඒ ප්‍රශ්නය නගන්නේ නෑ. ඒ නිසා ඔවුනට අර්ථ විරහිත බව කවදාවත් හැඟෙන්නේ දැනෙන්නේ නෑ. ජීවිතය ඇති සැටියෙන් ඔවුන් පිළිඅරගෙන තිබෙනවා. එහි අර්ථ සොයන්න යන්නේ නෑ. එනිසා ඔවුනට උදාසීනතා නෑ.

මිනිසාට උදාසීන බව දැනෙනවා. එහි ප්‍රතිපක්ෂය තමයි සිනහව. ඔබට සිතන්නේ නැතිව ජීවත් වෙන්න බෑ. මොකද උදාසීනකම මැරිය හැක්කේ සිනහවෙන් පමණක් නිසා. ප්‍රාථමික සමාජවල ඔබ එකම හෝ විහිළු කතාවක් සොයාග න්න ලැබෙන්නේ නෑ. ඔවුනට මොනම හෝ විහිළුවක් නෑ. යුදෙව්වනට තමයි විශාලතම සංඛ්‍යාවක් තියෙන්නෙ. ඔවුන් තමයි පෘථිවියේ ජීවත්වන ඉතාම උදාසීන මිනිස්සු. නමුත් ඒක එහෙම වෙන්න ඕනේ. මොකද අනෙක් ජන ප්‍රජාවන්ට වඩා වැඩිම නොබෙල් ත්‍යාග ලබන්නො ඒගොල්ල. පසුගිය ශත වර්ෂයේ විශිෂ්ටයන්ගේ නම්වලින් වැඩිම හරිය යුදෙව් නම් ෆ්‍රොයිඩ්, අයිස්ටයින්, මාක්ස් මේ සියල්ලෝම යුදෙව්වෝ. නොබෙල් ත්‍යාගලාභීන්ගේ නාම ලැයිස්තුව දිහා බලන්න. එයින් බාගයකටත් වැඩි පිරිසක්ම යුදෙව්වෝ. ඔවුනට තමයි විශාල ප්‍රමාණයෙන් විහිළු තිබෙන්නේ.

මේ නිසා වෙන්න පුළුවන් ලෝකය පුරාම යුදෙව්වන් වෛරයට පාත්‍ර වෙන්නේ.... මොකද හැමෝටම හරිම ඉරිසියයි යුදෙව්වන් ගැන. ඔවුන් කොතැනක සිටියත් ඕනෑම වර්ගයක තරගකාරිත්වයක් තියෙනවා නම් ඔවුන් හැම විටකම වාගේ ඒවායින් ජය ගන්නවා.

මේ නිසා හැමෝම ඔවුන් ගැන ඉරිසියාවෙන් පෙළෙනවා. මුළු ලෝකයම ඔවුනට එරෙහිව එක්සත්ව පෙළගැහිලා. ඔවුනට වෛර කරනවා. ඔබට තවත් කෙනෙක් සමඟ තරග කරන්න බැරි නම් එහි ප්‍රතිඵලය තමයි වෛරය. ඒ වගේම යුදෙව්වනට තමයි ලෝකයේ ඇති ලස්සනම විහිළු තියෙන්නේ. ඇයි? ඔවුනට දැඩි උදාසීනතාවක් දැනෙන නිසා ඔවුනට සිදුවෙනවා විහිළු නිර්මාණය කරන්න. උදාසීන හැඟීම මකා දමන්න විහිළුව අවශ්‍යයි. පැවැත්මට සිනහව අවශ්‍යයි. එහෙම නැතිනම් ඔබට වෙන්නේ සිය දිවි නසාග න්න.

දැන් සිනහවේ යාන්ත්‍රණය අවබෝධ කරගන්න උත්සාහ කරන්න. ඒක කොහොමද වෙන්නේ. මං විහිළුවක් කියද්දී ඔබ ඇයි සිනහ වෙන්නේ? මොකද වෙන්නේ. මොකක්ද මෙහි ඇති අභ්‍යන්තර යාන්ත්‍රණය....? මං විහිළුවක් කීවාම බලාපොරොත්තු දැල්වෙනවා. ඔබ අපේක්ෂා සහගත වෙනවා. ඔබේ සිත අවසානය කුමක්වේදැයි වටහගන්න බැරි ඒ අවසානය මොන විදිහේ එකක්දැයි සෙවීමේ නිරත වෙනවා. විහිළුවක් තල දෙකක් කරා ළඟා වෙනවා. පළමුවෙන්ම තාර්කික තලයක් වෙතට. එය ඔබට වටහග න්න පුළුවන්. විහිළුව අවසානය දක්වාම තාර්කික වෙත තරමට සිනහවක් හටගන්නේ නෑ. හදිසියේම ඔබට කලින් අනුමාන කරන්න බැරි අතාර්කික දිසාවකට විහිළුව ගමන් කරන්න ගන්නවා.එය අතාර්කික වුණු තරමට ඔබ තුළ ගොඩනැඟූ කම්පනය, අපේක්ෂාවන් හදිසියේ පුපුරා යනවා. ඔබ සැහැල්ලු වෙනවා. ඔබෙන් සිනහව පහළ වෙනවා.

සිනහව සිත් සැහැල්ලු වීමක්. නමුත් ඒකට කම්පනයක් අවශ්‍ය කරනව. කතාවක් බලාපොරොත්තුයි කම්පනයකුයි ඇති කරනවා. කතාවේ උපරිම උච්ච අවස්ථාව දැන් දැන් එළඹෙනවා යන හැඟීම මත කුතුහලය ඔබ තුළ හටගන්නවා. මොකක්දෝ වෙන්න යනවා. ඔන්න දැනුයි උච්චම අවස්ථාව එන්නේ. ඔබේ පිටකොන්ද යෝගියකුගේ වගේ කෙළින් ඔබේ සිතේ වෙනත් සිතුවිලි කිසිවක් නෑ.

ඔබ සමස්තයක් වශයෙන් බලා ඉන්නවා. කතාවේ අවසානය වෙත ඔබේ ශක්තිය යොමුවෙලා. ඒ වගේම කතාවේ අවසානය ඔබට හිතාගන්න බෑ. හදිසියේම හිතට දරාගන්න බැරි යමක් සිදුවෙනවා. මොනවාදෝ අමන දෙයක් සිදුවෙනවා. අතාර්කික අසාමාන්‍ය දෙයක්. අවසානය තර්කයට අසුවෙන්නේ නැති, හිතාගන්න බැරි දිසාවට ගමන් කරනවා. ඔබ පුපුරා යනවා. ඔබ තුළ කුලුනක් සේ ගොඩගැසුණු සම්පූර්ණ ශක්තිය සැහැල්ලු වෙනවා. ඒ සැහැල්ලුවත් සමඟම ඔබ තුළින් සිනහව නැගෙ නවා. මිනිසා උදාසීනයි. එනිසා ඔහුට සිනහව අවශ්‍යයි. ඔහු කොතරම් උදාසීනද ඒ තරමටම ඔහුට සිනහව අවශ්‍යයි. එහෙම නැතුව ඔහුට පවතින්න බෑ.

තුන්වෙනුව සිනහව වර්ග තුනක් ඇති බවත් වටහා ගැනීම අවශ්‍යයි. පළමුවැන්න ඔබ කාට හරි සිනහ වෙනවා. ඒක තමයි ඉතාම පහත්, අධම ඉතාම සාමාන්‍ය සිනහව. වෙනත් කෙනකුගේ වියදමින්, ඔබ සිනහසෙද්දී එය ප්‍රචණ්ඩයි. ආක්‍රමණශීලියි, අපහාසාත්මකයි. ගැඹුරුම තැන තිබෙන්නේ පළිගැනීමක්.

දෙවනුව ඔබ තමන්ටම සිනාසෙනව නම් මෙය අත්කර ගැනීම වටිනවා. මෙය හරිම සංස්කෘතිකයි. තමන්ට සිනහසෙන්න හැකි මිනිසා වටිනා කෙනෙක්. ඔහු පහත් ග්‍රාම්‍යකමින් මිදුණු කෙනෙක්. ඔහු පහත් ජම්මයෙන් ගෙන එන වෛරය, ආක්‍රමණශීලීත්වය, ප්‍රචණ්ඩත්වයෙන් මිදුණු කෙනෙක්.

## මානවසිංහන්ගෙන්...

24 වන පිටුවෙන්

එන්න එපා. පත්තරකාරයෝ ඉන්නේ ඒකට තමයි"

### වාට්ටුවේ ගෙදර

මානවසිංහ මහතා බරපතල ලෙස රෝගාතුර වෙන්නට පෙර එක්තරා දවසක අපේ ගෙදරටත් ආවේය. එතුමන් ජීවමාන මා දුටු අවසන් දවසය. ඒ 1964 එක්තරා දවසකි.අපි පදිංචිවෙලා හිටියේ සබරගමු මහ සමන් දේවාලය අසල ලොකු වෙද මහත්තයාට අයත් කුලී ගෙදරකය. ඒ ගෙදරට කවුරුත් කීවේ වාට්ටුවේ ගෙදර කියායි. කිසියම් දවසක ලෙඩුන්ට ප්‍රතිකාර කරන වාට්ටුවක් බවට පත් කිරීමේ අදහසින් ඉදිකළ ඒ නිවස කිසිදා වාට්ටුවක් බවට පත් කිරීමට ලොකු වෙද මහත්තයාට නොහැකි වුණත් අදටත් ඒ ගෙදරට ගම්වාසීන් කියනුයේ වාට්ටුවේ ගෙදර කියාය.

ඔන්න ඔය වාට්ටුවේ ගෙදරටයි මානවසිංහ මැතිඳුන් අවසන් වර අප දකින්නට ආවේ. එදාම උදෑසන තම පරම මිතුරෙකු වූ එවකට සංඛපාල රජමහා විහාරයේ වැඩ විසූ අත්තුඩාවේ ගුණරත්න නායක හාමුදුරුවොත් හමු වූ බව එතුමා අපේ තාත්තාට පැවැසුවා මට මතකයි. මේ සතුටු සාමීචිය අතරතුර මගේ පළමු ගුරුවරයා එක එල්ලේ මා දෙස බලා කළ සඳහන ගලේ කෙටූ අකුරු මෙන් තවමත් මසිතින් මැකී නොයේ. "කොල්ලෝ තෝ හොඳට ඉගෙන ගන්න ඕන". එතුමන් අර බුදු හාමුදුරුවෝ අවසන් වතාවට තම ශ්‍රාවකයන්ට කී ආකාරයෙන් අප්පමාදේන සම්පාදේත යන සනාතන දහම පුංචි මට තේරෙන බහින් එසේ කීවා වන්නටද පුළුවන.

ඉන්පසු අපේ ගෙදර දොර රෙද්දක හැඩතල මෝස්තර වගයක් පෙන්වමින් ඒ මොහොතේ එහි සිටි අපේ ගෙදර උදවියට රස නිශ්පත්තිය පිළිබඳ එතුමන් මහ ගැඹුරු පාඩමක් කියාදුන්නා මට මතකය. ඒ අන්තිම පාඩම මගේ කනට වැටෙන විට මා දස හැවිරිදි නොවැඩුණු කොලුවෙකි.

### අවසන් දවස

මානවසිංහ මහතා රෝගාතුරව කොළඹ මහ රෝහලක ප්‍රතිකාර ලබන අවධියේ අපේ තාත්තා සියලු දෛනික කටයුතු අතහැර දවස ගානේ කොළඹ ආවා ගියේය. ඒ හැමදාකම තාත්තා ආපසු ආවේ පෙරදාට වඩා මැලවුණු මුහුණිනි. මල්වල පන්සලේ, මහ සමන් දේවාලයේ, ශ්‍රී බලාබද්දල පන්සලේ පවා අපේ තාත්තා මානවසිංහයන්ට සුව පතා වරු ගණන් සෙත් කවි කීවේය.

එක් දවසක මානවසිංහ මහතා දුටු සිහිනයක් එතුමා අපේ තාත්තාට පවසා තිබිණි. එතුමා අපේ තාත්තාට කියන්නේ සිරිසේන අයියා කියාය.

"සිරිසේන අයියේ මම හීනෙන් දැක්කා බොහොම උජාරු උත්සවයක්. කතරගම දෙයිහාමුදුරුවොත් ඒ පෙරහැරේ වැඩියා. හැබැයි මං දැකල අහක බලා ගත්තා."

එතුමන් විස්තර කළ සිහිනය අපේ තාත්තා ඉතා සෝබරව පැවසීය. ඒ හැන්දෑවේ රාස්සිගේ අව්ව පොත්ගුල් කඳු වැටිය පුරා උලාකමින් තිබිණි. මානවසිංහයන්ගේ නියත මරණය පිළිබඳ පෙර නිමිති එදා අපේ තාත්තාගේ හඬේ ගැබ්ව තිබිණි. ඒ දවස්වල අපේ ගෙදරට ගත්තේ ලංකාදීප පත්තරේය. පත්තරේ සත පහකි. ගෙන් ගෙට පාපැදියකින් පත්තර බෙදූ පත්තර ළමයා ළඟ හොඳ මිනිස් ගතිගුණ තිබිණි. ලංකාදීප පත්තරේ ලොක්කෙකු වූ මානවසිංහ මහතා සහ වාට්ටුවේ ගෙදර වාසීන් වූ අප අතර කිට්ටුවන්තකම දැනගන්නට තරම් එදා ඒ පත්තර විකුණූ ළමයාට අද පත්තරකාරයන් කියන පත්තර මහත්වරුන්ට නැති තරම් ඉවක් තිබිණි. මානවසිංහ මහතා මියගිය දවසේ ලංකාදීප පත්තරේ අපේ ගෙදරට දී සයිකලයෙනුත් බැස පත්තර ළමයා අපිත් සමග මරණය ගැන කතා කළේය.

මානවසිංහයන්ගේ වියත් බව, කවීත්වය, පාණ්ඩිත්‍යය ගැන ලියන්න කියන්න තරම් තවමත් මම දැනුමැත්තෙක් නොවෙමි. එහෙත් ඒ අසහාය මහා පුරුෂයාගෙන් 'අ' යන්න කියවූ අනුහස මගේ ජීවිත කාලය පුරා මා ලද ඉහළ වත්කම ලෙසයි මට සිතෙන්නේ. මගේ පළමු ගුරුවරයා වූ ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ වෙතින් මා කියවූ තනි අකුර එදා අද සහ මතුදාත් මා රකින දිවමතුරකැයි කිසිදු සැක සංකාවකින් තොරව අදත් මම විශ්වාස කරමි.

අතීතයෙන් ඇසෙන

# මුදලිවරුන්ගේ වරුණ

■ ලලිත් චාමින්ද



මුදලි, මුහන්දිරම්, විදානේවරුන් හා ගම්මුලාදැනිවරුන් ගැන අපි අසා ඇත්තෙමු. එකල මෙකී තනතුරු, නම්බුනාම, පට්ටම් ලබා ගැනීම සඳහා ඇතැමුන් අත දිගහැර මුදල් වියදම් කළහ. ඒ විතරක් නොව, නොයෙකුත් වරදාන, අල්ලස් පවා ලබා දී මෙකී තනතුරු හා නම්බුනාම ලබා ගැනීමට ඇතැම්හු කටයුතු කළහ.

එහෙත් සුළු ජාතිකයෝ මෙම තනතුරු, පට්ටම් හා නම්බුනාම ලබා දීමේදී උගත්කමත් ශිෂ්ට සම්පන්න බවත් කෙරෙහි සැලකිලිමත් වූහ. නමුත් සුද්දාගේ කාලයේදී වුවද අද මෙන් නම්බුනාම තනතුරු ලබා දීමේදී එය ප්‍රායෝගිකව ඉෂ්ට වුයේ නැත. සුදුස්සාට පමණක් එම තනතුරු හිමි නොවීය.

එකල සරසවි සඳරැස පත්තරයේ පළ වු ලිපියක මේ ගැන හරි අපුරුවට විස්තර කොට ඇත්තේය. එක් කෝරලයක මුදලි තනතුරක් පවුම් තුන්සියයකට උගස් කොට තිබේ. ඒ විතරක් නොව, උඩරට පළාතේ ආරච්චි වාසගමක් පවුම් තුනකට හා මී හරක් බානකට උගස්කොට ඇත්තේය. පහතරට මුදලි තනතුරක් උගස්කොට ඇත්තේ පවුම් දොළහකටය. මේ නිසා එකල සරසවි සඳරැස පුවත්පත මගින් තනතුරු නම්බුනාම ලබා දීමේදී සුදුස්සන්ටම පමණක් ඒවා ලබා දීමට කොමිටි පත් කළ යුතු බවට මතයක් ගෙන ගියේය.

මීට වසර 128 කට පමණ ඉහතදී පළවු සරසවි සඳරැස පුවත්පතේ මුදලිවරුන් පත්කිරීම, කඩුකස්ථාන පැළඳවීම ගැන, මුදලි තනතුරට පත්කිරීම ගැන ස්තුති කිරීම්, මුදලිවරුන් ගැන සඳහන් ගුණ ගැයීම්, මුදලිවරුන්ගේ අභාවයන් පිළිබඳ වූ විචිත්‍ර සඳහන් දක්නට ලැබේ. ඒ විතරක් නොව, පඩි නොලබන ගම්මුලාදෑනින් හා ඔවුන්ගේ කාර්යන් ගැනද සඳහන්ව තිබේ. රුහුණු විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දේව මයිකල් ද සිල්වා විසින් වසර 128 ක් පැරණි එවැනි සරසවි සඳරැස පුවත්පත් මෙන්ම අනිකුත් පුවත්පත්වල පැරණි පිටපත් ඉතා සුරක්ෂිතව ආරක්ෂා කර තිබෙනු දක්නට ලැබිණි.

දේව මයිකල් ද සිල්වා විසින් මුදලිවරුන් ගැන මෙන්ම මෙකී චරිත හා බැඳුණු රසවත් කථාන්දර රැසක්ද අපට කිවේය. මෙතැන් සිට මේ ලිපිය දිග හැරුණුයේ ඔහුත් සමග කළ සාකච්ඡාවක් ඇසුරෙනි.

මුදලිවරුන් හා බැඳී ඇත්තේ හරි අපූරු රසවත් කථාන්දරයන්ය. විටෙක මේ චරිත ගැමියන්ගේ උපහාසයට පවා ලක්විය. මුදලි කෝලමෙන් මුදලිවරයාගේ චරිතය ඉතා සියුම් ලෙස උපහාසයට ලක්විය. ඒ විතරක් නොව, ගැමියෝ මෙකී චරිත හාස්‍යයට හා උපහාසයට ලක්කොට සියුම් වින්දනයක් ලැබූහ. එමෙන්ම මෙවැනි තනතුරක් ලැබුණු විට එය තම ගමට ලැබුණු නම්බුවක් කියා සිතූ ගැමියෝද මේ අතර සිටියහ.

ගැමියන් එදා මේ අය ආමන්ත්‍රණය කළේ මුදියන්සේ රාළහාමි, මුදියන්සේ හාමුදුරුවෝ, යන නම්වලිනි. මෙම තනතුරුවලට පත්වන පුද්ගලයාගේ වගතුග ගම්මුන් විසින් දැනගත් විට, මොවුන් සතු ධන සම්පත් අඩු වූ විට, මෙකී චරිත සඳහා ගැමි ජනතාව තුළ තිබූ ගෞරවය අඩුවන්නට විය. ඒ විතරක් නොව, මොවුන් අල්ලස්ගත් විටද ගැමියන් තලා පෙළා පිඩාවට ලක් කළවිටද මේ අයට තිබූ ගෞරවය අඩු වන්නට විය.

තම තනතුරේ ගෞරවය ආරක්ෂා කරමින් කටයුතු කළ මුදලිවරු, විදානේවරු, ගම්මුලාදෑනිවරු මේ අය අතර සිටියහ. ඔවුන්ට ඒජන්තවරුන්ගෙන් නම්බුනාම පවා ලැබුණි.

මේ මුදලිවරයකු හා බැඳුණු රසවත් කතාන්දරයකි. මුදලිවරුන් අතර කට්ට කෙරාටික වෙට්ට පිත්තල මුදලිවරුද සිටියහ. මේ මුදලිවරයා පහතරට පළාතේ පත්තුවක් භාරව ක්‍රියා කළ මුදලිවරයෙකි. ඔහු සතුව කාර් රථයක් තිබුණේය. මුදලිවරයා යටතේ සිටි විදානේවරුන් කැඳවා තම කාර් රථය විකුණන බව හේ කිවේය. සීට්ටු ක්‍රමයක් යටතේ කාර් රථය විකිණීමට මුදලිවරයා කටයුතු කළේය. එකල මොටර් රථවලින් ගමන් බිමන් ගියේ ඒජන්ත හා මුදලිවරුන් පමණි. මේ නිසා මොටර් රථයක නැගී මහත් උජාරුවෙන් ගමන් බිමන් යාමට විදානේවරුන්ටද දැඩි ආශාවක් ඇති විය. මේ නිසා මුදලිවරයාගේ කාර් රථය මිල දී ගැනීමට විදානේවරුන් අතර පැවතියේ දැඩි තරගයකි. අවසානයේ එක් විදානේවරයකු මුදලිවරයාගේ කාර් රථය මිලට ගත්තේය. එහෙත් මුදලිවරයා කාර් රථය විදානේට දුන්නේ නැත. ඒ සඳහා මුදලිවරයා උප්පරවැට්ටියක් යෙදීය.

"විදානේ ආරච්චි දන්නේ නැද්ද දැනට තිබෙන නීතිය අනුව විදානේවරුන්ට මෝටර් රථ පාවිච්චි කරන්න බැරි බව. ඒ නිසා කාර් රථය ගත්තත් වැඩක් වෙන්නේ නැහැ." මුදලිවරයා කිවේය. මුදලිවරයාගේ මේ කථාවෙන් විදානේවරයාගේ ඉහ මොළ රත්විය. මුදලිවරයාගේ උප්පරවැට්ටියකට තමන් හසු වී ඇති බව විදානේවරයාට තේරුම් ගියේය. අවසානයේ විදානේවරයාට වුයේ කාර් රථය මෙන්ම තමන් දුන් මුදල යන දෙකම නැති වීමය.

ගම්මුලෑදැනිවරුන් ගැනද බැඳී ඇත්තේ රසවත් කථාන්දරයන්ය. මේ එක් ගම්මුලාදෑනිවරයකු ගැන සඳහන් එවැනි කථාවකි.

දෙවන ලෝක යුද්ධ කාලයේදී ගාල්ලේ ඒජන්තවරයා විසින් බලපිටිය කෝරලයට අයත් ගම්මුලාදෑනිවරුන් කැඳවා තිබුණේය. ඒ යුද්ධය පිළිබඳ මේ අය දැනුවත් කිරීම සඳහාය. "යම් විදියකින් යුද ටැංකියක් මේ පැත්තට ආවොත් තමුන්ලා මොනවාද කරන්නේ" ඒජන්තවරයා ඇසුවේය. මේ අතර සිටි කටකාර ගම්මුලදෑනිවරයකු එකවරම නැගී සිටියේය. "කිසි ප්‍රශ්නයක් නැහැ හාමුදුරුවනේ... මගේ වැයික්කියට ආවොත් අත්අඩංගුවට ගන්නවා." මුලාදෑනිවරයා කීවේය. ඒජන්තවරයාගේ දෑස් එකවරම උඩ ගියේය.

"හොඳයි... කොහොමද අත්අඩංගුවට ගන්නේ කියා මට බලා ගන්න ඕන." ඒජන්තවරයා කීවේය. ඒජන්තවරයාගේ මේ කථාවෙන් ගම්මුලාදෑනිවරයාට තරු පෙනුණි.

"මම එනවා තමුන්ගේ වැයික්කියට කොහොමද තමුන් එය කරන්නේ කියලා දැනගන්න..." ඒජන්තවරයා තමන් එන දිනය ගැනද මුලාදෑනිවරයාට කිවේය. ගම්මුලාදැනිවරයා තමන් කුමක් කළ යුතුද කියා දස අතේ කල්පනා කරන්නට විය. ගම්මුලාදෑනියාට හොඳ අදහසක් පහළවිය. හේ මේ සඳහා උප්පරවැට්ටියක් යෙදීය. ගම්මුන් සියලුදෙනාට කඩු පොලු මුගුරු රැගෙන එන ලෙස මුලාදෑනියා කිවේය. ඒජන්තවරයා එන විට ගම්මු කඩු පොලු මුගුරු රැගෙන රැස් කකා සිටියෝය. මුලාදෑනිවරයාගේ මේ ක්‍රියාව නිසා ඒජන්තවරයා දැඩි සතුටට පත් වී මුලාදෑනිවරයාට උසස් වීමක්ද ලබා දුන්නේය.

මේ බලපිටිය ප්‍රදේශයේ මුදලිවරයකුට තම තනතුර අහිමි වීමට හේතු වූ කථාන්දරයකි. එක දිනක් ගාල්ලේ ඒජන්තවරයා තම නිල රථයෙන් බලපිටිය හරහා ගමන් කරමින් සිටියේය. මාර්ගය අසල සිටි මී නාම්බෙකු ඒජන්තවරයා ගමන්ගත් මෝටර් රථයට පැන්නේය. මින් කිපුණු ඒජන්තවරයා මුලාදෑනිවරයා සොයා ඔහුට දඬුවම් දී තනතුරෙන්ද පහ කළේය.

මේ කාලයේ මී හරක් බාන් වැඩි වශයෙන් අයත්ව තිබුණේ මුදලිවරුන්ට හා විදානේවරුන්ටය. ලන්දේසිකාරයින් කෘෂිකාර්මික කටයුතු සඳහා මී හරක් යොදාගනු ලැබීය. මේ නිසා එකල මී ගවයින්ට හොඳ ඉල්ලුමක් තිබුණි. මී ගවයින් සොරකම් කිරීමද මෙකල විශාල වශයෙන් සිදුවිය. හරක් හොරකම් කරන ක්‍රම ගැන එකල සරසවි සඳරැස පුවත්පතේද ලිපි පළ විය. ඇතැම් මුදලිවරු තම ගෝල බාලයින් යොදවා විදානේවරුන්ගේ හා මුදලිවරුන්ගේ මී හරක් බාන් සොරකම් කිරීමට කටයුතු කළහ. මේ නිසා මුදලිවරුන් හා මුදලිවරුන් අතර මෙන්ම විදානේවරුන් හා විදානේවරුන් අතරද ගැටුම් ඇති විය.

විදානේවරුන් කරන කියන දෑ ගැන දැන ගැනීමට ගම්මුන් තුළ පැවතියේ දැඩි උනන්දුවකි. එක් දිනක් ගැමියකු විදානේවරයකුගේ නිවසට ගොස් එබිකම් කරමින් සිටියේය. මේ දුටු විදානේවරයා "උඹ මොනවාද කරන්නේ..." යැයි ගැමියාගෙන් ප්‍රශ්න කළේය. "අනේ මුදියන්සේ රාළහාමි... මගේ මී හරක් බාන ඔබතුමාගේ වත්තේ බඳින්නද කියා අවසර ගන්න ආවේ" ගැමියා යටහත් පහත්ව කිවේය. අවසානයේ ගැමියාට සිදුවූයේ තම මීහරක් බාන විදානේවරයාට දන් දීමටය.

ඒ කොයි හැටි වුවද එදා හම්බන්තොට උපදිසාපතිවරයා වශයෙන් කටයුතු කළ ලෙනාඩ් සිඩ්නි වුල්ෆ් නැමති බ්‍රිතාන්‍ය ජාතික සිවිල් නිලධාරිවරයා ගම්මුන් ගැන මෙන්ම මුලාදෑනිවරුන් ගැන මේ අයුරින් සඳහන් කොට තිබුණි.

"පොදු ජනයා අනුවණයෝය. හණමිටිකාරයෝය. යම් යහපතක් නොමිලේ කරවා ගැනීමට කැමැත්තෝය. ඔවුන් කිසි වැදගත්කමකට නැති පිරිසකි. ගම්මුලාදෑනිහු ඊටත් වඩා නොහොබිනයෝය"

ඒ විතරක් නොව ලෙනාඩ් වුල්ෆ් ඇතැම් මුදලිවරුන් විදානේවරුන් ගම්මුලාදෑනිවරුන් එම තනතුරුවලින් පහ කරනු ලැබීය. කාර්යශූර පුද්ගලයින් එම තනතුරුවලට උසස් කරනු ලැබීය. නැගෙනහිර ගිරුවාපත්තුවේ මුදලි සිය නිල කටයුතු කරනු ලබන්නේ නොසැලකිල්ලෙන් බව පවසමින් හේ නිවාඩු නොගෙන සිය ස්ථානයෙන් බැහැරව ගොස් ඇති බව වුල්ෆ් වාර්තා කරයි. පසුව මේ මුදලිතුමා තනතුරෙන් පහ කරයි. හේ තලාවේ අබේසේකර ගමවිදානේ ආරච්චිගේද වරාපිටිය විදානේ ආරච්චිගේද වැඩ තහනම් කළේය. එමෙන්ම මහලු පත්තුවේ මුහන්දිරම්ගේ පුතා තහනම් කැළෑවේ ගස් කැපීමේ චෝදනාවට ලක් වූ බව වාර්තා කෙරුවේය. තිස්ස පත්තුවේ මුහන්දිරම් තනතුරු ඉසිලූ අමරසේකර මාගම් පත්තුවේ මුදලි තනතුරට සුදුසු බව වාර්තා කරයි. මීගහජදුරේ ආරච්චි නීතිය මැනවින් ක්‍රියාවේ යෙදවුවකු බවද පවසයි.

මෙම ලිපියේ අප මුලදී සඳහන් කළ පරිදි සුදු ජාතිකයින්ගේ පාලන කාලයේදී වුවද නම්බුනාම තනතුරු ලබා දිමේදී එය සුදුසු අයටම පමණක්ලැබුණේ නැත. ඒ කොයිහැටි වුවද සර් ආතර් ගොඩන් ආණ්ඩුකාරතුමා වික්ටෝරියා රැජිනගේ 65 වැනි උපන්දිනය වෙනුවෙන් රජ දැක්මක් හා නම්බුනාම ප්‍රදානය කිරීමේ උත්සවයක් මහනුවර මගුල් මඩුවේ පවත්වා තිබේ. එහිදී ආණ්ඩුකාරතුමා මෙසේ පවසා ඇත.

"නම්බුනාම ඉල්ලූ විට සුදුසුම අය බලා ලබා දුන්නා. නම්බුනාම ඉල්ලා එවනු ලැබූ ලිපි කණගාටු සිතින් බැලුවෙමි. තනතුරු නම්බුනාම මගෙන් බලෙන් ලබාගන්න බැහැ. තනතුරු හා නම්බුනාම ලැබූවන් රටවාසීන්ට හා රජයට වැඩ කළ යුතුය."

ඇත්තටම මේ කාලයේ තිබුණේ කුල වැඩ වසම් සමාජ ක්‍රමයකි. 1833දි කොල්බෲක් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමෙන් පසු මේ පාලන ක්‍රමය වෙනස් විය. 19 වැනි සියවසේ අවසානයේ සිට 20 වැනි සියවස මුල දක්වා කෘෂි ක්ෂේත්‍රයේ දියුණුවට ඉහල නිලධාරීන් වූ ආණ්ඩුකාර ප්‍රමුඛ රාජ්‍ය නිලධාරීන් හා කෝරළ හා පත්තු භාරව ක්‍රියා කළ මුදලි මුහන්දිරම් එකතුව පවත්වනු ලැබූ දර්බාර් නම් රාජ්‍ය මට්ටමේ සාකච්ඡා ක්‍රමයක් තිබිණි. ග්‍රාමීය ප්‍රදේශවල නායකයින් වූ මුදලි මුහන්දිරම්වරුන් රජ ගෙදරට කැඳවා සාකච්ඡා කිරීමෙන් මුලාදෑනි බලය හිස ඔසවන්නට විය.

ඒ කාලයේ මුලාදෑනි තනතුරු දීමේදී දේපල අයිතිය ගැන සැලකිලිමත් විනි. මේ නිසා මුලාදෑනි ක්‍රමය පැවතුණේ සීමිත පවුල් සංඛ්‍යාවක් තුළය. ඔවුහු විවිධ දූෂණ කළහ. ඡන්ද ලියාපදිංචි කිරීමේ කටයුතුවලදී මූලිකත්වය ගත්තේ ගම්මුලාදෑනින්ය. එකල මේ සම්බන්ධයෙන් ගම්මුලාදෑනින්ට බරපතළ චෝදනා එල්ල වී ඇත.

"ඒ කාලයෙත් සමාජයේ නොයෙකුත් අපචාර වුණා... ඒ සඳහා එදා භාවිත කළේ දැන් වගේ දූෂණය කියන වචනය නෙවෙයි... තගිස් කිරීම කියලා තමයි කීවේ. අපරාධ කුළුග න්වන වචන භාවිත කළේ නෑ..." රුහුණු විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දේව මයිකල් ද සිල්වා මහතා කිවේය.

Saliroo Creations

All Your Publishing Needs under one roof

Graphics
Illustrations, Logos, Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

Web Sites
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

Computer Repairs
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ
පරිගණක අලුත්වැඩියාවන් සඳහා
Tel : 416 201 0628

French Tutoring

Individual and small group classes for French learners
'French reading, writing, and conversing'
Any grade from grade 1-12,
university minors and French Immersion

Kumudu Abeywardena,

Masters (French Literature),
BA (Modern Languages), Dip (AFC)
T.P - 647 824 1897

MARRIAGE PROPOSALS

Bodu Govi Parents in Colombo seeks a professionally and academically qualified partner for their 1983(Dec) born 5' feet, fair & religious daughter. She is currently reading her PHD final year in Chemistry (USA).

Please reply with horoscope or date, time & place of birth and family details to proposal1283@gmail.com

MARRIAGE PROPOSALS

Govi Buddhist respectable parents (Father retired senior military officer and mother teacher) with Southern and Kandyan connections residing in Colombo suburbs seek an academically and professionally qualified good mannered Son with sober habits from a similar family for their fair, pretty daughter born 1994, 5'4"in height, studied at a leading private girls' school in Colombo, inherits substantial assets. She is a well-qualified Early Childhood Educator (Diploma in MMI from American National College and Higher National Diploma in Teaching Methodology from Gateway Graduate School) and an Elocutionist (CALSDA), presently working in an International School in Colombo. Twin brother a graduate employed. Please respond with family details,

contact numbers and a copy of the horoscope.
Email: muproposal61@gmail.com. Tele 0771447013.

# පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි

## නිකං ඉන්නව අයිසේ

ලුණුවිල අනුරුද්ධ මධ්‍ය මහා විද්‍යාලය පිහිටා ඇති පරිසරය අතිශයින්ම චමත්කාරය. එක් පසෙකින් ගමේ පන්සලත්, අනෙක් පස නිල්වන් ජලයෙන් සපිරුණු වැවත්, වැව පසුබිම් කරගත් ක්‍රීඩා පිටියත් විදුහලට අමුතුම සුන්දරත්වයක් ගෙන දුන්නේය. මෙම ආස්වාදජනක පරිසරයට අපි බෙහෙවින් ඇලුම් කෙළෙමු. අපි උසස් පෙළ අධ්‍යාපනය ලැබූ 60 දශකයේ මෙම පාසල හැඳින්වූයේ ලුණුවිල මහා විද්‍යාලය නමිනි. එය ජවන පිටිය මලල ක්‍රීඩා අංශයෙන් අප විදුහල ඉමහත් ප්‍රසිද්ධියක් ඉසිලූ අවදියකි.

විදුහල් වාර්ෂික නිවාසාන්තර මලල ක්‍රීඩා උළෙල, විජය, ගැමුණු, තිස්ස නිවාස අතර ආරම්භ කිරීමට කටයුතු සම්පාදනය විය. නිවාස බාර ගුරුවරුන් පත්කිරීමේදී ක්‍රීඩා නායකත්වය දැරූ ගැමුණු නිවාසය බාර වූයේ ඉංග්‍රීසි ගුරුවරයකු වූ වීරමන් සර්ටය. එතුමා පිට පළාතකින් පැමිණියකු වූ අතර ගමේ ප්‍රභූ නිවෙසක නවාතැන් ගෙන සිටියේය. සෙසු ගුරුවරුද තම නිවාස ජයග්‍රහණය සඳහා ඇප කැප වී ක්‍රීඩා පුහුණු කිරීම් කටයුතු නොකඩවා කරගෙන යන අතර දර්ශනීය ලෙස නිවාස ඉදිකිරීම් උදෙසා සිසුන් යොමු කරන්න වූහ.

නියමිත දිනය උදාවිය. විශේෂයෙන් ඉදිකළ මඩු කූඩාරම් මවුපිය ඇතුළු අමුත්තන්ගෙන් පිරී ඉතිරී තිබිණි. ජය ඝෝෂා මැද ක්‍රීඩකයෝ තරග බිමට අවතීර්ණ වූහ.

ක්‍රමයෙන් කාලය ඉක්ම යද්දී ගැමුණු නිවාසය මලල ක්‍රීඩා ඉසව්වලින් ප්‍රථම ස්ථානය ලබා ඇති බව ඔල්වරසන් හඬ මැද වරින්වර නිවේදනය විය. විශිෂ්ටතම නිවාස නිර්මාණයට විජය නිවාසය පළමු තැන ලබාගත්තේය.

එසැණින් විජය නිවැසියෝ ජය ඝෝෂා නගමින් තම නිවාස ධජය පෙරටු කොට අභියෝග කරමින් පිටිය වටා යමින් ගැමුණු නිවාසය ඉදිරිපිටදී ගැටුමක් ඇති කරගත්හ.

ගැමුණු නිවාසය බාර වීරමන් සර් ඉතා සංවේදී, සාමකාමී අහිංසක ගුරුවරයකු වූ අතර කිසි විටෙකත් ගැටුම් නොරිස්සූ එතුමා වහාම පිටියෙන් ඉවත්ව ගියේය. මලල ක්‍රීඩා විජයග්‍රහණයෙන් උද්දාමයට පත්ව සිටි අපි, "අපේ සර්ව උස්සගෙන පිට්ටනිය වටේ යමු... වරෙල්ලා..." යැයි කෑගසමින් සර් පිට වී ගිය ඉසව්ව දෙසට දුව ගියෙමු. ළමයි සර්ට පහරදීමට පන්නාගෙන එනවා යැයි වරදවා වටහාගත් අපේ ගුරුතුමා මහපාර දෙසට වේගයෙන් පියවර නැඟීය.

"සර් නවතින්ඩ.... නවතින්ඩ...." මම යටගිරියෙන් කෑගසමින් යහළුවන් සමඟ සර් පසුපස ලුහුබැන්දත් එතුමා නොපෙනී ගියේය.

යන්තම් අඳුර වැටෙමින් තිබිණ. පාපැදියක පිටුපස නැඟී යමෙකු යනවා දුටු අපි ඒ පසුපස හඹා ගියෙමු. වැව් කණ්ඩිය ඔස්සේ ගිය පාපැදිය සර් නවාතැන් ගත් නිවෙස පිහිටි ගුරුපාරට හැරෙනවාත් සමඟම අපි එය හරස් කර සර් ඔසවා ගත්තෙමු.

"නිකා ඉන්නව අයිසේ.... මට කරදර කරන්ඩ එපා.... යන්ඩ දෙනව අයිසේ" සර් කෑගසද්දී අපි එතුමා ඔසවාගෙන, ගැමුණු කොඩිය ලෙළවමින් ජයඝෝෂා කරමින් පිට්ටනිය වටා නටමින් ගමන් කරද්දී නරඹන්නෝ අත්පොළසන් දෙන්න පටන් ගත්හ.

ඒ මොහොතේ අපේ නිවාස බාර ගුරුතුමාගේ මුහුණේ ඇඳී ගිය අහිංසක සිනහව මගේ මතකයේ තවමත් රැඳී ඇත.

**සරත් විජයරත්න**

## පඩි මල්ල

ඌවේ ප්‍රධාන නගරයෙන් ඈත එපිට දුෂ්කර පාසලකි. ගුරු මණ්ඩලය විදුහල්පතිද සමඟ දස දෙනෙක් වූහ. එකල ගුරුවරුන්ගේ මාසික වැටුප බැංකු මගින් මුදලින් පමණක් ගෙවූ අතර, විදුහල්පතිවරුන්ට මාසයේ 20 වන දින, බදුල්ලේ මහජන බැංකුවට හෝ ලංකා බැංකුවට පැමිණීමට සිදුවිය. විදුහල්පතිවරුන් බොහෝ විට තමන් සමඟ ගුරුවරයකු හෝ දෙදෙනෙකු කැඳවාගෙන ආ අතර, කුඩා පාසල්වල විදුහල්පතිතුමා පමණක් බැංකුවට පැමිණ මුදල් ගෙන ගියේය.

මෙකල මෙන් චෙක්පත් හෝ ඒ ටී එම් කාඩ්පත් නොවූ එකල, බැංකුවෙන් නිසි ලෙස මුදල් ගැන බලා රැගෙන නිරුපද්‍රිතව පාසල කරා ඒම, මාසයේ 'දුෂ්කරම කාර්ය' ලෙස විදුහල්පතිවරු සැලකූහ. ඉහත සඳහන් පාසලේ විදුහල්පතිතුමා සුපුරුදු පරිදි මාසයේ 20 වැනි දින, මහජන බැංකුවෙන් වැටුප් මුදල් රැගෙන, කුඩා කවරයකට දා තවත් බඩු මල්ලක් තුළට දා ගත්තේය. බස් නැවතුමේ බසයක් එනතුරු බොහෝ වෙලාවක් රැඳී සිටි විදුහල්පතිතුමාගේ බඩ 'ගොර ගොර' ගාන්න වූයේ පෙරදා රාත්‍රියේ ආහාරයට ගත් මස් ව්‍යංජනයක දෝෂයක් නිසාය. තත්ත්වය බරපතළ වූයෙන් එතුමාට වැසිකිළි යෑමේ හදිසි අවශ්‍යතාවයක් ඇතිවිය. එතුමා තම අත වූ බෑගය විශ්වාසවන්ත අයෙකුට බාරදීම සඳහා වටපිට බැලීය. පාසල අසල වෙළෙඳසලක මුදලාලි කෙනෙකු බසය එනතුරු සිටිනු දුටු එතුමා, 'තමා වැසිකිළියට ගොස් එනතුරු බලා ගන්නැ' යි බඩු මල්ල ඔහු අතට දී, වැසිකිළිය සොයා දිව ගියේය. ඒ අතරතුරේදී ප්‍රමාද වී බස් නැවතුමට ආ බසය මගීන් නැගගත් සැණින් පිටත්ව ගියේය. විදුහල්පතිතුමා 'කාරිය නිමාකර' පැමිණෙන විට බස් රථය පිටත්ව ගොසින්ය. එතුමාට තුන්මුණින්ම දාඩිය දැම්මේය. ඊළඟ බසය ඇත්තේ තවත් පැයකට පසුවයි. විදුහල්පතිතුමා 'උමතු වූවෙකු සේ' ඊළඟ බසය එනතුරු බස් නැවතුමේ එහාට මෙහාට ඇවිදිමින් සිටියේය. පැයකට පමණ පසු පැමිණි බසයෙන් විදුහල්පතිතුමා පාසල අසලට ළඟා විය. කඩිනමින් පාසල අසල වෙළෙඳසැලට දිව ගියේය. මුදලාලි කඩේ නැත. පුතා කවුන්ටරය අසල වාඩිවී සිටියේය.

"පුතා... තාත්තා බඩු මල්ලක් එහෙම අරන් තිබ්බද?" විදුහල්පතිතුමා නොඉවසිල්ලෙන් ඇසීය.

"බඩු මල්ලක් නම් දුන්නා සර්... ඒත් ඒකෙ තිබුණු දේවල් හළලා වෙන මල්ලකට දාලා... තාත්තා ඒ මල්ල අරන් ගියා..."

විදුහල්පතිතුමාට දෙලොව රත්විය. කඩ බක්කිය යටට අත දැමූ මුදලාලිගෙ පුතා 'කිලිටි ගැහුණු මල්ලක්' විදුහල්පති අතට දුන්නේය. මල්ල අත පත ගා පඩි කවරය එහි ඇති බව දුටු විදුහල්පතිතුමාට "යම්තම් ඇති ඔයින් බේරුණා" කියැවිණි.

**ආනන්ද සරත් ගුණසේන**

## සිංහල මුල්පොත

සිරිදාස ඉස්කෝලෙ මහත්තයා ගමේ කාගේත් සිත් දිනාගෙන සිටියේ ඔහුගේ උගත්කමට වඩා ඔහු ළඟ තිබූ සිරියාව සහ දක්ෂකම නිසාමය. ගමේ පාසලේ දරුවන්ට උගන්වමින් සැම පොදු වැඩකටම උදව් දෙමින් ජනාදරයට පත්වූ අයෙකු බැවින් ගම්මුන් තම නැකතට අකුරු කියවීමට වැඩිපුරම දරුවන් ගෙන ආවේ ඔහු වෙතටය.

බුලත් අතක් සහ ගුරු පඬුරුද ඇතුව නැකතට අකුරු කියවීමට එකල වැඩිපුරම රැගෙන ආවේ "විජය හෝඩිය" නමැති හෝඩි පොතයි. එහි අ, ආ, ඇ, ඈ, ඉ, ඊ වශයෙන් දරුවන්ට අකුරු කියවීම ඉතා පහසු කටයුත්තක් විය. නමුත් කාලයාගේ ඇවෑමෙන් ප්‍රථම වරට "සිංහල මුල් පොත" හඳුන්වා දීමත් සමඟ එම සම්ප්‍රදාය වෙනස් වී "අම්මා" "මාමා" "සාමා" "අමර" වැනි වචන එකතු වන්නට විය. දිනක් සිංහල මුල් පොත සමඟ සිරිදාස ගුරුතුමාගෙන් නැකතට අකුරු කියවා ගැනීම සඳහා දරුවකු සමඟ ආ මවක් නැකත් පත්‍රය ඔහු අතට දුන්නේය. කෙමෙන් නැකත් වේලාව පැමිණි හෙයින් ගුරුතුමා තමාට සහ දරුවාට නුපුරුදු "සිංහල මුල්පොත" මේසය උඩ තබා දරුවාද ළංකරගෙන අකුරු කියවීම සඳහා ඉඳ ගත්තේය. හරියටම නැකතට 'ස්වස්ති සිද්දම්' කියා දරුවාගේ ඇඟිල්ල අල්ලා ගෙන "අයන්න අල්මයන්න මායන්න - අම්මා" යනුවෙන් ගුරුතුමා දරුවා ලවා 'අම්මා' කියවීමට උත්සාහ කෙරුවද ඒ එක් උත්සාහයක් හෝ හරියන බවක් නොපෙනිණ.

දැන් නැකැත් වේලාවද පසුවීමට එයි. ගුරුතුමාගේ කෝපයද නැග එයි. තැනට සුදුසු නුවණ පහළ කරගත් ගුරුතුමා වටපිට බලා එක්වරම මේසය යටින් දරුවාගේ කකුලක් හයියෙන් පෑගීය. වේදනාව හා බියවීම නිසා දරුවා එවිට මහ හඬින් "අම්මා" යනුවෙන් කෑගැසුවේය. මුවඟට සිනාවක් නඟා ගත් සිරිදාස ගුරුතුමා, "හොඳ පුතා, වේලාවට අකුරු කිව්වා ජය වේවා" යැයි පවසමින් යළිත් දරුවාගේ කකුල පෑගීය. එවිට දරුවා යළිත් වරක් "අම්මා" යැයි මහ හඬින් සිය මවට කෑ ගැසුවේය.

මෙලෙස දරුවාට අකුරු කියවූ ගුරුතුමා දරුවාගේ හිස අත ගා දක්ෂ දරුවෙක් යැයි පවසා මව සහ දරුවා පිටත් කර හැරියේය. දරුවා සහ මව පිටත්ව යනු බලා සිට ඔහු

50 වන පිටුව බලන්න

# නස්රුදීන් කතා



## රජවීම හා යමරජ වීම

මෑත කාලයේ වගේම නස්රුදීන්ගෙ කාලෙත් රජකම ගැන නොයෙක් මත ගැටුම් තිබුණා. වරක් රජයේ ඉහළ නිලධාරි පැලැන්තියයි දේශපාලකයොයි, තමන් විද්වතුන් යයි කියා ගන්නා කට්ටියයි, කවදාකවත් බලයට එන්න බැරිවුණාට තමන් රජුන් තනන්නන් යයි හිතන කට්ටියයි, දක්ෂම පරාජිතයොයි නස්රුදීන් වටකර ගෙන ලොකු කතාවක්.

මේ අයගෙ කතාවට මාතෘකා වුණේ රජතුමාගෙ ක්‍රියා පටිපාටිය. රජතුමා බලයට කෑදර බවත් අත්තනෝමතික බවත් නිදහස වළලා දමළ ඇති බවත් රජු තම පරපුරම හදන බවත් එයින් කියවුණා. සියලුම රට වැසියාට හොඳ කාලයක් උදාකර දෙන්න අලුත් රජ කෙනෙක් පත් කරගත යුතු බවත් කට්ටිය කතාවුණා. මේ කතා මැද නස්රුදීන් හිටියේ අඩුම ගානේ "හ්ම්" වත් නොකියා.

අන්තිමට නස්රුදීන් හැර සියල්ලෝම ඒකමතිකව තීරණයකට ආවා. දැනට වඩා හොඳ පාලන ක්‍රමයක් ඉල්ලා සිටින්නත් එසේ නොකෙරෙනවා නම් රජු සිංහාසනයෙන් පහකර නස්රුදීන් රජකමට පත්කර ගන්නත් තමා තීරණය.

මෙතෙක් වෙලා මේ සියලු කතාවලට නිහඬව සවන් යොමාගෙන සිටිය නස්රුදීන් මහ හයියෙන් හිනාවෙලා මෙහෙම කීවා.

"මම මේ ඉන්න තාලෙට ඉන්න ඉඩ දීපල්ලා. මම අපායට යන්න හරිම බය මිනිහෙක්. මිනිස් රජකමට යන පාරෙම තමා යම රජකමට යන පාර තියෙන්නේ."

## වෙන්න බැරිද?

රජතුමාට නස්රුදීන් හමුවීමට වුවමනා වූ නිසා එතුමා කළේ දෝලාවක් සමග සේවකයන් පිරිසක් නස්රුදීන්ගේ නිවසට යවන එක. නස්රුදීන් එනතුරු රජතුමා මගබලා හිටියත් හිස් දෝලාව රැගෙන ආ සේවකයෝ නස්රුදීන් දුන් ලිපියක් රජතුමාට ඉදිරිපත් කර සිටියා.

"ඔබතුමාගේම රාජකාරියට අසකු පිට යමින් සිටි මා ඒ අශ්වයා විසින්ම බිම හෙළන ලදුව තුනටියෙහි අමාරුවෙන් පෙළෙමි. ඔබතුමාගේ තිරිසනකු එසේ කළේ රාජ උෟෂ්ණය පෙන්වීමට විය යුතු යැයි මගේ අදහසය. ඒ අනුව බලන කල මේ මෝඩ රැළත් රාජබල පරාක්‍රමය පෙන්වන්න අදහස් කළොත් මා මියයනු ඒකාන්තය. එහෙයින් සුවය ලැබුණ වහාම පැමිණ බැහැ දැකීමට අවසර දෙනු මැනවි."

ලිපිය කියවූ රජතුමා ඒ දෝලාවම නැවත වරක් පිටත් කළා. "වහාම නස්රුදීන් කැඳවාගෙන ආ යුතුයි" යන රාජ නියෝගයත් සමග ඊළඟට රජතුමා නස්රුදීන් කැඳවාගෙන එනතුරු පත්තිරිප්පුවට වෙලා මග බලන් හිටියා.

ටික වේලාවකින් මේ එන්නේ නස්රුදීන්. දෝලාවේ නැගිල නොවේ දෝලාව කරගහගෙන. රජතුමා මේක දැකල කෝපයෙන් දත්මිටි කෑවා. දෝලාව බිමින් තිබ්බ නස්රුදීන් දෝලාවේ දොර ඇරියාම ඒක ඇතුළේ ඉඳන් එළියට ආවේ දෝලාව අරන් ගිය අයගෙන් මරුමුස්ම පෙනුම තියන මිනිහ.

නස්රුදීන් දණ නවල රජතුමාට මෙහෙම කිව්වා.

"සමාවෙන්න රජතුමනි ඔබතුමාගේ අශ්වයා මට මෙහෙම කළා නම් මේක අස්සේ ඉන්න මට මේ මෝඩ රැළ මොනව නොකරාවිද?" නස්රුදීන් එහෙම කීවේ දෝලාව දෙසට ඇඟිල්ල දිගු කරමින් නොවේ එයින් බිමට බැස්ස අර මරුමුස් පෙනුම තියන කෙනා දිහාට ඇඟිල්ල දිගු කරමින්. නස්රුදීන්ගෙ ඒ කියමනට රජතුමාත් නිරුත්තර වුණා.

## කවුද? මෝඩයා

ඉගෙනීම හා ඉගැන්වීම ගැන කෙරුණ සම්මන්ත්‍රණයකට සහභාගි වන්න දවසක් නස්රුදීන් ගියා. එතන දේශකයෝ වශයෙන් හිටියෙ අධ්‍යපන උපදේශකයෝ, විශේෂඥයෝ වගේ අය. මේ අයගේ ඔළුගෙඩි පිරිල තිබුණේ පිටරටවල එක එක උගත්තු කියන එක එක උපදෙස්වලින්. එහෙම වුණාට මේ අය අතර අඩුම ගානේ දෙන්නෙක්වත් එක මතයකට එකඟ වුනේ නැහැ. හැමෝම හිතුවෙත් කීවෙත් තමන්ගේ මතය හරි කියලා. මේ මත ගැටුම් නිසා කරදරේ වැටෙන්නෙ ගුරුවරුයි ශිෂ්‍යයොයි නිසා නස්රුදීන් හිටියෙ හරිම දුකින්.

එක් උපදේශකයකුගේ මතය වුණේ හැකි තරම් කට පාඩම් කළ යුතුයි කියල.

ඒකට විරුද්ධ වුණු තව විශේෂඥයෙක් කීවේ කට පාඩම් කරවීම යල් පැන ගිය ක්‍රමයක් නිසා කට පාඩම් කිරීම හොඳ නැති බව.

තව කෙනෙක්ගේ මතය වුණේ හැකි තරම් සටහන් දිය යුතුයි කියලා. ඊට විරුද්ධ වුණු අය කීවේ සටහන් දීම නැවත පොතක් ලිවීම වැනි දෙයක් නිසා සටහන් ලිවීම වැරදි කියලා.

අයෙක් කිවා ඕවා හරියන්නෙ නැහැ ළමයි හදන්න ඕනෙ දැඩි දඬුවම් මගින් කියල. වහා නැගී සිටි තව විශේෂඥයෙක් කියපි දඬුවම් දීම අද කාලයේ බරපතල වරදක් වගේම තහනම් දෙයක්. එහෙම දඬුවම් මගින් උගන්වන්න යන ගුරුවරුන්ට වෙන්නෙ ගෙදර යන්න කියල.

දැන් අදහස් ගොඩයි. අයෙක් කියනව ගුරුවරයා ළමයට යහළුවෙක් වගෙ වෙන්න ඕනෙ එතකොට ඉගැන්වීම ලේසියි කියල. තව අයෙක් කියනවා එහෙම යාළු වෙන්න ගියොත් උගන්වන්න බැහැ මොකද ගුරු ගෞරවය නැතිවෙන නිසා කියල.

ළමයින්ට උගන්වන්න බැහැ ඉගෙන ගන්න උදව් වෙන්න ඕනෙ කියලා අයෙක් කියන කොට තව කෙනෙක් කියනවා උදව් වෙලා හරියන්නැහැ උගන්වන්න ඕනෙ කියලා.

කොහොම කොහොම හරි මේ ප්‍රඥා අදහස් නිසා ගුරුවරුයි ශිෂ්‍යයොයි දැන් අන්දමන්ද වෙලා. කොයි එකද පිළිගන්නෙ කොයි එකද නොපිළිග න්නෙ කියලා තේරුම් ගන්න බැරුව. අධ්‍යාපනයයි, අධ්‍යාපන විද්‍යාවයි, මනෝ විද්‍යාවයි එකට පැටලිලා. සටහන් දිහා බලාගෙන ඒවා තේරුම් ගන්න බැරි ගුරුවරු අන්තිමට නිලධාරීන්ගෙන් විමසා සිටියා.

"හොඳයි අපි දැන් මොන ක්‍රමයද පාසලේදි උපයෝගි කරගන්නෙ" කියලා.

"තව තේරුණේ නැතිද? තමුසෙලා ගුරුවරුද? තමුසෙලා වගේ අය නිසා තමා අධ්‍යාපනය අන්තිමට පිරිහෙන්නෙ. තේරුම් ගන්න තරම් මවුබස හරි තේරෙන්නෙ නැතිද? තමුසෙලා වගේ මෝඩයෝ එක්ක කතා කරන්න අපි කැමති නැහැ." මෙහෙම කියපු නිලධාරීන් යන්න ලැස්ති වුනා.

වහා ක්‍රියාත්මක වුණු නස්රුදින් ලඟ තිබුන පුටුවක් ඇදල ඇරන් එහි නැගල මහ හයියෙන් මෙහෙම කීවා.

"පොඩ්ඩක් ඉන්න මෝඩයොත් එක්ක කතා කරන්න අපි කැමතියි."

## තනිවම ස්වර්ගයට යාම

නස්රුදීන් සිටිය පළාතේ වනාන්තරය මැද්දෙ මහා බලගතු පූජනීය ස්ථානයක් තිබුණා. මේක වඳින්න ගියේ ධනවත්, බලවත්, මිනිස්සු. මේ ගමන ගිරි දුර්ග අතරින් යායුතු වූවා පමණක් නොව, භයානක සොර සතුරන්ගෙන්ද බේරී යා යුතුව තිබුණා. මේ හේතුවෙන් එහි යන හැම ධනපතියෙක්ම බලවන්තයෙක්ම තමුන්ගෙ ආරක්ෂාවට දාසයො කම්කරුවො කැඳවාගෙනයි ගියේ.

මේ පූජනීය ස්ථානය වැන්දම ස්වර්ග යේ දොර ඇරෙනවාළු. හැබැයි එහෙම දොර ඇරෙන්නෙ වඳින්න යන ලොකු බල පුළුවන් කාරයින්ට විතරයි. ඒ නැතිව එයැයිලගෙ ආරක්ෂාවට, පහසුවට ගිය දාසයන්ට කම්කරුවන්ට මේ දොර ඇරුනෙ නැහැ.

දවසක් නස්රුදීන් පල්ලියට ගිය අවස්ථාවෙ එතන හිටිය ගමේ වැදගත් උගත් පොහොසත් ධනපතියෝ මේ පූජනීය ස්ථානය වඳින්න නොයාම ගැන නස්රුදීන්ට දොස් කීවා. තමාට එතනට යන්න හැකියාව තියෙද්දිත් නොයාම ගැන දෙවියන් ශාප කරාවි කියලා කීවා. නස්රුදීන් නිහඬව ඉන්නව දුටු එක් අයෙක් කීවා. ගමනට අවශ්‍ය කෑම බීම සියල්ල තමා ගානෙ දෙන්නම් කියල. තව එක්කෙනෙක් කීවා මගෙන් අවශ්‍ය ඇඳුම් පැළඳුම් සියල්ල ලැබේවි කියලා. තවත් අයෙක් පොරොන්දු වුණා ආරක්ෂාවට හා උපකරණ ගෙන යාමට අවශ්‍ය කම්කරුවො දාසයො සපයන්න.

මෙහෙම කියද්දිත් නිහඬව ඉන්න, ගමනට කැමැත්තක් නොදක්වන නස්රුදීන් දැකල කට්ටිය ඇහුවා ඔබ මිත්‍යාදෘෂ්ඨික හැඟීම්වලට යට වෙලා නේද. ඇයි නැතිනම් ස්වර්ගයට යන පාර වහගන්නෙ කියලා. ඔන්න එතකොට තමා නස්රුදීන් කට ඇරියෙ

"මම ස්වර්ගයට යන්න නම් හරිම කැමතියි. ඔය ගමන ගියාම ස්වර්ගයට ගිය හැකිනේ. ඒත් මට බය අර මගෙ උදව්වට ඔයාල එවන කම්කරුවො දාසයෝ. ඒ අයත් මගෙ පස්සෙන්ම ස්වර්ගෙට ඒවි කියල."

## නවරත්න කල්කය හැදුණු හැටි

පළමුවන රාජසිංහ රජ සමයේ බින්තැන්නේ වැදි නායක උක්කිනාට රාජකාරියක් පවරා තිබිණ. එනම් දිනපතා මාලිගයට මස් කදක් සැපයීමයි. මෙය ඒ ඒ කාලවල රජ කළ රජවරු වෙනුවෙන් වැදි නායකයෝ කළ යුතු රාජකාරියකි. මෙම මස් සැපයීම මෙසේ වසර ගණනාවක් සිදුවිය. උක්කිනා කෙරේ රජතුමාගේ සිත පැහැදිණි. බින්තැන්න ප්‍රදේශයේ ගම්වරයක් තෑගි ලැබුණේ ඒ නිසාවෙනි.

යුද කටයුතුවලදී කැළෑ සෙබළුන් රැ ස් කිරීමද පවරා තිබූ තවත් කාර්යයකි. දිනක් රජවාසලට සැපයීමට දඩමස් සොයා ගැනීමට උක්කිනාට නොහැකි විය. කළ හැකි කිසිවක් නැත. වැදි ගෙදර තිබූ තරමක් පරණ වූ මස් කදක් ගෙන ගියේය. සුපුරුදු පරිදි එම මස් සමග රාජ භෝජනය පිළියෙල විණි.

ඒවා අනුභව කළ රජතුමාට උදරාබාධයක් වැළඳිණි. රාජකීය වෙදැදුරන්ගේ නිගමනය වූයේ කල් ඉකුත් වූ මාංස අනුභවයෙන් රජතුමා රෝගාතුර වූ බවය. වහා වැදි නායකයා කැඳවනු ලැබිණ.

"තා රජ මාලිගයට මස් රැගෙන ආවේ කොහෙන්ද?"

"අවසර රජතුමනි, දඩයම් සඳහා සතකු හමුවූයේ නැත. එම නිසා ගෙදර තිබූ මස් කද ගෙනාවෙමි"

රජුගේ කෝපය ඉහවහා ගියේය.

"සෙබළුනි, හෙට මොහුගේ හිස ගසා දමන තුරු සිර කර තබනු"

රාජ කාරිවල ස්වභාවය එයයි. දිවිහිමියෙන් කටයුතු කළත් සුළු අතපසු වීමකින් සියල්ල දුක්ඛදායක ලෙස නිමා වේ. ශෝකබරිතව දඟ ගෙයි උන් උක්කිනා නින්දට වැටුණි. නින්දේදී සිහිනයෙන් යමක් පවසනු ඇසිණ. "නුඹගේ නිවස පිටුපස ඇති කුඩා පත්‍ර සහිත වෘක්ෂයේ පස් පංගුව කොටා මිරිකා යුෂ රජුට පොවනු... රජු පෙළෙන රෝගය නිවාරණය වේ"

පසුදිනට පහන් විය. උක්කිනා සෙබළකු අත රජතුමාට පණිවුඩයක් යැවීය.

"හොඳයි හා සුව කරන්නේ නම් ඔහුට අභයදානය දෙමි"

රජුගේ අණින් නිදහස ලත් උක්කිනා නිවසට ගියේය. පැවසූ හැඩරුවකම සහිත ශාකයේ පස්වගය කොටා මිරිකා රජුට පිළිගැන්වීය. රජතුමා සුවපත් විය. උක්කිනාට අභයදානය පමණක් නොව, ගම්වරයක්ද ප්‍රදානය කෙරිණි. එහෙත් කලකිරීම් පහව ගියේ නැත. ලැබුණු තාන්න මාන්න පසෙක ලා උක්කිනා දඹදිවට පලා ගියේය.

එහිදී වෛද්‍ය ශාස්ත්‍රයේ අගතැන්පත් අට දෙනෙකු මුණ ගැසිණි. පෙර කී ඔසුව පිළිබඳ ඔවුන්ගෙන් විස්තර විමසීය. එම අටදෙනා හා උක්කිනා එකතු වී ඖෂධය පිළිබඳ පරීක්ෂා කොට නැවත නැවත නිපදවනු ලැබිණ. නවදෙනෙකු එකතු වී තැනූ ඖෂධය 'නවරත්න කල්කය' නම් විය.

අද පවා අප රටේ සහ ඉන්දියාවේ ප්‍රකට ප්‍රත්‍යක්ෂ ඖෂධයක් ලෙස නවරත්න කල්කය හැඳින්වේ. මේ මහඟු ඔසුව ලබාගන්නේ 'මුරුංගා' ශාකයෙනි.

## ගල්ඔය සංවර්ධනය...

38 වන පිටුවෙන්

කෘෂිකාර්මික මධ්‍යස්ථානයේ සේවය කළ අතර ඔහුගේ සේවය අගය කොට සම්මාන පුරවැසිභාවය ඩී.එස්. අතින් ලබා සිටි අයෙකි. වර්ගවාදී හිංසනය ඔහු කරාද ළඟා වූ අතර එයින් දිවි ගලවාගත් ඔහු කැනඩාවට සරණාගතයකු ලෙස පැමිණ වැන්කූවර්හි රජයේ පශු වෛද්‍යවරයකු ලෙස සේවය කොට 2017 දී ජීවිතයෙන් සමු ගත්තේය.

සංවර්ධන ව්‍යාපෘතියේ සභාපති වූ ත්‍යාගසුන්දරම්ද සිය පවුල සමග අම්පාර තානායමේ මුහුණ දුන් අත්දැකීම් පසු කලෙක ඔහුගේ පුත් අජිත් ත්‍යාගසුන්දරම් හෙළිදරව් කර තිබුණේ මෙසේය.

'අපි දින දෙකක් තානායමේ හිරවෙලා හිටියා. කෑමට තිබුණු දේ ඉතා සීමිතයි. 500 ක පමණ පිරිසක් තානායම වට කළා. තුන්වන දිනයේ විදුලිය විසන්ධි කළා. වෙඩි තැබීමේ අවසරය සහිතව ද්‍රවිඩ උප පොලිස් පරීක්ෂකවරයකු හා කොස්තාපල් වරුන් පස් දෙනෙකු පැමිණියා. තත්ත්වය පාලනය කිරීමට නොහැකි තැන වෙඩි තැබීමට පොලිසියට සිදුවුණා. මැරයන් තිදෙනෙක් මැරී වැටුණා. සෙස්සෝ අතුරුදන් වුණා. සිංහල කොස්තාපල්වරු සිංහලයින්ට වෙඩි නොතබයිදෝ සැකයක් තිබුණු බව පොලිස් පරීක්ෂක පද්මනාදන් මගේ පියා සමග ප්‍රකාශ කොට තිබුණා.'

ගැටුම් පැවතුණු 3 වන දිනයේදී එතෙක් සාමකාමීව පැවති ගල්ඔය ජනපද ප්‍රදේශ කරාද භීෂණය පැතිරෙන්නට විය. මුලදී ගම්බිම් අතහැර පළා ගිය ද්‍රවිඩ වැසියෝ ආයුධ සන්නද්ධව පෙරළා පැමිණ සිංහල මැරයින්ට මුහුණ දුන්නා. 11, 14, 16 කොලනිවල දරුණු සටන් පැවතිණ. 6000 ක පමණ ද්‍රවිඩ හමුදාවක් මඩකලපුවේ සිට පැමිණෙන බවට කටකතාවක් පැතිරීමත් සමග සිංහල මැරයින් ගල්ඔය වැඩ බිමේ වාහන, ආයුධ හා ඩයිනමයිට් රැගෙන එම හමුදාවට මුහුණ දීමට පිටත් වූහ. ළමයින් හා ගැහැනුන් ඉතිරි වාහන මගින් මොනරාගල-ඉඟිනියාගල මාර්ගයෙන් පිට වී ගියහ.

ගල්ඔය නිම්නයට හමුදාව පැමිණීමෙන් පසු තත්ත්වය සාමාන්‍ය අතට හැරුණු අතර පළා ගිය ජනයා නැවත ගම්බිම් කරා ඇදෙන්නට විය. එහෙත් ඊට වසර දෙකකට පසු 1958 දී එම දෙමළ වැසියන් නැවත නොඑන්නට පළවා හැර ඇති අතර දැනට ඒවායේ පදිංචිය සිටින්නේ එහි පැමිණි සිංහලයින්ගේ තෙවන පරම්පරාවයි.

ගල්ඔය දී ඇවිලී ගියේ හුදු භාසා පනත ගැන අවබෝධයකින් ඇති වූ ජනතා ප්‍රචණ්ඩත්වයක් නොව, සැලසුම් සහගතව වර්ගවාදය හා ජාතිවාදය මුල්කර ගත් ආකල්පයන්ය. ආණ්ඩුවේ (සමගි පෙරමුණු) ඇමතිවරු වූ පිලිප් ගුණවර්ධන හා සී.පී. ද සිල්වා ගේ ක්‍රියාකලාපයන් මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවලට නොමඳ සහයක් දුන් බව එම සිදුවීම් විශ්ලේෂණය කිරීමේදී හා අතීත සටහන් පිරික්සීමේදී පෙනී යයි.

කීර්තිමත් සමාජ විද්‍යාඥයකු වූ ආචාර්ය ස්ටැන්ලි ජෙයරාජ් තම්බයියා විසින් සාමූහික ප්‍රචණ්ඩත්වය ගැන ලියූ Leveling Crowds (1997) කෘතියේ සිය අත්දැකීම් විස්තර කරයි.

'සමාව දිය නොහැකි තරම් අකාර්යක්ෂමතාවක් පළමු රැයේදී පොලිසිය පෙන්නුම් කළා. ඔවුන් බලය ප්‍රදර්ශනය කළේ නම් තත්ත්වය මීට වඩා බොහෝ සුභ විය හැකිව තිබුණා. මගේ හැඟීම වන්නේ කලහයකදී හරි වැරදි සොයා බැලීමට වඩා වැදගත් වන්නේ 'සිවිල් කලහය' යන ප්‍රපංචය අවබෝධ කර ගැනීමයි. කටකතා හෝ ඒවායේ ප්‍රතිවිපාක මගින් පෙන්නුම් කරන්නේ කලහයකදී සාමාන්‍ය සන්නිවේදන ක්‍රම වැඩකට නැති බවයි. සිහි බුද්ධිය ඇති මනුෂ්‍යයින්ගේ උපකල්පන අතාත්විකය'

විශ්‍රාමික විනිසුරුවරයකුගෙන් සමන්විත කමිටුවක් රජය විසින් ගල්ඔය ප්‍රචණ්ඩ ක්‍රියා සොයා බැලීමට පත් කළේය. වාචික/ලිඛිත සාක්ෂි සොයා බලා කමිටු වාර්තාවක් ඉදිරිපත් කෙරුණු අතර ගල්ඔය සංවර්ධන මණ්ඩලයට චෝදනා එල්ල වූයේ නැත. රජයේ පාර්ශ්වකරුවකු වූ දේශපාලන පක්ෂයකට චෝදනා එල්ල වූ අතර ඒ ගැන කිසිදු විමර්ශනයක් සිදු නොකොට සාමාන්‍ය 'සම්ප්‍රදායයට අනුව' කමිටු වාර්තාව හමස් පෙට්ටියට ගියේය.

1956 දෙමළ භාෂාවට සිදු වූ ආසාධාරණයට සාමකාමීව විරෝධය දැක්වූ දෙමළ වැසියාට පොලිසිය හා මැරයන් පහර දෙන විට වැල්වැටිතුරේ රජයේ ඉඩම් නිලධාරියකුගේ නිවසේ වැඩෙන ප්‍රභාකරන්ට වයස අවුරුදු දෙකකි. වසර 53 කට පසු ප්‍රභාකරන්ගේ සිරුර වට කොට කිරිබත් කෑ ශ්‍රී ලංකාව අද ගමන් කරමින් සිටින්නේ නිවැරදි දිශාවකටද?

## සාහිත්‍යයේ රසගුලාවක්...

40 වන පිටුවෙන්

ගොස් විඩාවට පත්වන විට අම්බලමත් පිරී තිබුණ නිසාය. එකල හැම ගමකම වාගේ අම්බලමක් ඉදිකර තිබුණේ පයින් ගමන් යන්නන්ට නවාතැන් ගැනීමටය. ආඬි හත් දෙනෙක් අම්බලමක නවාතැන් ගෙන කැඳ සෑදූ හැටි අපේ ජනප්‍රවාදයේ දැක්වේ. ගොඩමුන්න, අප්පල්ලාගෙ ාඩ, උඩුවාවල, නාපාන ආදී අම්බලන් නුවර යුගයේ ප්‍රසිද්ධ අම්බලම් විය. වෙලමැද අම්බලම කාටත් පරවේනි විය. එදා තරුණිය රෑට නවාතැන් ඉල්ලුවේ සාහිත්‍ය රසයද මතු කරවමිනි.

ඉද්ද පෙති දෙපෙති වද පෙති නුඹේ බදේ
නටන මොනරිඳුගේ කරනිල් නුඹේ බදේ
අහසින් වට යෝනි මිනිරන් නුඹේ බදේ
අදට නවාතැන් දෙනවද කුමා ලදේ

තරුණිය ගෙදර ඉඩ නැති බව කීවේ මෙසේය.

ඉද්ද පෙති දෙපෙති වද පෙති මෙමට නැතී
නටන මොනරිඳුගේ කරනිල් මෙමට නැතී
අහසින් වට යෝනි මිනිරන් මෙමට නැතී
අදට නවාතැන් දෙන්නට මෙහි ඉඩක් නැතී

ජනකවියේ ශෘංගාර රසයද මතු කළේ ගැමියාගේ රස වින්දනය තීව්‍ර කිරීමටය. ශෘංගාර රසය නුවර යුගයේ සාහිත්‍ය ඔප කළේය. ගෝලීයකරණයට අසුවී දුවන්නන් වාලේ දිවීමෙන් අපේ සංස්කෘතියෙන් අපට දායාද කරදුන් උතුම් ගුණාංග ඇවතුම් පැවතුම් හා හර පද්ධතියන් ක්‍රමයෙන් අපේ සමාජයෙන් ගිලිහී යමින් පවතී. පාසල් විෂයන් වශයෙන් තිබූ සාහිත්‍ය විෂය මාලාවක් ඉවත් කිරීමෙන් සිසුන්ගේ වින්දන හැකියාවන්ට හා රසාලිප්ත භාවයට විශාල හානියක් සිදුවී ඇති බව මගේ හැඟීමයි. ජනකවි ජන ගායනා එක් එක් භූගෝලීය කොටසකට අනුවද වෙනස් වේ. මෙම වෙනස් වීමද සලකා බලා එවැනි සංස්කෘතික අංගයන් මතු පරපුර සඳහා සංරක්ෂණය කර තැබීම රජයක යුතුකමය. වාණිජ ලෝකයේ මුදල් හඹා යන අධ්‍යාපන ක්‍රමයකදී අප මුල් තැන දී ඇත්තේ දැනීමෙන් මොලය පිරවීමටය. නමුත් දැනීම පමණක් මිනිසකු සම්පූර්ණ මිනිසකු බවට පත් නොකරයි. මිනිසා තුළ හැඟීම්ද වර්ධනය කළ යුතුය. හැඟීම් ජනිත වීමට නම් මිනිස් හදවත් තුළට දයාව කරුණාව මෛත්‍රිය සමානාත්වය ආදී මානව හිතවාදී ධනාත්මක චින්තනයන් ජනිත කළ යුතුය. එසේ නොමැතිව හදවත අමතක කර තාක්ෂණ දැනීම පමණක් ඔලුවට දැමීමෙන් සමාජයට යහපතක් වන්නේ නැත. කොම්පියුටරයකින් දැනීම ලබාදිය හැකි නමුත්, එම ලබාගත් දැනුම අනුව චරියාවක් වෙනස් වීමට නම් හදවත ඇමතිය යුතුයි. ජපන්, තායිලන්ත, කොරියා, ඉන්දියා වැනි රටවල් තාක්ෂණයෙන් කොතරම් දියුණු වූවත් එම සමාජයන් තුළ පැවති හර පද්ධතිය නොවෙනස්ව ආරක්ෂා කර ගනී. හදවතට ලැබෙන සංඥාවක් අනුව චරියාවන් යහමඟට ඇද ගැනීමට නම් අපේ සංස්කෘතික පසුබිමෙන් ලත් ආභාෂයන් සිත් තුළට කිඳා බැස්සවිය යුතුය. එම හරයන් උකහා ගත් සමාජයකට විශේෂ වූ මවුපිය දින, වැඩිහිටි දින, පරිසර දින, අමද්‍යප දින, කාන්තා දින, මිහිකත දින, මානව අයිතිවාසිකම් දින ආදී බටහිර සංස්කෘතියෙන් ණයට ගත් අංග අවශ්‍ය නොවීය. 'ඥානේන කිං ගුණ පරාක්‍රම වර්ජිතෙන' යන්නෙන් පුරාණ පඬිවරුන් විමසුවේ එබැවිනි.

සංවේදීතාව හදවතක ජනිත වුවහොත් එම පුද්ගලයා සමාජයට සේවයක් කරයි. අසංවේදීතාව විනාශය සිදුකරයි. හැඟීම් නොමැතිව දැනීම් පමණක් තිබූ උගතුන්ගෙන් මේ රටට සිදුවූ විනාශය ආවර්ජනය කර ඊට සුදුසු පිළියම් යෙදීමට බලධාරීන් කටයුතු කරන්නෙහි නම් සාහිත්‍ය මාසය පැවැත්මෙන් රටට යහපතක් සිදුවේ. නැතහොත් එයද වාර්ෂිකව පවත්වන සැනකෙළියක් බවට පත්වෙනවා ඇත.

### සංවේදීතාවය

ජන ජීවිතයේ සංවේදීතාවයෙන් ප්‍රශ්න විසඳා ගෙන සතුටින් ජීවත්වීම අපේ සංස්කෘතියේ කැපී පෙනෙන ලක්ෂණයකි. එදා සමාජයේ නොයෙකුත් ආකාරයේ දරුණු අපරාධයන් අවම වූයේ මෙවැනි ආකල්ප සමාජය තුළ ගොඩනැඟී තිබුණ නිසාය. පවුල් සංස්ථාව ගොඩනැඟී තිබුණේ උසස් හර පද්ධතියක් මතය පවුල් ගණනක් එක්ව හැදෙන ගමද එම හර පද්ධතියට ගරු කළේය. ගම් එකතු වී හැදුණු සමාජයේද මෙවැනි ආකල්ප මුල්බැස ගෙන තිබුණ බැවින් යහපත් සහනශීලී ශිෂ්ඨ සමාජයක් රටේම නිර්මාණය වී තිබිණි. එම සමාජය සිංහල බෞද්ධ සමාජය විය. එහි අත්තිවාරම වූයේ බෞද්ධ ශිෂ්ඨාචාරයෙන් අප ලත් ආභාෂයයි. ගැමි ජන දිවියෙහිදි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නම් ගෘහවාසී තිරිසන් සතුන්ට පවා දක්වන කරුණාවයි. ඔවුන් අමතන්නේද බලුහාමි, බළල් හාමි, නැතහොත් රාළ ආදී විශේෂණ පදවලිනි. ඔවුන්ගෙන් සේවයක් ලබා ගැනීමේදීද කවි රසය සිවුපා සතුන්ට පවා විඳ ගැනීමට පුරුදු පුහුණු කරවයි. ගැල පුරවා බර අදින ගොනා පවා සනසන්නේ 'පව් කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා' ආදී කරත්ත කවියෙනි. කුඹුර සී සාන විටද, ගොයම් පැසී අස්වැන්න පාගන විටද මුළු ගමම රසවත් කරන්නේ ගොවියාගේ අඬහැරයෙනි. හඳපානේ ඕසේ ඇද කමතෙහිදී පානා අඬහැරය කොතරම් චමත්කාරයක් ගමට මවා පාන්නේද?

"තිසරණ සරණයි බුදුන් දැකපන් මගේ හුරතල් මී මෝ උඹ උඹවෝ උඹවෝ"

"හතර වරන් දෙයියන්ට බාරයි මගේ මී වස්සා උඹ උඹවෝ උඹවෝ"

ගැමි ජීවිය හා බැඳි මෙවැනි සංස්කෘතික අංග ආරක්ෂා කර මතු පරපුරට දායාද කළ යුතුය.

## සිංහල සිනමා...

41 වන පිටුවෙන්

විමුක්ති පෙරමුණේ හරි එජාප කොළ කොටින්ගෙ හරි වෙඩි උණ්ඩයකින් මගේ හිස පොඩිපට්ටම් කරගෙන."

### ජනවාර්ගික අර්බුදය

එකල එල්.ටී.ටී.ඊ. භාරයේ සිටි පොලිස් නිලධාරීන් පිරිසක් නිදහස් කර ගැනීමට මැදිහත්වීම හේතුවෙන් විජයට නවමු උතුරු-දකුණු සංවාදයට මුල පිරීමට හැකිවිය. වරක් යාපනයේදී ඔහුව ඉතා උණුසුම් අයුරින් පිළිගනු ලැබීය. අවසන සිය බිරිඳ චන්ද්‍රිකාත්, බන්දුල පද්මකුමාරත් සමග විජය ඉන්දියාවට ගියේ මෙරට වාර්ගික ප්‍රශ්නය සාමකාමී හා සාකච්ඡාමය ලෙස විසඳීමේ අරමුණෙන් යැයි කියැවේ.

එහිදී විජය හා පිරිස උමා මහේෂ්වරන් (ප්ලොට්), පද්මනාභ (ඊ.පී.ආර්.එල්.එෆ්), සෙල්වම් (ටෙලෝ), බාලකුමාර් (ඊරෝස්) හා ඇන්ටන් බාලසිංහම් (එල්.ටී.ටී.ඊ.) යන අය මුණගැසී සාකච්ඡා පැවැත්වූහ. එකල ජයවර්ධන රජය මගින් වාර්ගික අර්බුදය විසඳීම අරභයා 1987 දී මුල්ම සර්ව පාක්ෂික සමුළුව කැඳවනු ලැබුවේ විජයගේ මේ මැදිහත්වීමේ එක්තරා අතුරුඵලයක් ලෙස යැයි බොහෝ දෙනා පවසනවා. විජය එහිදී ජ.වි.පෙ. විරෝධතාවන් පවා නොතකා ඉන්දීය මැදිහත්වීමෙන් හඳුන්වා දුන් පළාත් සභා යෝජනාවට පක්ෂව විශාල හඬක් නඟනවා. නමුත් මෙලෙස ඉතා අවදානම් සහගත දේශපාලන මාවතක ජාතික ඇඳුමින් හා දම්පැහැ සාටකයෙන් සැරසී අධිවේගී ගමනක් යමින් සිටි අතරතුර විජය සිය සිනමා රසිකයන් හමුවුණේ 'පෙරළිකාරයෝ' (1986), 'ජය අපටයි'(1986), 'රජ වැඩකාරයෝ'(1987) හා 'නොම්බර 17'(1989) වැනි අතිශය වාණිජ චිත්‍රපට හරහායි. මෙවන් බහුවිධතාවක් තිබූ චරිත මෙරට සමාජයේ එතරම් සුලබ නොවේ.

1988 දී ඝාතනය නොවන්නට විජය අද වන විට 73 වන වියේ පසුවන්නෙක්. ඉන් වසර හයකට පසු සිය බිරිඳ චන්ද්‍රිකා 1994 දී ජනාධිපති අසුනට තේරීපත්වන විට විජයට වයස අවුරුදු 49 ක් වීමට තිබිණි. මේ අනුව විජය ඝාතනය මෙරට දේශපාලන සිතියම පවා යම් පමණකට වෙනස් කිරීමට හේතු වුණු බව සිතිය හැක.

ජනප්‍රිය සිනමාව, සම්භාව්‍ය සිනමාව, ආදර ගීතය, විරෝධාකල්පී ගීතය, දුෂ්කර ළමා විය හා රටක් සෙළවූ සිය විවාහය මෙන්ම ජාතික වාමාංශික දේශපාලනයේ ආසන්න කූටප්‍රාප්තිය මෙවන් විවිධාකාර වූ සමාජ කතිකාවන් ගණනාවක් තම ආකර්ශනීය පෙනුම තුළ සඟවාගත් විජය කුමාරතුංග නියත වශයෙන්ම අපේ කාලයේ අපූරු ලාංකිකයෙක්. ඔහුට අවශ්‍ය ලෙසම ඔහු ඔහුගේ මරණයට ළං වූවා. ප්‍රේමයෙන් පිරුණු ජනප්‍රිය සිනමා ප්‍රතිරූපයත්, රැඩිකල් දේශපාලන භාවිතාවත් මෙතරම් එකට මුහු වූ තවත් චරිතයක් මෑතකදී නම් බිහි නොවනු ඇත.

'මානව-හිතවාදය' නම් වදන් දෙක විජය තරම් ප්‍රබලව අර්ථ ගැන්වීමට සමතෙක් ලාංකීය පොළොවේ නැවතත් ලේසියෙන් පහළ වේ යැයි සිතිය නොහැක. එක් අතකින් විජය යනු මෙරට ජනප්‍රිය සිනමා තරුවක උපරිම දීප්තියත්, අමු, අවංක දේශපාලනයට මෙරටදී ගමන් කළ හැකි උපරිම දුරත් පෙන්වා දුන් දුර්ලභ චරිතයක්. බොල් සරුවපිත්තල 'සුපර් ස්ටාර්ස්' ලා මතුවන්නට, වන්නට විජයගේ නිසඟ සිනහවේ අනුහස වඩා වඩා දැඩි වේවි. නිදහස් චතුරශ්‍රයේදී එදා අවසන්වරට දුටු ඔහුගේ හිස සුන් දේහය, මෙරටෙහි ඉදිරියට බිහිවන ඕනෑම 'අවංක' සමාජ සේවකයකු හට ඉතිරි කර ගියේ කිසිවිටකත් මඟ හැරිය නොහැකි පාඩමක්.

ඔහුට නිවන්සුව පතනවාද, ස්වර්ග රාජ්‍ය පතනවාද, නැතිනම් විප්ලවීය ආචාරය පිරිනමනවාද, ඔහු සිහිකොට හඬා වැටෙනවාද එසේත් නැතිනම් ඔහුගේ අපූරු ජීවිත ගමනෙන් පාඩමක් ඉගෙන ගන්නවාද? මෙයින් එක් පිළිතුරක් තෝරා ගැනීම කියවන ඔබට බාරයි.

# ඔබට ඇති ලොකුම අපලය ඔබ



■ පී. ඩී. පෙරේරා

තමන්ගේ සෙවණැල්ලටත් බිය වූ ආදි මිනිසා ක්‍රමයෙන් දියුණුවට පත්ව ශිල්ප ශාස්ත්‍ර මගින් එදිනෙදා ජීවිතයට මුහුණදීමට සිදුවන ප්‍රශ්න සරල කර ගැනීමට නිරාකරණය කර ගැනීමට ගත් උත්සාහය මල්ඵල ගන්නට විය

ස්වභාවයෙන් ඇති වූ ආහාර උත්සාහයෙන් එක්රැස් කර ගබඩා කර ගත් විට අලසයන් පිරිසක් සොරකම් කිරීමට පෙළඹීම නිසා මිනිසාට පාලකයකුගේ අවශ්‍යතාව මුල් යුගයේ ඇති විය. හැඩිදැඩි අයකු පාලකයා කරගත් මිනිසාට එතැනින් නොනැවතී ශරීරික මානසික ව්‍යාධිවලදී ඉන් ගැලවීම සඳහා නොපෙනෙන බලවේගවල පිහිට පැතීමට සිදුවිය. ගස් ගල් හා යක්ෂයන් දෙවි දේවතාවුන් ඇදහීමට ක්‍රමයෙන් පුරුදු විය.

එයිනුදු සෑහීමට පත් නොවූ මිනිසා ජ්‍යොතිෂය, ගුප්ත ශාස්ත්‍රය වැනි දේවල් තුළින් සහනයක් ලබා ගැනීමට කල්යෑමේදී හුරු පුරුදු විය. විවිධ අංශවලින් ක්‍රමයෙන් දැනුවත් වූ මිනිසා එදිනෙදා ජීවිතයට එල්ල වූ අභියෝග කල් ඇතිව දැන යම් යම් පියවර ගැනීමට ගත් උත්සාහය ජ්‍යොතිෂයෙන් වඩාත් හෙළිපෙහෙළි විය.

දුරදක්නා නුවණින් යුතු වූ සෘෂිවරුන් විසින් සැකසූ ජ්‍යොතිෂය අද දක්වාත් නොනැසී රැඳී ඇත්තේ එය තුන්කල්හිම ප්‍රායෝගික වූ එකක් බැවිනි. ජ්‍යොතිෂයෙන් පෙන්වා දුන් අපල උපද්‍රව පිටුදැකීම සඳහා පසුකාලීනව ඒ ඒ සමාජ තුළ පිළිගැනීමට ලක් වූ ආගමික සංකල්පවලටත් උචිත පරිදි සමාජගත විය.

ඉන්දියාව වැනි රටවල හින්දු ආගම ප්‍රචලිත වූ බැවින් ඊට අදාළ බලි යාග, බිලි දීම් සඳහා මිනිසා පොළඹවන ලදී. ශ්‍රී ලංකාව වැනි රටවල බොදු පිළිවෙත් යොදා ගන්නා ලදී. බෝධිපූජා, සෙත්කවි, පිරිත් දේශනා, භාවනා විධි, සිල්සමාදන් වීම, ගිලනුන්ට උවැටැන් කිරීම, සිල්වත් භික්ෂූන්ට සිව් පසයෙන් උවැටන් කිරීම, මරණයට කැපවූ ගවයන් කුරුල්ලන් නිදහස් කිරීම ඒ අතර ප්‍රමුඛ තැනක් ගනී. පැමිණෙන සියලු මානසික ව්‍යාධි සුවපත් කිරීමට පිරිත් පොතේ එක පදයකට ඇති බලය ප්‍රතිපත්තිගරුක බෞද්ධයාට අමුතුවෙන් පැහැදිලි කළ යුතු නැත.

කවර සමාජයක වුවත් මිනිසා ප්‍රතිපත්තිගරුක නම් ඔහුට පැමිණිය හැකි උපද්‍රව බෙහෙවින් අවම කරගත හැකිය. මත්පැන් බොන්නා ලෙඩ වෙති. පවුල් ආරවුල්වලටත් පැටලෙති. හිරේ විලංගුවේත් වැටෙති. එසේ නොවේ නම් ඔහුට පැමිණිය හැකි කරදර පීඩා ස්වල්ප වේවි.

කාමයේ වරදවා හැසිරෙන්නා ශරීර සෞඛ්‍ය හීන කර ගනිති. ජරාජීර්ණ ලෙඩට ගොදුරුව සමාජ නින්දාවටත් ලක් වෙති. දේපළ මිල මුදල් පවා විනාශ කර ගනී. මේ අන්දමින් සමාජය දෙස බලන විට බොහෝ දෙනා අසරණ අසීරු අඩියකට පත්ව ඇත්තේ සිය කැමැත්තෙන් නොමගට යොමු වීමෙනි. මිනිසාට අවශ්‍ය වී ඇත්තේ දැන දැන වැරදි කර ඒ වැරදි තුළම රැඳී සිටිමින් සැනසිලිදායක ජීවන රටාවක නිරත වීමටය. මෙය කිසිදා විය නොහැකි දෙයකි. කෝවිල් දේවාල ගානේ ගොස් ඇඟ බේරා ගැනීමටය.

බෞද්ධයන් නමට බෞද්ධයන් වී ඇති බැවින් හින්දු ආගමට අනුව සිදුවන බලියාග සඳහා යොමු කිරීමට ඇතැම් දෛවඥයන් පෙළඹී තිබීමද කණගාටුදායක කරුණකි. එළුවන් කුකුළන් බිල්ලට දී තම ආගමික වත් පිළිවෙත්වලටත් දැන හෝ නොදැන අගරු කරති. නිර්මල බුදු දහමට අනුව පැමිණෙන අපල උපද්‍රව ජය ගන්නට පැහැදිලි ගමන් මගක් තිබියදී නොපෙනෙන දෙවියන් පසුපස ගොස් අසරණ වන්නේ මන්දැයි ඔබම සිතා බලන්න.

කුණු වී ගිය පළතුරු අපිරිසිදු ජලයෙන් සෝදා පූජා වට්ටියක් පිදීමෙන් ඔබේ දුක් ගැනවිල්ල ඇසීමට තරම් පිරිසිදු දෙවියෙක් ඔබ අහලකටවත් පැමිණේවි දැයි සිතා බලන්නට ඔබට බුද්ධියක් නැත්තේ ඇයි? ඔබ ඒ තරමටම නොමනා දෙයට යොමුව ඇති බැවිනි. බොහෝ විට ඔබව විනාශ කරන්නේ ග්‍රහ අපල නොව ඔබගේ ඒ නොමනා ක්‍රියාකලාපය බව සිහියට ගත යුතුය.

දුක සේ හරිහම්බ කළ දේ නිකරුණේ කෝවිල්, දේවාලවලට පුදනවා වෙනුවට ඔබේ මවට පියාට දරුවන්ට බිරිඳට අසල්වැසියාට නිසි ගෞරවයෙන් යුතුකම් ඉටු කිරීමට යොදා ගත්තා නම් මාරක අපල මගහැර ගැනීමට පවා ශක්තිය ධෛර්ය උදාවනු ඇත. ඔබ තුළ ඇති වැරදි අඩුපාඩු තේරුම් ගැනීමට අපොහොසත් වීමෙන් ඔබම විපතට පත්වනු ඇත. දරුවන් නොමැති මවක් දෙවියන් යැදීමට පළමු වෛද්‍ය උපදෙස් ගත යුතුය. විවාහය පමා වන විට ඊට හේතුවුණ සැබෑ බාධක තේරුම්ගත යුතුය. ලෙඩදුක් සුව නොවන විට නිසි වෛද්‍ය ප්‍රතිකාර ගත යුතුය. පළමුව සත්‍යයට මුහුණ දී දෙවනුව වෙනතක යොමු වීම සමාව දිය හැකි කරුණකි. නමුත් අද සිදුව ඇත්තේ පසුව කළ යුතු දේ පළමුව කරට ගැනීමය.

සියලු සතුන්ට මෛත්‍රී සහගත වීමට හැකි නම් ඔබට ලෝකයම අවනත කර ගැනීමට හැකි වනු ඇත. ඔබ ප්‍රතිපත්තිගරුක බෞද්ධයෙක් නම් තම ග්‍රහයන් දෙපතුළ ළඟ දනගැස්වීමට ශක්තිය ලැබේවි. ඊර්ෂ්‍යාව කුහක කම ලෝභය ද්වේෂය පළිගැනීම ඔබ ගිලගෙන ඇති බැවින් ඔබ ඔබටම සාපයක් බවට පත්ව ඇත.

පිළිවෙත් අනුව නිතරම ගුණගරුක ගමනක් යන්න. ඔබට පැමිණෙන අභියෝග ජයගන්නට නිරන්තර ශක්තියක් ඉන් ලැබේවි. ඔබ වැරදි ගමනක් යයි නම් හැමදාමත් කනවැල අල්ලන්නට කෙනකු අවශ්‍ය වේවි. වාරුවක් අවශ්‍ය වේවි. ඔබ මිනිස්කමටත් නිගාවක් වේවි.

## උපහැරණයක වතගොත

### ‘පුරුදු කරණමට වැඩි කරණම් නපුරටයි’

■ මිල්ටන් ද සොයිසා

මෙහි තේරුම, ‘තමන්ගේ ශක්තිය ඉක්මවා කටයුතු කරන්ට යන්නෝ විනාශයට පැමිණෙත්’ යන්නයි.

### උපහැරණයේ උපත

පෙර කල කරනම්පන්න විජ්ජත් කුලයක එක් පුරුෂයෙක් සිය පිරිවරද රැගෙන ගමින් ගම යමින් විජ්ජාත් පාමින් ජීවත් වන්නේය. මේ පුරුෂයා එක් ගමකට ගියේ එහිදී රා බී ඒ රා මදින් වෙනදා සිටුවන ආයුධ සතර වෙනුවට ආයුධ පහක් සිටුවා වැඩි කරණමක් ගසන්නට සූදානම් වූයේය. ඒ දුටු ඔහුගේ එක් ගෝලයෙක් “ඇයි ආචාරිනී වෙන හැමදා ආයුධ සතරක් සිටුවා ගසන කරණම් සතරට අද ආයුධ පහක් සිටවූයේ. ආයුධ සතරක් පමණක් සිටවුව මැනවි” යි කියද්දීම, “තා මගේ බල නොදැන කතා කරන්නේය. අද මගේ බල බලව” යි කියා ආයුධ සතරේ කරණම් ගසා පස්වැනි කරණම ගසන්නේ වාවාගත නොහී ආයුධයේ ලය ඇමිණී එයින්ම මරණයට පත්විය.

වැඩි කරණම නපුරට හිටියා යැයි කී ගෝලයෝ ඔහු එහිම ආදාහන කළෝය.

### මීට සමාන කියමන්

ඇඟිල්ලේ තරමට ඕනෑ ඉදිමෙන්න

ගමරාළ අටසිල් රැක්කා වගේ

වර්තමාන කතාව - අබරා කියා ගමරාළ කෙනෙක් හිටියා. මේ ගමරාළගේ හාමිනේ හැම පෝයටම ගමේ පන්සලට ගිහින් සිල් ගන්නවා. හැමදාම සිල් ගන්න ගමහාමිනේ දිහා බලාගෙන හිටිය අබරා ගමරාළටත් දවසක් හිතුණා සිල් ගන්න. ඉතින් ගමරාළ ගම හාමිනේගෙන් ඇසුවා සිල්ගන්නේ කොහොමද කියා.

“සිල් රෙද්ද පොරවා ගෙන ගිහින් පන්සලේ හාමුදුරුවෝ කියන විදිහට උන්වහන්සේ කියන කියන එක කියලා, සිල් අරගෙන එන එකනේ” කියල හාමිනේ කිව්වා.

අබරා පෝය දිනයක් බලලා සිල් රෙදිත් පොරවා ගෙන පන්සලට ගියා. මීට කලින් පන්සල් ගිහින් නැති අබරා බයටම ගස්වලට මුවා වෙවී තමයි හිටියේ. අබරා කෙසෙල් පඳුරකට මුවාවෙලා පන්සලේ මොකද වෙන්නෙ කියල බලාගෙන හිටියා. අබරා නොදැන හිටියාට ඒ කෙසෙල් පඳුරේ එක ගසක පැහිච්ච කෙහෙල් කැනකුත් තිබුණා. පන්සලේ හාමුදුරුවෝ දැක්කා කවුරුන් හෝ කෙහෙල් පඳුරට මුවා වෙලා ඉන්නා බව. කෙහෙල් කැන කපන්නට හොරු ඇවිත් යැයි සිතූ හාමුදුරුවෝ තමන්ගේ කුටියේ ඉඳන්ම මෙහෙම ඇහුවා.

“ඔතන කවුද?”

“ඔතන කවුද?” යැයි අබරාද ඇසුවා.

“උඹ ආවේ මොකටද?” හාමුදුරුවෝ නැවත ඇසුවා.

“උඹ ආවේ මොකටද?” අබරාද ඇසුවා.

නිසැකවම කෙසෙල් කැන කපන්ඩ ආපු කෙනා තමන්ව බය ගන්වන්න හදනවා යැයි සිතූ ස්වාමීන්,

“මෙන්න හොරෙක්” යැයි කියා කෑ ගැසුවා.

අබරාද “මෙන්න හොරෙක්” යැයි කියා කෑ ගැසුවා.

ඒ සමගම පන්සලේ ඇබිත්තයෝ අබරාව වටකර ගෙන ඔහුට පහර දුන්නා. ගුටි කාල ගෙදර ආපු අබරා දැකපු හාමිනේ “මේ මොකැයි ගමරාළ මේ ගුටිකාල වගේ..” යැයි ඇසුවාය.

“හාමිනේම නේ කිව්වේ හාමුදුරුවෝ කියන කියන එක කියන්න කියලා. එහෙම කියල තමයි මෙහෙම වුණේ. මම දැනන් උන්නෙ නැහැනේ සිල් ගන්න එක මෙච්චරම අමාරුයි කියලා” ගමරාළ කීවා.

## කීකරු පුතා...

43 වන පිටුවෙන්

මැරෙන්න දෙන්න. මට ඕන නෑ ඔයාගේ පෙති කරල් කකා බෙහෙත් වතුර බිබී ජීවත් වෙන්න.”

“ටිකක් හිතන්න තාත්තා”

“ඔයත් හිතන්න” වර්මා හඬමින් කියයි

“කෑම තහනම් කරල. ලේලි සලකන්නෙ නෑ. නාකි මගේ කැමත්තට ඉඩක් නෑ. මුනුබුරෝ හිනාවෙනවා. මෙහෙම ජීවත්වෙලා වැඩක් තියෙනවද.”

දැන් දැන් වර්මා කියන දෙය කාටවත් තෙරුම් ගැනීමට අපහසුය. වචන පැහැදිලි නැත.

දෙන විටමින් සහ බෙහෙත් නිසා ඔහු ජීවත් වෙයි. සේවකයන් සැමදාම සවසට ඔහුව මිදුලට ගෙන යයි. ඔහු අකැමති වුවත් දොස්තර මහතා එලෙස කරන ලෙස කිවූ බව පවසන සේවකයන් වර්මාව මිදුලට ගෙන ගොස් අලුත් වාතය ලැබීමට සලස්වයි. ලේලිය පැමින පිටට කොට්ටයක් තබා ඔහුට වාඩි වීමට උදව් කරන විට තමන්ට නිදාගන්න දෙන්න යැයි කියමින් බැන වදියි.

“තාත්තා කොහොමද. ඔන්න මම තාත්තට තවත් ටොනික් ජාති දෙකක් ගෙනාව. ඇඟේ ශක්තිය වැඩිවෙන්න” සවස මිදුලේ ඇඳ මත වැතිර සිටින වර්මා වෙත පැමිණ රකේෂ් කිවේය.

තමා දෙස බලන තාත්තාගේ මුහුණේ වු බැල්මෙන් තාත්තා තමා ගැන සිතන දෙය රකේෂ්ට දැනුණි.

“මම මැරෙනවා. මට මැරෙන්න ඉඩදෙන්න.”

“තාත්තා විහිළු කරනවා” රකේෂ් සිනාසුණි.

“මේ ටොනික් බොන්න ඇඟට ගුණයි.”

“ටොනික් ඔයාම තියාගන්න. මම මීටපස්සෙ කිසිම බෙහෙතක් බොන්නෙ නෑ. කවදාවත්ම නෑ.”

ඔහු මුළු ශක්තිය යොදා පුතා අත තිබූ බෝතලයට අතින් ගැසීය. බිම වැටුණු බෝතලය බිඳුනි. එහි තිබූ බෙහෙත් රකේෂ්ගේ සුදු පාට ඇඳුමේ විසුරුණි. ලේලිය හඬාගෙන දුවගෙන ආවා. හැමදෙනාම ඇඳ වටා රොක් වුණා. ඇදේ තිබූ කොට්ටය ඉවතට විසි කළ වර්මා දෑස් පියාගෙන අහසට මුමුණන්නට වුණා.

“දෙවියන් මට කතා කරනවා. දැන් මට යන්න දෙන්න.”



# මැටි බඳුනෙන් කියැවෙන බුදුබණ

පසේනදී කොසොල් රජතුමා දිනක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණියේ ශෝකයෙන් බර වූ මුහුණින් යුතුවය. බුදුරදුන්ට වන්දනා කර එකත්පස්ව හිඳගත් රජුගෙන් " මහරජ, ඔබ මේ මහ දවල් පැමිණියේ කොහි සිටදැ" යි බුදුරජාණන් වහන්සේ විමසූ සේක.

රජතුමා පැවසූ වදන් මෙසේ ය. "බුදුරජාණන් වහන්ස, බොහෝ වයස්ගත දිරා ගිය සිරුරකින් යුක්ත, උපතින් එකසිය විසි අවුරුද්දක් වූ මගේ මිත්තණිය මිය ගියා. එතුමිය හරිම ප්‍රියමනාප කෙනෙක්. ඒ මරණය මට මහත් වූ දුක් ගෙන දෙන්නක්. ස්වාමිනි, ඇත් රුවන හෝ අස් රුවන ගම්වරයක් හෝ ජනපදයක් හෝ දී මිත්තණිය මරණයෙන් මුදාගැනීමට හැකියාව තිබිණි නම් මා එසේ කරනවා."

රජතුමා එසේ පැවසූ විට "මහරජ, සියලුම සතුන් මරණය ස්වභාව කොට ඇති අයයි. සියලු සතුන්ගේම ජීවිත මරණයෙන් කෙළවර වෙනවා. කිසිම සතකු නොමැරෙන තත්ත්වයට පත් වී නැත" යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාළහ.

එම බුදු වදන රජුගේ සිතට තදින්ම කා වැදිණි. ඒ නිසාම "භාග්‍යවතුන් වහන්ස, හරිම අසිරිමත්. හරිම පුදුමයි. සියලුම සතුන්ගේ අවසානය මරණය බවටත්, කිසිම සතකු නොමැරෙන ස්වභාවයට පත් වී නැති බවටත් කළ දේශනාව හරි අසිරිමත් එකකැ" යි හෙතෙම පැවසීය.

මෙහිදී ජීවිතය සහ මරණය අතර සම්බන්ධතාව බුදුරජාණන් වහන්සේ විසින් පැහැදිලි කරනු ලැබුයේ උපමාවක්ද ගෙනහැර දක්වමිනි. "මහරජ, කුඹල්කරුවන් විසින් නිපදවනු ලබන මැටි භාජන අමු හෝ වේවා පිලිස්සූ හෝ වේවා. සියල්ලම බිඳීම ස්වභාව කොට ඇතියේ බිඳීමෙන් අවසන් වනුයේ නොබිඳෙන තත්ත්වයට පත් නොවූයේ යම් සේද එමෙන් සියලුම සත්වයෝ මරණය ස්වභාව කොට ඇත්තෝය. මරණය අවසානය කොට ඇත්තෝය. නොමැරෙන තත්ත්වයට පත් නොවූවෝය." උන් වහන්සේ දේශනා කළහ.

මැටි බඳුනක් කුඹල්කරුවකු විසින් සාදනු ලබමින් සිටියදීම බිඳී යෑමට ඉඩ ඇත. ඇතැම් විට වේලීමට තබා තිබියදී හෝ පිලිස්සීම සඳහා පෝරණුවට ඇතුළත් කරද්දී හෝ බිඳී යෑමට හැකිය. ඇතැම් විට බිඳෙන්නේ පිලිස්සෙන අතරතුර හෝ පෝරණුවෙන් පිටතට ගැනීමේදීය. සමහරවිට වෙළෙඳ පොළට ගෙන යෑමේදී හෝ පාරිභෝගිකයකු විසින් සිය නිවසට ගෙන යනු ලැබීමේදී බිඳී යා හැකිය. ගෙදර ගෙනගෙ ාස් ටික දිනකින් මැටි බඳුන බිඳී යෑමට ඉඩ ඇති අතර පරම්පරා ගණනක් පරිහරණය කළාට පසුව වුවද බිඳී යෑමට හැකිය. සෑම මැටි බඳුනකම තිබෙන්නේ කවදා හෝ සිඳෙන බිඳෙන ස්වභාවයයි. ඒවා අවසාන වන්නේ බිඳීමෙන්මයි. නොබිඳෙන ගතියක් එම කිසිදු භාජනයක නැත.

සත්ව ජීවිතත් එම මැටි බඳුන් වැනිය. ඇතැම් සත්වයෝ කලල අවස්ථාවේදීම විනාශ වෙති. සමහර දරුවන් මිය යන්නේ මව්කුස තුළදීමය. කුසින් බිහිවන විට, ඉපදී දින දෙක තුනකින් හෝ මිය යන්නෝද වෙති. හොඳට දුව පැන සෙල්ලම් කරන වයසේදී හෝ නාඹර තරුණ වියේදී හෝ ඇතැම් අය මිය යති. වැඩිහිටියන් ලෙස ඇතැම්විට වසර සියයකටත් වැඩි ආයුෂ ගෙවා මිය යන්නෝද වෙති. ඒ සෑම ජීවිතයකම පවතින්නේ මැරෙන ස්වභාවයමය. කිසිවකුත් නොමැරෙන තත්ත්වයට පත් වී නැත. දිය ගොඩ වෙසෙන සියලුම සත්වයන්ගේ ස්වභාවය එයයි. ජීවිතය මැටි බඳුන්වලට උපමා කොට තිබෙන්නේ එබැවිනි.

සියලු සත්වයන් යන්නට තම දූ පුතුන්ද ඇතුළත් වන බව මව්පියන් තේරුම් ගත යුතුය. තම මව්පියන්ද සියලු සතුන්ට ඇතුළත් වන බව දරුවන් තේරුම් ගත යුතුය. සියලු සත්වයන්ට තම බිරිඳද ඇතුළත් වන බව සැමියාත් තම සැමියාද ඊට ඇතුළත් වන බව බිරිඳත් කල්පනා කළ යුතුය. සියලු සතුන්ට ඇතුළත් නොවන කිසිදු සහෝදරයකු සහෝදරියක, මිතුරකු මිතුරියක, ගිහියකු පැවිද්දකු, දෙවියකු, බ්‍රහ්මයකු, අපා, දෙපා, බහුපා සතකු නැති බව අප තේරුම් ගත යුතුය. අනිත්‍යතාව එනම් අස්ථිර බව එක ගමකට, නියම් ගමකට, එක කුල පරපුරකට වෙන් වූ ධර්මතාවක් නොවන බවත් දෙවියන් සහිත සමස්ත ලෝකයාටම පොදු වූ ධර්මතාවක් බවත් බුදු දහමෙහි ඉගැන්වේ.

අනිත්‍යතාව පිළිබඳ පණිවුඩය ඉතා ප්‍රබල ලෙස අපට ලබාදෙන්නේ මරණයයි. එයින් ඇති වන අමිහිරි වේදනාව අපගේ සිතට තදින්ම දැනේ. එම වේදනාව තුනී කර ගත හැකි වන්නේ මරණය කාටත් උරුම ධර්මතාවක් බවට ගැඹුරින් වටහා ගැනීමෙනි. මරණය පොදු උරුමය වුවද එය අකාලයේ සිදුවනු දැකීමට අපේ සිත කැමැති නැත. කුඩා දරුවන්ගේ, තරුණ තරුණියන්ගේ මරණ ගැන අසන, ඒවා දකින අපි බොහෝවිට කම්පා වෙමු. එය පුදුමයක් නොවන්නේ අවුරුදු එකසිය විස්සක් ගත කළ මිත්තණියගේ මරණය ගැන පවා කොසොල් රජු කළ ප්‍රකාශය විග්‍රහ කර බලන විටය.

උපත ලද අනුපිළිවෙළටම විපතද සිදු නොවේ. එය කුමන වයසේදී කොතැනකදී කෙබඳු ආකාරයට වේදැයි නිශ්චිතව කිව හැකි නොවේ. ඇතැම්විට මව්පියන් හොඳින් ජීවත්ව සිටියදී දරුවෝ මිය යති. වැඩිමහලු සොයුරු සොයුරියන් ජීවත් වෙද්දී බාල සොයුරු සොයුරියෝ මිය යති. භූමි කම්පා, සුළිසුළං, සුනාමි වැනි විපත් අවස්ථාවන්හි පවුල් පිටින්ම එකට මියැදෙති. අප සිතන පතන පරිදිම අප කැමැති පරිදිම ක්‍රියාත්මක වීමට ලෝකය සූදානම් නැත. 'නොසිතූ දෙය සිදුවේ - සිතූ දෙයද වැනසී යේ' අප සිතන පතන සියල්ල එලෙසම සිදු වෙත් නම් ලෝකය මොනතරම් සුන්දර සුවදායී වනු ඇත්ද?

උදෑසන හොඳින් මුණගැසුණු අය සවස මැරී සිටිනු දැකිය හැකිය. සවස යහතින් කල් ගෙවූ අය පසු දා උදය මරණයට පත් වී සිටිය හැකිය. අපද කවදා හෝ මිය යනු ඒකාන්තය. එය අදද හෙටදැයි අපි නොදනිමු. කුමන මොහොතක මරණය පැමිණියත් අප එයට සූදානම්ව සිටිය යුතුය. මරණයට සූදානම්ව සිටීම යනු උකටලීව, උදාසීනව, සියලු වැඩ අතහැර අක්‍රියව 'අනේ අනිච්චං' යයි සිතමින් කල්ගත කිරීම නොවේ. අප්‍රමාදීව කුසල් දහම්හි යෙදීමයි.

අද අද එයි මරු පින්කර ගන්නේ
කෙලෙසද සෙට මරු නේති සිතන්නේ
කිකලද මහ සෙන් මරු ඇප වන්නේ
කුමටද කුසලට කම්මැලි වන්නේ

ලෝවැඩ සඟරාව දෙන මෙම උපදේශය අප නිතර සිහිපත් කළ යුත්තකි. මරණය පිළිබඳව මෙනෙහි කිරීම ජීවිතයෙන් පලා යෑමක් නොවේ. යථාර්ථයට මුහුණ දීමකි. බුදුරජාණන් වහන්සේ අපට වදාළේ උදේ සවස මරණය පිළිබඳව මෙනෙහි කරන ලෙසයි. මරණය රාත්‍රි කාලයේ සිදු වූවත්, දවල් කාලයේ සිදු වූවත් ඒ මරණ මොහොත පැමිණෙන විට තමාට අහිත පිණිස විය හැකි අකුසල දහම් තමා තුළ පවතින බව පෙනේ නම් එම අකුසල දහම්වලින් මිදීමේ කැමැත්ත හා ඒ සඳහා වූ උත්සාහය අප ඇතිකර ගත යුත්තේ හිස ගිනි ගත්තකු එම ගිනි නිවා ගැනීමට වහ වහා ක්‍රියා කරන්නාක් මෙනි.

අප සසර අප්‍රමාණ වාර ගණනක් මැරී ඉපදී ඇත්තෙමු. කෙලෙසුන් සහිතව සිටින තාක් කල් අපට යළි යළිත් මරණයට ගොදුරු වීමට සිදුවේ. මෙම ජීවිතය අවසන් වූවායින් පසුව යළි නූපදින තත්ත්වයට මේ ජීවිත කාලය තුළම පත් විය නොහැකි නම් අප කළ යුත්තේ සසර මැරෙන වාර ගණනවත් අඩුකර ගැනීමට ක්‍රියා කිරීමයි. එයට එකම මග අකුසලයෙන් වැළකී කුසලයෙහි යෙදීමයි. ඒ සඳහා හොඳම ජීවිතය මේ ගත කරන ජීවිතයයි. හොඳම මොහොත මේ මොහොතයි. මහා සම්පත් වෙනුවෙන් දරු මුණුබුරන් වෙනුවෙන් වෙහෙසෙමින් අධාර්මිකව වාසය කළහොත්, අකුසල ක්‍රියාවන්හි යෙදුණහොත් එහි විපාක වශයෙන් දුගතිගාමී වන විට ඒ ධන සම්පත් හෝ දරු මුණුබුරන් හෝ පිහිටට එන්නේ නැත. ඒ අධාර්මික ජීවිතයේ විපාක තමාම විඳ ගත යුතු වේ. ධනය ඉපයිය යුතුය. දරුමල්ලන් ඇතුව ජීවත් වීමට කැමැති ගිහියන්ට ඒ සඳහා බාධාවක් නැත. එහෙත් සියල්ල කළ යුත්තේ තමන් මැරෙන බව දැනගෙ නය. මැරෙන බව දැනගෙන, මරණය මෙනෙහි කරමින් ජීවත් වන්නා තුළ මෛත්‍රිය , කරුණාව ආදී ගුණ දහම් වැඩේ. ප්‍රඥාව දියුණු වේ. මරණානුස්සතිය වඩන්නා සිල්වත් ජීවිතයකට පෙළඹෙන්නේ නිරායාසයෙනි. ඔහු නිසැකවම නිවන්මගෙහි යන්නෙකි.

## පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි

46 වන පිටුවෙන්

"මේ කෙහෙල්මල් අලුත් පොත් නිසා දරුවොත් අමාරුවේ. අපිත් අමාරුවේ" යැයි පැවැසීය.

**හේ. ක. සෝමපාල**

### ග්‍රීස් යකා

වෙසක් පෝය නිමිති කරගෙන නගරාසන්නයේ පිහිටි ප්‍රාථමික විද්‍යාලයක ශීල සමාදාන පිංකමක් පවත්වනු ලැබීය. පාසලේ සියලුම දූ දරුවන්ද ආචාර්ය මණ්ඩලයේ කීප දෙනෙක් ද සිල් සමාදන් වූහ. මේ කාලය තුළ පාසලේ බොහෝ ආගමික කටයුතු සංවිධානය කෙරිණි. මෙදින අවසන් ධර්ම දේශනාව සඳහා වැඩම කරන ලද්දේ පාසල පිහිටි ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන් වහන්සේය. ධර්ම ශ්‍රවණය සඳහා කුඩා දූ දරුවන් පිරිසක් තමන් ඉදිරියේ සිටිනා බැවින් ඔවුන්ගේ අවධානය යොමු කර ගැනීමේ අටියෙන් උන්වහන්සේ ආලවක දමනය පිළිබඳ කතා පුවත දරුවන් හට පැහැදිලි කළහ.

මෙය යක්ෂයෙකුගේ කතාවක් බැවින් දරුවන් ඉතා ඕනෑ කමින් හා සන්සුන් ඉරියව්වෙන් සිටිනා බවක් පෙනුණි. ධර්ම දේශනාව අවසන් කිරීමට පළමු හාමුදුරුවෝ දරුවන්ගෙන් බණ දේශනාවට අදාළ ප්‍රශ්න කීපයක්ද විමසූහ.

"දරුවනේ... මම අපේ දරුවන්ට දේශනා කළේ කුමන යකාගේ කතාවද?" එක් වරම නැගී සිටි ළමයෙක් මහහඬින් "ග්‍රීස් යකාගේ කතාව" යැයි පිළිතුරු දුන්නේය.

මේ අනපේක්ෂිත පිළිතුරින් ගුරුවරුන්ට හිනාව නවතා ගැනීමට නොහැකි වූ අතර හාමුදුරුවන්ද සිය හිනාව මැඬ පවත්වා ගනු ලැබුවේ මහත් වූ ආයාසයකිනි.

**සමන් චන්දන කුමාරසිංහ**

# BEYOND YOUR EXPECTATIONS !

## Residential & Commercial Real Estate

**BUY or SELL your HOME with me**

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

**My commission for your listing will be 0% when you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.



**5% DOWN ? No problem!**

I will guide you through obtaining your DREAM HOME through my proven system!

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

RE/MAX 100% Club Award

2016, 2014, 2013, 2011, 2010

RE/MAX Platinum Club Award

2015, 2012

The Diamond Realty Inc Brokerage

A member of CanLanka BUSINESS ASSOCIATION

RE/MAX HALL OF FAME

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

## Call me Today !

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.

Join the many happy home owners I've helped and find the perfect home for you!

# Gamini Abeysinghe. ABR, CNE

## Real Estate Sales Representative

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828

1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

# Mobile : 416 822 2789

**www.gaminiabeysinghe.com**

● Some conditions apply. Please feel free to contact me for further details ** ● Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements

# KATPAKAM GROCERY

TEL: 905 785 0444

MASOOR DHAL
URID DHAL
URID DHAL

MD CORDIAL
CONDENSED MILK
JAM
NESTOMALT

EASTERN - DOSA PODI, PUTTU PODI, IDLY PODI, IDIYAPPAM PODI, APPAM P

PAPADAM
MALDIV CHIP
SESAME OIL
GREEN JACK TIN

FROZEN COCONUT
FROZ ROTI 30PC

TUSK BASMATI RICE
URITHIRA RED RAW RICE

MORE SPECIALS IN THE STORE

THANK YOU FOR A SUCCESSFUL SIX YEARS OF BUSINESS!




**6970 Lisgar Drive, Unit B1, Mississauga, L5N 8C8**

Derry/ 9th Line(Behind 7 Eleven Gas Station)

TEL: 905 785 0444



දසත Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

## වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

## Gamini - 416 822 2789



# ඔබේ නිවසටම දසත Dasatha

**සැම මසකම දසත පුවත්පත ඔබේ නිවසටම තැපැල් මගින් ගෙන්වා ගැනීමේ අවස්ථාව දැන් සලසා ඇත.**

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට අදාළ චෙක්පත යොමු කරන්න.

**දසත දායකත්ව ගාස්තු**
**Subscription Rates for Dasatha**

මාස හයක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 35

වසරක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 70

Please make all Cheques payable to **Dasatha Publications**

Dasatha Publications, 114 Chatfield Dr. Woodbridge L4H 0Z7. Ontario. Canada

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

**www.dasatha.com**